# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 ජූනි 06** වන අඟහරුවාදා
2017 ஆனி 06 செவ்வாய்க் கிழமை
Tuesday 06th June 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்லஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.34 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.34 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.34 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා.

පසුගිය දිනවල ඇති වූ ස්වභාවික විපත් අවස්ථාවේදී බස්නාහිර පළාත ඇතුළු දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවක මහජනතාව ඉමහත් පීඩාවන්ට ලක් වුණා. එම ව්‍යසනය හේතුකොටගෙන වටිනා ජීවිත ගණනාවක් රටට අහිමි වුණු අතර විශාල පිරිසක් අවතැන් වුණා.

ඒ පිළිබඳව මගෙත්, පළාත් සභාවේත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරුන්, විපක්ෂ නායකතුමා, ධූරධාරීන් ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාගේත් ශෝකය, කනගාටුව ඒ මියගිය අයගේ පවුල්වල අයට මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. මුළු පළාත් සභාව වෙනුවෙන් මෙම අවස්ථාවේදී අපගේ ශෝකය, කනගාටුව පළ කර සිටිමින්, අද දින සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙර ඒ අය වෙනුවෙන් විනාඩි දෙකක නිශ්ශබ්දතාවක් පළ කරන ලෙසට මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

***ඊට අනුකූලව පළාත් සභාව එවලේ නැඟී සිට විනාඩියක කාලයක් නිහඬව සිටිමින් සිය ශෝකය පළ කළේය.***

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එමෙන්ම ව්‍යසනයෙන් පීඩාවට ලක් වූවන්ට නන් අයුරින් උපකාර කළ සියලුම ජනතාවටත්, මහජන නියෝජිතයන්ටත්, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ, සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ටත්, රාජ්‍ය නිලධාරීන්ටත්, ජනමාධ්‍ය ආයතනයන්හි කාර්ය මණ්ඩලවලටත්, උපකාර කළ දෙස් විදෙස් සියලුම අය වෙතත් අපගේ කෘතඥතාවය පළ කිරීමටද මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. අද අපි පළාත් සභාව පැවැත්වෙන මේ අවස්ථාවේදීම කඩුවෙල ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීම කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත් වෙනවා. කඩුවෙල ආසනයේ පවුල් 2800 ක් යට වෙලා, ඒ ප්‍රදේශයේ තවමත් ගංවතුර බැස ගියේ නැති තැන් තිබෙනවා. අට දහස් ගණනක් පීඩාවට පත් වෙලා. ඒ සම්බන්ධව කඩුවෙල ආසනය නියෝජනය කරන අපි විශේෂයෙන් සම්බන්ධීකරණ රැස්වීමේදී කථා කළ යුතුයි, යම් පිළිසරණක් වීමේ කටයුතුවලට දායක වෙන්න. නමුත් මේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීම් හැම අවස්ථාවකම පළාත් සභා රැස්වීම් දිනයේදීම තිබෙනවා. මම මීට පෙර අවස්ථා දෙකක් විතර මේ සභාවේ කථා කරලා ඔබතුමා මගින් අපි අදාළ නිලධාරීන්ට කිව්වා. රාජ්‍ය පරිපාලනයට, ප්‍රාදේශීය ලේකම්වරු, දිසාපති මේ සියලු දෙනාව දැනුවත් කරන්නය කියලා. මම දන්නේ නැහැ, එහෙම ලියුමක් යැව්වාද කියලා. මාගේ පැත්තෙන් දන්නේ නැහැ මෙහෙම කථා කළාට ලියුමක් යවලා අඩුම ගණනේ එහෙම යැව්වා කියලා අපව දැනුවත් කරලා නැහැ. ඒ නිසාමද දන්නේ නැහැ, කොහොම හරි සම්බන්ධීකරණයේ සභාපතිතුමා දෙන ඕනෑම වෙලාවක, දිනයක ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වරිය ඒ දින යොදා ගන්නවා. මේ තුළ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදත් කඩ වෙනවා. අනික් පැත්තෙන් මන්ත්‍රීවරු හැල්ලුවට ලක් වෙනවා. ජනතාවට අපේ නියෝජනය ඉදිරිපත් කරලා සහන සලසන්න තිබෙන අවස්ථාව නැතිව යනවා. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා. නැවත මෙවැනි දෙයක් නොවෙන්න අදම මේ සම්බන්ධව අදාළ සියලු පාර්ශව දැනුවත් කරලා කටයුතු කරන්න. එහෙම නැත්නම් මේ සභාව එහෙන් දිනයන් දැන්නුවාම

[ගරු ජගත් කුමාර]

මේක නවත්තන්න. මොකක් හරි දෙකෙන් එකක් කරන්න. අපි මෙතැනත් ඉන්න ඕනෑ. මෙතැනත් අපට මාසයකට දවස් දෙකයි කථා කරන්න තිබෙන්නේ. අපට ඒ අවස්ථාව ලබා ගන්න ඕනෑ. ජනතාව අපව එව්වේ මේ කටයුතු සඳහා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට පැහැදිලියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා වහාම ක්‍රියා මාර්ගයක් ගන්නය කියලා ඉල්ලනවා. අපවත් දැනුවත් කරන්න. අපේ තව මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගොඩක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ඔය වැඩේ කරනවා. පළාත් සභා රැස්වීම් දිනයට රැස්වීම් දානවා. ප්‍රාදේශීය ලේකම්තුමන්ලාත් ඔය දේම කරනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ලේකම්තුමාට උපදෙස් දෙනවා. අපේ පළාත් සභාවේ මේ වර්ෂයේ සහ ඉදිරියට තිබෙන සභා රැස්වීම් දින පිළිබඳ වාර්තාවක් ඒ සියලුම දිස්ත්‍රික් ලේකම්තුමන්ලාට සහ ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කරන්න, පළාත් සභා රැස්වීම් පැවැත්වෙන දිනයට රැස්වීම් යොදා නොගන්නා ලෙසට. මම ඔබතුමාට අවශ්‍ය ඒ කටයුතු කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මමත් ඒ සම්බන්ධයෙන් කථා කරන්න මේ ලියුමත් අරගෙන ආවේ. මම නොකඩවාම මේ සම්බන්ධීකරණ රැස්වීමට සහභාගි වුණු මන්ත්‍රීවරයෙක්. අඛණ්ඩව සම්බන්ධ වුණා. ඒ නිසා මම මේ ලියුම සභාගත කරනවා,[1] ඔබතුමාගේ අවබෝධය සඳහා. මින් ඉදිරියට මෙය නොවෙන්න කටයුතු කරන්න ගරු සභාපතිතුමනි.

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, බොහොම ස්තුතියි. සාමාන්‍යයෙන් ගරු මන්ත්‍රීතුමා ඕක වෙන්නේ මෙහෙමයි. අදාළ ආසනයේ ඉන්න ඒ දේශපාලන බලධාරීත්වය තමයි ඒ දිනය තීරණය කරන්නේ. ප්‍රාදේශීය ලේකම්ට දිනය දෙන්නේ අදාළ කමිටුවේ ඉන්න සභාපතිතුමා. එතුමන්ලා මේවා ගැන බලන්නේ නැහැ. පළාත් සභාව තිබෙනවාද? නැද්ද? කියලා බලන්නේ නැහැ. ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. මහජන නියෝජිතයන් වශයෙන් කථා කරන්න තිබෙන අවස්ථාවක් අපේ පළාත් සභා මන්ත්‍රීතුවරුන්ට අහිමි වෙනවා. මම ලේකම්තුමාට උපදෙස් දෙනවා. වහාම -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමන්ලා සම්බන්ධීකරණ සභාපතිතුමන්ලා දන්නවා නේ? අපේ පළාත් සභා බලප්‍රදේශයේ . ඒ අයව දැනුවත් කරන්න. මේ මන්ත්‍රීතුමන්ලාට සම්බන්ධ වෙන්න පුළුවන්, අඟහරුවාදා දවස් දෙක විතරක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, පළාත් සභාවේ හිටපු අය තමයි ඒ තැන්වල ගොඩක් ඉන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරු, ඇමැතිවරු තමයි ඒ තැන් නියෝජනය කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. බලවත් අසාධාරණයක් සිදු වුණු කෙනෙක් හැටියට කථා කරන්නේ. ඒ කාරණාව තමයි ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමයි, සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමයි කථා කළේ. කඩුවෙල ආසනයට තමයි මේ රෝගය බෝ වෙලා

තිබෙන්නේ. හැබැයි, කඩුවෙල ආසනයේ තමයි මේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ඉන්නේ. මේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුව අපට දන්වන්නේ නැහැ. මේක බලවත් අසාධාරණයක්. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කරන්න ඕනෑ. විශේෂයෙන් බැලුවාම දැන් කඩුවෙල ප්‍රාදේශීය ලේකම්ව දැනුවත් කරන්න ඕනෑ, මෙන්න මේ දවස්වල තමයි පළාත් සභාව තිබෙන්නේ කියලා. ඒ නිසා පළාත් සභාව තිබෙන දවසේ මොනම දෙයක්වත් දා ගන්න එපැයි කියලා. අපේ විතරක් නොවෙයි. සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරී, ගරු මන්ත්‍රීතුමා. අපි දැන් ඒ ගැන දිගින් දිගටම කථා කළා. ඔබතුමාගේ කථාව පිළිගන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තම තමන්ගේ පක්ෂවල සභාපතිවරුන්ට කිව්වාම හරි නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ ගංවතුරෙන් හුඟක් අය ජනප්‍රිය වෙන්න හදනවා. අපිව අයින් කරලා. මෙන්න උඹලා නැහැ. අපි විතරයි මේ ගංවතුරේ සේරම වැඩ කෙරුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ හිටපු ගරු ඇමැතිතුමා, සමාවෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ නිසා ඔබතුමාගෙන් ඉතාමත්ම බැගෑපත්ව ඉල්ලා සිටිනවා. ඔබතුමා මගින් ලේකම්තුමා හරහා අවශ්‍ය ඇවැසි පුද්ගලයින්ව දැනුවත් කරන්න. විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ව දැනුවත් කරන්න. මෙන්න බස්නාහිර පළාත් සභාවේ සිටින -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන අපි එතුමාට අවශ්‍ය -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හරි. බොහොම ස්තුතියි.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්නවනවා.

i. 2017.04.26 දිනැති බස්නාහිර පළාත් සභාවේ පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව සහ,

ii. 2017.05.23 දින පැවැති බස්නාහිර පළාත් සභාවේ සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, රාජගිරිය, රාජගිරිය පාරේ, අංක 51/2 හි පදිංචි ලලනි ශෂිකා හීන්වැල්ල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petition Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව. නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා. කෘෂිකර්ම, ඉඩම් ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට. කෘෂිකර්ම ගරු ඇමැතිතුමා එතුමිය සභා ගර්භය තුළ නැහැ. පිළිතුර ලැහැස්ති නම් ඔබතුමා සභාගත කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයත් මට අදාළ නොවන ප්‍රශ්නයක්. සභාගත කරලත් වැඩක් නැහැ. මේක මධ්‍යම රජයේ වැඩක්.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**01.**

**නිරෝෂා අතුකෝරාළ ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/46)**

*ප්‍රශ්නය :*

*අ. අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපලෙහි දැනට සේවය කරන සේවකයින් ප්‍රමාණය කොපමණද?*

*පිළිතුර :*

*අ. අදාළ නොවේ.*

*ප්‍රශ්නය :*

*ආ. මාසිකව කොපමණ ආදායමක් උපයනවාද?*

*පිළිතුර :*

*ආ. අදාළ නොවේ.*

*ප්‍රශ්නය :*

*ඇ. එහි මාසික වියදම කොපමණද?*

*පිළිතුර :*

*ඇ. අදාළ නොවේ.*

*ප්‍රශ්නය :*

*ඈ. ගොවිපලේ භූමි ප්‍රමාණය කොපමණද?*

*පිළිතුර :*

*ඈ. අදාළ නොවේ.*

*ප්‍රශ්නය :*

*ඉ. වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද?*

*පිළිතුර :*

*ඉ. අදාළ නොවේ.*

*අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපල බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතනයක් නොවන අතර එය මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනයක් බව කාරුණිකව දන්වා සිටිමි.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් මාර්ග, ප්‍රවාහන ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**02.**

**සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/47)**

අ. 2013 වර්ෂයේදී බස්නාහිර පළාත් සභා මාර්ග සහ පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා රජයේ අමාත්‍යාංශ හරහා කොපමණ මුදලක් ලබා දී ඇත්ද?

ආ. 2014 වර්ෂයේදී බස්නාහිර පළාත් මාර්ග සහ පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා රජයේ අමාත්‍යාංශ හරහා කොපමණ මුදලක් ලබා දී ඇත්ද?

ඇ. 2015 වර්ෂයේදී බස්නාහිර පළාත් සහා මාර්ග සංවර්ධනය සහ පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා රජයේ අමාත්‍යාංශ හරහා කොපමණ මුදලක් ලබා දී ඇත්ද?

ඈ. 2016 වර්ෂයේදී බස්නාහිර පළාත් සහා මාර්ග සහ පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා රජයේ අමාත්‍යාංශ හරහා කොපමණ මුදලක් ලබා දී ඇත්ද?

ඉ. මෙම අවස්ථාව වන විට වර්තමාන රජය මුදල් ප්‍රතිපාදන නිසි ලෙස මාර්ග සංවර්ධනයට ලබා නොදෙන්නේ නම් එම මුදල් ලබා ගැනීමට ඔබතුමා කිසියම් වැඩ පිළිවෙළක් සකස් කර තිබේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ.

| | | | |
|---|---|---|---|
| 2011– 2013 | රන් අරුණ 01 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | රු. මිලියන 3,423.00 |
| 2012 -2013 | රන් අරුණ 02 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | රු. මිලියන 4,677.00 |
| | | මුළු එකතුව | රු. මිලියන 8,100.00 |

ආ.

| | | | |
|---|---|---|---|
| 2013 -2014 | රන් අරුණ 03 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | රු. මිලියන 3,423.00 |
| දොරින් දොරට ගමින් ගමට මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය 2014 | | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | රු. මිලියන 2,457.00 |
| | | මුළු එකතුව | රු. මිලියන 8,890.00 |

ඇ. 2015 වර්ෂය සඳහා මුදල් ලබා දී නොමැත.

ඈ.

| | |
|---|---|
| මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | රු. මිලියන 1,626.00 |
| නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | රු. මිලියන 102.72 |
| **මුළු එකතුව** | රු.මිලියන 1,728.72 |

ඉ. ඔව්.

බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මගින් මුදල් අමාත්‍යාංශය වෙත පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2015 හා 2016 වර්ෂයේදී කාපට් කිරීමට ඇති ඉතිරි කිලෝ මීටර් 543 සඳහා හා වැඩිදියුණු කළ යුතු පාලම් සඳහා ව්‍යාපෘති වාර්තා යවා ඇති අතර, ඒ සඳහා ප්‍රතිචාරයක් තවම ලැබී නොමැත. එමෙන්ම විදේශීය සහ දේශීය බැංකු වෙතින් ණය ගැනීම සඳහා ද ව්‍යාපෘති වාර්තා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යවා ඇති අතර, ඒ සඳහා ද තවම ප්‍රතිචාරයක් ලැබී නොමැත.

ඊ. අදාළ නොවේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, පළාත් මාර්ග සඳහා විශාල මුදල් ප්‍රමාණයක් තවම ලැබිලා නැහැ. එතකොට අපේ පළාත්වල පළාත් සහා මාර්ග විශාල ප්‍රමාණයක් ගමනා ගමනයට නුසුදුසු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මෙතුමාගේ පිළිතුරේම සඳහන් වෙනවා, මුදල් ලැබිලා නැහැයි කියලා. ඉල්ලුම් කළා. ලැබිලා නැහැයි කියලා. ඉතින් මොකක් හෝ වැඩ පිළිවෙළක් නැද්ද? මේ පළාත් මාර්ග සඳහා මුදල් ප්‍රමාණයක් ලබා ගන්න. දැන් මේ අවුරුද්දේ ශතයක්වත් ලැබිලා නැහැ නේ? ඉල්ලුම් කරපු අයගෙන් ලැබිලත් නැහැ. අමාත්‍යාංශයේත් සල්ලි නැහැ. මොකක් හෝ වැඩ පිළිවෙළක් නැද්ද? මධ්‍යම රජයත් එක්ක සාකච්ඡා කරලා -

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

I ව්‍යාපෘතිය යටතේ දැනට අපි මුදල් ඉල්ලා සිටිනවා. සමහර ඒවා ලැබෙමින් පවතිනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඇයි මහ ඇමතිතුමා දුන්නේ?

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මහ ඇමැතිතුමා දීපු සල්ලි මෙතැනට බලපාන්නේ නැහැ. ඒ පළාත් පාලන සල්ලි. ඒක කථා කරන්න එපා. මම අහන්නේ ගරු ඇමැතිතුමාගෙන් මධ්‍යම රජයෙන් මුදල් ගන්න පුළුවන්ද කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ඔබතුමාට වැඩිය මුදල් මම එතුමාට දුන්නා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මේකෙන් බොහොම පැහැදිලි වෙනවා. පසුගිය රජය කාලයේ මිලියන 50,000 ක් විතර ලැබෙන කොට මේ රජයෙන් මිලියන 2000 යි ලැබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභානායකතුමා, දුන්නේ නැහැයි කියලා කියන්න දෙයක් නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ, නැහැ. ලක්ෂ 20 ක් විතර දුන්නා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ලක්ෂ 20 ක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා. අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මම ගරු ඇමැතිතුමාට මතක් කරන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දීර්ඝ විස්තරවලට යන්න එපා. ඔබතුමා ප්‍රශ්න තුනක් අහන්න කෝ. එතුමාගෙන් අහපු ප්‍රශ්නවලට අතුරු ප්‍රශ්න තුනක් අහන්න. (බාධා කිරීම්) අනේ සමාවන්න. අනවශ්‍ය විහිළුවලට යන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අතුරු ප්‍රශ්න ඉලාස්ටික් කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව විහිළුවට ලක් කරන්න එපා. අනවශ්‍ය ප්‍රකාශවලට යන්න එපා. ගරු සභානායකතුමා කථා කරන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මම දැන් මෙතුමාගෙන් අහන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න තුනක් අහන්න කෝ. එච්චරයි. පැහැදිලි කිරීම්වලට යන්න එපා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මෙතුමාට මුදල් මධ්‍යම රජයෙන් ලබා දෙන්නේ නැහැ. ඒ නිසා මෙතුමා ඒකට වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. අඩුම ගණනේ උපවාසයක් හරි කරන්න, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ඉස්සරහා. තමුන්නාන්සේට මුදල් ලැබෙන්නේ නැහැ නේ? මහා මාර්ග අමාත්‍යාංශයේ මුදල් ඇත්තෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, දීර්ඝ විස්තර කිරීම්වලට යන්න දෙන්න බැහැ. ප්‍රශ්න අහන වෙලාවේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ඒ නිසා අපි කියන්නේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නීත්‍යානුකූලව අහන්න පුළුවන් ඒවා අහන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

පාරවල්වලට තාර ටික දාන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න කියන එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ගරු සභානායකතුමාගේ අවසරය මත මම අතුරු ප්‍රශ්නයක් අහනවා. මේ ප්‍රතිපාදනවලටම අදාළ නිසා. දැන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සමහර පාලම් බෝක්කු වෙනුවට පාවිච්චි කරලා තිබෙන්නේ ගරු ඇමැතිතුමා, අර බැරල් අරගෙන ගිහිල්ලා පස් පුරෝලා තියෙන්නේ. ඒවා දැන් තාවකාලිකව කරපු දේවල්. දැන් අවුරුදු ගණනාවක් ගිහිල්ලා. දැන් මේ කළල්ගොඩ තැනක් තිබෙනවා. මම සාමාන්‍යාධිකාරීතුමාටත් කිව්වා. ගරු සභාපතිතුමනි, එතැන ඩෙංගු බෝ කරන මධ්‍යස්ථානය වෙලා තිබෙන්නේ. දැන් ඒ බැරල්වල ඒ පස් තට්ටුවේ වතුර රැඳෙන එක ඉවරයි. දැන් උඩ අලුත් වතුර. වහින වතුර. ගියාට පස්සේ පේනවා. ඒවායේ ඩෙංගු. ඩෙංගු බෝ කරන මධ්‍යස්ථාන බවට පත් වෙලා තිබෙනවා. ඉතින් මේවා සම්බන්ධයෙන් ඉක්මන් ක්‍රියා මාර්ගයක් ඇමැතිතුමා හැටියට ඔබතුමා ගන්නවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, හැකි ඉක්මණින්ම ඒ පිළිබඳව සොයා බලලා කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තුන්වැනි ප්‍රශ්නය ගරු සභානායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**03.**

**සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/48)**

අ. 1988 ප්‍රථම බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් සඳහා එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා, ක්ෂයවීමේ පදනම මත මාසිකව රු.1200/- ක් දීමනාවෙන් අඩු කර මිට්ෂුබිෂි පෙජරෝ රථයක් ලබා දුන් බව ඔබතුමා දන්නවාද?

ආ. දෙවන හා තෙවන පළාත් සභා සඳහා පොදුජන එක්සත් පෙරමුණ රජය යටතේ ගරු චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය 75% ක තීරු බදු සහනයක් යටතේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට වාහනයක් ආනයනය කර ගැනීමට බලපත්‍රයක් ලබා දුන් බව ඔබතුමා දන්නවාද?

ඇ. සිව්වන හා පස්වන පළාත් සභා සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය යටතේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා තීරුබදු සහන යටතේ වාහනයක් ආනයනය කිරීමට බලපත්‍රයක් ලබා දුන් බව ඔබතුමා පිළිගන්නවාද?

ඈ. හයවන පළාත් සභාවෙහි නවක මන්ත්‍රීවරු විශාල සංඛ්‍යාවක් සිටින අතර පවතින සෑම රජයක්ම පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා මෙම වාහන බලපත්‍රය ලබා දීමට කටයුතු කර ඇති නිසා වත්මන් රජය සමඟ ඉතාම සුහදශීලීව කටයුතු කරන ඔබතුමා මෙම බලපත්‍රය මන්ත්‍රීවරුන්ට ලබා දීමට ගරු ජනාධිපතිතුමා හා ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡා කර බලපත්‍රය ලබා දීමට පියවර ගන්නේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. රජයේ සැපයුම් දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇත. වැටුප් ලේඛන පරීක්ෂාවේදී එම වාහන සඳහා මාසයකට රු.1760/- ක මුදලක් බැගින් අය කර ගෙන ඇත.

ආ. තීරු බදු සහන යටතේ වාහන ආනයන බලපත්‍ර ලබා දී ඇති බව දනිමි.

ඇ. ඔව්.

ඈ. ඔව්.

ඉ. අදාළ නොවේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මම ප්‍රධාන ඇමැතිතුමාගෙන් අහන්නේ තමුන්නාන්සේ මේ ආණ්ඩුවත් එක්ක බොහොම මිත්‍රශීලීව කටයුතු කරන ප්‍රධාන අමාත්‍යවරයෙක්. ඔබතුමා මේ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගෙන් හෝ අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවාද? මේ අහිංසක පළාත් සභා මන්ත්‍රීවරුන්ට වාහනයක් අවශ්‍යයි කියලා. විශේෂයෙන් අලුත් මන්ත්‍රීවරු රාශියක් මේ පළාත් සභාව නියෝජනය කරනවා. දැන් පළාත් සභාවල කාලයත් අහෝසි වෙන්න සමහර ඒවායේ ගිහිල්ලා. නමුත් මේ දක්වා ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා ඔබතුමා දීර්ඝ විස්තරවලට යනවා නේ? විස්තර කරන්න දෙයක් නැහැ. කෙටියෙන් කියන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

දීර්ඝ කථාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න බැහැ. අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

අවශ්‍ය කථාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දිග කතන්දරවලට යනවා නේ? ඔබතුමා අතුරු ප්‍රශ්න තුනක් අහන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මම අහන්නේ ජනාධිපතිතුමාගෙන් ඒ ගැන ඉල්ලීමක් කළාද කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍ය සමුළුවේදීත්, ප්‍රධාන අමාත්‍යවරු එකතු වුණු වෙලාවේදීත් ජනාධිපතිතුමාගෙන් ඉල්ලලා තිබෙනවා. මේ මෑතකදී මමයි තිලකසිරි ගරු ඇමැතිතුමායි ඉන්න වෙලාවකදී අපි ජනාධිපතිතුමාට මතක් කළා. ඒ වාගේම අගමැතිතුමා අපව හමු වුණු වෙලාවේදීත් අවස්ථා දෙකකදී අපි මෙම ඉල්ලීම කරලා තිබෙනවා. හැබැයි ඒ ඉල්ලීම කරන වෙලාවේදී දෙන්නේ නැහැයි කියලා කිව්වේ නම් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉක්මණට ලැබෙයි. ගංවතුර ප්‍රශ්නත් තිබෙනවා නේ? හතරවැනි ප්‍රශ්නයත් ගරු සභානායකුතමාගෙන්මයි. ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**04.**

**සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/49)**

අ. බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරු කණ්ඩායම් 03 ක් ලෙස විදේශ අධ්‍යයන සංචාර සඳහා යැවීමට පවතින මුදල් තත්ත්වය මත සභා ලේකම් කටයුතු කළ බව දන්නවාද?

ආ. ඒ යටතේ 2016.08.10 දින මන්ත්‍රීවරු 34 දෙනෙකු නිලධාරීන් 04 දෙනෙකු රුසියාවේ සහ පින්ලන්තයේ සංචාරයක යෙදුන බව ඔබතුමා දන්වාද?

ඇ. ඉතිරි දෙවන මන්ත්‍රී කණ්ඩායම අධ්‍යාපන සංචාරයක් සඳහා යැවීම සඳහා 2017 පළාත් අයවැය මගින් මුදල් අනුමත කර වෙන් කර ඇති බව ඔබතුමා දන්නවාද?

ඈ. එසේ තිබියදීත් 2017 වර්ෂයෙහි මාස 05 ක් ඉක්ම ගොස් ඇතත්, දෙවන කණ්ඩායම යැවීම සඳහා මෙතෙක් පළාත් සභාව පියවරක් ගෙන නොමැති බව දන්නවාද?

ඉ. විදේශ ගත වූ පළමු මන්ත්‍රී කණ්ඩායම විදෙස් අධ්‍යයන චාරිකාව මගින් දැනුම් සම්භාරයක් ලබා ගෙන ඇති නිසා දෙවන හා තෙවන සංචාර සඳහා යාමට සිටි මන්ත්‍රීවරුන්ට එම අවස්ථාව නොලැබීමෙන් දැඩි කලකිරීමට පත්ව ඇති බව ඔබතුමා පිළිගන්නවාද?

ඊ. පිළිනොගන්නේ නම් ඒ මන්ද?

උ. දෙවන අධ්‍යයන සංචාරය සඳහා මන්ත්‍රීතුමන්ලා කණ්ඩායමක් යැවීමට කටයුතු කරන්නේද?

ඌ. ඒ සඳහා කිසියම් නීතිමය ගැටලුවක් පැන නැගී ඇත්ද?

එ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ගරු මන්ත්‍රීවරුන්ගේ විදේශ පුහුණු සඳහා මුදල් වෙන් කර ඇත.

ඈ. දැනට පියවර ගනිමින් සිටී.

ඉ. මෙම පුහුණු වැඩ සටහන සඳහා සහභාගී වීමට ගරු මන්ත්‍රීවරුන් උනන්දුවෙන් පසුවන බව දනිමි.

ඊ. අදාළ නොවේ.

උ. පියවර ගනිමින් සිටී.

ඌ. ජනාධිපති ලේකම්ගේ සී.එස්.ඒ/1/3 හා 2016 සැප්තැම්බර් 05 දිනැති "විදේශ සංචාර සඳහා අරමුදල් ලබා දීම" හා පළාත් ආණ්ඩුකාරවරු අමතන ලද ජනාධිපති ලේකම්ගේ සී.එස්.ඒ/1/1/83 හා 2015 ජූනි 05 දිනැති "පළාත් සභා සහ පළාත් පලාන ආයතන මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාර" නැමැති චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට උපදෙස් දී ඇත.

එ. අදාළ නොවේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්න එකක් තිබෙනවා. දැන් මෙතුමා සඳහන් කළා, පියවර ගනිමින් පවතිනවා කියලා. මම ගරු ඇමැතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. ඒ සඳහා මන්ත්‍රී නාම ලේඛනයක් හදලා තිබෙනවාද? එහෙම නැත්නම් පියවර ගන්න ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛවලින් බාධාවක් තිබෙන සඳහන් කළා. ඒ අයත් එක්ක සාකච්ඡා කරලා විසඳුමක් ලබා ගන්න කටයුතු කළාද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක කථා කරලා මේ පිළිබඳව සාකච්ඡාවක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, ඒ දෙවන චාරිකාව සඳහා මේ වන විට අපි ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. අපි, සභා ලේකම් කාර්යාලය අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා, දෙවන කණ්ඩායමට යාමට අවසර දෙන්නය කියලා.

පස්වැනි ප්‍රශ්නය සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## 05.

**සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/50)**

අ. බස්නාහිර පළාත් සභාව මගින් ක්‍රියාත්මක වන බස්නාහිර පළාත් සභාවේ ආර්ථික ප්‍රවර්ධන කාර්යංශය යනුවෙන් නම් සඳහන් ආයතනයක් පිහිටුවා තිබේද?

ආ. වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් මෙම ආයතනය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද? ඒ කුමන වැය ශීර්ෂ යටතේද?

ඇ. මෙම ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය විසින් මෙතෙක් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති ගණන අදාළ වර්ෂයන්ට අනුව ව්‍යාපෘති නාමය සහිතව වෙන් වෙන්ව සඳහන් කළ හැකිද?

ඈ. එම ව්‍යාපෘතිවලින් ලැබූ ලාභය හෝ අලාභය එක් එක් ව්‍යාපෘතිවලට අදාළව වෙන් වෙන්ව මෙම ගරු සභාවට දැනුම් දිය හැකිද?

ඉ. මෙම ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ගැන අභ්‍යන්තර විමර්ශනයක් සිදු කළේද? ඒ කිනම් වර්ෂයකද?

ඊ. එම විමර්ශන වාර්තාවේ සඳහන්, සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව ඔබතුමා ගෙන ඇති සහ ඉදිරියේදී ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. තිබේ.

ආ. ඔව්. වැය ශීර්ෂ අංක 104-3-2-1504(III) යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

ඇ. හැකිය.

| | |
|---|---|
| 2011 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය |
| | ස්වයං රැකියා ව්‍යාපෘතිය |
| 2012 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය |
| | ස්වයං රැකියා ව්‍යාපෘතිය |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය |
| 2013 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය |
| 2014 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය |
| | ඉන්ටර්ලොග් ඇතුරුම් ව්‍යාපෘතිය |
| 2015 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය |
| | ඉන්ටර්ලොග් ඇතුරුම් ව්‍යාපෘතිය |
| 2016 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය |

ඈ. හැකිය.

| වර්ෂය | ව්‍යාපෘතිය | ලාභය/අලාභය |
|---|---|---|
| 2011 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | -372,899.99 |
| | ස්වයං රැකියා ව්‍යාපෘතිය | -95,976.37 |
| 2012 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | 10,907,222.37 |
| | ස්වයං රැකියා ව්‍යාපෘතිය | -69,000.00 |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය | -556,810.91 |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය | 55,458.50 |
| 2013 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | 12,876,387.45 |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය | -2,883,480.77 |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය | 260,875.55 |

| | | |
|---|---|---|
| 2014 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | 10,656,148.93 |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය | -1,040,105.70 |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය | 201,871.33 |
| | ඉන්ටර්ලොග් ඇතුරුම් ව්‍යාපෘතිය | 10,052.23 |
| 2015 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | 9,856,682.05 |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය | 57,786.27 |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය | 123,138.12 |
| | ඉන්ටර්ලොග් ඇතුරුම් ව්‍යාපෘතිය | -1,622,250.71 |
| 2016 | වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | 11,360,394.36 |
| | වෙස්ප්‍රෝ මුද්‍රණාලය | 2,919,278.29 |
| | ඉන්ටර්ලොග් ව්‍යාපෘතිය | 1,227.84 |

ඉ. 2011 වර්ෂයේ සිට මේ දක්වා අභ්‍යන්තර විගණන අංශයෙන් හා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

ඊ. අභ්‍යන්තර විගණන අංශයෙන් හා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති විගණනයන් වලදී අක්‍රමිකතා පිළිබඳ සඳහන්ව නැත.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අක්‍රමිකතාවන් “ඇත“ කියලාද “නැත“ කියලාද කිව්වේ. මට ඇහුණේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැත. වාර්තා වෙලා නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මගේ ළඟ තිබෙන වාර්තාවක් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා ඒක කියැව්වොත් - ඔබතුමාගේ කාලයේ නොවෙයි. ඔබතුමාත් මේකේ මන්ත්‍රීවරයෙක් හැටියට සිටියා. එතකොට මේ සිද්ධ වුණු පරීක්ෂණය අනුව සිදු වුණු අලාභයන්, වංචා දූෂණ රැසක් මේකෙන් හෙළිදරව් කරගන්න පුළුවන්. ඔබතුමාට මම මේක ෆොටෝ කොපියක් ගහලා දෙන්නම්. ඔබතුමා මේක කියෙව්වොත් මේ අලාභයන් අවම කරගන්න පුළුවන්. මෙන්න මේ සිද්ධ වුණු මූල්‍ය අක්‍රමිකතාවන් රාශියක් මේක ඇතුළේ තිබෙනවා. ගරු සභාපතිතුමනි, උදාහරණයක් කිව්වොත්, නිලධාරීන් 580 ක් කැඳෙව්වා කියලා තිබෙනවා. හැබැයි, ඒ 580 නාම ලේඛනයක් සඳහන්ව නැහැ. ඒ අයගේ කෑම සඳහා හය ලක්ෂ ගණනක් වියදම් කරලා තිබෙනවා. නිලධාරීන් 580 ක් කැඳෙව්වා කිව්වාම පුදුමයි ගරු සභාපතිතුමනි .

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට පැහැදිලි කරන්න -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මම පැහැදිලි කර ගැනීමක් කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ පැහැදිලි කිරීම වැදගත්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ නිසා මගේ ප්‍රශ්නය මේ වාර්තාව අනුව - ගරු සභාපතිතුමනි, සමාවෙන්න. මේ වාර්තාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා මේ අදාළ වංචාකරුවන්ට දඬුවම් දීම සිදු කරනවාද? කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න.[2]

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ ව්‍යාපෘති සරුදම් අරුණැල්ල, නෙතට අරුණ ආදී ව්‍යාපෘති මේකේ කරලා තිබෙන්නේ. එතකොට ඒවා මුදල් උපයන ව්‍යාපෘති නොවෙයි. මම හිතන්නේ මන්ත්‍රීතුමා සේවාවක්. මන්ත්‍රීතුමා සඳහන් කරන්නේ එවැනි කාරණාවක් වෙන්න ඇති. කොහොම නමුත් අභ්‍යන්තර විගණනයක් සිදු වෙලා තිබෙනවා. මට පිළිතුරු සපයන්න පුළුවන් වන්නේ, ඒ ලැබෙන දේ අනුව. ගැටලුවක් තිබෙනවා නම් ඔබතුමා ඉදිරිපත් කරන්න. අපි පරීක්ෂා කරලා බලමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හයවැනි ප්‍රශ්නය අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව. එතුමා සභා ගර්භය තුළ නැහැ. පිළිතුර ලැහැස්ති නම් සභාගත කරන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** *[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

**06.**

**කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/51)**

*ප්‍රශ්නය :*

*අ. බස්නාහිර පළාත තුළ නොතාරිස්වරු විසින් ලියා සහතික කරන ලද ඔප්පු/සාධන පත්‍ර සඳහා නියමිත මුද්දර ගාස්තු නොගෙවූ, නොතාරිස්වරු කොපමණ සිටීද? එම අය නම්, ලිපිනයන් සහ දෙවන පිටපත භාරදෙන කාර්යාල වශයෙන් වෙන් වෙන්ව කවුරුන්ද?*

*පිළිතුර :*

*අ. දැනට හඳුනාගත් අය 46 යි.*

*ඇමුණුම 01 හි දක්වා ඇති නීතිඥ හා නොතාරිස්වරුන්ගේ ලිපිනයන්ට ආසන්නම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ඔවුන් විසින් ඔප්පුවේ දෙවන පිටපත් භාර දිය යුතුය. සියලු තොරතුරු ඇමුණුම 01[3] හි දක්වා ඇත.*

*ප්‍රශ්නය :*

*ආ. එක් එක් අයවලුන් වෙතින් අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු සහ දඩ මුදල වෙන් වෙන් වශයෙන් සහ මුළු මුදල කොපමණද? අය කරගෙන ඇති මුදල කොපමණද?*

*පිළිතුර :*

| | | |
|---|---|---|
| *ආ. හිඟ මුද්දර ගාස්තුව* | *රුපියල් මිලියන* | *50* |
| *දඩ මුදල* | *රුපියල් මිලියන* | *94* |
| *එකතුව* | *රුපියල් මිලියන* | *144* |

*දැනට අය කරගෙන ඇති මුදල රුපියල් මිලියන 24 යි.*

*ප්‍රශ්නය :*

*ඇ. එවැනි අයවලුන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?*

*පිළිතුර :*

*ඇ. බස්නාහිර පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය විධිවිධාන පරිදි හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත.*

[2] එවලේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යොමු කරන ලදී.

[3] පිළිතුර අවසානයේ පළ කර ඇත.

ප්‍රශ්නය :

ඈ. එම අයවලුන් අතරින් කා හට නඩු පවරා ඇත්ද? කුමන අධිකරණ බල ප්‍රදේශයකද?

පිළිතුර :

ඈ. ඇමුණුම 01[4] හි දක්වා ඇත.
ඇමුණුම 01[5] හි දක්වා ඇත.

ප්‍රශ්නය :

ඉ. එම අයවලුන් විසින් බිඳ දමා ඇති වෘත්තිමය ආචාර ධර්ම සම්බන්ධයෙන් යම් ආයතනයක්/ අධිකරණයක් වෙත කරුණු දක්වා ඇත්ද? ඒ කා සම්බන්ධයෙන්ද?

පිළිතුර :

ඉ. ඔව්.
ඇමුණුම 01[6] හි සඳහන් සියලුම නීතිඥවරුන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමයට සියලු විස්තර සහිතව දන්වා යවා ඇත.

ප්‍රශ්නය :

ඊ. එසේ ඉහත (ඉ) හි පරිදි ක්‍රියා නොකළේ නම් ඒ කුමන හේතුවක් නිසාද?

පිළිතුර :

ඊ. ඉහත (ඉ) අනුව කටයුතු කර ඇත.

ප්‍රශ්නය :

උ. මෙම වංචා වැළැක්වීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

පිළිතුර :

උ. ඇමුණුම 02 හි දක්වා ඇත.

**ඇමුණුම 02**

**ප්‍රශ්න අංක - ප්‍ර/vi(1)/17/51 හි (උ) සඳහා පිළිතුර**

1. ලියා සහතික කරන ලද ඔප්පුවල දෙවන පිටපත් භාරදෙනු නොලබන නීතිඥ හා නොතාරිස්වරුන්ගේ විස්තර ඇතුළත් මාසික වාර්තාවක් පළාත් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් මඟින් ලබා ගැනීම.

2. මුදල් ප්‍රඥප්තියේ 62 හා 63 වගන්ති අනුව නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා ඇති බවට සාධන පත්‍ර සහතික කර දීම 2013.03.01 දින සිට ක්‍රියාත්මක කිරීම.

3. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත විවිධ කාර්යයන් සඳහා ඔප්පු පිටපත් ඉදිරිපත් කිරීමේදී එම ඔප්පුවල නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා ඇති බවට සහතික කරදීම සඳහා එම එම ඔප්පුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ආයතන දැනුවත් කිරීම. (මෙම වැඩ පිළිවෙළ 2013.03.01 දින සිට ක්‍රියාත්මක වේ.)

4. බැංකු ණය මුදලක් යටතේ යම් දේපළක් මිලදී ගැනීමේදී ඉදිරිපත් කරනු ලබන සහ ලියා සහතික කිරීමට අදහස් කරනු ලබන ඔප්පු වල නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා ඇති බවට සහතික කරදීම සඳහා එම ඔප්පු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස සියලු බැංකු දැනුවත් කිරීම. (මෙම වැඩ පිළිවෙළ 2013.03.01 දින සිට ක්‍රියාත්මක වේ.)

---

4 - එම-

5 - එම-

6 පිළිතුර අවසානයේ පළ කර ඇත.

## නිසි පරිදි මුද්දර ගාස්තු නොගෙවූ නීතිඥ හා නොතාරිස් නාමලේඛනය

ඇමුණුම 01

| නීතිඥ / නොතාරිස්වරයාගේ නම | ලිපිනය | මුද්දර ගාස්තුව (රු.) | ඔප්පු සංඛ්‍යාව | දඩ මුදල (රු.) | මුළු මුදල (රු.) | අයකරගත් මුදල (රු.) | අයවිය යුතු මුදල (රු.) | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| නීතිඥ එම්.පී.සී.ජෝෂප් මිය | නො.21, කොලින්වුඩ් පෙදෙස, කොළඹ 06 | 9,973,000.00 | 19 | 29,919,000.00 | 39,892,000.00 | 9,973,000.00 | 29,919,000.00 | 1. පළාත් ආදායම් කොමසාරිස් විසින් කොළඹ වංචා විමර්ශන ඒකකයට 2015.10.23 දින පැමිණිලි කර ඇත. පැමිණිලි අංකය - IR/1242/7/15 2. හිඟ දඩ මුදල් අයකරගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 68264 සිට 68267 |
| නීතිඥ නයනා එන් සිල්වා මිය | නො.24/4, ශාන්ත පීටර් පාර, ගල්කිස්ස | 672,500.00 | 6 | 2,017,500.00 | 2,690,000.00 | 672,500.00 | 2,017,500.00 | 1. නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් (මහරගම) විසින් ගල්කිස්ස පොලිස් ස්ථානයේ 2015.11.11 දින පැමිණිල්ලක් දමා ඇත. පැමිණිලි අංකය - 255/52 2. හිඟ දඩ මුදල් අයකරගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 68254 සිට 68256 |
| නීතිඥ සී.ජේ.ප්‍රනාන්දු මියා | නො 2/ඒ, ප්‍රනාන්දු පෙදෙස, මොරටුව | 1,694,750.00 | 25 | 5,084,250.00 | 6,779,000.00 | 1,694,750.00 | 5,084,250.00 | 1. නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් (මහරගම) විසින් ගල්කිස්ස පොලිස් ස්ථානයේ 2015.11.17 දින පැමිණිල්ලක් දමා ඇත. පැමිණිලි අංක - 259/53 2. හිඟ දඩ මුදල් අයකරගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 68252 |
| නීතිඥ එම්.එන්.ඩී.ප්‍රනාන්දු මිය | නො.83/2, චන්ද්‍රවංශ මාවත, වත්තල්පොළ, පානදුර | 552,000.00 | 9 | 1,963,500.00 | 2,515,500.00 | 552,000.00 | 1,963,500.00 | නම සහතිකාවට විරුද්ධව පොලිසියේ පැමිණි කර ඇති අතර ඇය දුම්රියට පැන සියදිවි නසාගෙන ඇත. මුද්දර ගාස්තුව නැවත අයකරගෙන ඇත. දඩ මුදල නැවත අයවිය යුතුය. |
| පී.එස්.කාරියවසම් මිය | නො.4-1/1, විජය මාවත, ගල්කිස්ස | 198,000.00 | 1 | 601,500.00 | 799,500.00 | 198,000.00 | 601,500.00 | 1. හිඟ දඩ මුදල් අයකරගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 68260 |
| නීතිඥ එම්.ඩී.මැලගොඩ මියා | නො.35, රන්සිරි පටුමග, කොළඹ 07 | 11,271,444.00 | 38 | 31,545,151.00 | 42,816,595.00 | | 42,816,595.00 | 1. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 60935/5/17 යටතේ නඩු පවරා ඇත. නඩුව සඳහා ලිපිනයේ නොමැති බව සඳහන් කරමින් සිතාසි භාරගෙන නොමැත |
| නීතිඥ චින්තක විජේසූරිය මියා | නො.34/29, නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ - 12 | 101,000.00 | 1 | 303,000.00 | 404,000.00 | | 404,000.00 | 1. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 68258 2. පළාත් ආදායම් කොමසාරිස් විසින් කොළඹ වංචා විමර්ශන ඒකකයට 2015.10.23 දින පැමිණිලි කර ඇත. පැමිණිලි අංකය - IR/1243/7/15 |
| නීතිඥ ඉන්දිකා පී චන්ද්‍රතිලක මිය | නො.153/4, පහළ බෝමිරිය, කඩුවෙල | 367,100.00 | 1 | 91,775.00 | 458,875.00 | 458875.00 | 0.00 | අනෙකුත් ඔප්පු ද පරීක්ෂා කළයුතු බැවින් 2016 වර්ෂයේ සහතික කළ ඔප්පු වල පිටපත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් කැඳවා ඇතත් මෙතෙක් ලැබී නොමැත. |

| | නිතීඥ / නොතාරිස්වරයාගේ නම | ලිපිනය | මුද්දර ගාස්තුව (රු.) | ඔප්පු සංඛ්‍යාව | දඩ [illegible] (රු.) | මුළු මුදල (රු.) | අයකරගත් මුදල (රු.) | අයවිය යුතු මුදල (රු.) | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|
| / | නිතීඥ ඩබ්.එච්.එම්.ටී.බණ්ඩාර මිය | නො.11/බී, ලක්ෂපතිය පාර, මොරටුව | | | | | | 0.00 | විමර්ශණ කටයුතු ආරම්භකර ඇත. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ඔප්පු පිටපත් ලැබී නොමැත. |
| 0 | නිතීඥ ටී.ඒ.හේමචන්ද්‍ර මයා | නො.35/9, සණස වතුරශ්‍රය, උසාවි පාර, ගම්පහ | 2,052,780.00 | 202 | 2,052,780.00 | 4,105,560.00 | 4,105,560.00 | 0.00 | අයකරගෙන ඇත |
| 1 | නිතීඥ ප්‍රේමසිරි එච් විලේකොටුව මයා | නාල්ල් පාර, මීරිගම | 13,620.00 | 2 | 40,860.00 | 54,480.00 | | 54,480.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරාඇත. නඩු අංක 49194 |
| 2 | නිතීඥ කේ.ඒ.අයි.එස්.කළුබෝවිල මිය | නො.8/1, බෝනගල, උඩුතුත්තිරිපිටිය | 68,872.00 | 2 | 68,874.00 | 137,746.00 | | 137,746.00 | සති දෙකක් ඇතුලත ගෙවීමට එකගවී ඇත. |
| 3 | නිතීඥ සේන උඩවත්ත මයා | නො.71, විද්‍යාල පාර රඹුක්කන, බණ්ඩාරගම | 1,734,150.00 | 62 | 1,734,150.00 | 3,468,300.00 | 59,000.00 | 3,409,300.00 | කළුතර අධිකරණයේ නඩු පවරාඇත. නඩු අංක - 61222 / 66292 |
| 4 | නිතීඥ පී.ඩී.ආර්.ප්‍රියදර්ශනී මිය | නො.517/3, ප්‍රීතිකා මාවත, පිටිපන උතුර, හෝමාගම | 3,088,560.00 | 104 | 3,088,560.00 | 6,177,120.00 | 149,980.00 | 6,027,140.00 | කළුතර අධිකරණයේ නඩු පවරාඇත. නඩු අංක - 55184 / 47436 / 47464 / 55185 |
| 5 | නිතීඥ කාන්ති රයිගම මිය | නො.181/බී, පළමු පටුමග, කොතලාවල, බණ්ඩාරගම. | 4,826,150.00 | 61 | 4,826,150.00 | 9,652,300.00 | 8,500.00 | 9,643,800.00 | කළුතර අධිකරණයේ නඩු පවරාඇත. නඩු අංක - 60508 / 60713 / 55177 / 60712 / 60711/ 60710 / 60709 / 60707 / 60708 |
| 6 | නිතීඥ රංජිත් රූපසිංහ මයා | පේනෙගම, පොකුණුවිට | 3,084,432.00 | 74 | 3,084,432.00 | 6,168,864.00 | 2,127,172.00 | 4,041,692.00 | කළුතර අධිකරණයේ නඩු පවරාඇත. නඩු අංක - 60683 / 61218 |
| , | නිතීඥ කේ.අයි.එස්.තිලකරත්න මිය | "තිලක" කනන්විල, හොරණ | 2,449,156.00 | 247 | 2,449,156.00 | 4,898,312.00 | 317,000.00 | 4,581,312.00 | කළුතර අධිකරණයේ නඩු 09 පවරාඇත. නඩු අංක - 70333 සිට 70341 දක්වා |
| | නිතීඥ එස්.එන්.නෙත්තසිංහ මයා | නො.77/4, කපාලකන්ද පාර, කදාන | 718,000.00 | 18 | 718,000.00 | 1,436,000.00 | 1,436,000.00 | 0.00 | අයකරගෙන ඇත |
| | නිතීඥ තමරා අබේරත්න මිය | නො.336/28, ගජබා මාවත, ඉහළ කරගහමුණ, කඩවත | 558,550.00 | 61 | 558,550.00 | 1,117,100.00 | 1,117,100.00 | 0.00 | අයකරගෙන ඇත |
| | නිතීඥ එස්.එම්.යූ.සේනාධිපති මිය | වැල්ලාව, පොල්ගහවෙල | 13,500.00 | 1 | 13,500.00 | 27,000.00 | 27,000.00 | 0.00 | අයකරගෙන ඇත |
| | නිතීඥ එඩිනා වීරරත්න මිය | නො.43/ඒ, දුම්රියපල පාර, වත්තල | 448,000.00 | 18 | | 448,000.00 | 448,000.00 | 0.00 | අයකරගෙන ඇත |
| | නිතීඥ ඉනෝෂිකා ඒකනායක මිය | නො.633/1ඒ, ඇල්දෙනිය කඩවත. | 101,250.00 | 2 | | 101,250.00 | 101,250.00 | 0.00 | අයකරගෙන ඇත |
| | නිතීඥ කදුරුවාන ඥානසිරි මයා | අංක 834/3, කඩුවෙල පාර, මාළඹේ | 3,219,200.00 | 120 (2013 වර්ෂයට පමණක්) | | 3,219,200.00 | 727,500.00 | 2,491,700.00 | නොතාරිස්වරයා මියගොස් ඇත. මුද්දර ගාස්තු දේපළ ගැණුම්කරුවන්ගෙන් අයකරගෙන යනු ලැබේ. |
| | ප්‍රසිද්ධ නොතාරිස් ඒ.ඊ.යෝගේෂ්වරන් | නො.49, කොලින්වුඩ් පෙදෙස, කොළඹ 06 | 16,000.00 | 1 | 16000.00 | 32,000.00 | | 16,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| | නිතීඥ යූ.නිහාල් පෙරේරා | නො.18, ජයසූරිය මාවත, කදාන | 200,000.00 | 1 | 200000.00 | 400,000.00 | | 200,000.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |

| [illegible] | [illegible] | ලිපිනය | මුද්දර ගාස්තුව (රු.) | ඔප්පු සංඛ්‍යාව | දඩ මුදල (රු.) | මුළු මුදල (රු.) | අයකරගත් මුදල (රු.) | අයවිය යුතු මුදල (රු.) | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | නීතිඥ ඒ.ඒ.ආර්.එන්.සිල්වා | නො.37, ජෝසප් පටුමඟ, කොළඹ -04 | 8,000.00 | 1 | 8000.00 | 16,000.00 | | 8,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 27 | නීතිඥ එස්.එස්.සී. ද සිල්වා | නො.34/59, නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ - 12 | 20,000.00 | 3 | 39875.00 | 59,875.00 | | 39,875.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 28 | නීතිඥ ජේ.එන්.රිස්මි | නො.293, ශ්‍රී වජිරඥාන මාවත, කොළඹ - 09 | 8,000.00 | 1 | 8000.00 | 16,000.00 | | 8,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 29 | නීතිඥ සී.විජේසූරිය | නො.143/3/ඒ, නාතුඩුව, කැළණිය | 11,500.00 | 2 | 11500.00 | 23,000.00 | | 11,500.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංකය - 48202 |
| 30 | නීතිඥ ඒ.කේ.සුමනසූරිය | නො.16/ඒ, ස්ටවෙල් ප්ලේස්, නුගේගොඩ | 60,500.00 | 1 | 60500.00 | 121,000.00 | | 60,500.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 31 | නීතිඥ ඩී.විජේනායක | නො.15, සුපර් මාර්කට්, කඩුවෙල | | 1 | 31000.00 | 31,000.00 | | 31,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 47373/5/2016 |
| 32 | නීතිඥ ශාන්ත නිරිඇල්ල | නො.433/1/ඒ, දළුපොත, මීගමුව | 2,132,270.00 | 96 | 2132270.00 | 4,264,540.00 | | 2,132,270.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 28608/15/5 |
| 33 | නීතිඥ සිරිකුංග සිල්වා | නො.26, රද්දොළුව, සීදුව | 268,659.00 | 37 | 268659.00 | 537,318.00 | | 268,659.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංක 28608/15/5 |
| 34 | නීතිඥ එස්.එස්.වල්පිට ගමනායක | ග්‍රාමෝදය, දෙමංහන්දිය, මීගමුව | 4,350.00 | 8 | 13050.00 | 17,400.00 | | 13,050.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 35 | නීතිඥ ඩී.එල්.ධර්මරත්න | නො.90, කෙලින් වීදිය, මීගමුව | 7,400.00 | 3 | 7400.00 | 14,800.00 | | 7,400.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංකය - 37016 |
| 36 | නීතිඥ බී.යෝගේෂ්වරී | නො.46, දෙවන මහල, 06 වන පටුමඟ, කොටහේන , කොළඹ - 13 | 40,000.00 | 5 | 40000.00 | 80,000.00 | | 40,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංකය 47012/5/2016 |
| 37 | එස්.එන්.එම්. ද සිල්වා | නො.181/1/ඒ, ධර්මපාල මාවත, කොළඹ -01 | 17,000.00 | 1 | 17000.00 | 34,000.00 | | 17,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංකය 44107/5/2016 |
| 38 | නීතිඥ එස්.පී.කෙලාවී | නො.13, පන්සල්හේන, කොලොන්නාව | 450.00 | 2 | 450.00 | 900.00 | | 450.00 | මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 39 | නීතිඥ කේ.ජී.ආර්.මනුජිත් | නො.535/1, අග්ගොන, මුල්ලේරියාව නව නගරය | 16,000.00 | 3 | 16000.00 | 32,000.00 | | 16,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංකය - 47107 |
| 40 | නීතිඥ නාලක එන් ප්‍රනාන්දු | දඹදූරය, සීදුව | 14,400.00 | 3 | 14400.00 | 28,800.00 | | 14,400.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. නඩු අංකය - 37015 |
| 41 | නීතිඥ වයි.ඒ.එන්.නිල්මිණි මැඩොන්සා | නො.20, උඩුගම්පොළ පාර, කොටුගොඩ | 11,827.00 | 20 | 11827.00 | 23,654.00 | | 11,827.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 42 | නීතිඥ ඩී.ඊ.එම්.වාසලතන්ත්‍රි | | 14,500.00 | 1 | 14500.00 | 29,000.00 | | 14,500.00 | මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 43 | නීතිඥ ඒ.එච්.එස්.එස්.ලක්ෂ්මන් | නො.78, මිහිදු මාවත, පල්ල වත්ත, ආඩි අම්බලම | 10,000.00 | 1 | 10000.00 | 20,000.00 | | 10,000.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 44 | නීතිඥ එම්.ජේ.වීරසේකර | නො.341/1, නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ - 12 | 249,000.00 | 1 | 249000.00 | 498,000.00 | | 249,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ ඇත. නඩු අංක 23642/5/15 |
| 45 | ඩී.එම්.පී.පී.බණ්ඩාර දිසානායක | නො.221/ඒ, 15 වන පටුමඟ, ඉසුරුපුර, මාලඹේ | 44,000.00 | 1 | 44000.00 | 88,000.00 | | 44,000.00 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ ඇත. |
| 46 | නීතිඥ කේ.එම්.ශිරාණි සිල්වා | නො.1054/ඒ, දූව වත්ත, රාගම | 413,500.00 | 10 | 413500.00 | 827,000.00 | | 413,500.00 | ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ සඳහා නඩු පවරා ඇත. නඩු අංකය |
| | එකතුව | | **50,773,370.00** | **1277** | **93,787,619.00** | **144,560,989.00** | **24,173,187.00** | **116,820,446.00** | |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හත්වැනි ප්‍රශ්නය, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමේ අවස්ථාව

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**07.**

**ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/52)**

අ. 2014 වර්ෂයේ මාගේ මුදල් ප්‍රතිපාදන මත හොරණ අධ්‍යාපන කලාපයේ පාසැල් දරු දැරියන්ගේ ප්‍රයෝජනය සඳහා සිංහල/දෙමළ/ඉංග්‍රීසි ශබ්ද කෝෂ මුද්‍රණය කරන ලද බව ඔබතුමා දන්නේද?

ආ. එම ශබ්ද කෝෂයන්හි දූදරුවන්ගේ මනස තුළ ඉතිහාසය පිළිබඳ දැනුම වර්ධනය කරලීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් දායකත්වය ලබාදුන් ඓතිහාසික වීරවරුන් 12 දෙනෙකුගේ ඡායාරූප පාලන යුග සහිතව මුද්‍රණය කර තිබූ බව ඔබතුමා දන්නේද?

ඇ. එම පොත සංස්කරණය කර හොරණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරියගේ නිර්දේශය සහිතව අධ්‍යාපන කලාප කාර්යාලය මගින් ටෙන්ඩර් කැඳවා මුද්‍රණය සඳහා ලබා දුන් බව ඔබතුමා දන්නේද?

ඈ. එසේ නම් එම පොත මුද්‍රණය කරලීමෙන් අනතුරුව බෙදා හැරීමේදී හොරණ අධ්‍යාපන කාර්යාලය මගින් එම පොතෙහි අවසාන පිටුවෙහි මුද්‍රණය කර තිබූ ඓතිහාසික වීරවරුන්ගේ ඡායාරූප ඉවත් කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඉ. එසේ නම් ඒ කාගේ නියමයෙන් හෝ කාගේ උපදෙසක් පරිදිද?

ඊ. එවැනි වෙනස් කරලීමක් කරලීමට කලාප අධ්‍යක්ෂවරියගේ ඇති හැකියාව කුමක්ද?

උ. මේ සඳහා ඔබතුමා ගන්නා ඉදිරි ක්‍රියා මාර්ග කවරේද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. 2014 වර්ෂයේ ප්‍රතිපාදන වලින් නොව 2015 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මෙම ව්‍යාපෘතියට අදාළව ශබ්ද කෝෂ මුද්‍රණය කර ඇති බව දනිමි.

ආ. ඔව්.

ගරු මන්ත්‍රීතුමා මුද්‍රණය කිරීම සඳහා ඉදිරිපත් කළ ආදර්ශ පොතේ කිසිඳු වීරවරයෙකුගේ ඡායාරූප නොතිබූ අතර, ඒ අනුව ශබ්ද කෝෂ මුද්‍රණය කිරීමට දීමේදී කිසිඳු වීරවරයෙකුගේ ඡායාරූපයක් ඇතුළත් කර නොතිබූ නමුත් ගරු මන්ත්‍රීතුමා අදාළ මුද්‍රණ ආයතනය ලවා පොතේ අවසානයට කොළයක් එක් කර එහි ඓතිහාසික වීරවරුන්ගේ ඡායාරූප මුද්‍රණය කර තිබූ බව දනිමි.

ඇ. ඔව්.

කිසිඳු වීරවරයෙකුගේ ඡායාරූපයක් නොමැතිව මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ශබ්ද කෝෂ පොත සංස්කරණය කර හොරණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ ලබා දී ඇති අතර, ඒ අනුව ටෙන්ඩර් කැඳවා මුද්‍රණය කිරීමට ලබා දී ඇත.

ඈ. ලබා දුන් ආදර්ශ පොතට අනුව තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පිළිගත් ඉහත සඳහන් ඡායාරූප රහිත පොතක් මුද්‍රණයට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඇණවුම් කරන ලදී. එහෙත් ගරු මන්ත්‍රීතුමා අදාළ මුද්‍රණ ආයතනය ලවා පොතේ අවසානයට කොළයක් එක් කර එහි කුඩා ප්‍රමාණයේ පරණ වීරවරුන්ගේ ඡයාරූප හා සාපේක්ෂව විශාල ප්‍රමාණයෙන් යුතු වූ 2015 වර්ෂයේ ජනාධිපතිවරණ අපේක්ෂකවරයෙකු හා පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂකයකු වූ හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඡායාරූපයක් ඇතුළත් කර ඇත. එවැනි දේශපාලන මුහුණුවරක් සහිත ඡායාරූප ඇතුළත් පොත මුද්‍රණය කර භාර දුන්නද ගෙවීම් කිරීමට පෙර එය ප්‍රතික්ෂේප කර ඇත.

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

අදාළ නිවැරැදි කිරීම් කර ලබා දුන් පිරිවිතර සහිත පොත ලබා දුන් පසු පමණක් පිළිගෙන බෙදා හැර ඇත.

ඉ. ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුව අදාළ පිරිවිතරයන්ට අනුකූලව කටයුතු කළ යුතු බැවින් ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කටයුතු කර ඇත.

ඊ. ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුව ඇණවුම්කරුට ලබා දුන් පිරිවිතර සහිත භාණ්ඩ පමණක් පිළිගැනීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට බලය ඇත.

උ. ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියට අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කටයුතු කර ඇති බැවින් මේ සම්බන්ධව ඉදිරි ක්‍රියා මාර්ගයක් ගත නොහැක.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මගේ හිතේ ඔබතුමාත් දන්නවා. මම මේ පළාත් සභාව තුළම, මම ඒක පැහැදිලිවම කියන්නේ. මේක මුද්‍රණය කරන අවස්ථාවේදී මේ පළාත් සභාව තුළම මම ඇමැතිතුමාගෙන් විමසුවා. මට මේකට අවසර දෙන්න කියලා. ගරු ඇමැතිතුමා පළාත් සභාව තුළම මේක විසඳලා දෙනවා කියලා පොරොන්දු වුණා. පළාත් සභාවේදී කරන ලද ප්‍රශ්නයකට අනුව. ඊට පසුව ගරු ඇමැතිතුමාම අමාත්‍යාංශයේදීම මට පොරොන්දුවක් වුණා. මේක ගැටලුවක් වන්නේ නැහැ. මේක කරලා දෙනවා කියලා. ඇත්තටම මම දැනගන්න කැමැතියි. ගරු ඇමැතිතුමා පළාත් සභාවේදී මම කිව්වා කියලා පිළිගන්නේ නැද්ද? කියන එක. මොකද පළාත් සභාවේදී පොරොන්දු වුණා. මේක කරනවා කියලා. ඒකත් එක්කම මම දැනගන්න කැමැතියි, මේක ඇත්තටම -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න විධියට අහනවා නම් හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමු ප්‍රශ්නය අහන්නේ ඇමතිතුමා දන්නවාද කියලා අහන්නේ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. ඒ ප්‍රශ්න ඔබතුමා කෙටියෙන් අහන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එකක් තමයි මම මීට ඉස්සෙල්ලා පළාත් සභාවේදී මේක කථා කළා. කථා කරපු වෙලාවේ එතුමා පැහැදිලිව කිව්වා, මේක විසඳුමක් කරලා දෙනවා කියලා . එතකොටම එතුමා දන්නවා මේක පොතේ ඇතුළත් කරලා තිබෙනවා කියලා. ඒක පිළිගන්නවාද කියන එක එකක්.

අනික් එක තමයි තවමත් මේ පොත් -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මගෙන් එවැනි ඉල්ලීමක් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉල්ලීමක් කළා. එතුමා ඒක පිළිගන්නවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එදා මට පොරොන්දුවක් වුණා. මේක විසඳලා දෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි ප්‍රශ්නය.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මගෙන් ඉල්ලීමක් කරපු නිසා මම ඉල්ලීම භාර ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පොරොන්දු වෙලා නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම අහන්න කැමැතියි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවසාන ප්‍රශ්නය අපි දෙන්නද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අවසාන ප්‍රශ්නය මේකයි. ඇත්තටම ගරු සභාපතිතුමනි, මම සභාවේ දැන ගැනීම සඳහා මේ වීරවරුන්ගේ සම්පූර්ණ ඡායාරූප පෙන්වන්න කැමැතියි. මම මේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් දැනගන්න කැමැතියි. මේ දරුවෝ පවා දන්නවා. මම දන්න තරමින් අධ්‍යාපන ඇමැතිතුමා උපාධිධාරියෙක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යටින් ඉන්න කෙනා ආයේ ඡන්දේ ඉල්ලනවා නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ වීරවරුන්ගේ ඡායාරූප අධ්‍යාපන ඇමැතිතුමා පිළිගන්නේ නැද්ද? මොකද මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා මේ යුද්ධය අවසන් කළා කියලා පිළිගන්නේ නැද්ද? මේක දරුවෝ දැනගන්න හොඳ නැද්ද? ඉතිහාසයේ කවුරු හරි දැනගන්න හොඳ නැද්ද? කියන එකයි මම අහන්න කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක්. ගරු මන්ත්‍රීතුමා තුන්වැනි ප්‍රශ්නය -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඕකේ සරත් ෆොන්සේකා මහත්මයාගේ එක නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සරත් ෆොන්සේකා මහත්මයා කෝ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඕකේ සරත් ෆොන්සේකා මහත්මයාගේ එක නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ රජයෙන් දාලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දේශපාලන වාසි ගන්න යන්න එපා. අතුරු ප්‍රශ්න අහන්න. දේශපාලන වාසි ගන්න යන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඕකේ සරත් ෆොන්සේකා මහත්මයාගේ එක නැහැ. සැබෑවටම යුද්ධය අවසන් කරපු එක්කෙනාගේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, දේශපාලන වාසි ගන්න එන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕකේ සරත් ෆොන්සේකාවත් දාන්න එපැයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කවුරුත් පිළිගන්නවා, රාජ්‍ය නායකයන්ව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යුද්ධය අවසන් කරපු නායකයාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දේශපාලන වාසිය ගන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න අහන මන්ත්‍රීතුමාටයි උත්තර දෙන ඇමැතිතුමාටයි විතරයි කථා කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි නැහැ. එක්කෙනෙක් කථා කරන්න කෝ. කියන දේවල් පැහැදිලි නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය නාස්ති කරන්න එපා. බොරුවට.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ඔබතුමාට අමතරව තව සභාපතිතුමියක් ඉන්නවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මහින්ද මහත්මයා එක්ක ඉන්නවා කියලා පෙන්වන්න. මහින්ද මහත්මයා රාජ්‍ය නායකයා. අපි රාජ්‍ය නායකයන්ව -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා මෙතුමන්ලාව වාඩි කරවන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සරත් ෆොන්සේකා මහත්මයාගේ නම දාන්න කෝ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ජෝරජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඔබතුමා වාඩි වෙන්න. ණයට කහින්නේ නැතිව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් තමයි තේරුනේ ඊළඟ ඡන්දෙට ලැහැස්ති වෙනවා කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයාටයි උත්තර දෙන ඇමැතිතුමාටයි විතරක් කථා කරන්න කියන්න. අනික් අය කොහොමද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය අය බොරු වීරයෝ වෙනවා නේ? ඒවා සිද්ධ වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට අදාළ නැහැ. කාලය නාස්ති කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ වාගේ නායකයෝ රට බේරගත්ත නිසා තමයි මේ රට අද මේ තත්ත්වයෙන් තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඕක අවසන් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

චන්ද්‍රිකා මැතිනියගෙයි, ප්‍රේමදාස මැතිතුමාගෙයි ෆොටෝ දාන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ප්‍රේමදාස මහත්මයා රට බේර ගත්තාද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලංකාවේ ඔක්කෝගෙම දාන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඕක ඔහොම ටිකක් උස්සගෙන ඉන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලංකාවේ හැම පුරවැසියෙක්ම යුද්දෙට දායක වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලස්සන චිත්‍ර ටිකක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔහොම ටිකක් අල්ලගෙන ඉන්න කොට ඔබතුමා ටිකක් උස යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොමලා වාඩි වෙන්න. ගරු ඇමැතිතුමා උත්තරයක් දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, සභාවේ කාලය නාස්ති වෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මුන්ට යුද්ධය කරපු නායකයාව අමතකයි. අද ඒ හින්දයි ඉන්නේ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු මන්ත්‍රීතුමා, ඔය රජවරුන්ගේ නම් ටික පොඩ්ඩක් අනුපිළිවෙළින් කියන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රටේ නායකයා ඉන්නේ මේකේ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මන්ත්‍රීතුමා දැන ගැනීම පිණිස අහන්නේ. ඔය රජවරුන්ගේ නම් ටික පිළිවෙළට කියන්න කෝ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ හැසිරීම අන්තිමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ! ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා නිශ්ශබ්ද වෙනවාද?

[සභාවේ ඝෝෂා]

ඔබතුමන්ලා මේ සභාවේත් වීරයෝ වෙනවා නේ? මම දන්නේ නැහැ, සභාවේ තවත් වීරයෝ ඉන්නවා කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ රටේ -

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

එදා ඔබතුමා සැබෑ රජෙක් කියලා, වත්මන් ජනාධිපතිතුමා කිව්වේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ රටේ ඉතිහාසයේ සිට අද දක්වාම රට ජාතිය බේරා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරපු සියලුම දෙනා ජාතික වීරවරයෝ හැටියට පිළිගන්නා බව ඉතාම අවංකව කියනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි අහන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. එතුමාව තවම පිළි අරගෙන නැහැ. එතුමා තවම ඡන්දය ඉල්ලනවා නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රට බේර ගන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වර්තමාන ජනාධිපතිතුමා තමයි රජෙක් කිව්වේ. අපි නොවෙයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් අහනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා රට බේරගත්ත -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එයාර්පෝර්ට් එකේදී කිව්වේ. වර්තමාන ජනාධිපතිතුමා තමයි කිව්වේ මේ අපේ රජ්ජුරුවෝ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා දැන් උත්තරයක් දුන්නා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වර්තමාන ජනාධිපතිතුමා තමයි රජෙක් කිව්වේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තවම මේවා පිළිගන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා රට බේරා ගත්තා කියලා අධ්‍යාපන ඇමැතිතුමා පිළිගන්නේ නැහැ. වර්තමාන ජනාධිපතිතුමා කිව්වා, රජෙක් කියලා. හැබැයි, අධ්‍යාපන ඇමැතිතුමා පිළිගන්නේ නැහැ. වර්තමාන ජනාධිපතිතුමා පිළිගත්තා.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔයාවත් වීරවරයෙක් කරන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජාතික වීරවරයෝ ටික එතුමා පිළිගත්තා. නම් ගම් කියන්න දෙයක් නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, අන්තිම ප්‍රශ්නයට ඇහුවේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රජ්ජුරුවෝ කරන්න ගියා. ඒක හරි ගියෙත් නැහැ. අපරාදේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කෑ ගහන්න එපා. හරි කරදරයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රජ්ජුරුවෝ කරන්න ගියා. ඒක හරි ගියෙත් නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මහින්ද රාජපක්ෂ මහත්මයා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා දැන් උත්තරයක් දුන්නා නේ?

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මහින්ද ඒකෙන් අයින් කරලා එල්ලාවලගේ එක දා ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එල්ලාවල රජ්ජුරුවෝ වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාව දාන්නේ නැහැ. ඔබතුමාව දාන්නේ එළුවන්ට. එළුවන්ගේ රජා කියලා දාන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**08.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/53)**

අ. කටාන ප්‍රා.ලේ. කොට්ඨාශය තුළ මහහුනුපිටියේ පිහිටි ඇවේන්ද්‍රා හෝටලයේ ගොඩනැගිලි සැලැස්ම කටාන ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර ඇත්තේද?

ආ. ඒ සැලැස්ම අනුමත කර ඇත්තේ නම් ඒ සැලැස්මේ පිටපතක් සභාගත කළ හැකිද?

ඇ. ඒ සැලැස්ම අනුමත කර ඇත්නම් ඒ කුමන වර්ෂයේද?

ඈ. මෙම ඇවේන්ද්‍රා හෝටලයෙන් මහජනතාව මෙන්ම දේශපාලන ප්‍රභූන්ද සේවාවන් ලබා ගන්නා බව ඔබතුමා දන්නේද?

ඉ. මෙම හෝටලය සෑදීමේදී එකී ගොඩනැගිල්ලට පිටුපසින් ජල බැස්ම සඳහා ඇති පොදු ඇළ මාර්ගයන් ගොඩ කිරීමක් සිදු කර ඇත්තේද?

ඊ. මෙම හෝටලයේ සැලසුම් අනුමත කර නොමැත්තේ නම් ඒවා කඩා ඉවත් කිරීමට හෝ නිසි ප්‍රමිතියකින් සකස් කරවීමට ඔබතුමා පියවර ගන්නේද?

උ. වැල්ලවත්තේදී උත්සව ශාලාවක් ප්‍රමිතියකින් තොරව ඉදි කර ජීවිත හානි කරමින් කඩා වැටුනාක් මෙන් පොදු මහජනතාවට සේවාවන් සපයන බස්නාහිර පළාත් සභා සීමාවේ ඇති අනවසර ගොඩනැගිලි ඉවත් කිරීමට හෝ නිසි ප්‍රමිතියකින් යුතුව සකස් කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

ඌ.නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. නැත.

ආ. අදාළ නොවේ.



ඇ. අදාළ නොවේ.

ඈ. විවිධ පාර්ශවයන් විසින් සේවය ලබා ගන්නා බව වාර්තා වී ඇත.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේවා මේ පෞද්ගලිකව පහර ගහන්න අහන ප්‍රශ්න. මේවා සභාවට ගේන්න බැහැ. මේවා මඩ ප්‍රශ්න. ගරු සභාපතිතුමා, මේවා මඩ ගහන ප්‍රශ්න. පෞද්ගලිකව අහන ප්‍රශ්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඉ. අනුමැතිය සඳහා සැලසුම් ඉදිරිපත් වී නොමැති තත්ත්වය යටතේ නිශ්චිතව තහවුරු කළ නොහැක. වාර්තා වී ඇති කරුණු අනුව, ගොඩනැගිල්ල පිහිටි ඉඩම තුළ හෝ ඊට මායිම්ව පොදු ඇළ මාර්ගයක් තිබූ බවට කරුණු අනාවරණය නොවේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් කමිටුවේ සිටියා නේ? ඔබතුමා එදා කියන්න එපැයි.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මඩ ප්‍රශ්න මේවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා මේවා මඩ ප්‍රශ්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් කමිටුවේ හිටියා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්නයට උත්තර දෙන්න දෙන්න. මඩද නැද්ද කියලා කියන්නම්. පොඩ්ඩක් ඉන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අර ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට කරපු දේම තමයි අපිත් කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න මෙතුමිය දුන්නේ නැහැ .

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් කමිටුවේ සිටියා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මඩ ප්‍රශ්න මේවා. මෙහෙම මඩ ගහන්න දෙන්න බැහැ. මඩ ප්‍රශ්න මේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම උත්තරය දෙන්නම්. අහගන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මඩ ප්‍රශ්න මේවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඊ. අදාළ හෝටලයේ ඉදි කිරීම් නාගරික සංවර්ධන ප්‍රදේශයක පිහිටා ඇති තත්ත්වය යටතේ, එම අනවසර ඉදි කිරීම් සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් පියවර ගත යුතු ය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අනික් අයගේ ප්‍රශ්නවලට උත්තර දෙන කොටත් එහෙම අහන්න කියන්න. අර අනික් මනුස්සයාගේ ප්‍රශ්නයටත් උත්තර දෙන කොටත් ඒවා අහන්න කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, උත්තරය අහගන්න දෙන්නේ නැහැ. මෙලහකට හෝටලෙන් ණයට කාපු කට්ටිය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැමෝගෙම ප්‍රශ්නවලට උත්තර දෙන්න තිබෙන අයිතිය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හෝටලෙන් ණයට කාපු කට්ටිය කෑ ගහනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එයාගේ ප්‍රශ්නය විතරද ප්‍රශ්නය. අර මිනිහාගේ ප්‍රශ්නය, ප්‍රශ්නයක් නොවෙයිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමියගේ ප්‍රශ්නය විතරක්ද ප්‍රශ්නය?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක වැදගත් ප්‍රශ්නයක්. අහගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැමෝගෙම ප්‍රශ්න අහන්න අයිතිය පිළිගන්නවා නම් විතරක් මේකට උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාවේ ඔබතුමාත් සාමාජිකයෙක්. ඔබතුමාත් සිටියා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලලිත් එල්ලාවලට කෑ ගහන්නයි, එතුමියට නිශ්ශබ්ද වෙන්නයි මොකක්ද ඒ සාධාරණය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ. සභාවේ කාලය නාස්ති කෙරුවේ එතුමා. අපි නාස්ති කරන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට තිබුණු දේ මෙතුමියටත් තිබෙන්න ඕනෑ. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න දුන්නේ නැහැ. මයික් එක පාවිච්චි කරලා කෑ ගැහුවා. ගරු සභාපතිතුමා, එතුමියගේ මයික් එක් off කෙරුවේ නැහැ. එතුමිය මයික් එක on කරලා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට කෑ ගැහුවා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට උත්තරයක් ගන්න දුන්නේ නැහැ. මොකක්ද ඒ සාධාරණය?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

මෙතුමිය කටවල් දෙකෙන්ම කථා කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමියට විතරක් මොකටද සාධාරණයක්. මෙතුමියට විතරක්ද සභාව නිශ්ශබ්ද වෙන්න ඕනෑ. අර අනික් මන්ත්‍රීවරුන්ට නිශ්ශබ්ද වෙන්න ඕනෑ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමන්ලාට අවස්ථාවක් දෙන්න ඕනෑ. මන්ත්‍රීවරු දෙතුන් දෙනෙක් කෑ ගැහුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ සියලු දෙනාම මේ ප්‍රශ්නවලට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමිය සම්පූර්ණයෙන්ම මුළු වෙලාවම මයික් එක පාවිච්චි කෙරුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කෑ ගහනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමිය නිශ්ශබ්දව සිටියද උත්තර දෙන කොට?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මට උත්තර දෙන්න -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මට උත්තර දෙන කොට ඔබතුමිය නිශ්ශබ්දව සිටියාද? ඒ අයිතිය අනික් අයටත් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අයිතිය තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න දුන්නේ නැහැ නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උත්තර දෙන්න දුන්නේ නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමා, මෙතුමියට කටවල් දෙකක් තිබෙනවාද? උදේ ඉඳන් දෙකෙන්ම කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය හැම කෙනාටම බාධා කිරීම් කරනවා වැඩියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කරුණාකරලා ප්‍රශ්නවලට උත්තර දෙන වෙලාවට අනික් මන්ත්‍රීවරුන්ට මයික් පාවිච්චි කරන්න දෙන්න එපා. රෝස් ගරු මන්ත්‍රීතුමිය කැත විධියට ඒක කළේ. රෝස් මන්ත්‍රීතුමිය මුළු වෙලාවම මයික් එක පාවිච්චි කළා. කොහොමද රෝස් මන්ත්‍රීතුමියට විතරක් මේ සභාව නිශ්ශබ්ද වන්නේ? රෝස් මන්ත්‍රීතුමිය කොහෙන් ඇවිල්ලද? රෝස් මන්ත්‍රීතුමියට විතරක්ද මේ සභාව නිශ්ශබ්ද වෙන්න ඕනෑ. රෝස් මන්ත්‍රීතුමිය කවුද? එක එකාට මඩ ගහන්න ප්‍රශ්න අහලා මේ සභාව නිශ්ශබ්ද කරන්න ද හදන්නේ. අර අහපු ප්‍රශ්නය, ප්‍රශ්නයක් නොවෙයිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ සභාවේ එක එක්කෙනාට වෙන වෙනම සාධාරණ ඉෂ්ට වෙන්න බැහැ. හැමෝටම සාධාරණය තිබෙන්න ඕනෑ. මුළු වෙලාවේම මයික් එක on කරගෙන සිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන මුළු වෙලාවේම මයික් එක on කරගෙන රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය සිටියා. ඒ සාධාරණය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා මඩ ගහන්න ප්‍රශ්න අහන කොට මේ සභාව නිශ්ශබ්ද කරලා තියන්න සභාතිතුමා ලැහැස්තිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මේක පාලනය කරන්න අමාරුයි. අරහෙන් කෑ ගහනවා. මෙහෙන් කෑ ගහනවා. හතර වටෙන්ම කෑ ගහනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමාගේ පොත ගැන ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහොමද මේක කරන්නේ?

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මඩ ගහන ප්‍රශ්නයක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මඩ ගහන ප්‍රශ්න අහන කොට අපි නිශ්ශබ්දව අහගෙන ඉන්න ඕනෑ. උත්තර දෙන කොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම සාධාරණයක් කරන්න බැහැ, මේ සභාවේ. එහෙම සාධාරණයක් මේ සභාවේ වෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, ඉතාම සාධාරණ ප්‍රශ්නයක් ඇහුවේ. එතුමාගේ පොතට ෆොටෝ එක දාලා නැති එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒකට උත්තර දෙන්න දුන්නේ නැහැ, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මුළු වෙලාවේම කෑ ගැහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman
පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න කෝ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

සභා කටයුතු එකේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු එකේ ඔබතුමා ඉන්නවා නේ?



**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභා කටයුතු එකේ ඉන්න එක ඇත්ත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභානායකතුමා ඉන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැබැයි, ඇයි ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න දුන්නේ නැත්තේ. ඇයි එතුමියට මයික් එක පාවිච්චි කරන්න දුන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලාට විරුද්ධ වෙන්න තිබුණා නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මුළු වෙලාවේම මයික් එක පාවිච්චි කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා සභා කටයුතු කාරක සභාවේදී විරුද්ධ නොවී දැන් මෙතැන කථා කරන්න එපා. එතැනදී විරුද්ධ වෙන්න ඔබතුමන්ලාට අයිතියක් තිබුණා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම කිසිම මන්ත්‍රීවරයෙක්ගේ අයිතිය උල්ලංඝණය කරන්න දෙන්න බැහැ. ඊට පස්සේ එතුමියට උත්තර දෙන කොට අපි නිශ්ශබ්ද වෙන්න ඕනෑ. එහෙම නිශ්ශබ්දව ඉන්නේ නැහැ අපි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වැරැදියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි එහෙම නිශ්ශබ්දව ඉන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නාාය පත්‍රයට දාපු එකද වැරැදි?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නාාය පත්‍රයට දාන එක නොවෙයි ප්‍රශ්නය. අර මන්ත්‍රීතුමාට උත්තර දෙන්න දුන්නේ නැහැ. මයික් එක පාවිච්චි කරන්න එතුමියට තිබෙන අයිතිය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම තීරණ ගන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මයික් එක පාවිච්චි කරන්න එතුමියට තිබෙන අයිතිය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමියට එහෙම මයික් පාවිච්චි කරන්න දෙන්න බැහැ. ගරු සභාපතිතුමා ඒකට විරුද්ධව තීරණය ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න අහන්න අයිතියක් තිබෙනවා. මඩ ප්‍රශ්න මම දන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, ඒකට විරුද්ධව තීරණයක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාවේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් එතකොට අපි අහපුවා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කෑ ගහන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නිකන් කෑ ගහන්නේ නැහැ. ඔබතුමන්ලා කෑ ගහපු නිසා කෑ ගහන්නේ. නිකන් කෑ ගහන්න පිස්සු නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා ඔබතුමා තීරණයක් දෙනතුරු අපි වාඩි වෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, කවුරු හරි ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙනකන් කට වහගෙන ඉන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැම වෙලාවේම ඒ කුපාඩි වැඩේ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියයි, ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමයි ප්‍රශ්න අහන්න දුන්නේම නැහැ. ඔබතුමන්ලා කෑ ගැහුවා නේ? ඒක පිළිගන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මෙගොල්ලෝ ප්‍රශ්නයක් ඇහුවොත් විතරයි වැදගත්. අනික් අය ප්‍රශ්නයක් ඇහුවාට ඒවා වැදගත් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනේ මේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අනේ මේ නොවෙයි. මයික් එක on කරගෙන -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. දැන් මේ ප්‍රශ්න සභා කටයුතු එකට යොමු කළාට පස්සේ - දැන් මගෙන් අහපු ප්‍රශ්නය මගේ අයිති විෂයක් නොවෙයි. මධ්‍යම ආණ්ඩුවට අයිති එකක්. ඒ පිළිබඳව සභා කටයුතු එකේ ප්‍රධානියා අපේ ලේකම්වරයාගෙන් හරි ඒ වෙලාවේ අපට අයිති එකක්ද කියලා දැනගන්න කථා කරනවා නම් මේ ප්‍රශ්නය වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ඔබතුමාගේ ප්‍රශ්නය නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මට දාලා තිබුණු ප්‍රශ්නය මට අයිති ප්‍රශ්නයක් නොවෙයි. නිකන් ඔහේ ප්‍රශ්නය දානවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට එක පාරටම ගරු ඇමැතිතුමා -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැහැ. නැහැ. ලේකම්වරයාට කථා කරලා , ටෙලිෆෝන් එකෙන් මගෙන් හරි ඇහුවා නම් ගරු සභාපතිතුමා මට කියන්න පුළුවන් මේක මට අයිති එකක් නොවෙයි කියලා. අපරාදේ මුද්‍රණ කටයුතුවලටයි, රස්තියාදුවයි. ප්‍රශ්නවලටයි. වෙලාවටයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉතින් ඒ කමිටුවේ මහේෂ් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. ඒකයි වැරැද්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

සොයා බලන්න කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේවා පෞද්ගලික ප්‍රශ්න. තමුන්ගේ සංගීත සංදර්ශනයට ලක්ෂයක් නොදුන්නාම මෙතැන ඇවිල්ලා ප්‍රශ්න අහනවා. අර ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න දුන්නේ නැහැ. මෙතුමියට ලක්ෂයක් නොදුන්නාම මෙතුමිය ප්‍රශ්න අහනනවා. අරක ඇහුවේ ළමයින්ට දෙන පොත ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියන්නේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි ඔක්කොමලා සභා කටයුතු රැස්වීමේ සිටියා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභා කටයුතු එකේ හිටපු එක හරි ගරු සංවිධායකතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේක මේ ප්‍රාදේශීය සභාව අයිති ගරු ප්‍රධාන අමාත්‍යතුමාට.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කොහොමද මයික් පාවිච්චි කරන්නේ? උත්තර දෙන වෙලාවේ මයික් එක පාවිච්චි කරන්නේ කොහොමද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රශ්න අහන්න අයිතියක් තිබෙනවා. එතුමියට අයිතියක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපටත් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, කරුණාකරලා මයික් off කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් කරුණාකරලා වාඩි වෙන්න. දැන් කථා කළා ඇති. නිශ්ශබ්ද වෙන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා උත්තරයක් දෙන්න. කොහොමද රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියට මුළු වෙලාවේම මයික් එක පාවිච්චි කරන්න දෙන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ කුපාඩි වැඩේ ආයේ කරන්න දෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා නිශ්ශබ්ද වන්න. මට ප්‍රකාශයක් කරන්න තිබෙනවා. සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට ප්‍රශ්න අහන්න අයිතියක් තිබෙනවා. ප්‍රශ්න අහන එක අපි වළක්වන්න යන්නේ නැහැ. නමුත් වැරැද්ද තිබෙන්නේ මෙතැනයි. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහපු වෙලාවේ ඔබතුමන්ලා කෑ ගැහුවා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියයි, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමයි තදින්ම කෑ ගැහුවා. උත්තරයක් දෙන්න දුන්නේම නැහැ. ඇයි ඔබතුමිය ඒ ප්‍රශ්නයට විරුද්ධ වෙන්නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය නාස්ති කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය නේ කාලය නාස්ති කළේ. කෑ ගහලා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි, ඔබතුමියයි කාලය නාස්ති කළේ. උත්තරයක් දෙන්න දුන්නේම නැහැ. ඒක වැරැදියි. නමුත් ප්‍රශ්න අහන්න ඔබතුමියට අයිතියක් තිබෙනවා. ඒක මම වළක්වන්නේ නැහැ. මම සභාපතිවරයා වශයෙන් සභා කටයුතු කාරක සභාවේදී සභානායකතුමා සිටියා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සිටියා. මට මතක හැටියට හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා ආවේ නැහැ. ඔබතුමිය සිටියා. එදා මේ ප්‍රශ්නය සම්බන්ධව සාකච්ඡා කළා. කවුරුත් එදා මේකට විරුද්ධ වුණේ නැහැ. එතැනදී කියන්න තිබුණා මේ ප්‍රශ්නය ගන්න එපා කියලා. දාන්න බැහැයි කියලා. එහෙම නැතිව දැන් ඒ ප්‍රශ්නයට කෑ ගහන්න එපා. මම ඒකට එකඟ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපට තිබුණු ප්‍රශ්නය මේ න්‍යාය පත්‍රයට ප්‍රශ්නය ආපු එක නොවෙයි. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරය දෙන වෙලාවේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය සම්පූර්ණයෙන් විනාශ කෙරුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක පිළිගන්නවා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මෙතුමියගේ සංගීත සංදර්ශනයට ඉල්ලූ සල්ලි දුන්නේ නැති හින්දයි මේ ප්‍රශ්නය අහන්නේ කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ප්‍රශ්නයට උත්තර දෙන්න දුන්නේ නැහැ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි නම් ගත්තේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වැරැදියි ගරු මන්ත්‍රීතුමා. ඒ කාරණාව වැරැදියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ කාරණය තමයි අපි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියයි, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි නිතරම කෑ ගැහුවා. ඇමැතිතුමාට උත්තරයක් දෙන්න දුන්නේම නැහැ. ඔබතුමියට ප්‍රශ්නයක් ආවාම මට ඒවා වළක්වන්න බැහැ. ඔබතුමියන්ලාත් සභාවේ ආදර්ශමත් වෙන්න. ඔබතුමිය නීතිඥ මහත්මියක්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රෝස් ගරු මන්ත්‍රීතුමිය හැමදාම මේ සභාවේ කාලය කනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නව වැනි ප්‍රශ්නයත් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගෙන්මයි. මහාමාර්ග ගරු අමාත්‍යතුමාට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න දුන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතුරු ප්‍රශ්න අහන්න අර ගරු මන්ත්‍රීතුමාට ඔබතුමිය දුන්නෙත් නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි සභාවට ආපු දවසේ ඉඳන්ම කට වහගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියත් වැරැද්දක් කළා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැඩේ හරියට කරනවා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියත් වැරැද්දක් කළා ගරු මන්ත්‍රීතුමිය. කරුණාකරලා ඒක පිළිගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හරි. අපි කෑ ගැහුවා නම් සියලු දෙනාම සමාවෙන්න කෝ. අපි සභාවට ආපුවාම කට වහගෙන ඉන්නම්. හැබැයි අපි අහන ප්‍රශ්නයට උත්තරය හරියට දෙන්න කෝ. ඔය අනන් මනන් කථා වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔබතුමිය හරියට උත්තරයක් ඉල්ලනවා. සාධාරණයක්. ඔබතුමියයි ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ

[ගරු සභාපතිතුමා]

ප්‍රධාන සංවිධායකතුමයි අර ප්‍රශ්නයට උත්තරයක් දෙන්න දුන්නේ නැහැ නේ? ඇමැතිතුමාට උත්තරයක් දෙන්න දුන්නේම නැහැ. සභා ගර්භය තුළ පුළුවන්තරම් කෑ ගැහුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි කට වහගෙන ඉන්නම්. හරියට උත්තරය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමෝටම අයිතිය තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, ප්‍රශ්නයේ ඉතුරු ටිකට උත්තරය දුන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

උ. බස්නාහිර පළාතට අයත් වැඩිමනක් ප්‍රදේශ නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් වී ඇති තත්ත්වය යටතේ එවැනි ප්‍රදේශයන්හි අනවසර ගොඩනැගිලි ඉවත් කිරීම ඇතුළු, ඊට අදාළ පියවර නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ එම අධිකාරිය විසින් ගත යුතු යි.

ඌ.පැන නොනගී.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අවුරුදු 80 ක්. නගර සභා, ප්‍රාදේශීය සභා පිහිටුවන්නත් ඉස්සරින් හදපු ගෙයක් මීගමුව නගර සභාවෙන් කැඩුවා, අනවසර කියලා. මම මෙතුමාගේ අවධානයට යොමු කරනවා. එහෙම තිබෙද්දී කෝටි ගණන් වියදම් කරලා මෙවැනි අනවසර දේවල් හදනවා. කිසිම අවසරයක් ගන්නේ නැහැ. ආයතනවලට ගෙවන්න ඕනෑ මුදල ගෙවන්නේ නැහැ. එතකොට මම අහන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය කථා පවත්වන්න බැහැ. ඔබතුමිය ප්‍රශ්න තුනක් අහන්න කෝ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතුමාගේ කොට්ඨාශයේ ගෙයක් කැඩුවා අනවසර කියලා. අවුරුදු 80 ක් පරණයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා කියන්න බැහැ. එතුමාගේ කොට්ඨාශයේ එතුමාට අහන්න පුළුවන්. ඔබතුමිය ප්‍රශ්න තුනක් අහන්න. ප්‍රශ්නයක් විධියට අහන්න. කට්ටිය කෑ ගහනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එවැනි දෙවිධියකට සලකන්නේ ඇයි?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒ යහපාලනය.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය අපට නැහැ. පළාත් පාලන ආයතනවලට. ඒ නිසා එතුමියට උත්තරයක් දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟ ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දෙවැනි ප්‍රශ්නය මම අහනවා. දැන් ඇළ මාර්ග යට කරලා ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් හදලා තිබෙනවා. මේ ප්‍රධාන වශයෙන් හදලා තිබෙන ඒවා තමයි අපි යොමු කරන්නේ. තවත් තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් කඩිනම් පියවරක් ගන්නවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ උත්තරයට ඒක අදාළ වෙලා නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් මම අහන්නේ විශාල ගොඩනැගිලි සංඛ්‍යාවක් අනවසරයෙන් ඉදි කරපුවා තිබෙනවා. ඇළ මාර්ගවල. ඒක ඉවත් කරන්න පියවරක් ගන්නවාද කියලා අහන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපට ඒක අදාළ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට ඒක අදාළ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නාගරික සංවර්ධන අධිකාරියට. හරි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කියපු කාරණය ඇත්ත. නමුත් 70% ක බලතල තවම ප්‍රාදේශීය සභාවට තිබෙනවා. වර්ග අඩි 4000 ට එහා තමයි - ඉතුරු ටිකේ බලතල සියල්ලම ප්‍රාදේශීය සභාවට තිබෙනවා. ඒ නිසා ඔබතුමාටත් අයිතියක් තිබෙනවා, මේක ගැන පොඩ්ඩක් සොයා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ චම්පික රණවක ගරු අමාත්‍යතුමාට බලය තිබෙනවා නේ? එතුමා දැන් පාවිච්චි කරනවා නේ? අනවසර ගොඩනැගිලිවලට. මම දැක්කා, පත්තරෙත් දාලා තිබෙනවා. ඒවා UD එකෙන් කරන්නේ.

නව වැනි ප්‍රශ්නය රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් මාර්ග, ප්‍රවාහන ගරු ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**09.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/54)**

අ. ගම්පහ දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික බස් ධාවනයට අදාළව පාරවල් සඳහා අලුතෙන් බස්රථ යෙදවීමට අවස්ථා කීයකදී ටෙන්ඩර් කැඳවන ලද්දේද?

ආ. ඒ කුමන ධාවන අංක සහිත පාරවල් සඳහාද? එකී ටෙන්ඩරයන්ට අනුව ඉදිරිපත් වී ඇති පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම් සහ මිල ගණන් වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඇ. එම ටෙන්ඩර් වලංගු වන්නේ වසර කීයක් සඳහාද?

ඈ. එම ටෙන්ඩර් මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා තනතුරු මොනවාද?

ඉ. බස් රථ ප්‍රමාණය අතිරික්ත වීම හේතුවෙන් දිනකට යම් බස් රථ ධාවනයෙන් ඉවත් කර තිබේද?

ඊ. අතිරික්ත බස් තිබෙන පාරවල් සඳහා නැවත ටෙන්ඩර් කැඳවා බස් රථ යෙදවීම නීත්‍යානුකූලද?

උ. පාරවල් සඳහා බස් රථ ඇතුළත් කිරීමට අධිකරණ නියෝගයකින් යම් ප්‍රමිතියක් හඳුන්වා දී ඇත්තේද?

ඌ. මෙම ටෙන්ඩර් කැඳවීම් වලදී අතයට ගණුදෙනු සිදු වී තිබේද?

එ. මෙලෙස ටෙන්ඩර් කැඳ වූ බස් රථ මේ වන විට ධාවනයේ යෙදෙන්නේද?

ඒ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. 2015 වසරේ සිට අවස්ථා 05 කදී ටෙන්ඩර් කැඳවා ඇත.

ආ. 2015 වර්ෂයේ සිට ටෙන්ඩර් කැඳවූ පුරප්පාඩු ඇමුණුම් 01[7] මඟින් ඉදිරිපත් කරමි.

[7] පිළිතුර අවසානයේ පළ කර ඇත.

[ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා]

ඈ. ටෙන්ඩර් මඟින් බලපත්‍ර ලබාදුන් පසු එම බලපත්‍රය ඊට අදාළ නියමයන් හා කොන්දේසි වලට යටත්ව මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යන තෙක් වලංගු වේ.

ඈ. 2016 ඔක්තෝබර් ටෙන්ඩරයේ කමිටු සාමාජිකයන්
සාමාන්‍යාධිකාරී - කේ.ජී. රුවන්ක මනුජිත මහතා
නි/සාමාන්‍යාධිකාරී - ඩබ්.එම්.අයි.කේ.විජේරත්නායක මහතා
ගණකාධිකාරී (ප්‍රවාහන අංශය) - ප්‍රාර්ථනා ෆොන්සේකා මිය

ඉ. බස් රථ අතිරික්ත වීම හේතුවෙන් බස් රථ ධාවනය ඉවත් කර තිබෙන මාර්ග පවතී.

ඊ. පුරප්පාඩු පවතින මාර්ග සඳහා ටෙන්ඩර් කැඳවා බලපත්‍ර ලබා දීම සිදු කර ඇත.

උ. අධිකරණ නියෝගයකින් ප්‍රමිතියක් හඳුන්වා දී නොමැති අතර, අංක 1488/32-2007.03.16 දින ගැසට් නිවේදනයට අනුව මාර්ග සඳහා බස් රථ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබයි.

ඌ. වාර්තා වී නොමැත.

එ. ධාවනය වේ. එහෙත් යම් යම් අවස්ථාවලදී විවිධ හේතු මත අඛණ්ඩව ධාවනය නොවූ අවස්ථා වාර්තා වී ඇත.

ඒ. අදාළ නොවේ.

ඇමුණුම — 01

2015 මාර්තු

| අනු අංක | මාර්ග අංකය | මාර්ගය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 180 (AC) | නිට්ටඹුව -කොළඹ | 2 |
| 2 | 187 | ජාඇල-කොටුව | 1 |
| 3 | 193 | කඩවත-පුරහල | 1 |
| 4 | 206 | ගම්පහ - වේයන්ගොඩ | 1 |
| 5 | 216 | කඩවත-දෙල්ගොඩ | 2 |
| 6 | 234 | දෙල්ගොඩ - පිටකොටුව | 3 |
| 7 | 240(AC) | මීගමුව - පිටකොටුව | 1 |
| 8 | 265(AC) | මිනුවන්ගොඩ - කොළඹ | 1 |
| 9 | 266 | ජාඇල-ගනේමුල්ල | 2 |
| 10 | 999 | මීරිගම - ගිරිඋල්ල | 1 |
| 11 | 187/2 | නිවාසිපුර - කොටුව | 1 |
| 12 | 188/1 | රද්දොළුව -සීදූව | 1 |
| 13 | 272 | වේයන්ගොඩ - ගලපිටමඩ | 2 |
| 14 | 429 | මීරිගම - දංඕවිට | 1 |

2015 ජූලි

| අනු අංක | මාර්ග අංකය | මාර්ගය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 104 | වත්තල - බම්බලපිටිය | 11 |
| 2 | 180 | නිට්ටඹුව - කොටුව | 1 |

| | | | |
|---|---|---|---|
| 3 | 182/1 | වේයන්ගොඩ - රංපොකුණගම | 1 |
| 4 | 187 | ජාඇල - කොටුව | 1 |
| 5 | 187/1 | ඒකල - කොටුව | 1 |
| 6 | 188/1 | රද්දොළුව - කොටුව | 1 |
| 7 | 193 | කඩවත - පුරහල | 3 |
| 8 | 204/227 | රබර්වත්ත හන්දිය - බියගම | 1 |
| 9 | 206 | ගම්පහ - වේයන්ගොඩ | 3 |
| 10 | 234 | දෙල්ගොඩ - පිටකොටුව | 2 |
| 11 | 235 | කැලණිය - කොටුව | 2 |
| 12 | 240 | මීගමුව - ගම්පහ | 1 |
| 13 | 242/4 | දිවුලපිටිය - මරදගහමුල | 1 |
| 14 | 244 | මීගමුව - ගම්පහ | 1 |
| 15 | 250 | මීගමුව - මඩම්පැල්ල | 1 |
| 16 | 273 | මීගමුව - ජාඇල | 1 |
| 17 | 290/1 | කිරිදිවැල - කැන්දගොල්ල | 3 |
| 18 | 343/1 | කිරිබත්ගොඩ - මාවරමණ්ඩිය | 1 |
| 19 | 670 | නිට්ටඹුව - වරකාපොල | 2 |
| 20 | 985 | වේයන්ගොඩ - බාදුරාගොඩ | 2 |

## 2015 නොවැම්බර් මස

| අනු අංක | මාර්ග අංකය | මාර්ගය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 182/1 | රංපොකුණුගම - වේයන්ගොඩ | 1 |
| 2 | 429/2 | මීරිගම -දංඕවිට | 1 |
| 3 | 821 | ගම්පහ - මිනුවන්ගොඩ | 1 |
| 4 | 193 | කඩවත - පුරහල | 3 |
| 5 | 206 | ගම්පහ - වේයන්ගොඩ | 3 |
| 6 | 999 | මීරිගම - ගිරිඋල්ල | 1 |
| 7 | 204/227 | හේනේගම - පිටකොටුව | 1 |
| 8 | 234 | දෙල්ගොඩ - කොළඹ | 1 |
| 9 | 187/1 | ඒකල - කොළඹ | 1 |
| 10 | 210 | දෙල්ගොඩ - කඩවත | 1 |
| 11 | 240 | මීගමුව - කොළඹ | 1 |

## 2016 මාර්තු

| අනු අංක | මාර්ග අංකය | මාර්ගය | පුරප්පාඩු සංඛයාව |
|---|---|---|---|
| 1 | 187 | ගුවත්තොටුපල -කොටුව | 1 |
| 2 | 187 | ජාඇල - කොටුව | 2 |
| 3 | 187/1 | ඒකල -කොටුව | 1 |
| 4 | 240 | මීගමුව - කොළඹ | 1 |
| 5 | 240/3 | මීගමුව - ඇවරියවත්ත | 1 |
| 6 | 250 | මීගමුව - මඩම්පැල්ල | 1 |
| 7 | 264/1 | රාගම - ජාඇල (ජයශ්‍රීගම) | 1 |
| 8 | 265 | මීනුවන්ගොඩ - කොළඹ | 4 |
| 9 | 266 | ජාඇල - ගණේමුල්ල | 2 |
| 10 | 278 | ජාඇල - ගණේමුල්ල | 1 |
| 11 | 900 | වත්තල - රාගම | 1 |
| 12 | 904 | මීනුවන්ගොඩ - ඇවරියවත්ත | 2 |
| 13 | 243 | වේයන්ගොඩ - දිවුලපිටිය (බල්ලපාන) | 1 |
| 14 | 270/1 | ගම්පහ - මීනුවන්ගොඩ (අස්ගිරිවල්පළ,වීදියවත්ත ,කළවාන ,පන්සිල්ගොඩ ) | 1 |
| 15 | 332 | යාගොඩ - ගම්පහ (ටැක්මෝහංදිය ,ඔරුතොටපාර) | 1 |
| 16 | 821/1 | ගම්පහ - මීනුවන්ගොඩ (උග්ගල්බඩ) | 1 |
| 17 | 983/2 | කිරිබත්ගොඩ - වත්තල (නාතුඩුව ,එඬේරමුල්ල ගොන්ගිතොට ,අප්පුගේ වත්ත) | 1 |
| 18 | 182/3 | වේයන්ගොඩ - නඩුවත්ත | 1 |
| 19 | 185/1 | නෙල්ලිගහමුල - වේයන්ගොඩ | 1 |
| 20 | 234 | දෙල්ගොඩ - පිටකොටුව | 2 |
| 21 | 245/1 | වේයන්ගොඩ - ගුවන්තොටුපල | 1 |
| 22 | 261 | මහරහංදිය - කොටුව | 1 |
| 23 | 272 | වේයන්ගොඩ - ගලපිටමඩ | 1 |
| 24 | 193 | කඩවත - පුරහල | 5 |
| 25 | 204/227 | හේනෙගම - කොටුව | 1 |
| 26 | 210 | දෙල්ගොඩ - කඩවත | 1 |
| 27 | 206 | ගම්පහ - වේයන්ගොඩ | 3 |
| 28 | 235 | කැළණිය - කොටුව(තොටලඟ හරහා) | 3 |
| 29 | 290/1 | කිරිදිවැල - කැන්දගොල්ල | 1 |
| 30 | 231 | කිරිදිවැල - පිටකොටුව | 1 |
| 31 | 206/3 | ගම්පහ - වේයන්ගොඩ (බෙම්මුල්ල | 1 |

| | | | |
|---|---|---|---|
| | | ,කොරසේ,වතුමුල්ල උඩුගම හරහා | |
| 32 | 206/7 | ගම්පහ - වේයන්ගොඩ (මාරපොළ ,මගලේගොඩ,කලගෙඩිහේනහරහා | 1 |
| 33 | 182/1 | වේයන්ගොඩ - රංපොකුණගම | 1 |
| 34 | 185/4 | වේයන්ගොඩ - ඕගොඩපොළ | 1 |
| 35 | 157/100 (A/C) | කඩවත - පානදුර | 4 |
| 36 | 185 | වේයන්ගොඩ -කිරිදිවැල | 2 |
| 37 | 104 | වත්තල - බම්බලපිටිය | 5 |
| 38 | 2016/2 | දෙල්ගොඩ - කඩවත | 1 |

## 2016 ඔක්තෝම්බර්

| අනු අංක | මාර්ග අංකය | මාර්ගය | පුරප්ප ඩු |
|---|---|---|---|
| 1 | 187 | ගුවත්තොටුපල -කොටුව | 1 |
| 2 | 187 | ජාඇල - කොටුව | 2 |
| 3 | 187/1 | ඒකල -කොටුව | 4 |
| 4 | 240 | මීගමුව - කොළඹ | 1 |
| 5 | 264/1 | රාගම - ජාඇල (ජයශ්‍රීගම හරහා) | 1 |
| 6 | 265 | මිනුවන්ගොඩ - කොළඹ | 4 |
| 7 | 266 | ජාඇල - ගණේමුල්ල | 2 |
| 8 | 904 | මිනුවන්ගොඩ - ඇවරියවත්ත | 2 |
| 9 | 104 | වත්තල -බම්බලපිටිය | 4 |
| 10 | 325 | රාගම - වැලිපිල්ලැව | 1 |
| 11 | 185/1 | නොල්ලිගහමුල - වේයන්ගොඩ | 1 |
| 12 | 234 | දෙල්ගොඩ - පිටකොටුව | 1 |
| 13 | 261 | මහරහංදිය - කොටුව | 1 |
| 14 | 243 | වේයන්ගොඩ - දිවුලපිටිය(බල්ලපාන) | 1 |
| 15 | 193 | කඩවත - පුරහල | 3 |
| 16 | 204/227 | හේනෙගම - කොටුව | 1 |
| 17 | 206 | ගම්පහ - වේයන්ගොඩ | 3 |
| 18 | 290/1 | කිරිදිවැල - කැන්දගොල්ල | 1 |
| 19 | 231 | කිරිදිවැල - පිටකොටුව | 1 |
| 20 | 200 | ගම්පහ - පිටකොටුව(සුඛෝපභෝගී) | 10 |
| 21 | 206/4 | ගම්පහ - වේයන්ගොඩ (මාරපොළ ,මගලේගොඩ,කළගොඩිහේන හරහා | 3 |
| 22 | 17/1 | නිට්ටඹුව - පානදුර (සුඛෝපභෝගී) | 4 |

| | | | |
|---|---|---|---|
| 23 | 185/4 | වේයන්ගොඩ - බොගොඩපොළ | 2 |
| 24 | 157/100 | කඩවත - පානදුර (සුඛෝපභෝගී) | 8 |
| 25 | 185 | වේයන්ගොඩ - කිරිදිවැල | 2 |
| 26 | 180 | නිට්ටඹුව - පිටකොටුව (සුඛෝපභෝගී) | 5 |
| 27 | 206/2 | ගම්පහ - වේයන්ගොඩ | 1 |
| 28 | 182/1 | රංපොකුණුගම - වේයන්ගොඩ | 2 |
| 29 | 225 | කිරිදිවැල - දෙල්ගොඩ | 1 |
| 30 | 245/1 | වේයන්ගොඩ - ගුවින්කොටුපළ | 2 |
| 31 | 228/1-270 | කඩුවෙල - මීගමුව | 4 |
| 32 | 154/1 | කිරිබත්ගොඩ - තොරණහංදිය | 4 |
| 33 | 235/1 | කැළණිය - තොරණහංදිය | 8 |
| | 206/6 | වේයන්ගොඩ - ගම්පහ (කළගෙඩි හේන හරහා) | 1 |
| 35 | 211 | දිවුලපිටිය - ගම්පහ | 2 |
| 36 | 211/2 | වේයන්ගොඩ - ගම්පහ (දඩිගමුව,මගලෙගොඩ,පිටියේගෙදර හරහා) | 1 |
| 37 | 138 | කඩවත - කොටුව | 8 |
| 38 | 225 | කිරිදිවැල - පිටකොටුව | 1 |
| 39 | 122/182/240 | අවිස්සාවේල්ල - මීගමුව (සුඛෝපභෝගී) | 2 |
| 40 | 122/182/240 | අවිස්සාවේල්ල - මීගමුව (අර්ධ සුඛෝපභෝගී) | 2 |
| 41 | 180/182 | නිට්ටඹුව - අවිස්සාවේල්ල | 2 |
| 42 | 245/1-182 | වේයන්ගොඩ - අවිස්සාවේල්ල | 2 |
| 43 | 271 | රාගම - ජාඇල | 2 |
| 44 | 278 | ජාඇල - ගනේමුල්ල | 2 |
| 45 | EX02-138 | කඩවත - කොට්ටාව (කොට්ටාව) | 8 |
| 46 | EX01-100 | කඩවත - පානදුර (ගැලනිගම) | 10 |
| 47 | EX01-120 | කඩවත - හොරණ (ගැලනිගම) | 4 |
| 48 | EX01-400 | කඩවත - අලුත්ගම (වැලිපැන්න) | 4 |
| 49 | EX01-400/1 | කඩවත - කළුතර (දොඩංගොඩ) | 4 |
| 50 | EX01-430 | කඩවත - මතුගම ((දොඩංගොඩ) | 10 |
| 51 | EX01-240/138 | මීගමුව - අලුත්ගම (කඩවත හරහා) | 2 |
| 52 | EX01-240/138 | මීගමුව - කොට්ටාව (කඩවත හරහා) | 2 |
| 53 | EX01-240/138 | මීගමුව - පානදුර (කඩවත හරහා) | 2 |
| 54 | EX01-240/138 | මීගමුව - හොරණ (කඩවත හරහා) | 2 |
| 55 | EX01-240/138 | මීගමුව - කළුතර (කඩවත හරහා) | 2 |
| 56 | 150/1 | කිරිබත්ගොඩ - බත්තරමුල්ල | 2 |
| 57 | 193 | කඩවත - පුරහල | 4 |
| 58 | EX01-138/240 | පානදුර - මීගමුව (කඩවත හරහා) | 2 |
| 59 | EX01-100/122 | පානදුර - අවිස්සාවේල්ල | 2 |
| 60 | EX01-261 240 | කඩුවෙල - මීගමුව (කඩවත හරහා) | 4 |
| 61 | 240/171 | කොටාවිකඩේ - -බත්තරමුල්ල | 2 |
| | 05 171 | දිවුලපිටිය - බත්තරමුල්ල | 2 |

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්න එක. දැනට මාර්ගවල ආරවුලකින් තොරව බස් ධාවනයේ යොදන්න ඔබතුමා රැස්වීම් කිහිපයක් කැඳවලා තිබුණා කියලා දැනගන්න ලැබුණා. ඒ ප්‍රශ්න මේ වන කොට විසඳලා අවසන් කර තිබේද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඇහුණේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙම ගැටලු සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නය යොමු කරපු අවස්ථාවෙන් පසුව රැස්වීම් කිහිපයක් කැඳ වූ බව දැනගන්නට ලැබුණා. ඒ ප්‍රශ්න සාකච්ඡා කර අවසන් කර තිබේද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සාකච්ඡා වට කිහිපයක් තැබුවා. උග්‍ර ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ පිළිබඳව මම නිලධාරීන් දැනුවත් කරලා වාර්තාවක් ලබා දීලා ඒකට හැකි ඉක්මණින් විසඳුමක් ලබා දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දහ වැනි ප්‍රශ්නයත් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියන්ගෙන්මයි. ගරු මාර්ග ඇමැතිතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**10.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/55)**

අ. ප්‍රවාහන අධිකාරියේ ජා-ඇළ ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

ආ. ඒ කවදා සිටද?

ඇ. ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

ඈ. එකී වැඩ බැලීම් වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඉ. මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

ඊ. මෙම වැඩ බැලීම් සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයන් බඳවා නොගන්නේ මන්ද?

උ. තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමගින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

ඌ. පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදුකරගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස් රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා/අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

එ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. එක් තනතුරක් පුරප්පාඩු වී ඇත.

ආ. 2015.05.15 සිට

ඇ. පරිපාලන නිලධාරී (ධාවන), එස්.ඒ. උදයශාන්ත ප්‍රේමරත්න මහතා ප්‍රාදේශීය කළමනාකරු (වැ.බ.) ලෙස පත් කර ඇත.

ඈ. ඔව්.

ප්‍රාදේශීය කළමනාකරු තනතුරට අදාළ වැටුපෙන් ¼ වන රු.6,410/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

[ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා]

ඉ. නැත.

ස්ථිර නිලධාරියෙකු බඳවා ගන්නා තෙක් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ආයතන ප්‍රධානියා විසින් වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කර ඇත.

ඊ. ඉහත පුරප්පාඩුව සඳහා 2017.03.16 දින විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇති අතර, ඒ අනුව ඉදිරියේදී ස්ථිර නිලධාරියෙකු බඳවා ගනු ඇත.

උ. ඔව්.

එම නිසා පෙර නම් සඳහන් නිලධාරියාට ප්‍රාදේශීය කළමනාකරු තනතුරේ රාජකාරී පවරා ඇති අතර පරිපාලන නිලධාරී (ධාවන) තනතුරෙහි රාජකාරී වෙනත් නිලධාරියෙකු විසින් ඉටු කරයි. එබැවින් ඉහත ප්‍රශ්නය පැන නොනඟී.

ඌ. ගරු මන්ත්‍රීතුමන්ලා විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු නිවැරැදි කිරීමට කටයුතු කරනු ඇත.

එ. අදාළ නොවේ.

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා ඇතුළු මේ සභාව දන්නා කාරණාවක් තමයි නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති හතරක් සඳහා මේ වන කොට ටෙන්ඩර් කැඳවලා එයින් දෙකක ගිවිසුම් අත්සන් කිරීමේ සූදානමකට අපි ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අනෙකුත් ටෙන්ඩර් කැඳවලා, ආයෝජකයන් හඳුනාගෙන ගිවිසුම් අත්සන් කිරීම සඳහා සූදානමක් තිබෙනවා. නමුත් පළාත් සභාවේ නීතිරීති අනුව වෙනම අධිකාරියක් විසින් කැබිනට් අනුමැතිය අරගෙන කරන ව්‍යාපෘතිවලට සාමාන්‍ය සම්ප්‍රදායේ සභා අනුමැතියක් ගැනීමක් සිදු වෙන්නේ නැහැ. නමුත් අපි හිතනවා, ලංකාවේ කෙරෙන පළමුවැනිම ව්‍යාපෘතිය තමයි, බස්නාහිර පළාතේ කසළ කළමනාකරණ අධිකාරිය මේ ආයෝජකයන් හඳුනාගෙන ක්‍රියාත්මක කරන මහා පරිමාණ ව්‍යාපෘති. ඉතින් ඒ අනුව මම හිතුවා, පළාත් සභාවේ රීතියේ කෙසේ සඳහන් වුවද මේ පිළිබඳව දැනුවත් කිරීමක්, මේ පළාත් සභාවේ ඔබතුමා ඇතුළු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම අපේ යුතුකමක් සහ වගකීමක් බව තේරුම්ගත් හෙයිනුත්, ඒ වාගේම පසුගියදා ඒ කාරණය පිළිබඳව පැහැදිලි කිරීමේදී පැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය අනුවත් මේ කාරණාව පිළිබඳව සභාව දැනුවත් කිරීමේ යුතුකමක් වගකීමක්, පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියටත්, විෂය භාර අමාත්‍යවරයා හැටියටත් මගේ යුතුකමක්ව තිබෙන නිසා මම ඒ ගැන කෙටි පැහැදිලි කිරීමක් මේ සභාව අබියස කරන්නට සූදානම්.

ගරු සභාපතිතුමනි, කාර්මිකකරණයත්,නාගරිකකරණයත් අනතුරුව බිහි වූ තාක්ෂණ විප්ලවයත් හේතුවෙන් මුළු ලෝකයම ඝණ අපද්‍රව්‍ය ගැටළුවකට මුහුණ දී සිටිනවා. මේ වන විට ලෝකයේ බොහෝ රටවල් නාගරික ඝන අපද්‍රව්‍ය ගැටළුව ආදායම් ජනනය කිරීමේ මාර්ගයක් බවට පත් කර ගෙන තිබෙනවා. අපට මෙතෙක් මේ ගැටළුව විසඳා ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ. පසුගියදා මීතොටමුල්ල කුණු කන්ද ආශ්‍රිතව ඇති වූ මහා ඛේදවාචකය ඝන අපද්‍රව්‍ය ගැටළුව විසඳා නොගැනීමේ ප්‍රතිඵලයක් බව අප සැම දෙනා දන්නා කරුණක්. ශ්‍රී ලංකාවේ ජනනය කරන නාගරික ඝන අපද්‍රව්‍ය තුළින් 60% ක් බස්නාහිර පළාත තුළ ජනනය වීමත්, පළාත් පාලන විෂය හා බැඳුනු අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීමේ වගකීම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා මෙන්ම පළාත් පාලන විෂය භාර ඇමතිවරයා වශයෙන් මා වෙත පැවරී තිබෙනවා. කාලාන්තරයක් තිස්සේ බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට විවිධ ව්‍යාපෘති හඳුන්වා දීමට උත්සාහ කළත් රජය සහ පළාත් සභා එක් ස්ථාවරයකට නොපැමිණීම මත මෙම ගැටළුව විසඳුනේ නැහැ. මේ තත්ත්වය අතිගරු ජනාධිපතිතුමා පවා මෑතකදී පෙන්වා දී තිබුණා. පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණය වශයෙන් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය කටයුතු කරන අතර, අපගේ නායකත්වය යටතේ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා 2016 සිට 2020 දක්වා පස් අවුරුදු සැලැස්මක් හඳුන්වා දී තිබෙනවා. මෙමගින් බස්නාහිර පළාතේ මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වන

හෙයින් ඒවා පෞද්ගලික අංශය සමඟ රාජ්‍ය හා පෞද්ගලික බද්ධ ව්‍යාපෘති වශයෙන් කිරීම වඩාත් සුදුසු බව හඳුනාගෙන තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර UK කම්පැනිය ද දන්නේ නැහැ නේ ඇවිල්ලා තිබෙන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ අනුව කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික් තුනටම වෙනමම ව්‍යාපෘති ඇති කිරීමට කටයුතු සලසා තිබෙනවා. රජයේ පාර්ශවයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් ලබා දීම, අවශ්‍ය අමුද්‍රව්‍ය වන කසළ ලබා දීම සම්බන්ධව වගකීමට බැඳෙන අතර, මෙම ව්‍යාපෘතිවල ප්‍රතිලාභවලින් අවම වශයෙන් 5% ක් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ලබා ගැනීමට හැකි වන සේ ව්‍යාපෘති සැලසුම් කර තිබෙනවා. කොළඹ ප්‍රධාන ව්‍යාපෘති තුනක් හඳුනාගෙන තිබෙනවා. කඩුවෙල මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ දිනකට අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 500 ක් කළමනාකරණය කිරීම සඳහා රිනිව්ජන් එන්වයිරෝ ඉන්දීය පුද්ගලික සමාගම සමඟ ගිවිසුම් ගත වී තිබෙනවා. ඔවුන් මේ සඳහා තෝරා ගෙන ඇති ඉඩම සම්බන්ධයෙන් මහජන විරෝධයක් පැන නැගී ඇති බැවින් විකල්ප ඉඩමක් තෝරා ගෙන ව්‍යාපෘති දියත් කිරීමට නියමිතව තිබෙනවා. කරදියාන යෝජිත මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ දිනකට අපද්‍රව්‍ය ටොන් 500 ක් කළමනාකරණය කිරීම සඳහා ෆෙයාවේ වේස්ට් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම සමඟ ගිවිසුම් ගත වීමට නියමිතයි. ඊට අමතරව කොළඹ මහ නගර සභාවේ යෝජිත මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය දිනකට මෙට්‍රික් ටොන් 500 ක් කළමනාකරණය කිරීම සඳහ ආයෝජකයෙකු හඳුනාගැනීමට දැනටමත් කටයුතු කරමින් සිටිනවා. ගම්පහ දඹුවත්ත යෝජිත මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ දිනකට අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 95 ක් ට්‍රයිලොජි ඊඑස්ටී පුද්ගලික සමාගම සමඟ ගිවිසුම් ගත වීමට අපි දැන් සූදානම් වෙලා තිබෙනවා. මුතුරාජවෙල යෝජිත මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා කේ.සී.එච්.සී. ලංකා ජන්ක් පුද්ගලික සමාගම සමඟ දිනකට අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 400 ක් කළමනාකරණය කිරීමට අයෝජකයන් සමඟ ගිවිසුම්ගත වීමට නියමිතව තිබෙනවා.

කළුතර දිස්ත්‍රික්කය සඳහා යෝජිත අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ දිනකට මෙට්‍රික් ටොන් 150 ක් සඳහා ආයෝජකයෙකු හඳුනාගැනීමට කටයුතු කරමින් සිටිනවා. මේ මහා පරිමාණ ව්‍යාපෘති අතුරින් කොළඹ දිස්ත්‍රික්කයේ කරදියාන සහ ගම්පහ දිස්ත්‍රික්කයේ මුතුරාජවෙල යෝජිත මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ලද ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව CCEN විසින් ලබා දෙන ලද උපදෙස් අනුව මහ නගර සභා සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත් වීම මත තෝරා ගන්නා ලද ආයෝජකයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අංක 17/0012/724/001 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2017.01.10 වන දින අනුමැතිය ලබා දී තිබෙනවා. මේ සම්බන්ධයෙන් පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අංක 5/67/2/11/2016/2 – 1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2016.11.17 වන දින අපගේ අමාත්‍ය මණ්ඩලය විසින් යෝජිත කරදියාන ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද ආයෝජක සමාගම වන ෆෙයාවේ හෝල්ඩින් පුද්ගලික සමාගමටත්, V1/77/3/2017/2/1 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2017.03.21 වන දින අපගේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය කේ.සී.එච්.සී. ලංකා ජන්ක් පුද්ගලික සමාගමටත් අනුමැතිය ලැබී තිබෙනවා. අනිකුත් ව්‍යාපෘති සඳහා ආයෝජකයන් හඳුනාගැනීමෙන් අනතුරුව එම ආයෝජකයන් සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කිරීමට නියමිතයි.

කරදියාන හා දඹුවත්ත ව්‍යාපෘති දියත් කිරීම සම්බන්ධයෙන් අත්සන් කළ ගිවිසුම් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ නීති අංශය විසින් ඒ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් සහිත නීතිවේදීන්ගේ උපදෙස් මත පිළියෙල කර ඇති අතර, ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ද ලබා ගෙන තිබෙනවා. දැනට පළාතේ පවතින උග්‍ර අපද්‍රව්‍ය ගැටළුවට තිරසාර විසඳුමක් ලබා දීම අරමුණු කර ගනිමින් උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් සභාව විසින් දැනුවත් කිරීමට මෙයින් අපේක්ෂා කරන අතර, අදාළ

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

කෙටුම්පත් ගිවිසුම්වල පිටපත් සභාගත කරන තෙක් අවශ්‍ය ගරු මන්ත්‍රීවරුන්ට සහා ලේකම් වෙතින් ලබා ගත හැකි බව ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් දැන්වීමට කැමැතියි. අපගේ මෙම කාර්යභාරයට මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ සහාය සහ මගපෙන්වීම මහා ඉහළින්ම අගය කරන බව ද ගරු සභාපතිතුමා මාර්ගයෙන් සභාවට දන්වන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, දැන් රීතිමය ප්‍රශ්නයක් නිසා මේක table කරන්න අපහසුයි. ඒ නිසා මේක සභාවේ දැනුවත් කිරීමෙන් පස්සේ අපි පිටපත් සූදානම් කරලා තිබෙනවා. මේ ප්‍රකාශයට සභාවේ එකඟතාවය පළ වීමෙන් පස්සේ සභා ලේකම්තුමාට පුළුවන් මේකේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ට බෙදලා දෙන්න. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අදහස් කරන්නේ - අද සභාවේ සාකච්ඡාවට ගන්න බැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් මේක අපට ප්‍රමාද කරන්න කාරණාවක් නැහැ. මොකද, මේ ලංකාවේ කරන පළමුවැනි ව්‍යාපෘතිය. එතකොට මේක ඉක්මණින් අපි ආරම්භ කරන්න ඕනෑ කාරණාවක්. එදා ගරු මන්ත්‍රීවරු කිව්වා, මේක සභාව දැනුවත් කරලා ඉවර වෙලා ගිවිසුම්වලට යමු කියලා. ඒ අනුව තමයි මම මේක ඒ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශයන්ට අදාළව මේක ඉදිරිපත් කළේ. ඒ නිසා මම හිතනවා, මේ සම්බන්ධයෙන් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒ දැනුවත් - ප්‍රකාශය සම්බන්ධයෙන් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අපටත් ඕනෑ ප්‍රමාද නොවී මේක සිද්ධ වෙන්න. නමුත් මේක අපට අවශ්‍යයි. ජනතාවට අවශ්‍යයි. ප්‍රදේශයේ අයට අවශ්‍යයි. පාරිසරික ඇගයීම් වාර්තාව මේකට අරගන්නවාද? අරගෙන තිබෙනවාද? ඒ කියන්නේ පාරිසරික ඇගයීම් වාර්තාව කියලා කියන්නේ EIA එක. වෙන එකක් නොවෙයි. ඒ නිසා ඒ දේවල් ටික සම්පූර්ණ වෙන්න ඕනෑ. ඒ දේවල් ටික සම්පූර්ණ නොවුණොත් ප්‍රදේශයෙන් ජනතා විරෝධයක් එන්න පුළුවන්. මේ කරුණු ඉදිරිපත් කරන්නේ මේක කෙරෙන්න ඕනෑ පැත්තෙන්. විසඳුමක් ලැබිය යුතු පැත්තෙන් තමයි මේක ඉදිරිපත් කරන්නේ. නමුත් එහෙම ප්‍රශ්න තිබෙද්දී මේකට ගියොත් එහෙම ලොකු ගැටළුවක් මතු වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ව්‍යාපෘතියේ ගිවිසුම් අත්සන් කරන්න දැන් සූදානම් වෙලා තිබෙන්නේ. EIA රිපෝට් එක දැන් ලැබිලා තිබෙනවා. සියලුම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමතිතුමා අපට පොඩ්ඩක් ඒකත් ඉදිරිපත් කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ඒක තිබෙනවා. දැන් ගිවිසුම බලන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගිය වතාවේ එංගලන්තයෙන් කම්පැනියක් ඇවිල්ලා කියලා ප්‍රකාශ කරලා අපේ අත උස්සා ගත්තා. දැන් අද ඒක කියවුණෙත් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එංගලන්තේ එක නොවෙයි. දැන් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමන්ලා මේ කාරණය පිළිබඳව දැනුවත් වෙලා තිබෙනවා. ගිවිසුමේ පිටපත සූදානම් කරලා තිබෙනවා. සියලු වාර්තා ලැබිලා තිබෙනවා. අපි ගිවිසුම් අත්සන් කළත් ගරු සභාපතිතුමනි, අපි ඒ අදාළ ආයතන දැනුවත් කරලා තිබෙනවා. ඒ ප්‍රදේශවලට ගිහිල්ලා මහජනයා හම්බ වෙලා, මහජනයා දැනුවත් කරලා, මහජනයා ඉල්ලන තොරතුරු ලබා දීලා මේක කරන්නය කියලා. කොහොමත්

ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිය කරන කොට මධ්‍යම පරිසර අධිකාරිය, ඒ සම්බන්ධ ආයතනවල අනුමැතිය ඇතිව තමයි කරන්නේ. නිකම් මේක අපි ගිවිසුම් අත්සන් කළාය කියලා කරන්නේ නැහැ. ගිවිසුම් අපි අත්සන් කරන්නේ ඒ සියලුම වාර්තා ලැබීමෙන් පස්සේ. එතකොට ඒ සියලු දේවල් ලැබිලා තිබෙනවා. මේකට අපි අනුමැතිය දීලා තිබෙනවා. නමුත් සභාව දැනුවත් කිරීමක් පමණයි කළේ. සෑම මන්ත්‍රීවරයෙකුටම ගිවිසුමේ පිටපතක් අපි දැන් සූදානම් කරලා තිබෙනවා. ඒගොල්ලන්ට මේ සභාවේදීම ඒක අරගෙන බලන්න පුළුවන්. දැන් මේ ව්‍යාපෘතිය අපට ප්‍රමාද කරන්න විධියක් නැහැ. මොකද, අඩුපාඩු තිබෙනවා නම් අපට ඒක කථා කරලා තමයි ඉස්සරහාට හදාගෙන යන්න වෙන්නේ. නමුත් නීත්‍යානුකූලව දේවල්, ඔක්කොම සිද්ධ වෙන්න ඕනෑ දේවල් රජයට මේ වාගේ ගිවිසුමකදී සිද්ධ වෙන්න ඕනෑ නීත්‍යානුකූල දේවල් සියලු දේ සිද්ධ වෙලා ඉවරයි. ඒ නිසා මේ සභාවේ එකඟතාවය මම ඉල්ලන්නේ. අප්‍රමාදව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ එකඟතාවය දෙන්නය කියලා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේකට අදාළව මමත් අදහසක් දක්වන්න ඕනෑ මේ රටේ -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

පොඩ්ඩක් මට දෙනවාද? මමයි ඉස්සෙල්ලාම නැගිට්ටේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඔබතුමාට කලින් මමයි නැගිට්ටේ. ඒ නිසා මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මෙතුමා තමයි මුලින්ම නැගිට්ටේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

දැන් අපට ඊයේ දිනයේදී කරදියාන සහ දඹුවත්ත කියන මේ ප්‍රදේශවල කසළ කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ ආයෝජන ගිවිසුම් අත්සන් කරනවාය කියලා ආරාධනා පත්‍රයක් ලැබිලා තිබුණා. ඒ අනුව ඊයේ සවස 3.00 ට කොළඹ Cinnamon Lake Side හෝටලයේදී මේ ගිවිසුම් අත්සන් කරනවාය කියලා දැනුම් දීලා තිබුණා. මම දැන ගන්න කැමැතියි. හදිසියේම මේ ගිවිසුම් අත්සන් කිරීම අත්හිටවූයේ කුමන කරුණු පදනම් කර ගෙනද? විශේෂයෙන්ම දැන් මේ පිළිබඳව අවශ්‍ය කරන විශේෂඥයින්, ඒ වාගේම තාක්ෂණවේදීන් සහ ඊට අදාළ ඒ කසළ කළමනාකරණය සම්බන්ධ මේ විශේෂඥයින් මේ සියලු කටයුතු අවසන් කරලා තිබෙද්දී ඊයේ දිනයේදී මේ කටයුත්ත අත්හිටෙව්වේ කවර කරුණු පදනම් කර ගෙනද? කවර තර්ක පදනම් කර ගෙනද කියලා දැන ගන්න කැමැතියි. මොකද, Invitation එක ගහලා සියලු කටයුතු සූදානම් කරලා තිබෙද්දී. ආයෝජකයන් හඳුනාගෙන, ඒ ආයෝජකයන් සමඟ ගිවිසුම්ගත වෙන්න තිබෙද්දී මේක නතර කළේ කාගේ වුවමනාව මතද? කවර කාරණා ඉදිරිපත් කිරීම මතද කියලා මම දැන ගන්න කැමැතියි මේ සභාවේදී.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා හේතු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක විවාද කරන්න දෙන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. විවාදයක් නොවෙයි. පැහැදිලි කිරීම - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක එක්කෙනා කථා කරන්න ගියාම. ගරු මහ ඇමතිතුමා ප්‍රකාශයක් කළා. එපමණයි. නැවත සභාවේ විවාද කරන්න දෙන්න බැහැ. එහෙම නම් -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කාලෝචිත ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, නැහැ. නැහැ. පොඩ්ඩක් - (බාධා කිරීම්)

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, දැන් කරදියාන අපට සෘජුව බලපානවා. මෙතුමාට ප්‍රශ්නයක් අහන්න පුළුවන් නම් මහ ඇමතිතුමාගෙන්. අපටත් අහන්න පුළුවන්. ඒ අවස්ථාව අපටත් ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට දැන් දෙන්න බැහැ අවස්ථාව. මම හිතුවා, මෙතුමා 36(1) යටතේ කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. පොඩ්ඩක් ඉන්න. මම පැහැදිලි කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් යෝජනාවක් ගේන්න. යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න. මම අවස්ථාවක් දෙන්නම් එහෙමනම්. එහෙම නැතිව එක එක්කෙනාට කථා කරන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔක්කොටම දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා, දැන් ඒකේ උත්තරය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට එහෙම අවස්ථාව දෙන්න බැහැ. මහ ඇමතිතුමා ප්‍රකාශයක් කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, දැන් ඊයේ ඒ ගිවිසුම අත්සන් කරන එක නතර කළේ එකක් තමයි, දැනුවත් කිරීමේ සාකච්ඡාවේදී මන්ත්‍රීවරුන් යෝජනාවක් කළා මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩල -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මහ ඇමතිතුමා, මේකට උත්තර දෙන්න ඔබතුමා බැඳිලා නැහැ නේ? ප්‍රකාශයක් කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක පිළිබඳව මේ සභාව දැනුවත් කළා. අනික් එක ඊයේ පරිසර දිනය. අතිගරු ජනාධිපතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ හිටියේ. ඒ නිසා අපට ඒකට මහ ඇමතිවරයා හැටියට මම එතැන යෙදෙන්න ඕනෑ. ඒ හේතුව උඩ කළේ. මේකේ මම දන්නවා. මේ උනන්දුවක් තිබෙන මන්ත්‍රීවරු දන්නවා. මේක සභාවේ විවාද කරන්න දෙයක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ වැඩේ වෙලා ඉවරයි. මහ ඇමතිවරයා හැටියට, විෂය භාර ඇමතිවරයා හැටියට මගේ යුතුකම තමයි මම කළේ. මොකද, මන්ත්‍රීවරු මගෙන් සාධාරණ ඉල්ලීමක් කළා, සභාව දැනුවත් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මහ ඇමතිතුමා කියන්නේ, සාකච්ඡාවේදී මන්ත්‍රීවරු ගණනාවක් මේකට විරුද්ධ වුණා කියලා කියන්න. සාධාරණ හේතු තිබුණා. එහෙම නැත්නම් වෙන කවුරුවත් ළමයි - අපට වාසගම දියන් කියලා කියනවා නම් අපි දැන ගන්න ඕනෑ මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැවතත් විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අනික් එක මේ සම්බන්ධයෙන් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා බැඳිලා නැහැ මේකට උත්තර දෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු දැනුවත් කිරීමේ රැස්වීමක් තිබුණා. මන්ත්‍රීවරුන්ට ඇවිල්ලා ඒකට සහභාගී වෙලා අදහස් ප්‍රකාශ කරන්න තිබුණා. ඒ සාකච්ඡාවේදී මන්ත්‍රීවරු ඉල්ලීමක් කළා, ගරු මහ ඇමතිතුමා අමත්‍යවරුන්ගේ ප්‍රකාශ අවස්ථාවේදී මේ සභාවට ප්‍රකාශයක් කරන්නය කියලා. එහෙම නැතිව මේකේ මුකුත් අභ්‍යන්තරයක් නැහැ. ඒ නිසා මේක මේ අපි විවාද කරන කාරණාවක් නොවෙයි. මේක ඉක්මණින් ක්‍රියා කරන කාරණාවක්. ඒ නිසා මම හිතනවා, ගැටළුවක් තිබෙනවා නම් ඕනෑම මන්ත්‍රීවරයෙකුට පුළුවන් කසළ කළමනාකරණ අධිකාරියත් එක්ක ඒක වෙනම සාකච්ඡා කර ගන්න. ඒ නිසා මේ එකඟතාවය දෙන්න කියන ඉල්ලීමයි මම කරන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, ඒ කියන්නේ මට දැන ගැනීමේ අයිතියක් තිබෙනවා, තොරතුරු දැන ගැනීමේ අයිතියත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි වගන්තිය යටතේ. මම දැන ගන්න ඕනෑ කවර කරුණු මතද මේ ගිවිසුම අත්හිටෙව්වේ කියලා. ඒ කියන්නේ, මන්ත්‍රීවරු කරුණු පැහැදිලි කළා නම්, ඒ කරුණු මොනවාද කියලා කියන්න. මේ තාක්ෂණ විශේෂඥයින් - මේ ගොඩ වෙද්දු කියන කාරණා නොවෙයි. කරුණාකර තාක්ෂණ විශේෂඥයින් සහ විද්‍යාඥයින් කියන කරුණු මත පදනම් වෙලයි මෙවැනි කාරණා කරන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මමත් වරප්‍රසාද ප්‍රශ්නයක් 36(1) යටතේ යොමු කරන්නේ. ඔබතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මම කියන්නේ. කරුණාකරලා කියන්න අපට දැන ගන්න අයිතියක් තිබෙනවා. මොන කරුණු මතද මේ ගිවිසුම අත්සන් කිරීම නතර කළේ කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැන් මේ තොරතුරු දැන ගැනීමේ අයිතිය ගැන කථා කරනවා නම්, මන්ත්‍රී වරප්‍රසාද ගැන අපි කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් 36(1) යටතේ හැමෝම කථා කළොත් ගැටළුවක් නේ මේක. අපට න්‍යාය පත්‍රයට යන්න තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක තමයි. දැන් කරුණාකර ඔබතුමා මාර්ගයෙන් මම ප්‍රධාන අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාව ඇතුළේ විවාදයක් කළ යුතු කාරණාවක් නොවෙයි. කරදියාන සම්බන්ධයෙන් විසඳුමක් ඕනෑ. මේකේ මේ ඔක්කොටම වඩා දුක් විඳින්නේ කැස්බෑව ආසනයේ අපේ ජනතාවයි. ඒ නිසා කරුණාකර ඔබතුමා හරහා ඉදිරිපත් - හැබැයි, මේකේ ශක්‍යතා වාර්තා පිළිබඳව, මේකේ Tender Procedure එක පිළිබඳව, මේකේ තාක්ෂණික දැනුම පිළිබඳව - ඉතිහාසයේ මේකට Golden Sunrise සමාගමේ සිට සමාගම් 25 ක් 30 ක් මේකට ඉතිහාසයේ ඩීල් ගෙනාවා. ඒ නිසා මේ යන ගනුදෙනුව, මේ යන Contractor, මේක මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට තමයි තවම චෝදනා පත්‍රය එන්නේ. ඒ නිසා ප්‍රධාන අමාත්‍යවරයාට මේකේ වගකීමක් තිබෙනවා. මේ ව්‍යාපෘතිය

[ගරු නිරෝෂන් පාදුක්ක]

පිළිබඳව - දැන් මම කැස්බෑව සංවර්ධන කමිටුවේ සභාපතිවරයා විධියට මේ අදාළ ආයතනය මම කැඳෙව්වා කැස්බෑව නගර සභාවට. ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් දන්නවා. අපි ඔවුන්ගෙන් ඇහුවා යම් යම් ප්‍රශ්න. මේ ප්‍රදේශවාසීන් අහපු ප්‍රශ්න ටිකක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආයිත් දැන් මුලට යනවා. 36(1) කියලා ඔබතුමා දැන් වෙන වෙන ඒවා කියන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ වාගේම අපි ඔබතුමා හරහා ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, යම්කිසි මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ අදාළ ආයතනය මේ ස්ථානයට ගෙන්වලා, මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න කිරීමේ අයිතිය, මේ මන්ත්‍රීවරුන්ට යමක් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මන්ත්‍රීවරුන්ට ඒක දුන්නා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. වර්තමාන තත්ත්වය. මේ කියන Risk එකක් තිබෙනවා නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපටත් ඒ ප්‍රශ්නය තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

එහෙම නම් මොකටද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේක ප්‍රශ්නයක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපටත් ඒ ප්‍රශ්නයම තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපටත් මේ ආරාධනා පත්‍රය ආවා. පස්වැනිදා ගිවිසුම අත්සන් කරනවාය කියලා. ඒ නිසා බ්‍රහස්පතින්දා තිබුණු සාකච්ඡාවට අපි ගියා. බ්‍රහස්පතින්දා සාකච්ඡාවක් පැවැත්වුවා. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින්. ඒකේදී අපි ඉල්ලීමක් කළා, සභාව දැනුවත් කරන්නය කියලා. අපි ස්තුතිවන්ත වෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. ප්‍රධාන ඇමතිතුමා එදා දවස නතර කරලා, අද සභාව දැනුවත් කරලා ඉදිරි කාලයේ ගිවිසුමට යන්න ලැහැස්ති කරලා තිබෙනවා. ඒ නිසා අද මේ සභාව දැනුවත් කරන්න තමයි එදා ගිවිසුම අත්සන් කරන එක නතර කළේ. අපි ස්තුතිවන්ත වෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. අපි කරපු ඉල්ලීම ඒක. මේ සභාව දැනුවත් කරන්න කියලා. ඒ අනුව තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමා සභාව දැනුවත් කළේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපටත් ප්‍රශ්න තිබෙනවා ගරු සභාපතිතුමනි. නමුත් මේ වැඩේ පටන් ගනිමු අපි. අරගෙන යන කොට එන අභියෝගවලට මුහුණ දීලා ඒ වැඩේ සාර්ථක කරන්න අවස්ථාව දෙන්න. මේක මගදී කකුලෙන් ඇදලා කඩලා දාන්න එපාය කියලයි මම කියන්නේ. අපි එකඟයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සමහර කට්ටිය ඉන්නවා ගේම් ගහන කට්ටිය. ඉසුර දේවප්‍රිය මේ සභාවත් එක්ක ගේම් ගහන්නේ නැහැ. හැබැයි, ගේම් ගහන කට්ටියට පොඩි අවුලක් තිබෙනවා. හැබැයි, මේ සභාවේ මේ ඉන්න මන්ත්‍රීවරුන්ට අපිත් එක්ක ගේමක් නැහැ. අනික් එක මම මේ කුණු සමාගම් එක්ක ගේම් ගහන්නේ නැහැ. ගේම් ගහන අයට පොඩි හිතේ අමාරු තිබෙන්න පුළුවන්. හැබැයි, අපි මේ වැඩේ වගකීමක් ඇතිව, ජනතාව දැනුවත් කරලා, ජනතාවගේ එකඟතාවය අනුව ක්‍රියාත්මක කරනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු භාපතිතුමනි, අපි කියන්නේ කරුණාකරලා ඉතා ඉක්මණින් මේ ගිවිසුම අත්සන් කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවදුරටත් කථා කරන්න දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගිවිසුම අත්සන් කරන්න. සභාව දැනුවත් කරලා ඒක කරන්න එපැයි. ඒක පෙන්න පෙන්න කල් අදින්න එපා කියලයි අපි කියන්නේ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රධාන ඇමතිතුමාගේ උපදේශක කාරක සභාවේදී මන්ත්‍රීවරු හැටියට අපි ඉල්ලීමක් කළා. දිස්ත්‍රික්ක තුනේම ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වලා මුල් මාස පහේ එක් එක් අමාත්‍යාංශවල ප්‍රගතිය බලන්න අවස්ථාවක් ලබා දෙන්නය කියලා. මොකද ඒකට හේතුව, මීට ඉහතත් ඒ කියන්නේ, ගිය අවුරුද්ද කාලයේත්, ගිය අයවැය ඉදිරිපත් වන කාලයේත් මේ අමාත්‍යාංශවල තිබුණු අඩුපාඩු ගැන අපි මේ සභාව තුළ කථා කළා. ඒ වාගේම ඒ සභාව තුළ කථා කිරීමේදී සියලුම සංඛ්‍යා ලේඛනත් එක්ක අපි ඉදිරිපත් කළා. නැවතත් මීට ඉහතත් මම පෙබරවාරි මාසේ 21 වැනිදා පළාත් සභාව තුළත් මේ ගැන සාකච්ඡා කළා. ඒ වාගේම මෙතැන ඒ අවශ්‍ය කරුණු ටික දැක්වුවා. නමුත් මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාව සහ සභාව දැනුවත් කරනවා. මොකද, 2016 අවුරුද්ද තුළ මේ ප්‍රගති සමාලෝචන රැස්වීම දිස්ත්‍රික්ක තුනේම පවත්වන කොට ප්‍රධාන ඇමතිතුමාගේ අමාත්‍යාංශය සහ අනෙකුත් අමාත්‍යාංශවල 2016 ප්‍රගතිය පෙන්නුවා. ඒ ප්‍රගතිය පෙන්වීමේදී අපි දැකපු දෙයක් තමයි 2016 අවුරුද්දට විතරක් වෙන් කළ ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 5829 යි. ඒ වාගේම 2016 ට අනුමත කර ගත් මුදල ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 5792 යි. ඒ වාගේම දෙසැම්බර් 31 වන දිනට සියලු ව්‍යාපෘතිවලට වැය කළ මුදල රුපියල් මිලියන 5121 යි. එතකොට අපි මුල ඉඳලා බැලුවොත් ලැබුණු ප්‍රතිපාදන මුදලින් අනුමත කර ගන්න බැරි වුණු මුදලක් තිබෙනවා. රුපියල් මිලියන 36 ක්. ඒ වාගේම අනුමත කළ මුදලින්, වැය කළ මුදලින් ඉතිරි මුදල රුපියල් මිලියන 670 යි. ඒ වාගේම දෙසැම්බර් මාසේ 31 වන කොට එක් එක් මුදල් මූලාශ්‍ර අනුව රුපියල් මිලියන 160 ක වැඩ කර ගන්න බැරිව ගියා. මුළු මුදල විතරක්, ගිය අවුරුද්දේ විතරක් ගරු සභාපතිතුමනි, රුපියල් මිලියන 870 ක් ඉතිරි වුණා. රුපියල් මිලියන 870 ක් ගිය අවුරුද්දේ ඉතිරි වුණා. ඒ නිසා තමයි අපි ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළේ මේ මාසේ - මොකද, අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී පෙන්නුවා, ගිය නොවැම්බර් මාසෙයි, දෙසැම්බර් මාසෙයි විතරක් ව්‍යාපෘති 2256 කට, රුපියල් මිලියන 1560 ක් වියදම් කරන්න අනුමත කළෙත් මාස දෙක ඇතුළත. ඒ නිසා තමයි වැඩිම වශයෙන් මුදල් ඉතිරි වෙන්න සහ මේ රුපියල් මිලියන 870 ඉතිරි වෙන්න ප්‍රධාන හේතුව බවට පත් වුණේ. අන්න ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ගිය වසරේ අපි මීට ඉහතත් ප්‍රකාශ කළා. උපදේශක කාරක සභා හැටියට අඩුම උපදේශක කාරක සභා සංඛ්‍යාවක් පවත්වා තිබෙන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය. ගිය අවුරුද්දේ බැලුවොත් අපි -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

දෙකම කළුතර.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දෙකම කළුතර. මොකද, ගිය අවුරුද්දේ පවත්වලා තිබෙන්නේ අධ්‍යාපනයේ උපදේශක කාරක සභා පහයි. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා හයයි. එතකොට ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවධානය යොමු කරනවා. මේ කාර්ය පටිපාටි රීතිවල 83 වන රීතියේ තිබෙනවා, සෑම උපදේශක කාරක සභාවක්ම අඩුම වශයෙන් දින 30 කට වරක් රැස් විය යුතුයි කියලා. අද මේ අවුරුද්ද වෙන කොට බලන්න මොකද තත්ත්වය කියලා. මේ වසරේ මේ වන කොට අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා එකයි මාස පහකටම. සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා දෙකයි. මේ මාස පහටම. ගරු සභාපතිතුමනි, අපි අහනවා මේකේ වගකීම භාර ගන්නේ කවුද? අධ්‍යාපනය කියන්නේ,

[ගරු මෙරිල් පෙරේරා]

අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ටික ලබා දීම, අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ටික ලබා දීම, ඒ වාගේම පාසල්වල තිබෙන අඩුපාඩු ගැන කථා කිරීම, විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්න, ගුරුවරුන්ගේ ප්‍රශ්න, කලාප මට්ටමෙන්, කොට්ඨාශ මට්ටමෙන් මේ ප්‍රශ්න ටික විසඳාගන්න තිබෙන එකම අවස්ථාව තමයි උපදේශක කාරක සභාව.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අනික් අමාත්‍යාංශ කියන්න. ඒවාත් කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අනික් අමාත්‍යාංශ කියනවා. පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාට දැන ගන්න ඕනෑ ටිකක් කියවන්නම්. ඔබතුමාට අත්‍යවශ්‍යව තිබෙනවා නම් ඉතිරි ටිකත් සොයා ගන්න. එහෙම නැත්නම් කට වහගෙන ඉන්න. එතකොට ගරු සභාපතිතුමනි, -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහ ඇමතිතුමාගේ පිට අත ගාන්න පුළුවන් නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මහ ඇමතිතුමා කාගේවත් පිට අත ගාන්නේ නැහැ. මහ ඇමතිතුමා නිසා තමයි ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මේවා දැන ගන්න පුළුවන් වුණේ. අපි මේවා ඔප්පු කරලා පෙන්නුවා එදා රැස්වීමේදී. එහෙම නැත්නම් එහෙමවත් නැහැ. අපි ඒක තමයි ගරු සභාපතිතුමා මගින් එතුමාගෙන් ඉල්ලන්නේ, මේකට වග කියන්නේ කවුද? මේ පළාත් සභාව තුළ මාස පහකට එක සභා වාරයක් තියෙනවා නම්. අනික ගරු ප්‍රධාන අමාත්‍යතුමා මහජන දිනයට ඉන්නවා. ගිහිල්ලා මන්ත්‍රීවරයෙකුට හම්බ වෙන්න පුළුවන්. ප්‍රශ්නයක් කථා කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ඇත්ත.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම ගිහිල්ලා හම්බ වෙලා කථා කරන්න පුළුවන්. මෙතුමන්ලා උපදේශක කාරක සභාවෙත් නැහැ. පැහැදිලිව කියනවා නම්, මෙතුමා ගියවර කණ්ඩායම් රැස්වීමට ආවෙත් නැහැ. නාඩා එකේ ගුරු පත්වීම් ටික ගරු ආණ්ඩුකාරතුමාත්, ගරු ප්‍රධාන ඇමතිතුමාත් එක්ක දීලා කණ්ඩායම් රැස්වීමට කථා කරන්න එන්නේ නැහැ. කොතැනද කථා කරන්නේ එතකොට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒගොල්ලොන්ගේ කණ්ඩායම් රැස්වීමට යනවාද එතකොට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාගේ කණ්ඩායම් රැස්වීමටවත් යන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසා තමයි අපි කියන්නේ, මේකේ දුර්වලකම නොවෙයි. ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීම කරන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාගේ මාර්ගයෙන් අපි ඉල්ලීම කරන්නේ. මේ වැඩ සටහන් ක්‍රියාත්මක නොකර, අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා රැස්වීම තියන්නේ නැත්නම්, ප්‍රගති සමාලෝචන රැස්වීම බලන්නේ නැත්නම්, මේ අවුරුද්දෙත් වෙන්නේ වෙන් කරපු මුදල් ඉතිරි වෙන එක විතරයි. මේ වන කොට ව්‍යාපෘති අනුමත කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. අනුමත කරපු මුදල්වලට මේ වන කොට ව්‍යාපෘති අංක දුන්නාට, ගිහිල්ලා බලන්න. කිසිම ආයතනයක 80% ක් වැඩ පටන් අරගෙන නැහැ. ප්‍රගතියක් නැහැ. එහෙම භය නැතිව ප්‍රකාශ කරනවා. මොකද, තවත් ඔබතුමාට එක පණිවුඩයක් කියන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙන්න අමාරුයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. මෙතුමාගේ අමාත්‍යාංශයෙන් මීගමුව කලාපයට 2016.09.06 වැනි දින ලිපියක් ඇරලා තිබෙනවා, 2017 සංවර්ධන යෝජනා එවන්නය කියලා. 2017 සංවර්ධන යෝජනා ටික 2016.10.03 වැනිදාට එවනවා, අමාත්‍යාංශයට. ඒ අමාත්‍යාංශයට එවපු සියලු වාර්තා ටික පැත්තක තියලා, එතුමා මීගමුව කලාපයට මුදල් ටික අරිනවා, අර සම්පූර්ණ ව්‍යාපෘති නැතිව, එතුමාට හිතවත් කවුරු හරි අත්සන් කරපු ව්‍යාපෘති ටිකක් අනුමත කරලා අරිනවා. එතකොට අපට පැහැදිලිව පේනවා. මේ ව්‍යාපෘති ගන්න ඒවා පැත්තක. මුදල් අනුමත කරන්නේ - තමන්ට හිතුමතේ ව්‍යාපෘති අනුමත කරලා තිබෙනවාය කියලා මේකෙන් පැහැදිලිව පේනවා. ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ. මේකට කවුරු හරි වගකියන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමතිතුමා, ඕක මෙරිල්ගෙන් අහලා කරන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මිනිස්සු කථා කළා. මේ කථා කරපු ඒවාට වගකියන්නේ නැත්නම් ගරු සභාපතිතුමාගෙන් අහනවා, ඔබතුමාට තිබෙනවා මේ රීති යටතේ උපදේශක කාරක සභා පවත්වාගෙන යාමට නීතියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන් මට තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නීතිය ක්‍රියාත්මක කරන්නය කියලා ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. දැන් ගරු මන්ත්‍රීතුමා ගොඩක් කරුණු කාරණා පැහැදිලි කළා. මටත් තිබෙනවා, එක කාරණාවක් මේ ගරු සභාවට කියන්න ඕනෑ. මටත් ලැජ්ජයි. ඔබතුමා කියපු රීතිය යටතේ මගෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් විස්තර ඇහුවා, මේ උපදේශක කාරක සභා සම්බන්ධව. ගොඩක් ඒවා ලැබුණා. අධ්‍යාපන අමාත්‍යාංශයේ මම ලේකම්තුමාට පෙබරවාරි මාසයේ ලිපියක් ඇරියා ලේකම්තුමාගේ අත්සනින්. මට වාර්තාවක් දෙන්න කියලා. පසුගිය කාලය තුළ උපදේශක කාරක සභාව රැස්වීමට සම්බන්ධ වුණේ නැති මන්ත්‍රීවරු සම්බන්ධයෙන්. කිසිම උත්තරයක් නැහැ. ඊට පස්සේ දෙවන සිහි කැඳවීමත් අමාත්‍යාංශයේ ලේකම්තුමාට යැව්වා. ඒකටත් තවම උත්තරයක් නැහැ. නමුත් මට එදා ලේකම්තුමා හමු වෙලා කිව්වා, උත්තර ඇරියා කියලා. අමූලික බොරු මේ කියන්නේ. මම දැන් ලේකම්තුමාගෙන් ඇහුවා. උත්තරයක් ආවේ නැහැලු තාම. උත්තර ආවේ නැහැ. උත්තරයක් ආවේ නැහැ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන්. පසුගිය මාසයේ 16 පෙත්සම් කාරක සභාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා තීරණයක් ගත්තා, ළමයෙක් ඇතුළත් කිරීම සම්බන්ධව. ඒ දරුවා ඇතුළත් කරන්න නිර්දේශයක් දුන්නා. මේ ගැන පුළුවන් නම් පරීක්ෂණයක් පවත්වන්නය කියලා. ලේකම්තුමාට යවපු ලියුම මම 26 වැනිදා අහනකල්ම ඒ ලියුම නැහැ. වෙච්ච දෙයක් නැහැ. තවමත් උත්තරයක් නැහැ. ඉතින් මෙහෙම යන්න පුළුවන්ද? ඇමතිතුමා අසරණ වෙන්නේ. වෙන කවුරුවත් නොවෙයි. මේ හැම ප්‍රශ්නයෙන්ම අසරණ වෙන්නේ අධ්‍යාපන ඇමතිතුමා. ලේකම්තුමාට ලියුමක්

[ගරු සභාපතිතුමා]

ඇරියාට පස්සේ ලේකම්තුමාට කියන්න බැහැ මම දැක්කේ නැහැයි කියලා. අපේ නීති නිලධාරිතුමිය සභා ගර්භයේ ඉන්නවා. එතුමිය කථා කරලත් ලේකම්තුමාට කිව්වා. පස්සේ බලන කොට ඒ ලියුම විෂය කරන නිලධාරිතුමියගේ මේසය උඩ තිබුණා. එහෙම නොවෙයි වෙන්න ඕනෑ. මේ ලේකම්තුමා මොකක් හරි උත්තරයක් එවන්න ඕනෑ අපට. පෙත්සම් කාරක සභාව කියන්නේ මම විතරක් නොවෙයි. මහජන නියෝජිතයෝ සම්බන්ධ වන තැනක්. එහෙම නම් ජනතාව පෙත්සම් ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ නේ? මේවාට උත්තරයක්වත් නැත්නම් පෙත්සම් ගේන්න ඕනෑ නැහැ නේ? ඒ නිසා මේක තේරුම් ගන්න ඕනෑ. ඔබතුමා ඇමතිවරයා වශයෙන් අසරණ වෙනවා. මොකද, මේ ප්‍රශ්න ඔක්කොම එන්නේ ඔය හේතුව නිසා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලේකම්ට අවවාද කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේක දැන ගන්න කිව්වේ. මම යවපු ලියුමට තවම උත්තරයක් නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇමතිතුමා නොවෙයි අසරණ වෙන්නේ. බස්නාහිර පළාතේ දරුවෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දරුවෙකු ඇතුළත් කිරීම සම්බන්ධව පෙත්සමක් ආවාට පස්සේ, පෙත්සම විභාග කරලා දෙන නිර්දේශය ක්‍රියාත්මක කරලා උත්තරයක් එන්නේ නැත්නම් ලේකම්තුමාගෙන් මේ පෙත්සම් කාරක සභාව තේරුමක් නැහැ නේ? ඒ තීන්දු අරගෙන වැඩක් නැහැ නේ? මූලාසනයට වාඩි වෙලා, වියදම් කරලා, ස්ථාන පරීක්ෂණයක් කරලා මේවා කරලා වැඩක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේවා සොයලා බලන්න. ප්‍රධාන ලේකම්තුමාත් මේ සභා ගර්භයේ ඉන්නවා. ඇත්තෙන්ම අපට ලැජ්ජයි මේවා මේ සභා ගර්භය තුළ ප්‍රසිද්ධියේ කියන්න. මේවා කියන්න ලැජ්ජයි. තව ගොඩක් දේවල් තිබෙනවා, මට කියන්න අධ්‍යාපන අමාත්‍යාංශය ගැන. කරුණු ගොඩක් තිබෙනවා. හැමෝම ලැජ්ජ වෙන්න ඕනෑ.

මීළඟට අධ්‍යාපන පරිපාලනය සහ බස්නාහිර පළාතේ අනාගතය ගැන ප්‍රකාශ කිරීමට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම මීට කලිනුත් මේ අධ්‍යාපන පරිපාලනය බිඳ වැටීම ගැන කථා කළා. මම විශ්වාස කරනවා, ඒකේ මේ අද කථා කරන්නේ දෙවැනි පරිච්ඡේදයයි කියලා. උපදේශක කාරක සභාව ඊයේ රැස් කරන්න නියමිතව තිබුණා. පස්සේ අවසාන මොහොතේ ඒක කල් දානවාය කියලා දැනුම් දුන්නා. සාධාරණ හේතුවක් තිබෙනවා. මොකද, පෙරෙයිදා රාත්‍රියේ මම ඇමතිතුමාට කථා කළා. මම කිව්වා, ඇමතිතුමා මේ සැරේ උපදේශක කාරක සභාව අනිවාර්යයෙන් තියන්න. මොකද, අපට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා කථා කරන්න කියලා. පාසල් වශයෙන් තිබෙනවා, මගේ ළඟ ෆයිල් 12 ක්. ලිපි ගොනු 12 ක්. එතකොට අවාසනාවකට එතුමා කිව්වා, හෙට එස්.බී. දිසානායක ඇමතිතුමා එනවා. මගේ පළාතේ රැස්වීමක් තිබෙනවා. මේ වෙච්ච හානිය ගැන. පිළිගන්නවා. ඔබතුමන්ලාට විශාල හානියක් සිද්ධ වුණා. ඔබතුමාගේ පවුලේ අයත් නැති වෙලා තිබෙනවා. ඒ සියල්ල හරි. හැබැයි, මේ කියන කාරණා ඔබතුමා එක කනකින් අරන් අනික් කනින් එළියට දාන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එපා. ඒක හරි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පසුගිය මාස කිහිපයේම ගරු ඇමතිතුමනි, ඔබතුමා කළේ ඒකයි. අපි ඔබතුමාගේ එක කනක් පිරෙන්න කියනවා.

බණිනවා. නොසෑහෙන්න බණිනවා. බැණලා ඔබතුමා කියන්නේ මල්ලී, මට තේරෙනවා ප්‍රශ්නය. එහෙම නේ කියන්නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

එහෙමයි කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම කිව්වා. ඔබතුමාටත් කිව්වා නේද එහෙම.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කිව්වා. කිව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කිව්වා නේ? ඒක නේ? ගරු සභාපතිතුමනි, එහෙම කියලා -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

උඹ කියන දේ තේරෙනවා බං.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තේරෙනවා බං. මට තේරෙනවා මල්ලී. හැබැයි, ගරු සභාපතිතුමනි, අධ්‍යාපනයේ - අපි මේ වග කියන්න ඕනෑ අපේ අනාගතයට. අපේ දරුවන්ගේ අනාගතයට. අපි මෙතැන ඇවිල්ලා සටන් කරන්නේ ප්‍රතිපත්ති හදන්න. මේ රට නිවැරදි මාර්ගයට ගන්න. රට හරි තැනට ගෙනියන්න ඕනෑ. අධ්‍යාපනය හරි තැනට ගෙනියන්න ඕනෑය කියලා කථා කරනවා කෙස් පැලෙනකල්. හැබැයි, අවසානයේ බැලුවාම, ප්‍රතිඵල දිහා බැලුවාම අපි ආපස්සට ගිහිල්ලා. අපි කනගාටු වෙන්න ඕනෑ. පසුගිය වසර කිහිපය ඇතුළත බොහෝ ප්‍රදේශවල, විශේෂයෙන් මම ජීවත් වන කොළොන්නාවේ අධ්‍යාපනය දිහා බැලුවාම ඉතාම පල්ලෙහා මට්ටමට වැටිලා. ඊයේ මගෙන් කෙනෙක් ඇහුවා, ඇත්තටම මේ පළාත් සභාවේ අධ්‍යාපනය බලන්නේ නැද්ද කියලා. ඇහුවේ, අපේ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා. මම වගකීමෙන් කියන්නේ. එතුමාව ඊයේ රාත්‍රියේ හම්බ වුණු වෙලාවේ මට කිව්වා. මේ පළාත් සභාවේ අධ්‍යාපනය බලන්නේ නැද්ද? බලන්න කෝ අපේ පළාතේ ඉස්කෝලවල ප්‍රතිඵල පල්ලෙහාම මට්ටමට බැහැලාය කියලා එතුමා ඉස්කෝලයක නමකුත් කිව්වා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක බරපතළ තත්ත්වයක්. මේ පසුගිය කාලයේ මෙතුමාගේ වැඩ සියල්ල අසාර්ථකයි. මම මුහුණටත් කියනවා. මෙතැන සභාවේදීත් කියනවා. එක පැත්තකින් ඔබතුමාට පාලනය කර ගන්න බැහැ. නිලධාරීන්ට ඕනෑ දේ නිලධාරීන් කරනවා. විදුහල්පතිවරුන්ට ඕනෑ දේ විදුහල්පතිවරු කරනවා. අපේ පළාත් සභාවේ ඉන්න සමහර මන්ත්‍රීවරු, මන්ත්‍රීවරුන්ට ඕනෑ දේ කරනවා. ඉස්කෝලවලට බැහැලා. අධ්‍යාපනයට බැහැලා. සමහරු වළං කඩේට පැන්න ගොනා වාගේ දඟලනවා. කලාප අධ්‍යක්ෂවරු තවත් මොනවාදෝ කරනවා. මොනවා වෙනවාද දන්නේ නැහැ. මම ගිය සුමානේට ඉස්සෙල්ලා සුමානේ මෙතුමාටත් කථා කළා. ලේකම්වරුන්ට කථා කළා. අධ්‍යක්ෂවරුන්ට කථා කළා. පෙබරවාරි 28 වැනිදා අලුත් ගුරුවරියකට දෙනවා පත්වීම. සති දෙකකට පස්සේ තව කොහේද කැළේ ඉස්කෝලෙකට මාරු කරලා දානවා. එතකොට මේ ඉස්කෝලේ පස් වන පන්තියට උගන්වන්න ගුරුවරයෙක් අවුරුදු ගණනාවක් හිටියේ නැහැ. කොළොන්නාවේ තිබෙන දුර්වලම ඉස්කෝලයක්. වෙහෙරගොඩ කනිෂ්ට විද්‍යාලය. මේ ගුරුවරිය මාරු කරලා. බලන කොට අන්තිමට ශ්‍රී ලාල් නෝනිස් මැතිතුමාගෙන් ඇහුවාම, එයා ඉන්නේ වෙන කොහේද? අභ්‍යාවකාශයේ තැනක ඉන්නේ. එයාව සොයන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පුටුව අප්සෙට් ඒකයි. පළාත් අධ්‍යක්ෂකගේ පුටුව අප්සෙට්. ඒකයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඇඳලා. තමන්ගේ ජොබ් එක දන්නේ නැහැ. අනේ මොකටද මෙහෙම නිලධාරීන්. එතුමාගෙන් ඇහුවාම කියනවා, අනේ මම දන්නේ නැහැයිලු. මේ ගුරුතුමිය එතුමාගේ ඉස්සරහාට ගියාම කෑත විධියට බැණලා එළවනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත. ඇත්ත. කතන්දරය ඇත්ත. මටත් පැමිණිලි තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමා මගෙන් ගුටි කන්න ගියේ. මෙතුමා බේරා ගත්තේ. මෙතුමාගේ කාර්යාලය ඇතුළේදී. මම කිව්වා, මෙතුමාට කථා කරන කොටම මම ඕකාගේ අණ්ඩක් කඩනවාය කියලා. සමාවෙන්න ගරු සභාපතිතුමනි, මෙහෙම කිව්වාට. අපි නිලධාරීන්ට ගරු කරනවා. අපි හොඳට වැඩ කරන නිලධාරීන්ට, ජනතා නියෝජිතයින්ගේ හැඟීම් තේරුම් ගත්ත නිලධාරීන්ට අපි ගරු කරනවා. මම කිසි දවසක කාර්යාලයට ගියොත් කවුරුහරි නිලධාරියෙක් නැගිට්ටොත් මම බැනලා එන්නේ. මම කියනවා, තමුන්නාන්සේලා නැගිටින්න ඕනෑ නැහැ දේශපාලඥයින්ගේ ඉස්සරහා. හැබැයි, තමුන්නාන්සේලාගේ වැඩේ හරියට කරන්න. එහෙම නිලධාරීන්ට අපි ගෞරව කරන එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ පාසල්වල විදුහල්පතිවරුන්ට ඕනෑ දේවල් කරන්න දෙන්න එපා. කොට්ඨාශ අධ්‍යක්ෂවරුන්ට ඒගොල්ලන්ට ඕනෑ දේවල් කරන්න දෙන්න එපා. ඒ වාගේම මන්ත්‍රීවරුන්ට, මෙතුමා අර ලූලා නැති වලට කණයා පණ්ඩිතයා වාගේ මෙතුමා නැති තැන ඒකේ සමහර අපේ මන්ත්‍රීවරු - සමාවෙන්න මෙහෙම කිව්වාට. අපි ඔගොල්ලෝ ඔක්කොම සහෝදරයෝ. මමත් ඒ වැරැද්ද කරනවා ද මම දන්නේ නැහැ. මට පේන්නේ නැහැ. හැබැයි, සමහරු නම් කරනවා. මගේ සහෝදර මන්ත්‍රීවරු. මට පේනවා. ගිහිල්ලා තමන්ට ඕනෑ දේවල් ඉස්කෝල්වල කරනවා. අර එක මන්ත්‍රීවරයෙක් - මෙතුමා නැහැ. මම නැති නිසා නම කියන්නේ නැහැ. ගිහිල්ලා මාළඹේ රාහුල විද්‍යාලයට ගිහිල්ලා රෙදි ගැලවෙන්න කිඳෙල්පිටියට බැණලා එනවා. බැණලා විතරක් නොවෙයි. පාසල් සංවර්ධන සමිතියේ නිලවරණයට මැදිහත් වෙනවා. නිලවරණය පවත්වන්නේ එතුමා. එතුමා පවත්වලා හිටපු නිලධාරීන් ආ.. දැන් හරි නේද? ඔන්න එහෙම නම් හිටපු නිලධාරීන් පත් කර ගත්තා කියලා ආපහු එනවා. මහ ඇමතිතුමාට මම කිව්වා. ඇමතිතුමාට කිව්වා. ලේකම්තුමා අන්න ඉන්නවා. ලේකම්තුමාට කිව්වා. පස්සේ මම කථා කරලා ලේකම්තුමාගෙන් ඊට ඇහුවාම, ලේකම්තුමා කියනවා. මන්ත්‍රීතුමා මට තීරණයක් ගන්න බැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

කොයි මන්ත්‍රීවරයාද කියලා දැන ගත්තොත් හොඳයි නේද? අනික් අය ඔක්කොම -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුරුවත් නොවෙයි. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා. මගේ ළඟ CD පටය තිබෙනවා, ඉස්කෝලේ ඇතුළේදී මට බැනපු එක. මම ඕනෑ නම් ඔබතුමාගේ කාර්යාලයට එවන්නම්. හරිද? ගරු සභාපතිතුමනි, ඒ නිසා කරුණාකරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ නිසා කරුණාකරලා ගරු සභාපතිතුමනි, - කමක් නැහැ. අද පරිච්ඡේදය වහන්නම්. ඊළඟ සභා වාරයේදී ආයිත් ඊළඟ පරිච්ඡේදය අරින්නම්. ඒ නිසා කරුණාකරලා ගරු මහ ඇමතිතුමනි, ගරු සභාපතිතුමනි, කරුණාකරලා මේකට මැදිහත් වෙන්න. නැත්නම් යන්න පුළුවන් ඊට ඉහළම තැන්වලට ගෙනියනවා. අනතුරු අඟවනවා. මම දන්නවා, මේ වැරදි ටික පෙන්නුවාට පස්සේ මේ සභාවේදී අපට යම් තීරණයක් ගන්න පුළුවන්. ඊළඟ බජට් එකට නම් එන්න එපා ගරු ඇමතිතුමනි. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අද මම පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ පැහැදිලි කරන්න බලාපොරොත්තු වෙන්නේ, මේ කසළ කළමනාකරණය විධිමත්ව සිදු නොවීමත්, ඒ වාගේම මේ බස්නාහිර පළාත තුළ සිදු වන අනවසර සහ අවිධිමත් ඉදිකිරීම් නිසා ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වය පිළිබඳවත් කරුණු පැහැදිලි කරන්න. විශේෂයෙන්ම මේ පිළිබඳව මේ සභාවේ මීට මොහොතකට කලින් අවධානය යොමු වුණා. කසළ කළමනාකරණය සම්බන්ධ කාරණය පිළිබඳව නැවත නැවත අපි අවධාරණය කරන්න අවශ්‍ය නැහැ. අද කසළ විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. එය නිරාකරණය කිරීම සහ ඒ සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක අවශ්‍යතාවය පිළිබඳව කිසිදු ගැටළුවක් නැහැ. නමුත් අපි කියන්න ඕනෑ. මේ ප්‍රශ්නය පිළිබඳව විවිධ තර්ක විතර්ක ඉදිරිපත් කරමින්, ඒ වාගේම ගොඩ වෙදකම් ඉදිරිපත් කරමින් සමහර අය කාලය නාස්ති කරන්න උත්සාහ කරනවා. මේ කාලය ඇවිල්ලා විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. විද්‍යාඥයින්ගේ, තාක්ෂණවේදීන්ගේ, ඒ වාගේම ඒ විෂය සම්බන්ධ විශේෂඥයින්ගේ කාල පරිච්ඡේදයක් මේ තිබෙන්නේ. ආපදා කළමනාකරණය, කසළ කළමනාකරණය, ඒ වාගේම නාය යාම්, ගංවතුර තත්ත්වයන් සහ විශේෂයෙන්ම ලෝකය පුරා ඇති වෙමින් තිබෙන මේ කාලගුණික, දේශගුණික විපර්යාස සම්බන්ධ කරුණුවලදී විශේෂයෙන්ම විශේෂඥයින්ගේ සහ විද්‍යාඥයින්ගේ දැනුම මතයි මේ පිළිබඳව තීන්දු තීරණ සහ ප්‍රතිපත්ති තීරණය කරන්න වෙන්නේ. ඒ නිසා අපි කියන්නේ, මේ කාරණය කඩිනමින් අප විසඳිය යුතුයි. කාලය නාස්ති කළ යුතු නැහැ. මොකද, දැන් මේ දිනවල අපි වැඩිපුරම ගං වතුර ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරනවා මේ. මීට මාස කිහිපයකට කලින් අපි මීතොටමුල්ල ගැන පැය ගණන් කථා කළා. දින ගණන්, සති ගණන් අපි කථා කළා. නමුත් දැන් ඒක අමතක වෙලා තිබෙනවා. හරියට මේක අර වඳුරෝ ගෙවල් හදනවා වාගේ. වැස්සට වඳුරෝ ගෙවල් හදනවා වාගේ තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

ඒ නිසා අපි පැහැදිලිව කියන්නේ, දැන් මේ කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි. මුළු රට පුරාම ඇති වෙලා තිබෙන මේ කැළි කසළ අර්බුදයේදී විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ තමයි වැඩියෙන්ම කැළි කසළ උත්පාදනය වෙන්නේ. ඒ නිසා මේ කැළි කසළ වෙන් කිරීම පිළිබඳ කාර්යාවලිය සම්බන්ධයෙන් කසළ වෙන් කිරීම අනිවාර්යයි කියලා බස්නාහිර පළාත් කොමසාරිස්වරිය චක්‍රලේඛයකින් සියලුම පළාත් පාලන ආයතනවලට දැනුම් දීලා තිබෙනවා. අපි දැන ගන්න කැමැතියි, මේකේ ප්‍රගතිය මොකක්ද කියලා. පැහැදිලිව දැන් මේ කසළ කළමනාකරණය වීමක් සිදු වෙනවාද? කසළ වෙන් කිරීමක් සිදු වෙනවාද? දිරාපත් වන කසළ සහ ඒ වාගේම දිරාපත් නොවන කසළ සම්බන්ධයෙන් පැහැදිලි වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක වෙනවාද? ඒ වාගේම අවසාන වශයෙන් මේ කැළි කසළ බැහැර කරන ස්ථානය කුමක්ද කියන එක පැහැදිලිව හඳුනාගන්න ඕනෑ. ඒ නිසයි අපි කියන්නේ, මේ සම්බන්ධයෙන් දැන් අවසාන වශයෙන් විසඳුමකට ඇවිල්ලා තිබෙනවා. මධ්‍යම රජයත්, කැබිනට් මණ්ඩලයත්, ඊට අදාළව තිබෙන අමාත්‍යාංශයත් සමඟ පුළුල් සාකච්ඡාවකින්, එකඟතාවයකින් ආයෝජකයෝ හඳුනාගෙන තිබෙනවා. ඔවුන්ගේ හැකියාව, ඔවුන්ගේ ධාරිතාව, ඔවුන්ගේ තාක්ෂණය පිළිබඳව පුළුල් සාකච්ඡාවක් ඇති කරලා අවසාන ඉමට ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් ඇයි මේක තවත් ප්‍රමාද කරන්නේ. මම පිළිගන්නවා. මේ පිළිබඳව මහජන නියෝජිතයින් විධියට අපි දැනුවත් විය යුතුයි. ඒ පිළිබඳව අපට සාමාන්‍ය දැනුමක් තිබෙනවා. නමුත් මේ සම්පූර්ණ විශේෂඥ දැනුම අපට ලබා ගන්න පුළුවන්කමක් නැහැ.

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

ඉසේ කැක්කුමක් හැදුනාම අපි දන්නවා පෙනඩෝල් එක බොන්න ඕනෑය කියලා. නමුත් අපි හෘදය සැත්කම් කරන්න දන්නේ නැහැ. වකුගඩු සැත්කම් කරන්න අපි දන්නේ නැහැ. ඒ නිසා මේ විෂය පිළිබඳව විශේෂඥභාවයක් තිබෙන අය දෙන තීන්දු තීරණ මත මේ කටයුතු ඉදිරියට කර ගෙන යන්න කඩිනමින් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන එකයි මගේ අදහස. එහෙම නැතිව මේක කඩාකප්පල් කරන්නවත්, මේක Spoil කරන්න, මේක අවුල් කරන්නවත් කරන කථාවක් නොවෙයි. ගරු මහ ඇමතිතුමා මේකේ සම්පූර්ණ ගෞරවය ලබා ගන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ. මේකේ අපි කාටවත් ගේම් ගහන්න අවශ්‍ය නැහැ. විවෘත භාවයකින්, විනිවිද භාවයකින් මේ කටයුත්ත සිදු විය යුතුයි කියන එකයි අපි කියන්නේ. ඒ නිසා මීතොටමුල්ල කුණු කන්ද, ඒ වාගේම මුතුරාජවෙලට ගෙනියන්න බලාපොරොත්තු වෙන කැළි කසළ, ඒ වාගේම කරදියාන, ඒ වාගේම ගම්පහ දඹුවත්ත කියන ප්‍රදේශයේ දැනට හඳුනාගෙන තිබෙන මේ කසළ ව්‍යාපෘති සම්බන්ධයෙන් කඩිනමින් ගිවිසුම්ගත වෙලා ආයෝජකයින් සමඟ මේ වැඩ පිළිවෙළ ආරම්භ කරලා ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් මේ භයානක උවදුර, මේ භයානක ආපදා තත්ත්වයෙන් අපේ රට නිදහස් කර ගන්න. ඒ වාගේම බස්නාහිර පළාත නිදහස් කර ගන්න කටයුතු කරන්නය කියන එක ඉල්ලීම කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ අනවසර, අවිධිමත් ඉදි කිරීම් 1800 ක් තිබෙනවා. මේ සම්බන්ධව පසුගිය කාලය පුරාම මේවාට අනුමැතිය ලබා දුන්නේ නගර සභා, ප්‍රාදේශීය සභාවලින්. එහෙම නම් ඒ බලය නැවත වතාවක් නාගරික සංවර්ධන අධිකාරියට ලැබිලා තිබෙන බව ඇත්ත. නමුත් මේ අනවසර, අවිධිමත් ඉදි කිරීම් පිළිබඳව අනිවාර්යයෙන් සොයා බලලා, මේකෙන් විශාල විපත්තිදායක තත්ත්වයක් ඇති වෙන්න කලින් - අපි දැක්කා වැල්ලවත්ත ප්‍රදේශයේ උත්සව ශාලාවක ඇති වුණු තත්ත්වය. ඒකෙන් ජීවිත කිහිපයක් නැති වුණා. විශාල පිරිසක් තුවාල ලැබුවා. එවැනි තත්ත්වයන් ඉදිරියේදීත් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මේ අනවසර ඉදිකිරීම්, අවිධිමත් ඉදිකිරීම් කඩිනමින් ඉවත් කරන්න බස්නාහිර පළාත් සභාවේ සම්පූර්ණ ආශිර්වාදය, අනුග්‍රාහය ලබා දීලා මේ ආපදා තත්ත්වයක් ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් එක වළක්වා ගැනීම සඳහා පිළියම් යෙදීම සඳහා කටයුතු කරන්නය කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආශිර්වාදය ඉල්ලනවා. හැබැයි, -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කඩන්න ගියාම ඒකට හැමදාම බාල්දිය දානවා නේ? (බාධා කිරීම්) කඩන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන් තමයි. දැන් මේ ඊයේ පෙරෙයිදා නේ ඒක ගත්තේ. එතකල් ඕවාට කවුද අනුමැතිය දුන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

නගර සභාවලින්, ප්‍රාදේශීය සභාවලින් තමයි ඕවාට අනුමැතිය දීලා තිබුණේ. (බාධා කිරීම්)

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආශිර්වාද කරන්න මේක දේවාලයක් නොවෙයි. ඕගොල්ලෝ නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ආශිර්වාද කරන්න කිව්වේ, ඒකට බකට් දාන්න එපා. බාල්දි දාන්න එපාය කියලා කිව්වේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නීතිය ක්‍රියාත්මක කරන්න. කවුරුවත් බාල්දි දාන්නේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඔබතුමා මේ වෙන වෙන කාගේ හරි - (බාධා කිරීම්)

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කාගේවත් කොන්ත්‍රාත් - (බාධා කිරීම්)

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කාගේවත් කොන්ත්‍රාත් කරන්න එපා. ඔබතුමා, ඔබතුමාගේ රාජකාරිය කරන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

කොළඹ මහ නගර සභාව නීත්‍යානුකූල සැලැස්ම අනුමත කරලා හදපු ඒවා කඩන්න යන්න එපා. වැල්ලවත්ත උත්සව ශාලාව නිසා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කාගේ හරි පිට කහන එකනේ ඔයා කරන්නේ ගිහිල්ලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගෞරවය මෙතුමාට දෙන්න ඕනෑ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගෞරවය එතුමාට දෙන්න ඕනෑ, එතුමා ඒ කාර්යය කරනවා නම්. එතුමාට කරන්න කියලා කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මේක කාලීන ප්‍රශ්නයක් නිසා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කොමිස් ගන්න එපා. (බාධා කිරීම්) කොමිස්වලට සම්බන්ධ වෙන්න එපා. අපි ඒවාත් එළි කරනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගොඩ වෙදකම්වලට, ගොඩ වෙද්දුන්ගේ ගොඩ වෙදකම්වලට, ගොඩ වෙද්දුන්ගේ යෝජනාවලට ඇහුම්කන් දෙන්නේ නැතිව ඒ විශේෂඥයින් කියන දේවල්වලට කටයුතු කරන්න කියලා කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔයයි පායලියි තමයි - (බාධා කිරීම්) ඔය විශේෂඥයෝ ලිස්ට් එකත් පෙන්වන්නම් කෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයට, ඔබතුමා පෙන්වපු කාරණයට දැන් මහ ඇමතුමා ඒකට උත්තරයක් දෙන්න හැදුවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා අවසානයේ අවසන් කරපු කාරණය ගැන උත්තරයක් දිය යුතුයි. බස්නාහිර පළාතේ අනවසර ඉදිකිරීම් කොපමණ සංඛ්‍යාවක් කර තිබේද? ඒ සියලු දේට අපේ පළාත් පාලන ආයතන වාගේම නාගරික සංවර්ධන අධිකාරියත් වගකියන්න ඕනෑ. මොකද, මම පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයෙක්. මෙතැන පළාත් පාලන ආයතනවල හිටපු සභාපතිවරු ඉන්නවා. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිලධාරියෙකු නැතිව කිසිම පළාත් පාලන ආයතනයක් සැලසුම් කමිටුව තියන්නේ නැහැ. කිසිම අනුමැතියක් දෙන්නේ නැහැ. වර්ග අඩි 4000 ට, මේ අමුතුවෙන් නියෝග දාලා UDA එකට ගන්න ඕනෑ නැහැ. කොහොමත් වර්ග අඩි 4000 ට වඩා වැඩි එකක් ආවොත් නගර සභා, ප්‍රාදේශීය සභා - මමත් සභාපතිවරයෙක් හැටියට කමිටුවට ගිහිල්ලා ඒ කාලේ අනුමැතිය අර ගන්නවා. මොකද, සිරිකමල් මන්ත්‍රීතුමා කියන්නේ. එහෙම කළා. මේක හොඳට කර ගෙන ආවා. මෙහෙම කර ගෙන ආපු එක දැන් වැඩේ අල කරලා තිබෙන්නේ. මට ආශිර්වාද වැඩක් නැහැ. මම මේ සභාවට කියනවා, අපෙන් උදුරා ගත්ත බලතල නැවත පළාත් පාලන ආයතනවලට දෙන්න. ඒ වගකීම අපි ඉෂ්ට කරනවා.

අනික් එක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආචාර්ය, මහාචාර්යවරු මේ ප්‍රවීණයන් ගැන කිව්වා. මම

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

තමුන්නාන්සේලාට ඉතා කනගාටුවෙන් කියනවා. මම මේ කුණු ප්‍රශ්නය විතරක් නොවෙයි. අපි දන්නවා, දැනටමත් කැලණි ගඟ සම්පූර්ණයෙන්ම අපවිත්‍ර වෙලා. කැලණි ගඟ විතරක් නොවෙයි සියලුම ගංගා. මම මේකට පදනම් ආයතනයට මන්ත්‍රීවරු කැඳෙව්වා. කැඳවලා සාකච්ඡාවක් තිබ්බා. මේ රටේ ඉන්න ආචාර්ය, මහාචාර්යවරු ගෙනාවා, පදනම් ආයතනයට. මාර්තු 22 වැනිදා මේකේ රිපෝට් එක ගන්න හිටියේ. මම අපේ GM ගෙන් ඇහුවා, මේ රිපෝට් එක කෝ කියලා. මේ අපේ සම්මතයක් තිබෙනවා. මේක කියන්න ඕනෑ මේ සභාවේ. මට කරන්න දෙයක් නැහැ. මෙය කට්ටියකට අපහාසයක්, අපහසුතාවයක් වෙයි. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, දැන් මේ අපි මොනවා හරි කිව්වාම හිතන්නේ, මේ ආචර්ය මහාචාර්යවරු, මේ සම්බන්ධයෙන් දැනුම තිබෙන අය ගැන නේ මේ රටම කථා වෙන්නේ? විද්‍යාඥයෝ ගැන. ඉංජිනේරුවෝ ගැන. කියන්න කනගාටුයි. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, මේ රිපෝට් එක එන්නේ නැහැ. ආචාර්ය මහාචාර්යවරු ගහගන්නවා. කුහකකම. අපට ආවා නම් අපි ඒ වැඬේ කරනවා නේ? ඔබතුමන්ලා පිළිගන්නවා නේ? ගරු මන්ත්‍රීතුමා, මේකයි අපේ රටේ තත්ත්වය. සමහර අය මේ දේශපාලඥයින්ට ඇඟිල්ල දික් කරනවා. දේශපාලඥයින් හැටියට අපට තිබෙන උනන්දුව මේ රටේ ඒ විෂයයන් පිළිබඳව ඉගෙන ගත්ත අයට නැහැ. ඒගොල්ලෝ රටට ආදරේ නැහැ. ඒගොල්ලෝ ජාතියට ආදරේ නැහැ. මේ පොඩ්ඩක් හරි තිබෙන්නේ දේශපාලඥයින්ට.

දැන් මේ දවස්වල ගං වතුර ගැන TV එක ළඟ ඉඳගන්න පොඩි ළමයෙක් හිතන්නේ මොකක්ද? යකෝ ගං වතුරේ ඔක්කොම වැඩ කරන්නේ මේ රටේ විද්‍යුත් මාධ්‍යයනේ? රජය වැඩ කරන්නේ නැහැ. අගමැතිතුමා වැඩ කරන්නේ නැහැ. ජනාධිපතිතුමා වැඩ කරන්නේ නැහැ. ඇමතිවරු වැඩ කරන්නේ නැහැ. ත්‍රිවිධ හමුදාව, පොලීසිය වැඩ කරන්නේ නැහැ. දිසාපතිලා, ප්‍රාදේශීය ලේකම්වරු වැඩ කරන්නේ නැහැ. මහජන නියෝජිතයෝ නැහැ. දැන් තමුන්නාන්සේලා අපි දැන් දවස් කීයක්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඔක්කොම මාධ්‍ය ආයතන.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේක තමයි සමාජ තත්ත්වය. මේක නිවැරදි වෙන්න ඕනෑ. මම කියන්නේ, දේශපාලඥයෝ නැත්නම් රටක් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මිළඟට කළුතර ගංවතුරෙන් අනාථ වීම පිළිබඳව -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මගේ නම සඳහන් කරපු නිසා කියන්නේ. ඇත්තටම මේ කැලණි ගඟ දූෂණය වීම සම්බන්ධයෙන් කටයුතු කරන්න පියවර ගත්ත එකම ප්‍රධාන ඇමතිතුමා මෙතුමා. එතුමා ඒ කාර්ය අතට ගත්තා. හැබැයි, මේ නිලධාරීන් - එතුමා කියපු විධියට මේ නිලධාරීන්ගේ නම් එළිදරව් කරලා, කවුද කියලා මේ පරීක්ෂණ වාර්තාව යට ගහන නිලධාරීන්ගේ නම් හෙළිදරව් කරලා, මේ සභාව දැනුවත් කරන්නය කියලා මම එතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කළුතර ගං වතුරෙන් අනාථ වූවන් පිළිබඳව සාකච්ඡා කරන්න නන්දන පද්මකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ 2004 සුනාමියෙන් පස්සේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ ඔබතුමාට ඕනෑ තරම් වෙලාව තිබෙනවා. කරීක ලැයිස්තුවේ වෙලාව තිබෙනවා.

මීළඟ ප්‍රකාශයත් ඒ වාගේමයි. ගංවතුරෙන් ආපදාවට පත් වූ ජනතාවට සහන සැලසීමේ අඩුපාඩු පිළිබඳව කථා කරන්න ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා අවස්ථාව ඉල්ලා තිබෙනවා. මම හිතන්නේ, ඔබතුමාටත් මේ යෝජනාවේදී කථා කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. තවත් කරුණු තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුව ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. විශේෂයෙන් ගංවතුරෙන්, ස්වභාවික ආපදාවෙන් හානියට පත් වුණු අතුරුදහන් සහ මියගිය - අතුරුදහන් කියන්නෙත් බොහෝ අය මිය ගිහිල්ලා. තුන්සියයකට ආසන්න පවුල්වල අයට අපි අපේ කනගාටුව ප්‍රකාශ කරන ගමන් ලක්ෂ සංඛ්‍යාත ජනතාවකට ඇති වුණු ඒ අවතැන්වීම් සහ ඒ පීඩනයට පත් වීම පිළිබඳව අපි සියලු දෙනාගේ සංවේගය ප්‍රකාශ කරන ගමන්, ඒ ගංවතුර ස්වභාවික ආපදාව වෙලාවේ අපි මේ රටේ දේශපාලඥයෝ විධියට, රජය විධියට, පළාත් සභාව විධියට ඒ වාගේම වගකිවයුත්තෝ විධියට ඉටු කළ යුතු යම් යම් කටයුතු පිළිබඳව මගේ යම්කිසි විවේචනයක් සහ යම් පැහැදිලි කිරීමක් තිබෙනවා.

පසුගිය දිනවල ගරු මහ ඇමතිතුමාත් කිව්වා, මාධ්‍යවලින් තමයි ඇත්තටම මේ දේවල් කරපු බව පේන්නේ කියලා. ඇත්ත. එහෙම එකකුත් තිබෙනවා. හැබැයි, එක් පැත්තකින් රජයක බලධාරීන්ගේ අඩුපාඩුකම් තමයි ඒ මාධ්‍ය හරහා මතු වෙමින් තිබෙන්නේ. විශේෂයෙන්ම ගංවතුරක්, සාමාන්‍යයෙන් ස්වභාවික විපතක් පාලනය කර ගන්න අමාරුයි. නමුත් යම් කළමනාකරණයක් කර ගන්න වගකිවයුතු රජයකට යුතුකමක් තිබෙනවා. දැන් අවුරුද්දක් ඇතුළත තමයි මේ මිනිස්සු දෙවතාවක් යට වෙන්නේ. දෙවතාවක් යට වෙන කොට, ඒ වාගේම මහා දරුණු වර්ෂාපතනයක් එන කොට අගමැතිතුමා නම් කිව්වා, නිලධාරීන් ඒ ආයතනවලින් අපට දැනුම් දුන්නේ නැහැ කියලා. එහෙම නිලධාරීන්ට, ආයතනවලට දොස් කියලා රජයට තමන්ගේ ගෞරවය බේරා ගන්න, එහෙම නැත්නම් රෙදි ගැලවෙන එක නවත්වා ගන්න පුළුවන්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම කළේ නැත්නම් ඒ සම්බන්ධව යම්කිසි පියවරක් අරගෙන ඒ ආයතනවලට කටයුතු කරන ගමන් ක්ෂණිකව මැදිහත් විය යුතු අවස්ථාවන්වල මැදිහත් විය යුතුව තිබුණා. නමුත් මේ ගංවතුර නිසා අද වනකොටත් තවමත් වතුරේ - මගේ ආසනය කඩුවෙල ඇතුළු මේ කොළඹත්, වෙනත් ප්‍රදේශවලත් තවමත් වතුරේ ඉන්න අය ඉන්නවා. ඒ වාගේම ඒ අයට තවමත් යම් පිළිසරණක් ඒ රජයේ ආයතනවල - අපි මහ ඇමතිතුමා හම්බ වෙලා කිව්වේ. අපි මොනවාද කරන්නේ? අපට පළාත් සභාවෙන් මොනවාද කරන්න පුළුවන්. එතකොට පළාත් සභාවේ අපට තිබුණා ආපදා කළමනාකරණය සම්බන්ධ විෂය. යම් විධියකට ඒ විෂය අපට අහිමි වෙලා තිබෙනවා. නමුත් අපට විෂයයක් විධියට ඒක තියෙනවා, අපට ලැබුණු බලතල අනුව. ඒ අනුව අපි තවම කටයුතු කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් මම මහ ඇමතිතුමාට යොමු කරනවා. එතුමා යම් කමිටුවක් දාලා, මේ සම්බන්ධව ප්‍රඥප්තියක් හදන්න සාකච්ඡාවක් කරනවා.

නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව තමයි රටේ තිබෙන පාර්ලිමේන්තුවට නොදෙවෙනි ප්‍රධාන ආයතනය. මේ ආයතනයෙනුත් බොහෝ දේවල් කරන්න පුළුවන්. නමුත් අපට පේන්නේ යම් මැදිහත්වීම් මත යම් යම් පෞද්ගලිකව - මම මගේ මට්ටමින් මැදිහත් වෙනවා. පෞද්ගලික මුදල්, හිතවතුන්ගේ සහාය අරගෙන අපි ගිහිල්ලා ආධාර දීලා, කෑම දීලා, ගං වතුරින් විපතට පත් වුණු අයට සහන දෙන්න කටයුතු කළා, මේ දිනවල. හැබැයි, ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැ. දැන් ගෙවල් කැඩුණු අය විශාල ප්‍රමාණයක් ඉන්නවා කඩුවෙල ආසනයේ විතරක් ගත්තාම මේ වතුරෙන් ආපදාවට පත් වුණු අය අට දහස් ගණනක් ඉන්නවා. ගෙවල් කැඩුණු අය සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම බිත්ති බිමට පාත් වුණු අය ඉන්නවා. එතකොට ඒ අය සඳහා අපට පළාත් සභා මට්ටමින්, අඩු තරමින් නිවාස ආධාරයක්වත් ලබා දීලා, ඒ අයට සහනයක් දෙන්න ක්‍රමවත් වැඩ පිළිවෙළක් පේන්නේ නැහැ. ඒ වාගේම අනික් අතට අපි ඒ අය දුකට පත් වුණාම පෞද්ගලික මට්ටමෙන් - ඒක තමයි මාධ්‍ය කළාය කියලා කියන්නේ. දැන් අපි කරන ඒවා මාධ්‍යවල

[ගරු ජගත් කුමාර]

ගියේ නැහැ. නමුත් මාධ්‍ය තමන් එකතු කර ගත්ත ප්‍රතිපාදන ගිහිල්ලා දෙන කොට ඒගොල්ලන්ගේ චැනල් එකේ වැඩි ප්‍රමාණයක් කාලය දෙන්නේ ඒකට. අපිත් ගත්ත ඒවා ටික ගිහිල්ලා මීඩියා එකට දුන්නා නම්, ඔන්න අපටත් වචනයක් කියා ගන්න තිබුණා. නමුත් අපි ගිහිල්ලා ක්ෂණිකව ඒ තැන්වල මැදිහත් වුණා. ඒ නිසා මේ අඩුපාඩු සිද්ධ වෙන්නේ මාධ්‍ය ඒවා පෙන්වන හින්දා නොවෙයි. ඒක මාධ්‍ය වගකීම. ඒ අය ලොකු උදව්වක් කරන්නේ. රජයේ සේවකයෝ, මාධ්‍ය ආයතන සහ විවිධ පාර්ශව ලොකු වගකීමක් කළා. හැබැයි, ආණ්ඩුවක් විධියට කළමනාකරණය කර ගන්න ඕනෑ තැන් කර ගෙන නැහැ. වතුර බහින්නේ නැත්තේ සමහර අනවසර ඉදිකිරීම් නිසා. දැන් කඩුවෙල ආසනයේ, අපි අද මේක කථා කරන්න ඕනෑකම තිබෙනවා. ඇමතිවරු ගිහිල්ලා කාණු කපන්න ගත්තා. හැබැයි, ඒගොල්ලොන්ගේම කාලයේම මේවා අනුමත කරපුවා. නගර සභාවේ නගරාධිපතිවරයා එතැන බලාගෙන පස්සට වෙලා ඉන්නවා. එතුමාම අනුමත කරපු කාණු නිසා යට වෙලා තිබෙන්නේ. දැන් මේ වතුර බැස ගෙන යන්න අවශ්‍ය ප්‍රමාණයට ඇළ වේලි පද්ධතිය සකස් කරලා, ජනතාවට පහසුකම් සලසනවා නම්, අනික් පැත්තට මෙපමණ දවසක් යට වෙලා ඉන්නේ නැහැ. තවමත් යට වෙලා ඉන්නවා. ඒ අවශ්‍ය කටයුතු සිද්ධ කරන්නේ නැති නිසා. ඒ නිසා අපි වර්තමාන රජයෙන් - රජයේ වගකීමක් තිබෙනවා. අගමැතිතුමාට, ජනාධිපතිතුමාට. එතුමන්ලා වැඩි හරියක් පිටරටවල හිටියා, ගංවතුර අවස්ථාවල. නමුත් ආවාට පස්සේවත් ඇවිල්ලා මේවා සම්බන්ධව මීට වඩා සොයලා බලලා කටයුතු කරන්න ඕනෑ. රජය පැත්තෙන්, පාර්ශවය පැත්තෙන් ඒ කටයුතු සිද්ධ නොවුණු නිසා තමයි මාධ්‍ය සහ අනෙක් අයට ඇඟිල්ල දික් කරන්නේ. හැබැයි, ඒවාත් නොතිබුණා නම්. මිනිස්සු කියන්නේ, මාධ්‍ය නොතිබුණා නම් අපට මොකුත් වෙන්නේ නැහැයි කියලා. දේශපාලඥයොත් කළා. හැබැයි, අර පැත්තත් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඒ මාධ්‍ය සහ ඒ හැමෝටම ස්තුතිවන්ත වෙන ගමන් ඒක මතක් කරනවා.

ඒ වාගේම ගංවතුරත් එක්ක අනිවාර්යයෙන්ම එන උවදුර තමයි ඩෙංගු උවදුර. ඩෙංගු උවදුර වැඩි වෙලා තිබෙනවා. ඒක ඩබල්, ට්‍රිබල් වෙනවා තව ටික දවසක් යන කොට. කඩුවෙල ආසනයේ පසුගිය දින කිහිපයේ විතරක්, මම මේ ගංවතුරට කලින් මරණ හතකට ගියා ඩෙංගු උවදුර හැදිලා තරුණයෝ - අපේ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා ඩෙංගු උවදුරට පත් වුණා. එතුමා එක්ක උණ රෝහලේ හිටපු තරුණයෝ දෙන්නෙක්, අවුරුදු 31 ක හා අවුරුදු 29 ක තරුණයෝ දෙන්නෙක් මිය ගියා. තව අපි දන්නා හඳුනන බොහෝ අය මිය ගියා. මේ කඩුවෙල විතරක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අපේ මහ ඇමතිතුමාට, සෞඛ්‍ය ඇමතිතුමාට විශේෂයෙන් අවධානය යොමු කරනවා. මධ්‍යම ආණ්ඩුව කරන දේ අපි දන්නේ නැහැ. අපට ඒගොල්ලන්ට කරුණු කියලා පෙන්වන්න පුළුවන්. හැබැයි, අපේ අමාත්‍යාංශය, අපේ සීමාව තුළ මීට වඩා දෙයක් කළ යුතුයි. කරන ප්‍රමාණය මදියි කියලයි මගේ හැඟීම. මේ ඩෙංගු උවදුරෙන් විශේෂයෙන්ම මිය ගිය සංඛ්‍යාව මේ අවුරුද්දේ වැඩි වෙලා තිබෙනවා. ඒක කළමනාකරණය කර ගන්න, මන්ත්‍රීවරුන්ගේ අදහස් යෝජනාත් අරගෙන වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එහෙම නැත්නම් ගංවතුරෙන් මැරුණාට වඩා ඊළඟ පියවරේ ඩෙංගු උවදුරෙන් නැවත වතාවක් මිනිස්සු බැට කනවා. එහෙම සිදු වුණොත් ආණ්ඩුවයි, පළාත් සභාවයි විතරක් නොවෙයි. අපි හැමෝම ජනතාවගේ විශාල විවේචනයකට ලක් වෙනවා. ඒ නිසා ඒක කළමනාකරණය කර ගත හැකි උවදුරක්. ඒ සඳහා මැදිහත් වෙන්නය කියලත් ඉල්ලා සිටිනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මම අද පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තුවෙන් නොවෙයි ආවේ. නමුත් මට වාහනයේදී එන කොට හිතුනා, මේ අපි එන්නේ බස්නාහිර පළාත් සභාවට. ඔබතුමන්ලා කියනවා වාගේ, මේ පාර්ලිමේන්තුව වාගේ එකකට අපි මේ එන්නේ. එහෙම එන කොට මට හිතුනා, මේ පළාත් සභා ක්‍රමය ඇති කළේ 1988 දී. මම මේ නියෝජනය කරන්නේ හය වන පළාත් සභාව. මේ පළාත් සභාව නියෝජනය කරන්න එන මම අවබෝධ කර ගත් දෙය තමයි, පළාත් සභා ක්‍රමය තුළ පොලිස් බලතල හා ඉඩම් බලතල විතරයි නැත්තේ. අනික් ඕනෑ දෙයක් මේ පළාත් සභාවට කරන්න පුළුවන් කියන විශ්වාසයක් අපට තිබුණා. ඒ නිසා අපි මේ පළාත් සභාවට ආවා. හැබැයි, මට කාරණයක් තිබෙනවා. මම මේ පළාත් සභාවට ඇවිල්ලා - පළාත් සභාවේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් නියෝජනය කරනවා අත්තනගල්ල ආසනය. මේ තුන්

දෙනා එක හෙළාම කිව්වා, අපේ පළාතේ තිබෙන රෝහලේ පාලන අධිකාරිවරයාව මාරු කරන්නය කියලා. ඒක ප්‍රසිද්ධියේ කරපු ප්‍රකාශයක්. හැබැයි, තව වන තුරු මාරු කරන්න පුළුවන්කමක් නැහැ. කියන උත්තරය තමයි ඔහු පත් කරන්නේ, මධ්‍යම රජයෙන් කියලා. එහෙම නම් මධ්‍යම රජයෙන් තමයි - බස්නාහිර පළාතෙන් බෙහෙත් ටික දෙනවා. බස්නාහිර පළාතෙන් පාලනය කරනවා. ප්‍රධානියා පත් කරන්නේ මධ්‍යම රජයෙන්. අපි ඒක පිළිගත්තා, ඒකට අපට කරන්න දෙයක් නැහැයි කියලා. ඒ වාගේම අපි කෘෂිකර්ම අමාත්‍යාංශයට බද්ධ වෙලා වැඩ කරන මන්ත්‍රීවරු. අපට ඇළ කපන්න පුළුවන්. වී ටික දෙන්න පුළුවන්. හැබැයි, කුඹුරේ අයිතිය අපට නැහැ. එතකොට කෘෂිකර්ම නිලධාරීන්ට උදව් කරන්න පුළුවන්. ගොවි ජන සේවා නිලධාරියාට උදව් කරන්න පුළුවන්කමක් නැහැ අපට. ඒකත් මධ්‍යම රජයට ගිය කාරණයක්.

දැන් මෙතැන මේ ඇති වන ප්‍රශ්නය. මම එදත් කිව්වා, මේ කසළ ප්‍රශ්නය අයිති පළාත් පාලන ආයතනයට. ඒක නියාමනය කරන්නේ බස්නාහිර පළාත් සභාව. එතකොට අද මධ්‍යම රජය මේකට අතපොවලා, ඒ කාර්යය ඉටු කරනවා. මහ ඇමතිතුමා කරන්න උත්සාහ කරන කොට, මධ්‍යම රජය කියනවා. නැහැ, අපි මේක කරන්නට ඕනෑ කාරණයක්. එතකොට එතැන ගැටුමක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි නාගරික සංවර්ධන අධිකාරිය. පළාත් පාලන ආයතන නැති යුගයක - තමන්ට බලය දුන්න විධියක් තිබෙනවා. පළාත් පාලන ආයතනවලට. අභිනියෝජන බලය දුන්නා. ඒ දුන්න ක්‍රමයට ගන්නේ නැතිව, ඒක නැවත ලියුමකින් පවරා ගත්තා අධිකාරිය. පර්චස් 40 ට අඩු ඉඩමක් අනු බෙදුමක් කරන්න, මිනින්දෝරුවෝ ඇඳලා දුන්නත්, මේ නාගරික සංවර්ධන අධිකාරියට ගියාම රු. 10,000 ක් ගෙවන්නට ඕනෑ. මේ අපි සතු බලතල. එතකොට මේ බලතල දීලා, එහෙම නැත්නම් වරලත් ඉංජිනේරුවරයෙක් අත්සන් කරන්නට ඕනෑ. ගම්පහ දිස්ත්‍රික්කයේ, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ඉන්නේ පස් දෙනයි. ආයතන 13 ක, 14 ක කාර්යය කරන්නට ඕනෑ. මේකෙන් අසරණ වෙන්නේ ජනතාව. අපි සතු බලය ඒ අය බලෙන් උදුරා ගෙන තිබෙනවා. බස්නාහිර පළාතේ පාසල් තිබෙනවා, මේ ගම්පහ දිස්ත්‍රික්කයේ 519 ක්. දරුවෝ ඉන්නවා, තුන් ලක්ෂ පනස් දාහකට ආසන්න ප්‍රමාණයක්. ගුරුවරු ඉන්නවා, 14,280 ක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එක අතකට සතුටු වෙනවා. මධ්‍යම රජයේ අධ්‍යාපන ඇමතිතුමා මේ රටේ තිබෙන මේ අවදානම් තත්ත්වය තුළ යම් ප්‍රදේශවල පාසල් ටික වහන්න තීන්දු කළා. හැබැයි, මම කනගාටු වෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කයට මේ ජල ගැල්මෙන් කිසිම ආපදාවක් සිද්ධ වුණේ නැහැ. මා නියෝජනය කරන අත්තනගල්ල ආසනය ඕනෑ තරම් ජල ගැලීම් සිදු වන ප්‍රදේශයක්. අපට ජල ගැල්මෙන් කිසිම හානියක් සිද්ධ වුණේ නැහැ. මේ ගම්පහ දිස්ත්‍රික්කයේත් පාසල් ටික වහලා දාන්න තීන්දු කළා. මේ මම දෙමව්පියෙකු වශයෙන්, පියෙකු වශයෙන් මම කනගාටු වුණා. අනේ දරුවන්ට පාසල් යන්න තිබෙන දවස් තුන. එක දවසක් නම් අපට රටේ අවධානම හින්දා ගත්ත තීන්දුවක් කියන්නට පුළුවන්. ඒකට අපි ගරු කරන්නට ඕනෑ. හැබැයි, දෙවැනි දවස කාලගුණය යහපත් වුණා. තුන් වන දවසේ යහපත් වුණා. බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමතිතුමා අපි මොන විධියට විවේචන කළත්, ඔහු තීන්දුවක් ගත්තා. පාසල් ටික අරින්නට ඕනෑ කියලා. අධ්‍යාපන ලේකම්තුමා ලියුමක් ඊමේල් කළා. ලියුමක් දැම්මා මේ පාසල් ටික අරින්න කියලා. මධ්‍යම රජයේ ඇමතිතුමා කියනවා, ඔවුන්ට ඕනෑ විධියට මේ පාසල් අරින්න ඕනෑකමක් නැහැ. අපි මේ ගෙදර පුටුවේ ඉඳගෙන මේ ප්‍රවෘත්තිය අහනකොට, අපි කොහේද නියෝජනය කරන්නේ.

අපි මේ නියෝජනය කරන්නේ බස්නාහිර පළාත් සභාව. මේ රටේ පොලිස් බලතලයි, ඉඩම් බලතලයි නැති අනික් බලතල සියල්ල තිබෙන පළාත් සභා නියෝජනය කරන අපට අනේ කියලා හිතුනා. අපට නිකම් ලැජ්ජාවක් වාගේ තිබෙනවා. ලේකම්තුමා, ඇමතිතුමා ගත්ත තීන්දුව තඹයකටවත් ඇමතිතුමා ගණන් ගත්තේ නැහැ. මම මේ කියන්න උත්සාහ කරන්නේ, මේ පළාත් සභා ඇති කළේ 1988 දී නම්, පළාත් පාලන ක්‍රමය ඇති කළා නම් අපට වඩා දේශපාලන හස්තයක්, අපට වඩා දේශපාලන බලපුළුවන්කාර අය මේවා නියෝජනය කළා නම්, අදටත් අපට වඩා දැනුමෙන් මුහුකුරා ගිය අය මේවා නියෝජනය කරනවා නම්, ඇයි අපි සතු බලය අපි ඇහට ගන්නේ නැත්තේ. අපි සතු බලය ඇයි අපි ප්‍රඥප්තිවලින් පවරා ගන්නේ නැත්තේ. ඇයි අපි මේ කාටවත් හැල්ලු වෙලා කටයුතු කරන්නේ. අපට තිබෙන බලය ඒ විධියට කටයුතු කළා නම්, අර මධ්‍යම රජයේ චක්‍රලේඛයට යට වෙලා, එකේ පන්තියේ දරුවෝ, ගෙදර ඉන්න දරුවෝ ගෙදර ඉන්න

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

විධියක් නැහැ. මේ දරුවෝ එහෙම නම් පාසල් යන්නට ඕනෑ. ඒ නිසා මධ්‍යම රජය හැම තිස්සේම පළාත් සභාව අතකොළුවක් කර ගෙන තිබෙනවා. දවසින් දවස අපේ බලතල උදුරාගෙන තිබෙනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඔබතුමාට කියන්නේ. අපි මන්ත්‍රීවරු වශයෙන් අපි මේ නියෝජනය කරන්න ආවේ බස්නාහිර පළාත් සභාව. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් පනතක් තිබෙනවා අපට. අභිමත බලය තිබුණා අපට. අපි ඒ කාර්යයන් ඉටු කළා. අපි ඒ කාර්යයන් ඊට එහා ගිය තැනකට ආවේ මේ ප්‍රදේශයේ ජනතාවට වැඩක් කරන්න. ඒ වැඩ කරන අවස්ථාව, අපි අපේ ඒ බලය නිසි ආකාරයෙන් ප්‍රයෝජනයට අරගෙන මේ බස්නාහිර පළාතේ මිනිස්සු වෙනුවෙන් වැඩ කරන්න ඒ අවශ්‍ය පහසුකම සලසන්න සභාපතිවරයා වශයෙන් ඔබතුමාට, මහ ඇමතිවරයා වශයෙන් එතුමාට, ඇමතිවරු වශයෙන් එතුමන්ලාට සහ ප්‍රධාන නිලධාරීන් සියලුම දෙනාට වගකීමක් තිබෙනවා. අනාගතය අපේ අභිමානය ගොඩ නගන්න මේ බස්නාහිර පළාත් සභාව කටයුතු කරයි කියන දැඩි අධිෂ්ඨානයෙන් මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශේෂ කොටම සඳහන් කරන්න ඕනෑ. ලංකාව පුරාම දැන් මේ ආපදා තත්ත්වයන් ගැන කථා කරන කොට එක කොටසක අධික ජල ගැල්මකුත්, තවත් කොටසක බීමට පානීය ජලය නැති ප්‍රශ්නයකුත් තිබෙන විධියට මේ කාලගුණ විපර්යාසය අද ජනතාවට බොහොම බරපතළ විධියට බලපාන්න පටන් අරගෙන තිබෙනවා. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට මේ වන කොට ඉතා සුළු වශයෙන් වැසි ලැබුණත්, පානීය ජලය නැතිව ඉතාම උග්‍ර අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. මම හිතන්නේ, මධ්‍යම ආණ්ඩුව තමයි ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වගකීම මේ වැනි අවස්ථාවක දරන්න ඕනෑ. ඒ වුණත් අපේ පුංචි පළාත් පාලන ආයතන සතු සම්පත් උපයෝගී කරගෙන මේ ජලය සැපයුවත් ප්‍රමාණවත් ආකාරයට ජල සැපයුමක් සිදු කර ගන්න බැරි වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ සභාව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා පෞද්ගලික වියදමෙන් බවුසර් අරගෙන, රියදුරන්ට පඩි ගෙවලා, විශාල වශයෙන් කැප වෙලා ඒ වැඩ කටයුත්ත කරගෙන ගියා. නමුත් දැන් මාස දෙකක් තුනක් වනකල් විශේෂයෙන්ම නම් වශයෙන් කිව්වොත් අපේ උපුල් රාජිත ගරු මන්ත්‍රීතුමා, රජිත හපුආරච්චි මන්ත්‍රීතුමා, ආනන්ද හරිස්චන්ද්‍ර මන්ත්‍රීතුමා - ලලිත් වනිගරත්න ඇමැතිතුමා නම් අමාත්‍යාංශයෙන් බවුසරයක් එව්වා. ලලන්ත මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු තමන්ගේ පෞද්ගලික වියදමෙන්, කැපවීමෙන් වැඩ කළා.

මම මේ අවස්ථාවේ ඔබතුමා හරහා ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. දඩුගම්ඔය සහ මහඔය ජල මූලාශ්‍ර දෙකක් මැදි කරගෙන තමයි මේ ඡන්ද බල ප්‍රදේශය පිහිටලා තිබෙන්නේ. නමුත් එයින් නිෂ්පාදනය කරන ජලය පිටස්තර ප්‍රදේශවලට යැව්වත් මේ ප්‍රදේශවල මිනිස්සු වතුර නැතුව අද දුක් විඳිනවා. මෙය ඉතාමත් දැඩිව බලපාන නිසා මම නැවතත් මතක් කරනවා ෆවුසි ඇමැතිතුමාටත්, ජල කළමනාකරණ ඇමැතිතුමාටත් මම ලිපියක් භාර දීලා කඩිනමින් මේ කොට්ඨාශයට ජල සැපයුම ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. මා කියන්නේ, වෙන කිසිම දෙයකටත් වැඩිය, ආහාරවලටත් වැඩිය මනුස්සයෙකුට පානීය ජලය වැදගත්. අද වනකොට අපි වසර 20 ක පාලනයක් අවසන් කරලා නව පාලනයකට පත් වුණා. ඒ වසර 20 තුළ මිනිස්සුනට පානීය ජලයවත් දීලා නැහැ. ඉතින් මේ සියලුම ප්‍රශ්න නව රජයට තමයි විසඳන්න වෙලා තිබෙන්නේ. ඒ වාගේම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ජල ටැංකි ලබා දුන්නා. ආපදා අමාත්‍යාංශයට බල කරන්නේ නැතුව පළාත් සභාවත් කැපවෙලා ජල ටැංකි ලබා දීලා අපේ මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීමෙන් මේ සහනදායී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ සියලු දෙනාට ස්තුති කරන ගමන්ම මේක පැලැස්තර දාමින් ඉන්න පුළුවන් දෙයක් නොවෙයි. මේකට තිබෙන හොඳම විකල්පය තමයි දැනට අපේ ජල මූලාශ්‍රවල ජලය ඇති වෙන්න තිබෙනවා. මේ බෙදා හැරීමේ ක්‍රමවේදය ජල කළමනාකරණ ඇමැතිතුමා මගින් ඉෂ්ට වෙන්න ඕනෑ. ඒ නිසා මම මධ්‍යම රජයේ අවධානයට යොමු කරනවා. හැකි ඉක්මණින් - මම හිතන්නේ, අපි යෝජනා දීලා තිබෙනවා. අවුරුදු තුනකට කලින් මෙයට කොපමණ වියදමක් යනවාද? ජලය ඉල්ලුම් කරන අය කොපමණ ප්‍රමාණයක් ඉන්නවාද? ලක්ෂ 2 ½ ක විතර ජනතාවක් ඉන්නවා. එම නිසා අපි මෙතැන මොනවා කථා කළත් වැඩක් නැහැ. අපි මොන තනතුරු දැරුවත් වැඩක් නැහැ.

පළාතේ මිනිස්සුන්ට බොන්න වතුර ටිකක් දුන්නේ නැත්නම් ආණ්ඩු බලය සහ මොනවා තියාගෙන හිටියත් වැඩක් නැහැ. ඒ නිසා මම දැඩිව මධ්‍යම රජයට අවධාරණය කරනවා. කඩිනමින් මේ ජල සැපයුම ලබා දෙන්න කියලා. මේ පළාත් සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා පක්ෂ විපක්ෂ නැතුව දැක් වූ දායකත්වයට මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

**ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු යටතේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙනවා කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ වාහන ගාල් කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

## කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
## THE BYLAW PARKING VEHICLES IN COLOMBO ADMINISTRATIVE LIMITS

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කරන ලද,*

*කොළඹ මහ නගර සභාවට විසින් 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය යටතේ සාදනු ලැබූ, කොළඹ මහ නගර සභා සීමාව තුළ වාහන නැවැත්වීම තහනම් කිරීම, නවතා තැබීම සඳහා නැවතුම් ස්ථාන ඇති කිරීම සහ විධිමත් කිරීම, ගාස්තු අය කිරීම හා පැහැර හැරීම පාලනය කිරීම සඳහා විධිවිධාන සලසා ගැනීම සඳහා පනවනු ලබන, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි "වාහන ගාල් කර තැබීමේ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථා,*

*ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ ස්ථිර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි, යන යෝජනාව කරමින්ම එකී අතුරු ව්‍යවස්ථාවන්, මෙම පළාත් සභාවට 2017.04.04 දින ඉදිරිපත් කර ඇති අතර,*

*ඉදින් එහිදී ගත් තීරණය පරිදි, 2017.04.18, 2017.04.25 සහ 2017.04.26 යන දිනවල පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේදී, ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර එම අතුරු ව්‍යවස්ථාවේ සියලුම වගන්තීන් සංශෝධනය කිරීමටත් හා නව වගන්ති ඇතුළත් කිරීමටත් නිර්දේශ කළ අතර, එම නිර්දේශිත සියලු සංශෝධනයන්ද ඇතුළත්ව සකසන ලද සංශෝධන සහිත අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ද ඇමුණුම 01 ලෙස ඇතුළත් වූ එම ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව 2017.05.23 දින මෙම පළාත් සභාවට පිළිගන්වන ලද හෙයින්, මෙහි පෙර කී අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ලද එම කාරක සභා නිර්දේශ පිළිබඳව ද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ මේ යෝජනාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. මීට පෙර අවස්ථා කිහිපයකදීම ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කළා. එහි කිසිම ප්‍රශ්නයක්

[ගරු සභාපතිතුමා]

නැහැ. අතුරු ව්‍යවස්ථාව න්‍යාය පත්‍රයේ ඇමුණුම 01 වශයෙන් තිබෙනවා. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ ඒ සංශෝධනයන්ට යටත්ව තමයි එකඟතාව විමසන්නේ. ඒ නිසා මේ පිළිබඳව සභාවේ ගැටළුවක් නැහැ නේද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය, සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දින කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා සහ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනා දෙකක් ඉදිරිපත් කරල තිබෙනවා. මගේ නිල කාමරයේදී ඒ පිළිබඳව සාකච්ඡා කරලා එකඟතාවයකට ආවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ ගංවතුර ආපදාව සම්බන්ධ යෝජනාව ඉරිපත් කිරීමටත්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කිරීමටත් එකඟතාවය ලැබුණා. ඒ අනුව මම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, "*පොදු වැදගත්කමින් යුක්ත වූද, පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි*" යෝජනා කරමි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාතේ සහ අනෙකුත් පළාත් වල පසුගිය දිනවල ඇදහැළුණු වර්ෂාපතනය නිසා ඇති වූ ගංවතුරෙන් සහ නායයෑම් වලින් මියගිය හා අවතැන් වූ ජනතාවට බස්නාහිර පළාත් සභාව තම කනගාටුව පළ කර සිටින්නීය.*"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම එම යෝජනාව සංශෝධන සහිතව ස්ථිර කරන්න කැමැතියි. මගේ සංශෝධනය වන්නේ, "*පසුගිය දින කීපය තුළ ඇති වූ නායයෑම හා ජල ගැලීම් තුළින් බස්නාහිර පළාත තුළ පමණක් පවුල් 55,962 ක්ද, පුද්ගලයන් වශයෙන් ගත් කළ 212,971 ක් ආපදාවට ලක් වූ අතර අතුරුදහන් 50 ක් හා මියගිය 65 ක් වන අතර අතුරුදහන් හා මියගිය අය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක්ද සම්පූර්ණයෙන් ජලයෙන් යට වූ නිවාස සඳහා මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට රුපියල් 50,000/- ක මුදලක්ද කඩිනමින් පළාත් සභාවෙන් ලබා දෙන ලෙස පළාත් සභාව යෝජනා කර සිටින්නීය.*"

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කියන්නේ ඔබතුමා අදහස් කරන්නේ එක පවුලකටද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔව්. සම්පූර්ණයෙන් ජලයෙන් යට වුණු එක පවුලකට රුපියල් 50,000/- ක දීමනාවක් බස්නාහිර පළාත් සභාවෙන් ලබා දෙන්න කියලා මම මේ යෝජනාවට සංශෝධනයක් හැටියට ගේනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතිය. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 11.50]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ සංශෝධන යෝජනාව මෙම සභාවේ ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඒක ලොකු දෙයක්. එයට එකඟ වෙමින්, පසුගිය දවස්වල කළුතර දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය ඇතුළත්ව බස්නාහිර පළාත් සභාවේ විශේෂයෙන්ම බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශයේ අපේ ජනතාව, මේ අධික වර්ෂාව නිසා ඇති වුණු නායයෑම් තුළින් වතුරට ගසාගෙන යෑමෙන්, ඒ වාගේම කඳු කඩා වැටීම් ආදී සියල්ලක්ගෙන්ම ජීවිත විනාශ කර ගත්තා. දේපළ අහිමි කර ගත්තා. ඒ වාගේම සියලු යාන වාහන සහ සතා සිවුපාවා පවා මේ ආපදාවට ලක් වුණා. ඒ පිළිබඳව මම මුලින්ම මගේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාට අපි දුරකථනයෙන් කථා කළා. කථා කළාම එතුමා එදාට පසුවදාම කළුතර දිස්ත්‍රික්කයට ඇවිත් සාකච්ඡාවක් ආරම්භ කළා. පළාතේ මහ ඇමැතිතුමා ඒ අවස්ථාවට සම්බන්ධ වෙමින් අපේ අමාත්‍යවරුන් වන ගාමිණී තිලකසිරි ඇමැතිතුමා, ඒ වාගේම රංජිත් සෝමවංශ ඇමැතිතුමා, ලලිත් වනිගරත්න ඇමැතිතුමා, සුමිත් ලාල් මැන්දිස් ඇමැතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා පක්ෂ භේදයකින් තොරව මේ වැඩ කටයුත්තට දායකත්වය ලබා දීම පිළිබඳව මම මේ සභාවට ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේකට පෞද්ගලික අංශය, ඒ වාගේම රාජ්‍ය නිලධාරීන් මේ සියලු දෙනාම දායකත්වය ලබා දීලා කැපවීම පිළිබඳවත් මම ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම පවුල්වල මියගිය සියලු දෙනාටම, ඒ පවුල්වල ඥාතීන්ට බස්නාහිර පළාතේ ශෝකය ප්‍රකාශ කරන ගමන්ම අපට කථා කරන්න ලොකු දෙයක් තිබෙනවා. මේ ඛේදවාචකයට ලක් වුණු ජනතාවට අපි මුදල්වලින්, දේපළවලින් සියල්ලටම වන්දි ගෙව්වත් මේ මිනිස්සුන්ගේ ජීවිතවලට ජීවිතයක් ලබා දෙන්න අපට පුළුවන්කමක් නැහැ. ගරු සභාපතිතුමනි, මම දකින්නේ මේකට මූලික හේතුව බවට පත් වෙලා තිබෙන්නේ, අපි මේ රටේ නිදහස් ලබා ගන්න කොට අපේ රටේ තිබුණු ස්වභාව ධර්මය, සම්පත් සහ ස්වභාව ධර්මයෙන් අපේ ආරක්ෂාවට ලබා දීපු ඒ සියලුම දේපළ මේ රටේ ජීවත් වන මිනිසුන් වශයෙන් අපි දවසින්, දවස විනාශ කරලා, කැලෑ කපලා, කඳු කපලා, නොයෙකුත් ගල්බෝර දාලා ගල් වෙඩි පත්තු කරලා ඇති වුණු හානිය නිසා ස්වභාව ධර්මය මිනිසාට කියලා දුන්නා ස්වභාව ධර්මයට ආදරය නොකරන මිනිස්සුන්ට මෙන්න දෙන දඬුවම කියන එක. එලෙස දඬුවමක් හැටියට තමයි අපේ රටේ මේ වාගේ ආබාධිත තත්ත්වයන්වලට ලක් වන ජනතාවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක මම මුලින්ම ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම මේ ව්‍යසනය ඇති වුණු අවස්ථාවේදී අපේ පළාත්වල තිබුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිසාපති ලේකම් කාර්යාලය, ඒ වාගේම ග්‍රාම සේවා නිලධාරී මහත්මයාගේ පටන් අනෙකුත් සියලුම නිලධාරීන් පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා මේ අයගේ බඩගින්න නැති කර ගැනීම සඳහා පිසූ ආහාර, වියළි ආහාර නොයෙකු වශයෙන් ලබා දීලා, මේ ව්‍යසනයට ලක් වුණු ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරන්න වැඩ කටයුතු කළා. අපේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා, අමාත්‍ය මණ්ඩලය විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ බුලත්සිංහල ආසනය නියෝජනය කරන අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා මම දැක්කා කොට කලිසමක් ඇඳගෙන එතුමාගේ මහජන නියෝජිතත්වය ඉතාමත්ම ඇගයීමකට ලක් කරමින් එතුමා ඒ වැඩ කටයුත්ත ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් අපි මතක් කරන්න ඕනෑ. එහෙම නම් ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාව හැටියට මේ ව්‍යසනයට ලක් වුණු ජනතාව දිහා බැලුවාම මේක එකක් නොවෙයි. කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා ඔක්කෝම කිව්වා, මීතොටමුල්ල කුණු කන්ද ගැන. ඒ වාගේම නියඟය ආවාම නියඟයට වේලිලා වතුර නැති වෙලා, රතුපස්වල ප්‍රදේශයේ ඇති වුණු ඛේදවාචකය. ඒ වාගේම අපි දකිනවා ගංගා ආශ්‍රිතව මේ රටේ නීති විරෝධී ලෙස නීතියෙන් කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබුණත්, ඒවායේ පදිංචිය ඇති කරගෙන, ඒවායේ විශාල ගෙවල් දොරවල් හදාගෙන ජීවත් වන ජනතාව දැනුවත් කිරීමේ කාලය එළැඹ තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. එහෙම නම් අපි මේකට මේ පළාත් සභාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මට මතකයි මේ වාගේ ආපදාවකට ලක් වුණා

[ගරු කිත්සිරි කහටපිටිය]

චන්ද්‍රිකා කුමාරතුංග ප්‍රධාන අමාත්‍යවරිය මේ සභාවේ ඉන්න කාලේ. රංජිත් සෝමවංශ අමාත්‍යතුමා මට මතකයි එදා මධ්‍යම ආණ්ඩුව පාලනය කළේ එක්සත් ජාතික පක්ෂය. පළාත් ආණ්ඩුව පාලනය කළේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. මෙතුමා එක්කරගෙන ගියා බදුරලියට. ගෙනිහිල්ලා රුපියල් ලක්ෂයක ගණනේ නිවාසයක් කැඩුණු හැම පුද්ගලයෙකුටම ලබා දෙන්න මේ පළාත් සභාවේ හදිසි ආපදා අරමුදල උපයෝගී කරගෙන වැඩ කටයුතු කරන්න පුළුවන්කමක් එදා තිබුණා. එහෙම නම් අද අර මන්ත්‍රීවරු ගණනාවක් කථා කරලා කිව්වා, මෙවැනි දෙයක් වුණාම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ සංශෝධනයේ පෙන්වන්නේ අඩුම ගාණේ රුපියල් 50,000 කවත් එවැනි යම්කිසි දෙයක් ඒ ජනතාවට ලබා දෙන කටයුත්තක් හදන්න කියලා. මම ඔබතුමාගේ මාර්ගයෙන් මේ සභාවට මතක් කරන්න කැමැතියි ආපදා කළමනාකරණය පිළිබඳ අමාත්‍යාංශයක් මධ්‍යම ආණ්ඩුවේ තිබෙනවා. අපේ පළාත් සභාවේ මේ ආපදා කළමනාකරණය කරන ප්‍රඥප්තිය අපට තවම හදා ගන්න බැරි වුණු නිසා මේ ප්‍රදේශයට ඇති වුණු ඛේදවාචකයට මුහුණ දුන්නු මියගිය ජනතාවට ලබා දීම ක්‍රියාත්මක කරන කොට ප්‍රමාද වෙනවා. ජීවත් වන ජනතාවට ඒ ලබා දීමේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරවීමේදී, ඒ දේවල් ක්‍රියාත්මක කරන්න ගියාම පළාත් සභාව අසරණ වෙනවා. අනෙක් පැත්තෙන් මේකට මුහුණ දෙන ග්‍රාමීය මට්ටමේ අපේ පළාත් නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරු 104 දෙනාම අපහසුතාවයකට පත් වෙනවා, මෙවැන්නක් මේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක නොවී, ඒ ප්‍රඥප්තිය අපට හදාගන්න බැරි වීම පිළිබඳව. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු සභාවට ඉදිරිපත් කරනවා. මේ පිළිබඳව ඉතාමත්ම ඉක්මණින් කඩිනම් තීරණ අරගෙන මෙවැනි විපර්යාස වුණු පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාත් සභාව මේකට වැඩ කටයුතු කරන්න පුළුවන් ප්‍රඥප්තියක් හදා ගැනීමට කටයුතු කරන්න කියන යෝජනාවත් මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අපි නියෝජනය කරන්නේ කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය. හොරණ මැතිවරණ කොට්ඨාශයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය. ඒ වාගේම අගලවත්ත, බණ්ඩාරගම, මිල්ලනිය යන ප්‍රදේශවල මෙවැනි ඛේදවාචකයකට ලක් වුණු බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනතාවගේ ජීවන තත්ත්වය පිළිබඳව අපට කථා කරන්න මේ සභාවේ අපේ හඬ අවදි කළත් අපි අද සතුටු වෙනවා ප්‍රධාන ඇමැතිතුමා, අමාත්‍යවරු හතර දෙනා ඇතුළු හැකි හැම මන්ත්‍රී කෙනෙක්ම ඇවිදින් මේ ඛේදවාචකය දැක්කා. බුලත්සිංහල පාහියංගල ප්‍රදේශයේ ඇති වුණු ඛේදවාචකය. ඒ ඛේදවාචකය වෙනුවෙන් ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ඊයේ උදේ පාන්දර ඒ ප්‍රදේශයට ඇවිදින් ඒ වාගේම ජනාධිපතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට විශේෂයෙන්ම පාහියංගල ප්‍රදේශයට ඇවිදින් එතුමාගේ තනතුර ගැන හිතන්නේ නැතුව, එතුමාගේ ආරක්ෂාව ගැන හිතන්නේ නැතුව එතුමා පයින් ඇවිදගෙන හැම ගෙදරකටම ගිහිල්ලා, ඒ මිනිස්සුන්ගේ දුක සැප විමසලා, මේ පෞද්ගලික අංශයෙන් ලබා දීපු උපකරණ බෙදා දීලා එතුමා තීරණයක් අරගෙන මේ ඛේදවාචකය ඇති වුණු ජනතාවට නැවත වාරයක් කළුතර දිස්ත්‍රික්කයේ සහනාධාරය වශයෙන් ලබා දීමට කටයුතු කරන්න කියලා දිසාපතිතුමාට නියෝග කළා. අන්න ඒ වාගේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ජනාධිපතිතුමෙක් අපේ රටේ ජනාධිපති වීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. ඒ වාගේම අර මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා, සමහර දේශපාලඥයෝ ගංවතුර ආවාම රටින් පිට ගියා කියලා ඒ මන්ත්‍රීතුමා කියන්නේ, අගමැතිතුමා ගැන. මම ඒක පැහැදිලි කරන්න ඕනෑ, මේ සභාවට.

ගරු සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා කියන්නේ මේ රටේ පරිණත දේශපාලනයක් ඇති අමුතුම දේශපාලන විපර්යාසයක් කරපු අග්‍රාමාත්‍ය කෙනෙක්. එතුමා මේ ව්‍යසනය ඇති වන අවස්ථාවේ රටේ හිටියා. ඒ මුල්ම දවසේ. අපිත් එතුමා සමග දුරකථන සාකච්ඡාවල් කිහිපයක් කළා. දැනුම් දීම් කළා. එතුමා සාකච්ඡා කරලා, එතුමාට තිබුණු අසනීප තත්ත්වයට හතර වතාවක් - මේ වාගේ වැඩ කටයුතුවල යෙදුණු නිසා අසනීප තත්ත්වය මඟ හැරලා බෙහෙත් ගැනීම සඳහා යෑම නතර කරලා තිබුණා. නමුත් මේ අසනීප තත්ත්වය ඇති වුණු අවස්ථාවේදී එතුමා ගියේ සියලුම අමාත්‍යවරුන් සහ ජනාධිපතිතුමා සමග සාකච්ඡා කරලා. මේ හදිසි ආපදාවෙන් විපතට පත් වුණු ජනතාවට කොහොමද අපි ජාත්‍යන්තරයේ සහයෝගය ලබා ගන්නේ? කොයි ආකාරයෙන්ද මේවා පරිහරණය කරන්නේ? කොයි විධියටද පුද්ගලික අංශය දෙන ආධාර උපකාර ලබා දෙන්නේ? දුක් සොම්නස ඇති කර ගන්න එක

අපට රජයක් හැටියට පාලනය කරන්න බැහැ. ඒක පෞද්ගලික අංශයේ වගකීමක්. අපේ සංස්කෘතියේ හැටියට අපේ රටේ මිනිස්සු ගුණ ධර්ම, සාර ධර්මවලින් පිරුණු මිනිස්සු ආධාර උපකාර ලබා දුන්නා. එහෙම නම් එතුමා ක්‍රියාත්මක කළේ, එතුමාගේ අසනීප තත්ත්වය තියාගෙන ගිහිල්ලා ඒකට ප්‍රතිකාර ලබා ගන්න ගමන්ම මේ රටේ සමහර දේශපාලන පක්ෂවල උදව්ය කිව්වා අගමැතිතුමා රටෙන් පැනලා ගියා. මේ වාගේ ගංවතුරක් එද්දී මහ ඇරලා ගියා කියලා. ඒක නිවැරැදි කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි. මම මේ ආදරණීය මාධ්‍ය ආයතනවලට කියන්න කැමැතියි ඒ වාගේ යම්කිසි කුඨ ව්‍යාපාරයක් දාගෙන පටු දේශපාලන අරමුණක් ඇති කරගෙන වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න හදන්න එපා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එහෙම නම් අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත්, ඒ වාගේම සියලුම අමාත්‍යවරුත් අද තීරණයක් අරගෙන තිබෙනවා මේ ව්‍යසනයට ලක් වුණු ජනතාවටත්, ලක් වෙන්න ඉන්න ශ්‍රී ලංකාවේ ජනතාවටත් මේ ගංගා ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ ඉඩම් රජය සතු කරගෙන, මේ විපතට පත් වුණු ගෙවල්වලට ලංකාවේ ප්‍රථම වතාවට තමයි රුපියල් විසිපන් ලක්ෂයක දීමනාවක් නිවසක් හදන්න උපරිම වැඩ කටයුතු කර ගැනීම සඳහා ලබා දෙන්න රජයක් හැටියට තීරණය කළේ.

ඒ වාගේම තමයි මේ විපතට පත් වුණු, යට වුණු කොටු වුණු සියලුම ජනතාවට තමන්ගේ බඩගින්න නිවා ගැනීම සඳහා දවසක වේලකට රුපියල් 100 ක් ගණනේ වේල් තුනට රුපියල් 300 ක සලාකය ලබා ගෙන ජනතාවට ග්‍රාම සේවා මට්ටමෙන් කොටු වෙලා සිටින ප්‍රදේශවලට ඒ අයගේ ආහාර ද්‍රව්‍ය අරගෙන පිසූ ආහාර ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මෙතෙක් කල් සහනාධාරයක් වශයෙන් තිබුණු රුපියල් 210 ක කොහේදෝ මුදල වැඩි කරලා පළමුවැනි වතාවට ඒ විපතට පත් වුණු ජනතාවට රුපියල් 300 ක් ලබා දීමේ වැඩ කටයුත්ත ක්‍රියාත්මක කරන්න කියලා නියෝගය දුන්නේ අගමැතිතුමයි, ජනාධිපතිතුමයි. ඒ පක්ෂ දෙකක එකතුවකින් ඇති වුණු නිසා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙමින් ඔබතුමා කියන විධියට මගේ කාලය අවසන් වන බැවින් ගොඩක් තව මන්ත්‍රීවරු විස්තර කරාවි. බස්නාහිර පළාත් සභාව මේක උපයෝගී කරගෙන, ඒ ප්‍රඥප්තිය හදාගෙන වැඩ කටයුතු කරන්න ක්‍රියාත්මක වෙමුයි කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.04]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාත් අපේ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු හැටියට මේ යෝජනාව මේ ආකාරයෙන් සංශෝධනය කරලා ගෙන ඒම පිළිබඳව මම බොහොමත්ම ස්තුවන්ත වෙනවා. ඒ වාගේම මේ ගංවතුරෙන් විපතට පත් වුණු ආකාරය පිළිබඳව විග්‍රහ කරන්න මම සූදානම් වෙන්නේ නැහැ. නමුත් මේ ගංවතුර ඇවිල්ලා ජනතාව විපතට පත් වුණාට පස්සේ, ඒ ජනතාව මුහුණ දුන්නු ආකාරය පිළිබඳව මේ ගරු සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා දැන ගන්න ඕනෑ කියන එකයි මා විශ්වාස කරන්නේ. මොකද, මේක අද අපට වෙලා, හෙට තව පැත්තකට වෙලා, හෙට තවත් කෙනෙකුට වෙන්න පුළුවන්. ඒක නිසා අපි පළාත් සභාවක් වශයෙන් මේ සඳහා සූදානම් වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව තමයි මේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරන්නේ. මේ සිද්ධිය වුණු අවස්ථාවේ ඉඳන් අපි බොහොම ස්තුතිවන්ත වෙනවා, ඒ වාගේම ඊට කලින් අපි ශෝකය ප්‍රකාශ කරන්න ඕනෑ. මේ විපතෙන් මියගිය පවුල්වල සාමාජිකයන් අද දුක් වන ආකාරය දිහා බැලුවාට පස්සේ ඒකට අපි ශෝකය ප්‍රකාශ කරන ගමන් ඒ වාගේම මේ සඳහා අර කිත්සිරි කහපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්වරු, අනෙක් නිලධාරීන්, ඒ වාගේම පොලීසිය, ග්‍රාම සේවක මහත්වරු, මේ බහුතරයක් - ඒවා අතරේ අඩුපාඩු තිබෙන නිලධාරීන් කිහිප දෙනෙක් ඉන්න පුළුවන්. නමුත් බහුතරයක් තමන්ගේ රාජකාරියට එහා ගිහිල්ලා තමන් පෞද්ගලික නිදි වරාගෙන මේ ජනතාව නැවත වතාවක් ගොඩ ගැනීමේ මහ දැවැන්ත ව්‍යාපාරයක යෙදුණා. අපි ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. මේ කාරණාව පළාත් සභාවේ දැන ගත්තු ගමන් අපේ පළාත් සභාවේ විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමා අපේ කළුතර ප්‍රදේශයට තුන් හතර වතාවක්, ඊයේ රෑ 07.00 වනකනුත් කළුතර දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ආයතන - ආයතන සැරෙන් සැරේ කුද්ද කුද්ද නියෝජනය කරමින් ඒ පළාත්

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

පාලන ආයතනවල ඉන්න ලේකම්වරුන්ට නියෝග දුන්නා මෙන්න මේ වැසිකිළි පද්ධතිය හදන්න ඕනෑ. මේ ආකාරයෙන් ළිං ඉසින්න ඕනෑ. මේ වාගේ වැඩ සටහනක් ක්‍රියාත්මක වීම පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ඇවිල්ලා ගම් කිපයක ඒ සත්‍ය දැකලා, ඒවාට උදව් පදව් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා පුද්ගලික කොයි ආකාරයෙන් හරි සහන සොයාගෙන, පෞද්ගලික මට්ටමෙන සොයාගෙන අපට පුළුවන් උදව් කළා. ගංවතුර උවදුරට පත් වූ අයට මෙතුමා සායන දාලා සෞඛ්‍ය ප්‍රතිකාර ලබා දුන්නා. ඒක නොවෙයි වැඩේ. මේ ආකාරයට උදව් කළා. නමුත් මේ උදව් කළාට මේකේ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එකයි අපි අහන්නේ? කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන් කාරණා එක්ක මම එක දෙයක් පෙන්වා දෙන්න කැමැතියි. මේ රටේ නීතිය වෙනස් කරන්න ඕනෑ කියන එකයි මම මේ කථා කරලා කියන්නේ. මේ ගංවතුර ආධාර අද අපට වුණාට මීට කලින් මේ අවුරුදු දෙක ඇතුළත ඔබතුමා දන්නවා සාමස්සර කන්ද, එහෙම නැත්නම් අරංතලාවේ කන්ද නාය ගියා. මිනිස්සුන්ගේ ජීවිත විනාශ වුණා. ගෙවල් දොරවල් අහිමි වුණා. ඒ අය මේ සිද්ධියට කොයි ආකාරයෙන්ද මුහුණ දුන්නේ කියන එක පිළිබඳව, දැනී ගියේ කොයි ආකාරයටද කියන එක පිළිබඳව පසු විපරමක් කරලා බැලීමේ අවස්ථාව අද උදා වෙලා තිබෙනවා. ඒ වාගේම කොළඹට ගංවතුර ආවා. තමන්ගේ දේපළ සියල්ලක් විනාශ වුණා. ජීවිත හානි වුණා. ඒ අයට මොකද, වුණේ කියන එක, අපි පළාත් සභාවෙන් මොකක්ද කළේ කියන එක පිළිබඳව නැවත නැවත පසු විපරම් කරලා බලන්න ඕනෑ. ඒ වාගේම සාලාවේ බෝම්බය පුපුරුවා හැරියා. ඒ ආයුධ ගබඩාව විනාශ වුණා. ජීවිත විනාශ නොවුණත් තමන්ගේ දේපළ සියල්ලක් විනාශ වුණා. සියලු දේ අහිමි වුණා. මේ ජනතාව පිළිබඳව අපි නැවත වතාවක් පසු විපරම් කරලා බලන්න ඕනෑ. ඒ අය යථා තත්ත්වයට පත් වුණාද? පත් කළාද? කියන එක පිළිබඳව.

ඒ වාගේම කුණු කන්ද නාය ගියා. මිනිස් ජීවිත විශාල ගණනක් මිය ගියා. මේ මිනිස්සුන්ට නැවත වතාවක් ජීවත් වෙන්න අවසරය අපි දුන්නාද කියන එක පිළිබඳව පසු විපරම් කරලා බලලා කථා කරන්න මේ පළාත් සභාවට පුළුවන්කමක් ලැබෙයිද? අද අපට ගංවතුරෙන් හානි වුණා. සමහර කෙනෙක් හිතයි, ගංවතුර ගලනවා කියලා අපි ඉතිහාසයේ අහලා තිබෙන්නේ මෙහෙම නොවෙයි. අඩියක් ගලනවා. දෙකක් ගලනවා. තුනක් ගලනවා. එතකොට අපට අයින් වෙන්න කාලය තිබුණා. එහෙම එකක් නොවෙයි මෙතැන වුණේ. මහ ගංගාවක් මැදට, මහ ගංගාව ගලා බසින කොට මහ කන්දක් ඇවිල්ලා ගහ වසා ගන්නවා. එතකොට ගහ යනවා ගම හරහා, ඒ වේගයෙන්ම. ඒ යනකොට මේ ගෙවල් දොරවල් කඩාගෙන, මේවා විනාශ කරගෙන ගියා. මම හිතන්නේ බුලත්සිංහල විතරක් පූර්ණ හානිදායක ගෙවල් එකසිය අනූ ගණනක් තිබෙනවා. පූර්ණ හානි කියන්නේ මිනිස්සුන්ගේ ගෙවල් දොරවල් නොවෙයි. මිනිස්සුන්ගේ බඩු මුට්ටු නොවෙයි. මිනිස්සුන්ගේ ඉඩම් කොටස විතරයි. අත්තිවාරම්වත් නැහැ. මේ මිනිස්සුන්ට රජයෙන් කියලා මොකක්ද දෙන්නේ?

ගරු සභාපතිතුමනි, එක වේලකට රුපියල් 100 ගණනේ කෑම උයලා දෙන්න අවසරය තිබෙනවා. හරි. මේක අවිධිමත් ආකාරයෙන්, විවිධ සංවිධාන, විවිධ පුද්ගලයෝ උදව් කරන කථාව පැත්තකින් තියන්න. ඒ අපේ මනුස්සකම. උදව් කළා. ඒක වෙනම කථාවක්. ගරු මන්ත්‍රීතුමන්ලා මේකට ඇහුම්කන් දෙන්න. මම මේ කියන කථාව වෙනස් කරන්න උදව් වෙන්න. ඒක වෙන කථාවක්. රජයේ චක්‍රලේඛ උල්ලංඝණය කරලා වැඩ කරන්න කියලා ඕනෑම නිලධාරියෙකුට ඇඟිල්ල දික් කරලා කියනවා, දේශපාලන නායකයෝ. නමුත් එක නිලධාරියෙක්වත් එහෙම වැඩ කරන්නේ නැහැ. ඇයි? ඒ මිනිස්සුන්ට රැකවරණයක් නැහැ. ඒ නිලධාරීන්ට එහෙම කරන්න රැකවරණයක් නැහැ. පුළුවන් නම් ලිඛිතව දෙන්න. මෙන්න මේ කාල පරිච්ඡේදය තුළදී, මෙන්න මේ සිද්ධියේදී චක්‍රලේඛ උල්ලංඝණය කරලා ඔබ වැඩ කරන්න, ඔබව මම බලාගන්නම් කියලා නායකයෝ ලියමනක් දෙන්න. එහෙම නැතුව මිනිස්සු වැඩ කරන්නේ නැහැ. ඒක නිසා අද සිද්ධ වුණේ, හෙට සිද්ධ වෙන්නේ, එදා සිද්ධ වුණේ ආපදාවක් වුණා නම්, ආපදාව වුණු වෙලාවේ ඉඳන් දින ගණනක් තිබෙනවා. ඒ දින ගණනේ කෑම උයලා දෙනවා. කන්න දෙනවා. උයනවා. ඒකට එක මනුස්සයෙකුට වැය

කරන්න පුළුවන් රුපියල් 100 යි. රුපියල් 100 යි එක වේලකට. වේල් තුනට රුපියල් 300 යි. හරි. මේ ආපදා කාලය ඉවර වුණාට පස්සේ මොකද වෙන්නේ? මතක තියා ගන්න සාමාන්‍ය පවුලකට සතියකට හම්බ වෙන්නේ රුපියල් 800 යි. මම මේ කියන කථාව වැරැදි නම් මගේ මේ උප සභාපතිකමෙන්, මේ මන්ත්‍රීකමෙන් මම ඉල්ලා අස් වෙනවා. රුපියල් 1700 ක් දෙනවා පවුලේ 05 දෙනෙකුට වැඩි නම්. පවුල් සංඛ්‍යාවට තමයි දෙන්නේ. 1700 ට වඩා අඩුවෙන් දෙන්නේ පස් දෙනාට අඩු පවුල්වලට. 1700 කියමු කෝ? පූර්ණ හානියක් වුණු ගෙදරකට රජයෙන් කියලා ගෙවන්නේ රුපියල් 1500 යි. මතක තියාගන්න. පූර්ණ හානි, කෑම, වියළි ආහාර - කෑමට අමතරව මොනවත් දෙන්නේ නැහැ. අර කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කියන්නේ ඒකයි. අඩුම ගණනේ මුලින්ම රුපියල් 50,000 ක්වත් දෙන්න කුඩාරමක්වත් ගහගන්න. වළඳක් ගන්න. ලිපක් ගන්න. පූර්ණ හානි වුණු නිවසක ජීවත් වෙන්න වටපිටාව හදාගන්න මුලින්ම රුපියල් 50,000 ක්වත් දෙන්න. ඊට පස්සේ රුපියල් 1700 ක් දෙනවා. රුපියල් 1700 ක් දීලා පුළුවන්ද වළඳක් නැති ගෙදරකට, මොලෝ දෙයක් නැති ගෙදරකට, බිම් කැල්ලක් තිබෙන ගෙදරකට ළමයින් පස් හය දෙනෙක් එක්ක ජීවත් වෙන්න පුළුවන්ද? දෙයියනේ මේ රටවලින් ලැබෙන ආධාර, රජයෙන් කෝටි ගණන් කියලා වෙන් කරන මුදල මෙහෙමද බෙදෙන්නේ? රුපියල් 1700 නොවෙයි, මේ පවුලකට රුපියල් 15,000 ක් 20,000 ක්වත් දෙන්න. සතියකට 1700 දීලා දෙවැනි සතිය දුන්නු තැන් තවම නැහැ. දැන් දෙන්න ලැහැස්ති වෙනවා. ඒක නිසා -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

බන්දුල ඇමැතිතුමාගේ න්‍යාය.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අපි ඒවා අනුමත කරන්නේ නැහැ. ඒක නිසා මෙන්න මේ කථාව ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ ඉන්න සියලු ඇමැතිතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. අපි ඉස්සර රජය කරලා තිබෙන්නෙත් ඔහොම තමයි. ඒක වෙනම කථාවක්. මම කියන්නේ දැන් වෙනස් වෙන්න ඕනෑ. ඒක වෙනස් වෙන්න ඕනෑ. අඩුම ගණනේ මේ 1700, රුපියල් 5000 ක්, 6000 ක්, 7000 ක් දක්වා වැඩි කරන්න හැම දෙනාගේම අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ ව්‍යසනය නොවෙයි, වෙන ව්‍යසනයක් වුණත් ඒක කරන්න.

ඒ වාගේම පාසල් පිළිබඳව. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ ආසනයේ, එතුමාගේ ගමේ, එතුමා ගිය ඉස්කෝලයේ ඊයේ හදිසියේම නාය යෑමක් ඇවිල්ලා සිද්ධියක් වුණා. පාසල් දරුවෝ 700 ක් විතර ඉන්න පාසලක්. අද පාසල වහලා. මේවා පිළිබඳව අවධානය යොමු කරලා යම් වැඩ සටහනක් කඩිනමින් යොමු කරන්නත් කියන එකත් මතක් කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේම මෙවැනි ආපදාවලට ලක් වූ ස්ථාන මම නම් කළා. අරංගලකන්ද නාය යෑම, කොළඹට ගංවතුර යෑම, ඒ වාගේම සාලාවේ බෝම්බය පිපිරීම, කුණු කන්ද නාය යෑම පිළිබඳව මාස තුනකින්වත් නැවත නැවත බලලා අපි අවධානය යොමු කරලා වැඩ සටහනක්, එහෙම නැත්නම් ඒවායේ ප්‍රගතියක්, ඒවායේ තිබෙන තත්ත්වය පිළිබඳවත් සාකච්ඡා කරන්න අවස්ථාව, පරිසරය උදා කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම පළාත් සභාවේ සමාජ සේවා ඇමැතිතුමාට අඩුම ගණනේ මේ ඉන්න මන්ත්‍රී කෙනෙකුට රුපියල් 50,000 ක් දීගන්න බැරි නම් අපි පළාත් සභාවෙන් කරපු සේවාව මොකක්ද? පළාත් සභාවේ මහ ඇමැතිතුමාගේ ඇගේ හයියෙන්, අපේ ඇමැතිතුමන්ලාගේ ඇගේ හයියෙන් ගිහිල්ලා යම්කිසි දේවල් කරන්න ඇති. මේ ව්‍යවස්ථාවේ වෙනසක් වෙන්න ඕනෑ. සමාජ සේවා අමාත්‍යාංශය හරහා ඒ ආපදා වුණු පළාත් නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට රුපියල් 50,000 ක්වත් තමන්ගේ ප්‍රතිපාදනවලින් දීලා මෙන්න මේ ආපදාවට ලක් වූ මිනිස්සුන්ට උදව් කරන්න, වළඳක් අරගෙන දෙන්න, කොස්සක් අරගෙන දෙන්න ඒ දේවත් මේ සමාජ සේවා අමාත්‍යාංශයෙන් කරන්න බැරි නම් අපි මේ කරන දෙයින් වැඩක් වෙන්නේ නැහැ. ඒක නිසා අපට පුළුවන්කම වෙන්න ඕනෑ, ඒ හරහා අපි යම්කිසි මුදලක් වෙන් කරලා, ඒ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නත් සමාජ සේවා අමාත්‍යාංශය නියෝජනය කරන ඇමැතිතුමාගේ අවධානය යොමු කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.18]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කළුතර දිස්ත්‍රික්කයේ විශාල ව්‍යසනයක් වුණු අවස්ථාවේ ඒ වෙනුවෙන් වෙන් කරලා, මේ යෝජනාව ගෙන ආපු මන්ත්‍රීවරු දෙපළට මම ස්තුතිවන්ත වෙනවා. මම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කෙට්ඨාශය, බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය, මතුගම මැතිවරණ කෙට්ඨාශයේ ඉංගිරිය, බණ්ඩාරගම සහ කළුතර කියන අපේ මැතිවරණ කොට්ඨාශවල විශාල වශයෙන් අවධානමකට ලක් වෙලා අවතැන් වූ ජනතාවක් මේ අවස්ථාව වනකොට ඉන්නවා. මේ ගංවතුර, මම හිතන්නේ කාලෙකින් ආවේ නැති ගංවතුරක් අපට ආවේ. අපේ ජීවිත කාලය තුළ මේ තරම් ලොකු ගංවතුරක් කවදාවත් ආවේ නැහැ. අපේ ජීවිතයේ දැකපු ලොකුම ගංවතුර, මේ ගංවතුර. මේ ගංවතුරේ අවදානම පමණක් නොවෙයි. විශාල ජීවිත ගණනාවක් බිළි ගනිමින් නාය යෑම් විශාල ගණනාවක් සිදු වුණා. මම නියෝජනය කරන අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ නාය යෑම්වලින් තුන් පොළකගේ ජීවිත හානි වුණා. ඒ වාගේම අපේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ මායිමේ තිබෙන මාකෙළි ඇල්ලට පහළින් රත්නපුර දිස්ත්‍රික්කයේ නාය යෑමක් වෙලා අපේ කොට්ඨාශයේ ගඟ වහලා, අපේ කොට්ඨාශයේ පාර දක්වා ගඟ ගොඩ වුණා. ඒ තුළින් විශාල ජල කඳක් පාර දිගේ යෑම තුළින් විශාල නිවාස ගණනක් යට වුණා. එතැන නව දෙනෙක් මැරුණා. ඒ පස් කන්ද මේ පැත්තට ඇවිල්ලා ගඟ වහලා, විශාල විනාශයක් වුණා. ඒ වාගේ විශාල විනාශ වීම් වුණා වාගේම විශාල නාය යෑම්වලට ලක් වෙලා දැන් වනකොට මගේ මැතිවරණ කොට්ඨාශයේ 23 දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. 07 දෙනෙක් අවතැන් වෙලා තිබෙනවා. තවම ඒ මෘත දේහ සොයා ගැනීමේ කටයුතුවලට යෙදෙනවා. ඒ වාගේම පාරවල් විශාල ප්‍රමාණයක් අවහිර වෙලා. අපේ ප්‍රාදේශයේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ හුඟ දෙනෙක් ජීවත් වෙන්නේ තේවලින්. අද එක පැත්තකින් යට වුණු ප්‍රදේශවල තේ ගස්වලින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් තැනක් නැහැ. සමහර ගස් මැරිලා. සමහර ගස්වල කොළ ටික වැටිලා. අවුරුදු ගණනාවක් යනකල් ඒ අයට ආදායමක් ගන්න පුළුවන්කමක් නැහැ. සමහර ප්‍රදේශවල දළු ටික කඩා ගත්තත් ගේන්න පුළුවන්කමක් නැහැ. පාරවල් වැහිලා.

ඒ නිසා මුළු ප්‍රදේශයම විශාල ව්‍යසනයක් ලක් වෙලා තිබෙන අවස්ථාවක්, මේ අවස්ථාව. ඒ වාගේම විශාල ප්‍රදේශයක් යට වුණා. යට වීම තුළින් මම මිදලන ප්‍රදේශයට ගිහිල්ලා බැලුවොත් එක ගමක් නැහැ, සෑම ගමකම වහළ මට්ටමට වතුර ගිහිල්ලා. ලුණු පොල් කට්ටේ ඉඳලා කිසිම දෙයක් ගෙදර නැහැ. ඔක්කෝම ගහගෙන ගිහිල්ලා. ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ අය වෙනුවෙන් සහන සැලසුවේ නැත්නම් ඒ අයට යථා තත්ත්වයට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. සමහර පවුල් තිබෙනවා ඔක්කෝම මිය ගිහිල්ලා. එක දරුවෙක් විතරක් බේරුණු පවුල් තිබෙනවා. ගෙදර අනෙක් ඔක්කෝම මිය ගිහිල්ලා. මේ වාගේ විශාල ව්‍යසනයකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම පවුල් විනාශ වෙලා ගියා වාගේම අපේ හුඟක් පාසල් වහලා තිබුණා. දැනටත් පාසල් දෙකක් - එකක් වහලා තිබෙනවා තවාන විද්‍යාලය. ඔබතුමා කිව්වා වාගේ මාපුටුගල මහ විද්‍යාලය ඊයේ වැහුවා. මේ වාගේ ළමයිනුත් අකරතැබ්බවලට පත් වෙලා තිබෙනවා වාගේම පාසල් යන දරුවන්ට පාසල් යන්න විධියක් නැහැ. ඇඳුම් නැහැ. ඇඳුම් ටික ගහගෙන ගිහිල්ලා. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ වාගේ විශාල ව්‍යසනයක් වුණු වෙලාවක් මේක. අපේ ප්‍රදේශවල පාලම් බෝක්කු කැඩිලා ගිහිල්ලා ඒ වාගේ විශාල විනාශයක් වෙලා තිබෙනවා. ඒ වාගේම මේකට හේතුව අපි සොයලා බලලා යම්කිසි

පියවරක් නොගත්තොත් මීන් ඉදිරියටත් මෙවැනි ව්‍යසනවලට ලක් වෙන්න පුළුවන්.

අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා කථා කරද්දී කිව්වා, ඉස්සර ගංවතුර එන්නේ අඩියක් ඇවිල්ලා, දෙකක් ඇවිල්ලා, තුනක් ඇවිල්ලා හිමින් හිමින්. අපි දන්නවා අපටත් මතකයි. අද ටිකක් යට වෙනවා. හෙට තව ටිකක් යට වෙනවා. දවස් දෙක තුනක් ගියාට පස්සේ තමයි පාරේ බස් යන්න බැරි වෙන්නේ. නමුත් අද එහෙම නොවෙයි. එක රැයක් එළි වනකොට යට වෙලා ඉවරයි. ඒකට හේතුව අපිම කරන දේවල්. අපි දන්නවා, අපේ රටේ පහත් බිම් තිබුණා. අද මේවා ඔක්කෝම ගොඩ කරලා. ඒ නිසා වතුර ගලාගෙන එනකොට ඒවා රැඳෙන්න තැනක් නැහැ. ඔක්කෝම ගලාගෙන එන්නේ - අපේ ප්‍රදේශ යට වෙන්නේ ඒකයි. විශේෂයෙන්ම මම මතක් කරනවා අපේ අධ්‍යාපන ඇමැතිතුමාත් ඉන්නවා. පාලින්දනුවර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මම යනකොට ලක් සතොසට මෙහා කන්දේ රබර් ගස් ටික බැකෝ දාලා ගලවනවා. යන්න පාරවල් කපනවා ගහක් ගානේ. මම ඒ වෙලාවේ යෝජනාවක් ගෙන ආවා මේ වැඩේ නවත්වන්න ඕනෑ කියලා. මොකද, හේතුව මුළු කන්ද පුරාම ගහෙන් ගහට පාරවල් කපනවා. ඒ වාගේම බැකෝ එක්ක දාලා ගලවන්නේ. ඉස්සර රබර් ගහක් ගැලෙව්වේ මුල් ටික කපලා ඇදලා ගහ පෙරනවා. එතකොට ගහේ ප්‍රමාණයට විතරයි වළක් හැදෙන්නේ. අද බැකෝ එකක් ඇරියාම ඒ වාගේ දහ ගුණයක් ලොකු විශාල වළක් හැදෙනවා. මුදුන් මුලේ අඩියටම යටට යනවා. ඉතින් මේ රබර් ගස් අක්කරයක 260 ක්, 270 ක් තිබෙනවා. වැස්සට ඒවායේ වතුර පිරිලා ඒ වතුර ටික යටට ගියාම ගලාගෙන යන්න තැනක් නැහැ. ඒ වාගේම යටින් පාරවල් කැපුවා කඩාගෙන යයි කියලා මම ඒ යෝජනාව සම්බන්ධීකරණ කමිටුවට ගෙන ආවා. එදා මම යනකොට දැකපු තැනම හරියටම ලක් සතොසට මෙහායින් නාය ගියා. ගිහිල්ලා නව දෙනෙක් නැති වුණා. අද මේ වාගේ දේවල් නවත්වන්න ඕනෑ. අනෙක් එක අධික ලෙස වැලි ගොඩ දැමීම. කළු ගඟේ පතුල දිහා බැලුවාම, අපි පොඩි කාලේ කණ්ඩියේ ඉඳලා ගඟේ වැල්ලට පනින්න පුළුවන්. අද පැන්නොත් බෙල්ල කඩලා යනවා. අඩි 60 ක් විතර ගැඹුරුයි. මොකද වැලි අරන්, අරන් හෑරිලා.

ඒ වාගේම කළු ගල් කැඩීම. අපි කළු ගල් කඩන්න විරුද්ධ වුණාම, පරිසරයෙන් වාර්තාවක් දෙනවා කඩන්න පුළුවන් කියලා. කළුතර දිස්ත්‍රික්කයේ ගලක් කඩන එක ගැන විශාලා විරෝධයක් තිබුණා. ප්‍රදේශය විනාශ වෙලා ගිය වෙලාවක. අන්තිමට වාර්තා ඉදිරිපත් කරනවා කිසිම ප්‍රශ්නයක් නැහැ මේක කඩන්න පුළුවන් කියලා. අදත් ඒ ගල කඩනවා. පොළොව යට හාරලා, කන්ද සුද්ධ කරලා අක්කර 05 ක් විතර විනාශ කරලා. ඒවාට පරිසර වාර්තා දෙනවා. මේ පරිසර වාර්තා දෙන්නේ, මුදලට යට වෙලා. එහෙම නැත්නම් එහෙම වාර්තා දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අද ඕනෑම වැඩක් කරන මිනිහෙකුට පරිසර වාර්තාවක් ගන්න පුළුවන්. ඒ නිසා පරිසරය විනාශ වෙනවා. පරිසර විනාශය තමයි මේ තත්ත්වය ඇති වීමට හේතුව. ඒ නිසා වගකිව යුත්තෝ මේ වාගේ කටයුතු නවත්වන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ කියලා අපි අවධාරණය කරන්න කැමැතියි. ඒත් එක්කම වගුරු බිම් ගොඩ කිරීම. මම කලින් කිව්වා වාගේ ගහක් ගලනකොට, වැස්සක් ආවාම ගහෙන් පිටාර යන වතුර ටික එක් වෙන්න ස්වභාධර්මයෙන් තෘණ බිමක් පිහිටලා තිබුණා. අද ඒවා ඔක්කෝම ගොඩ කරලා. ඒවා කවදාවත් ඒ වාගේ තැන්වල රැඳෙන්නේ නැහැ. ඒ නිසා ඔක්කෝම වතුර අපට තර්ජනයක් බවට පත් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අනෙක් පැත්තෙන් කැලෑ කැපීම. සම්පූර්ණයෙන් කැලෑවල් කපනවා. ගස් පෙරලනවා. ඒ නිසා සෝදා පාළුව වැඩි වෙලා තිබෙනවා. අනෙක් එක ඉස්සර නුවර එළිය පැත්තේ කඳුවල බැලුවාම කැලේ කඳු මුදුන්වල කැලේ ඉතුරු කරලා තිබෙනවා. අපේ ප්‍රදේශවල එහෙම නැහැ. මුළු පළාතේම කන්ද උඩයි, ඔක්කෝගෙම තේ වවනවා. තේ වගාවේ තණකොළ ගහක්වත් තියන්නේ නැහැ. සෝදා පාළුව වැඩි වෙනවා. ඒ සෝදා පාළුව වැඩිවීම තුළ පස ඇතුළට ජලය ඇතුල් වීමේ අවස්ථාව වැඩි වෙනවා. ඒ තුළින් නාය යෑම්වලට ලක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ වැඩ පිළිවෙළ මීට වැඩිය පරිසරය ආරක්ෂා වන වැඩ පිළිවෙළක් ගෙන ආවේ නැත්නම් මේ ගංවතුරෙන් වුණු විනාශය දිහා බැලුවාම මම හිතන්නේ තවත් මේ වාගේ ගංවතුරක් ආවොත් කඳු එකක්වත් ඉතුරු වන එකක් නැහැ. කඳු ඔක්කෝම යයි.

අනෙක් ලොකුම ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අගලවත්තේ කඳු කිහිපයක් පරීක්ෂා කරලා බැලුවා. කඳුවල කිලෝ මීටර් දෙකක විතර කාණු හැදිලා. කඳු පුපුරලා. දෙබෑ වෙලා. ඒවා අස්සට ගල් දැම්මාම ඩාල් ගාලා ශබ්දය ඇහෙනවා. ඉතින් මේවාට වතුර පිරුණාම ඒවාත් කඩලා යනවා. ඒ වාගේ ලොකු

[ගරු පී.ඩී. අබේරත්න]

අවදානමක අද ඉන්නේ. කළුතර දිස්ත්‍රික්කය ලොකු අවදානමකට ලක් වෙලා තිබෙනවා. මේ වුණු දේ නවත්වන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. අද වුණු ව්‍යසනයට පිළියම් යොදනවා වාගේම, ඒ වාගේ වැඩ පිළිවෙළක් යෙදුවේ නැත්නම් අනාගතයේ මීට වැඩිය ව්‍යසනයක් වෙනවා. අපි ඒ ගැන හොඳට හොයලා බලලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ ව්‍යසනයකට පත් වුණු අයට අපි කරන්න පුළුවන් තරම් වැඩ කටයුතු කරලා තිබෙනවා. ඒ අයට විවිධ ආධාර උපකාර දෙනවා. කන්න බොන්න බඩු භාණ්ඩ ලබා දීලා තිබෙනවා. රජයෙන් දෙනවා. පුද්ගලික අය දෙනවා. ඒ අයට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ අවතැන් වුණු අවස්ථාවේ දිසාපතිතුමා සහ සහකාර ලේකම්වරු ග්‍රාම නිලධාරීන් එක්ක විශාල කැපවීමක් කළා. ඒ තුළින් තමයි මේ තත්ත්වය අපට අවම කරගන්න ලැබුණේ.

විශේෂයෙන් යුද්ධ හමුදාව. යුද්ධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව ඒ අය ඇවිල්ලා අපට උපකාර කළා. ඒ තුළින් ජීවිත ගණනාවක් බේර ගත්තේ නැත්නම් මීට වැඩිය ජීවිත හානි වෙනවා. ඒ වාගේම ස්වේච්ඡා ආයතන අපට සහයෝගය දුන්නා. ඒ වාගේම ආහාර පාන ලබා දුන්නා. ඊයේ අපේ ආසනයේ ඉඳලා තීරණයක් ගත්තා, එස්.බී. දිසානායක ඇමැතිතුමා. ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මටයි, රංජිත් සෝමවංශ ඇමැතිතුමාටයි අපි දෙන්නටම එස්.බී. දිසානායක මැතිතුමා දාලා තිබෙනවා. අවතැන් වෙලා ඉන්න අයව කුළියට ගෙවල් අරගෙන පදිංචි කරවන්න කියලා තීරණයක් අරගෙන තිබෙනවා. ඒ අයට අසාධාරණයක් නොවෙන්න, යන්න තැනක් නැති කෙනෙක් ඉන්නවා නම් ආණ්ඩුවෙන් කුළිය දීලා පදිංචි කරනවා වාගේම සියලුම ගෙවල් හදන්න අද වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වෙලාවේම නියෝගයක් දුන්නා. ඒ වාගේම මේ රජය විසිපන් ලක්ෂය දක්වා ගෙවන්න කටයුතු කරනවා. ඒකට අපි ස්තුතිවන්ත වෙනවා. මීට කලින් ගෙදරකට ලක්ෂයයි ගෙව්වේ. විසිපන් ලක්ෂය දක්වා ගෙවන්න තීරණය කරලා තිබෙනවා. අපට ඉඩම් හොයා ගන්න කිව්වා. ඉස්සර ලක්ෂයයි, අද විසිපන් ලක්ෂය දක්වා වැඩි කරලා තිබෙනවා. සහනාධාර මුදල වැඩි කරලා තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අර සාලාවේ -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අපි කියන්නේ මේක ගැන. දීපු අයත් ඉන්නවා. මොනවා කළත් තමුන්නාන්සේලා හොඳයි කියන්නේ නැහැ. අපි වගකීමක් ඇතුව කියනවා අපේ දිස්ත්‍රික්කයේ සෑම කැඩුණු ගෙදරකටම, නාය යෑමට ලක් වුණු සෑම ගෙදරකටම ඉඩමක් එක්ක ගෙයක් හදලා දෙනවා කියන එක මම මේ අවස්ථාවේ වගකීමක් ඇතිව මතක් කරන්න කැමැතියි. අපි අනිවාර්යෙන් ඒ වැඩේ කරලා දෙනවා. අපි ඒකට කැප වෙනවා. අපි දෙදෙනයි අගලවත්ත ආසනයේ ඉන්නේ. අපි වගකීමක් ඇතිව කියනවා අගලවත්තේ සෑම නාය යෑමකට ලක් වුණු තැනකම, විනාශයට ලක් වුණු ගෙදරකටම ගෙයක් හදලා දෙන්න කටයුතු කරනවා කියන එක. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. අපි එහෙම කැප වෙලා වැඩ කරනවා. අපි ඒ වගකීම ඉටු කරනවා. අපි ඒ වැඩ පිළිවෙළ කරනවා කියන එක මම මතක් කරන්න කැමැතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සාලාවේ තියෙන්න පුළුවන්. මීතොටමුල්ලේ එහෙම තිබුණා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒ කියපු අය කියයි. අපි කියන්නේ නැහැ. මේකේ වෙලා තිබෙන්නේ හොඳ වැඩක් කළත් නරකයි කියනවා. අනෙක් එක තමයි මම කියන්නේ මීට ඉස්සෙල්ලා මේ රට රක්ෂණය කරලා තිබුණේ නැහැ. අද මේ ආණ්ඩුව රක්ෂණය කරපු නිසා රටට බරක් නොවී මේ ආපදාවලට ගෙවන්න පුළුවන් වීම අපේ රටට ලොකු යහපතක් වෙලා තිබෙනවා. නැත්නම් මේ ආපදාවෙන් ගොඩ එන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම අපේ රජයට අද යුරෝපා රටවල්වලින් ආධාර දෙනවා. අනෙකුත් රටවල්වලින් ආධාර දෙනවා. ඉන්දියාවෙන් විශාල ආධාර දුන්නා. අපට ඒ ආධාර ගන්න පුළුවන් වුණේ, අපේ රජයේ ක්‍රියාදාමය තුළින්. ඒ නිසා අද මේ වාගේ විපතක් වුණු අවස්ථාවක ලඟි

ලභියේ ජීවිත බේරා ගන්න කටයුතු කළා වාගේම, ඉදිරි කටයුතුත් කරලා මේ සෑම දෙනාටම උපරිම සහයෝගය දෙන්න අපි කැපවීමෙන් කටයුතු කරනවා කියන එක මතක් කරන්න කැමැතියි. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන අවස්ථාවේ මහ දිසාපතිතුමා ඇතුළු ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ග්‍රාම නිලධාරී මහත්වරුන්ට, ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, ස්වෙච්ඡා සංවිධානවලට මම ස්තුතිවන්ත වන අතර, මියගිය පවුල්වල අයටත්, අවතැන් වූ පවුල්වල අයටත් අපේ පළාත් සභාවේ ශෝකය ප්‍රකාශ කරමින් මෙවැනි ව්‍යසනයක් කවදාවත් නොවේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතිය. මම පොඩි ඉල්ලීමක් කරනවා. විශාල කථික ලැයිස්තුවක් තිබෙන නිසා ඉතාමත් කෙටියෙන් කථා කරනවාත් එක්කම ආපදාවට ලක් නොවූ ප්‍රදේශවල මන්ත්‍රීතුමන්ලා කාලය පිළිබඳව සැලකිල්මත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.30]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි අවස්ථාව ලබා දුන්නාට. ගංවතුර අපට නාවට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ දැන් මාස හතරක් තිස්සේ නියඟය ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම අවංකව කියන්නේ. මම මේ පාන් කිරිත්තා කථා කරන මිනිහෙක් නොවෙයි. මම ඔතැනත් හිටපු මිනිහෙක්. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා, කවුද අපේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉතාම කෙටියෙන් කියන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

කැඳවලා තිබෙනවා. හිතේ වේදනාවෙන් - අපි කැමැතියි. මටත් යන්න අවසරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මූලාසනයට කරන්න දෙයක් නැහැ. රීති අත්හිටුවලා යෝජනාවක් ආවාම කරන්න දෙයක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විජේරත්න මහත්තයා දන්නවා අපි නිදි නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු ඇමැතිතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා ගැන නොවෙයි මේ කියන්නේ රත්තරං. මේ වාගේ යෝජනාවක් ආවාම සංවිධායකතුමයි, සභාපතිතුමයි කථා කරලා මේක පොඩි පසුබිමක් හදාගන්න ඕනෑ. ඔබතුමාට නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කථා කරලා දුවන්න බලාගෙන -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

කථා කරලා දුවන්න බලාගෙන නොවෙයි. ඔබතුමාට ගැලුවේ නැති වුණාට, අපට ගැලුවා. ගංවතුර විසි ගණනකට මුහුණ දීපු මිනිහෙක් මම. එතුමාට අයිතියි. එතුමාගේ අයිතියට විරුද්ධව නොවෙයි. එතුමා කථා කරන්න ඕනෑ. මම කියන්නේ සැලසුමක් නැහැ. ගංවතුර විසි ගණනකට නාපු මිනිස්සු අපි. මමද, කිත්සිරිද, ලලිත්ද, ඕනෑ තරම්. අපි ගංවතුරෙන් හොඳට නාපු මිනිස්සු. ඔබතුමන්ලා වාගේ මිනී කරේ තියාගෙන අපි රඟපාන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කෙටියෙන් කථා කරන්නම්. අපට ගංවතුර නාවට හැමදාම දඩුගං ඔයයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඉතාම හොඳ වැදගත් මන්ත්‍රීවරයෙක්. මම ඔබතුමාට විරුද්ධව කථා කරනවා නොවෙයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගංවතුර නාවට අපේ දඩුගං ඔයයි, මාඔයයි දෙකටම මැදි වෙලා අපි ඉන්නේ. හැමදාම ගංගා දෙකෙන්ම පීඩා විඳිනවා. මෙදා පාර ඒ දෙකම ඉතුරුවේ නැහැ. අපි මාස හතරක් පහක් තිස්සේ, අර රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අතින් සල්ලි දීගෙන ගහගෙන බොන්නේ නැතුව ඉන්නවා කටාන ආසනයේ පවුල් 10,000 ක් 15,000 ක් විතර. මේ ඇමැතිතුමා වතුර ගහනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මේක ආපදාවක්. මම මේ කාටවත් ගහන්න උත්සාහ කරනවා නොවෙයි. මේ ආපදා හැමදාම එනවා. ප්‍රවෘත්ති අහන කොට ප්‍රවෘත්තිවලට කියනවා ලෝකයේ රටවල් තියෙනවාලු. මෙහෙම ගංගා උතුරන කොට එක ජල බිංදුවක්වත් මහ මුහුදට යන්නේ නැති. එහෙම කියද්දී මට හිතුනා දැන් රත්නපුර යට වෙනවා. රත්නපුර යට වෙලා පැය 24 කට පස්සේලු කළුතරට එන්නේ. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කිව්වා. මම දන්නේ නැහැ. මම ඒ පැත්තේ නොවෙයි නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ඉංජිනේරු ඇමැතිතුමා කියලා තිබුණා Highyway නිසා තමයි යට වෙන්නේ කියලා. හැබැයි රත්නපුරේ වතුරටට යට වුණේ Highyway එකට බ්ලොක් වෙලා නොවෙයි නේ? රත්නපුරේ යට වෙලා පැය 24 කට පස්සේ තමයි Highyway එක ළඟට ආවේ. කළුතරට ආවේ. ඉතින් ඒ වාගේ මෝඩ කථා කියලා වැඩක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රත්නපුරේ යට වෙන කොට රත්තපුරේට උඩින් වතුර එනවා නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වේලි කිහිපයක් බැඳලා මේ ජල කඳ තැනින් තැනින් නවත්වලා සීමා කරලා එවන්න පුළුවන් නම් මහ ජල කඳක් රත්නපුරේට එන්නේ නැහැ. මේ රජය කියන දේ හැමදාම සල්ලි උපයන ආයතනයක් නොවෙයි. මහජන සුභ සිද්ධිය සඳහා අපෙන් ගන්න බදු මුදල් භාවිතා වෙන්න ඕනෑ. ඒ බදුවලින් භාවිත වෙලා රජය මම හිතන්නේ කල්පනා කළා, දිග වැඩක් වශයෙන්. කෝටි ගණනක් වියදම් කරලා - අර මහවැලි, කැලණි, කළු, වළවේ කියලා ගංගා තුන හරයි තියෙන්නේ. මේ ගංගා තුන හතරට ඉහළින් වේලි දෙකක් තුනක් බැන්දා නම් ඔය මුහුදට ගලාගෙන යන මහ ජල කඳ එක පාරට මුහුදට යන්නෙත් නැහැ. රඳවලා ඉවර වෙලා ක්‍රම ක්‍රමයෙන් පාලනය කරලා පහතට එවනකොට - උදාහරණයක් විධියට කැලණි ගඟ ගත්තොත් පායන කාලෙට රට කැලණි ගඟට ලුණු මිශ්‍ර වෙනවා. බොන්න බැහැ. ඒ වනකොට කුඩා ජලාශවල වතුර තිබුණොත් ඒ ජලය යම් ප්‍රමාණයක් ගඟට යොමු කළොත් එහෙම ලුණු පහළට තල්ලු වෙලා ගිහිල්ලා පසෙන් ලුණු නැතුව යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේ දිගු කාලීන වැඩ සටහන්වලට රජය යන්න ඕනෑ. ඒ වාගේම මම දැකලා තිබෙන දෙයක් තමයි අපි ගම්පහ දිස්ත්‍රික්කයේ ඇළ වේලි සුද්ධ කළා. මෝය කට කැපුවා. වහිනවා වහිනවා බැහපු ගමන් ඇළෙන්, දොළෙන් ගඟෙන් මුහුදට ගියා. කතන්දරේ ඉවරයි. කොහේවත් වතුර රැඳෙන්නේ නැහැ. ඊළඟට පැවිලි දෙකක් යද්දී වතුර නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇළ වේලි සුද්ධ වෙනවා වාගේම ජලාශ හැදෙන්න ඕනෑ. උදාහරණයක් ගත්තොත් දැන් අර පාර්ලිමේන්තුව පිටිපස්සේ ජලාශයක් හදලා තිබෙනවා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා. වතුර තියෙනවා. එහෙම නැත්නම් මේ වනකොට ඒ තිබුණු කුඹුරුවල - ඒ කුඹුරු තිබුණේ පයින් යන්න පුළුවන් තත්ත්වයට. ඒ වාගේ ජලාශ හදලා ඒ ජලය රැක ගන්න ඕනෑ. ජල උල්පත්, ජල පෝෂක ප්‍රදේශ ඇති කරන්න ඕනෑ. එහෙම ඇති කරමින් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට විසඳුමක් සොයන්න වෙන්නේ. ඒ වාගේම මම දැක්කා - මම එක දෙයක් කියන්න ඕනෑ. ජාති භේද වෙන් කරනවා නෙවෙයි. යාපනයේ, ත්‍රිකුණාමලයේ දෙමළ ජනතාවට කරදයක් වනකොට අපේ සිංහල ජනතාව ජාති භේදයෙන් තොරව බඩු මුට්ටු අරගෙන ගියා. අපේ ගෙවල්වල එකතු කළා. මම නම් දැක්කේ නැහැ අපේ

විපක්ෂ නායකතුමා යාපනයට පමණක් විරුද්ධ පක්ෂයේ නායකතුමා වෙන්න ඇති. අර කඳුකරයේ හිටපු දෙමළ ජනතාව යට වුණා. නාය ගියා. ඒ අය වෙනුවෙන්වත් ශෝක ප්‍රකාශයක් කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැක්කේ නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

කළුතර ආවා. යාපනෙන් ගෙනැල්ලා රෙජිනෝල්ඩ් කුරේ ආණ්ඩුකාරතුමා ඇවිල්ලා භාර දුන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

යාපනෙන් ගෙනැල්ලා මටම දුන්නා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

යාපනේ පොලීසිවලින් එකතු කරලා ගෙනැල්ලා දුන්නා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

නැහැ, නැහැ. යාපනෙන් ගෙනැල්ලා දුන්නා. ආණ්ඩුකාරතුමා ඇවිල්ලා භාර දුන්නා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීවරු ඔක්කෝම කිව්වා බොහොම අමාරුවෙන් ආධාර දෙන්නේ කියලා. අද අපි ස්තුතිවන්ත වෙනවා. 2010 ගම්පහ දිස්ත්‍රික්කය යට වුණු වෙලාවේ බැසිල් රාජපක්ෂ මැතිතුමා කන්ටේනර් පිටින් බඩු එව්වේ කන්න. අපි එකතු කළේ නැහැ.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

උස්සපුවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එතුමා උස්සපුවාද අපි දන්නේ නැහැ. ස්තුතිවන්ත වෙන්න ඕනෑ මේ වෙලාවේ. ඊළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා කටාන ආසනයේ ජල හිඟයට රජයවත් උත්තර දුන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය කාලයේ ජල ප්‍රශ්නයට උත්තර දෙන්න ඉස්සෙල්ලා, රටේ තිබුණු ලොකුම ප්‍රශ්නය යුද්ධ ප්‍රශ්නය. අර කවුද වීරයෙක් නොවෙයි කියලා කිව්වා. ලෝකයේ හැම තැනම යුද්ධ. යුද්ධය යුද්ධයෙන් ඉවර කරපු - චන්ද්‍රිකාත් යුද්ධ කළා. ඊළඟට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා යුද්ධ කළා. ප්‍රේමදාස මහත්තයා යුද්ධ කළා. සරත් ෆොන්සේකාත් යුද්ධ කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යුද්ධය යුද්ධයෙන් අවසන් කරපු ලෝකයේ එකම නායකයා මහින්ද රාජපක්ෂ මහත්තයා. එහෙම නම් එළාර රජු යුද්ධ කරලා කවුද දිනුවේ? දස මහ යෝධයෝද? නැහැ. දුටුගැමුණු රජු. රාජ්‍ය නායකයා දින්නා කියලා කියනවා මිසක් සොල්දාදුවන් ගැන කියන්නේ නැහැ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක නිසා කටාන ආසනයේ ජල හිඟයට විසඳුමක් වශයෙන් බැසිල් රාජපක්ෂ මැතිතුමා අක්කර 50 ක - මෙතුමා දන්නවා. ජල යෝජනා ක්‍රමය පටන් ගත්තා. ඒක තමයි දැන් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ඒ වාගේම බම්බුකුලියේ ජල මූලාශ්‍රයේ අක්කර 1 ½ ක භූගත ටැංකියක් ගැහුවා. අද ඒ ටැංකියෙන් වතුර දෙන්නේ. ඒක ගැහුවේ නැත්නම් අද කටාන පැත්තට වතුර දෙන්නේ නැහැ. ඒ නායකයෝ ඇත දැක්කා. කරමින් ඉන්න කොට තමයි මේ පාපකාරී යහපාලන ආණ්ඩුව ආවේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ ආණ්ඩුවේ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා චම්පික රණවක ඇමැතිතුමා වාගේ මෝඩ කථා කියන්නේ නැතුව - එතුමා දැන් හෙට අනිද්දා Highway එක කඩලා දායි. වෙන විධියක් නැහැ නේ? Highway එක ටැංකියක් වාගේ වෙලා තිබෙන්නේ. ඒ වාගේ මෝඩ කථා කියන්නේ නැතුව මේවාට පොළොවේ පය ගහන පුද්ගලයෙක් වෙලා හරි සාධාරණ උත්තරයක් දෙන්න කියලා ඉල්ලා සිටිමින් ගංවතුරෙන් යට වුණු සියලු දෙනාට අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ වනකොට අපේ ආසනයේ මුස්ලිම් කඩ සාප්පුවක් ගිනි තියලා තිබෙනවා. විජේරාම නගරයේ තිබුණු එකක්. උදේ පාන්දර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඒකෙන් ඔබතුමාට වුණු වරප්‍රසාද අහිමි වීම මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස්නාහිර පළාත් සභාවට අයිති කඩයක් නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, නැහැ. ඔබතුමා වුණු වරප්‍රසාද කඩවීමක් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පොඩ්ඩක් අහගන්න. ඉස්සෙල්ලාම අපි ඒක හෙළා දකින්න ඕනෑ. අපේ මිත්‍රයෙක් නිසා නොවෙයි. කාට කළත් මේක වැරදියි. ඔබතුමා අපේ පළාත් සභාව හැටියට මේවායේ ක්‍රියාත්මක කරන්න බස්නාහිර පළාතේ පොලීසියට නියෝග කරන්න ඕනෑ. පළාත් සභාවට ඇවිල්ලා කයිවාරු ගහලා වැඩක් නැහැ. රටේ වන සිද්ධිවලට. මගේ ගෙදර මගේ බෑණාට, මගේ මුනුපුරාට දෙන්නටම ඩෙංගු හැදිලා. මගේ වත්තේ විතරක් හත් දෙනෙක් hospital එකේ. සෞඛ්‍ය අපට තිබෙන විෂයයක්. මීට කලින් මම පෙන්නුවා මෙපමණ ඉන්නවා පළාත් සභාවේ ඩෙංගු හැදිලා කියලා. අද වනතුරු මේ සභාවෙන් ගත්තු action මොනවාද? පළාත් සභාවේ ඩෙංගු සම්බන්ධව එක රැස්වීමක් කැඳෙව්වාද? ඒ වෙනුවෙන් ක්‍රියා කරලා තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සෞඛ්‍ය ඇමැතිතුමා සභාවේ ඉන්න වෙලාවක ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් පාලන ආයතන කැඳෙව්වාද? මහජනයාගේ සල්ලිවලින් දීමනාවක් අරගෙන ඒ කෑම ටිකක් කාලා යන එක නොවෙයි අපේ යුතුකම. අපව මහජනයා පත් කළේ මහජන ප්‍රශ්න විසඳන්න. මේක ඇතුළේ කථා කරන්න. දීමනා ගන්න නොවෙයි. අපි මහජන සේවකයෝ හැටියට ඔබතුමා මගින් වහාම ඩෙංගු සම්බන්ධව මීට වඩා ගංවතුර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි සෞඛ්‍ය ඇමැතිතුමාට දැනුම් දීමක් කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඩෙංගු ඉවර නැහැ. ඩෙංගු දවසින් දවස වැඩි වෙනවා. ඔබතුමා මගින් පළාත් සභාවේ වහාම ක්‍රියාත්මක වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. යෝජනාවක් දාමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වහාම කැඳවන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඕකට යෝජනාවක් දාන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගංවතුරෙන් මැරුණේ එකසිය ගණනයි. ඩෙංගු වලින් දැන් හාරදහස් ගණනක් මැරිලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව. ඔබතුමා ලබන පාර යෝජනාවක් ගේන්න.

[අ.භා. 12.41]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ස්ථිරත්වය අනුව මම හිතන්නේ කාලයකදී අපේ නීතිරීතිත් එක්ක තිබෙන අත්‍යවශ්‍ය, වැදගත්ම විධියේ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. අපට සාමාන්‍යයෙන් රීති අත්හිටුවලා ගේන කොට සමහර වෙලාවට ඒ ගෙනෙන යෝජනා එක්ක බැලුවාම මේක ඇත්තටම අපේ පළාතේ සිද්ධ වුණු අපට බලපාන යෝජනාවක්. ඒ වාගේම මම යෝජනාව තුළ පොඩි සංශෝධනයක් ඉල්ලා සිටිනවා. මේකේ ගංවතුරින් හා නායයාම්වලින් මියගිය හා අවවැන් වූවන්ට කනගාටුව විතරයි මේකෙන් ප්‍රකාශ කරන්නේ. මේ යෝජනාවේ තිබෙන්නේ. එදා පළාත් සභාව විධියට අපි මොකක්ද මේකට කළ යුත්තේ කියන වැඩ පිළිවෙළත් එක්කම මේ යෝජනාව ගියා නම් මම හිතන්නේ, මේකේ සාරාංශය හැටියට වැදගත්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක සංශෝධනය කළා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

සංශෝධනය කළා නම් හරි. ඇත්තටම කළුතර දිස්ත්‍රික්කයේ අති විශාල විධියට අලාභහානි වුණා. විශාල ජීවිත ප්‍රමාණයක් නැති වුණා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කය හැටියට ගන්නවා වාගේම, විශේෂයෙන්ම බුලත්සිංහල ආසනය ගත්තාම කළුතර දිස්ත්‍රික්කය තුළ වැඩිම අලාභහානි වුණු, වැඩියෙන්ම මියගිය, වැඩියෙන්ම ආපදාවට ලක් වුණු ප්‍රදේශය තමයි බුලත්සිංහල. බුලත්සිංහල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 54 ක් තිබෙනවා. ඒ 54 ම යට වුණා. 54 ම තැනින් තැන නාය ගියා. කිහිප පොළක අති විශාල සංඛ්‍යාවක් මිය යන්නට යෙදුණා. දැන් මිය යන්න කිව්වාම, සමහර වෙලාවට ඒ තිබෙන චක්‍රලේඛත් එක්ක ඇත්ත තමයි. මිනී හම්බ වුණොත් විතරයි ඇත්තටම මිය ගිය අය ලෙස නම් වෙන්නේ. අතුරුදහන් තමයි අනික් ටික. ඒ කියන්නේ, පොළොව යට ඉන්න අය, සොයාගන්න බැරි අය අතුරුදහන්. ඒක තමයි සාමාන්‍ය චක්‍රලේඛය. නමුත් මේ සේරම මිය ගිහිල්ලා කියන එක තමයි ඇත්තටම කියන්න තිබෙන්නේ. අපේ කොබවක කන්ද නාය යන කොට 11 දෙනෙක් එතැන හිටියා. අපට හය දෙනයි ගන්න වුණේ. ඊළඟට තිබ්බොට්ටාව කන්දේ හිටපු ගණන තවම සොයා ගන්න බැහැ. එදා තරුණයින් දෙදෙනෙකු ඉන්න ගෙදරක, රට ගිහිල්ලා ආපු කෙනෙක් ගෙයක් හදන්න අත්තිවාරම කපන දවස පහුවෙනිදා උදේ පාන්දර තිබුණේ. මේ ගෙදරට ආවා හැම තැනින්ම. කිතුල්ගලින් ආවා. ඇතගමින් ආවා. සමහර අය අපි දන්නෙත් නැහැ කොහෙන් ඇවිල්ලාද? කීයක් හිටියාද කියලා. අපි නිකම් අනුමාන කරනවා, සාමාන්‍යයෙන් 30 ක් විතර එතැන ඉන්න ඇතියි කියලා. එතැනින් දෙන්නයි අපට ගොඩ ගන්න පුළුවන් වුණේ. ඉතිරි සියල්ලම එතැන මිහිදන් වුණා.

ඒ වාගේම තමයි පාහියන්ගල ගෙවල් හයක් කඩාගෙන ආවා. විසි දෙදෙනෙකු එතැන හිටියා. අපට එකම එක අම්මා කෙනෙකු විතරයි මාස තුනක දරුවෙකු ඉන්න අම්මා කෙනෙක් විතරයි ගොඩ ගන්න වුණේ. නමුත් ඒකේ ඔලුව - බෙල්ලෙන් උඩ නැහැ. ඉතින් අපි ඒවාට අපේ ආගමේ හැටියට ඒ කටයුතු කළා. ඇත්තටම අපට හිතාගන්න බැහැ, මොකක්ද? මේක දේව ශාපයක්ද? එහෙම නැත්නම් මේ ජනතාවගේ කරුමයක්ද කියන එක අපට ඇත්තටම හිතාගන්න බැහැ. මේ පාහියංගල ගහ - ගහ කියන්නේ ඇළක් වාගේ තමයි. ඒක මෙහෙම ගලාගෙන යන කොට ඒක උඩ තිබුණු ගෙවල් ටික බිඳ ගෙන පාහියන්ගල ගල අයිනේ තිබෙන කන්ද ආවා. ඒ පස් ටික ඇවිල්ලා ගහ හරස් වුණා. ගහ හරස් වෙලා, ගහ ආපු පැත්ත වෙනස් වෙලා කවදාවත් වතුරෙන් යට නොවන ගෙවල් 12 කට සම්පූර්ණයෙන්ම ඒ ගෙවල්වල ගලුයි,

[ගරු ලලිත් වර්ණකුමාර]

ඒ ගෙවල්වල ලීයි විතරයි ඉතිරි වුණේ. ඔබතුමා කිව්වා වාගේ අත්තිවාරමක්වත් නැහැ. එහෙමම කඩාගෙන ගියා. ඉතිහාසයේ කවදාවත් ඒ අය හිතුවේ නැහැ මෙහෙම වතුරක් එයි කියලා.

ඒ වාගේම ඇත්තටම ඒ එක ස්ථානයක ගෙදරක ළමයාට දින 14 යි. එක ළමයෙකුට. එයාගේ ගේ ටිකක් පල්ලෙහා නිසා අයියාගේ ගේ උඩ තිබෙන නිසා තවත් ආරක්ෂාවට ගිහිල්ලා අයියාගේ ගෙදර තිබ්බා. මේ දරුවාවයි අම්මාවයි. ඒ වාගේම අයියාගෙත් ඉන්නවා අවුරුදු පහක ළමයෙක්. මේ ළමයාට කිරි දිදී සිටිද්දී තමයි කන්ද හරස් වුණු නිසා අර වතුර පාර ආවේ. දොරෙන් අර ළමයාව එළියට ගිහිල්ලා. ඒ දින 14 ළමයයි, අවුරුදු පහේ ළමයයි දෙන්නාම නැති වුණා. නාය යාමෙන් නොවෙයි. නාය ගිය කන්ද හරස් වෙලා. නාය යාමට 22 ක් යට වෙන කොට අතනත් එහෙම ගිහිල්ලා. තව කිහිප පොළක කොඳු ඇට පේලිය සවුත්තු වෙලා. සුසුම්නාවල් ඇදිලා. ආපු වතුර හිමින් නොවෙයි ආවේ. මහ සැරට ආපු නිසා ගස්වල වදිනවා. බිත්තිවල වදිනවා. වහළේ වදිනවා. ඒ ආකාරයට තුවාල ලබපු අය තවමත් නාගොඩ රෝහලේ විශාල පිරිසක් ඉන්නවා.

ඉතින් ඇත්තටම මේ එක පැත්තක්. තව පැත්තකට ගියාම තවත් ආකාරයකට තමයි මේ සිද්ධිය වෙලා තිබෙන්නේ. මුස්ලිම් ජනතාවත් කිහිප පළක් මේ නාය යාම්වලට ලක් වෙලා හය දෙනෙක් හෝ අට දෙනෙකු මිය යන්න යෙදුණා. තවත් මාගම ප්‍රදේශයේ බෝගහවත්තේ 11 දෙනෙකු මිය යන්න යෙදුණා මේ නාය යාමත් එක්ක. වතුරට තැනින් තැන ගිහිල්ලා මිය ගිය අය තව හත් අට දෙනෙක් ඉන්නවා. මිය ගිය වයසක අයත් ඒ අතර ඉන්නවා. ලෙඩ දුක් හැදිලා, යන්න බැරිව, වට වෙලා තිබෙන නිසා මිය ගිය අයත් නැතිවා නොවෙයි. ඒ වාගේම සත්තු කාපු, සර්පයෝ කාපු - දැන් සමහර විට තවමත් දුක් විඳින, තවමත් මිය යාමට ළං වෙලා ඉන්න කොටස් නැතිවත් නොවෙයි. ඒ නිසා මේ වුණු දේ ගැන අපට මියගිය ජනතාවට අපේ ආගමේ හැටියට අපි නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම කනගාටුව ඒ පවුල්වලට ප්‍රකාශ කරනවා මිසක් අපට ඒ අයගේ ජීවිත දෙන්න බැහැ. හැබැයි, අපි රජයක් හැටියට හරි, පළාත් සභාවක් හැටියට හරි මීට වඩා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා, එක කොටසක්. හැබැයි, තවත් කාරණාවක් මෙතැන තිබෙනවා. අපේ මේ මෝල්කාවට උඩින් කුඩා ගඟ හරස් කරලා, කුකුළේ ගඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. හැබැයි, මේක අපි මේ කාලයේ කථා කළාට අනික් කාලවලට විදුලිය දෙන්න සේරම කරන්න වෙන්නේ එතැනින් තමයි. නමුත් මේකේ තාක්ෂණ ක්‍රමවේදය මම දන්නේ නැහැ. ඒක යම්කිසි ක්‍රමවේදයක් එක්ක කථා කරලා, මේ වේල්ල සාමාන්‍යයෙන් පැය පහක්, හයක් වහිනවා නම් ඒ පැත්තට - විශේෂයෙන්ම ඒ පැත්තට වැස්ස වැඩියි. සිංහරාජ අඩවිය උඩ තිබෙනවා. මේ පැත්තෙන් ජලාශය නිසා හැම තිස්සේම වර්ෂාපතනය තිබෙනවා. අඩුම ගණනේ එක දිගට පැය පහක්, හයක් වහින කොට මේ ගඟේ වතුර ටික මේ වේල්ලෙන් අයින් කරන ක්‍රමයක්, ටිකක් අඩු කරන ක්‍රමයක් ඇති කරනවා නම් මේ මහා ජලකඳ අල්ලගෙන එක සැරේ ඇරලා යවන්න උවමනාවක් නැහැ. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ දෙපැත්තක් යට වෙනවා මේක නිසා. එක පැත්තකින් අයගම, කළවාන, රත්නපුරටත් සමහර වෙලාවට බලපානවා. අයගමට, කලවානට දිගටම බලපානවා. දැන් එකෙන් එහා පැත්තෙන්. මෙහා පැත්තෙන් මුළු කළුතරට යනකල්ම මෝල්කාවේ සිට කළුතරට යනකල්ම බලපානවා. ඒක ඔබතුමන්ලා කිව්වා වාගේ දැන් මේ වතුර දැක දැක තමයි යට වෙන්න වෙලා තිබෙන්නේ. එහෙම වතුර ආපු ඉතිහාසයක් ඇත්තටම තිබුණේ නැහැ. අපට මතකයි, අඟල තියලා කෝට්ටක් ගහලා ආ... දැන් අඟලයි. පැයට අඟල් දෙකයි එහෙම කිය කියා වතුර ආවේ. එතකොට තමන්ගේ තිබෙන මොනවා හරි, කසාද සහතිකය හරි අඩුම ගණනේ පරිස්සම් කර ගෙන එහාට දාගෙන, ගොඩට දා ගෙන -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු මන්ත්‍රීතුමා, ඊයේ තීරණය කළා වහින වෙලාවට වාන් ඇරලා දාන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

වහින වෙලාවට තමයි දැන් - ඒක තමයි වෙලා තිබෙන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

වහින වෙලාවට. වැස්ස පටන් ගන්න වෙලාවට.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එහෙම තීරණය කරලා එහෙම වෙනවා නම් හොඳයි. නමුත් අපේ බුලත්සිංහලට ආපු බලධාරීන් තුන් දෙනෙකුට කිව්වාම කිව්වා, ඒක ලෙහෙසි වැඩක් නොවෙයි කියලා. නමුත් එහෙම වෙනවා නම් කමක් නැහැ. වතුර ගඟ හරහා නිදහසේ යයි. එහෙම නොවන තාක්කල් තමයි මේ ව්‍යසනය තුළ මේ ජලාශයට අඩි දෙකක් පිරෙන කල්, යට වතුර ටික අඩි දෙකක් උසට විතරක් දාන්න තිබෙන කල් මේගොල්ලෝ බලාගෙන හිටියා. අඩි දෙකක් තිබෙන කොට තමයි ඇරියේ. අරකෙන් එක පාරටම එන ජල කඳ තල්ලු කර ගෙන යන්නේ. ප්‍රෙෂර් කර ගෙන යන්නේ. අර හයි ප්‍රෙෂර් ගන් එක වාගේ තල්ලු කර ගෙන යන්නේ. එතකොට ගඟෙන් නොවෙයි. යන්න පුළුවන් කොහෙන්ද? සේරම යට කර ගෙන යනවා. පෙරළගෙන, හෝදාගෙන, තල්ලු කර ගෙන, ගෙවල් කඩාගෙන යන්නේ අන්න ඒ නිසයි.

අපි ඇත්තටම ඒකට විසඳුමක් හදන්න ඕනෑ. විදුලිය දෙනවා වාගේම, ඒගොල්ලෝ වතුර රැස් කරනවා වාගේම මේ වාගේ වෙලාවකදී මෙහෙම දෙයක් නොවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අද බුලත්සිංහල පාසල් පද්ධතිය ගත්තාම 50% ක් දරුවන්ට අද අඳින්න ඇඳුමක් නැහැ. පොත්පත් නැහැ. ඒ අයගේ කිසි දෙයක් නැහැ. ගෙවල් 198 ක් තිබෙනවා. අත්තිවාරමවත් ඉතිරි නොවුණු ජනතාවක්. සමහර ගෙවල් හැදුවේ මේ ජීවිත කාලේම, අවුරුදු තිහ හතළිහ ලෝන් එක අරගෙන පඩියෙන් කැපෙන්න. එහෙම හදපු ගෙවල්වලට ඒ අයට ආයිත් හිතන්න තැනක් නැහැ. හිතන්න දෙයක් නැහැ. අද යටගම්පිටිය ගත්තාම ගෙවල් 10 ක් එතැන කැඩිලා තිබෙන කොට ඊට පිටිපස්සේ මහා සොහොනක් තමයි තිබෙන්නේ. 23 දෙනෙක්, 24 දෙනෙක් වැළලුනු සොහොනක් එතැන තිබෙන්නේ. ඉස්සර මිනිස්සු සොහොන ළඟ ගෙවල් හදන්නේ නැහැ. අද ඒ අය කරන්නේ මොකක්ද? කළ යුත්තේ මොකක්ද කියන එක හිතාගන්න බැරිව ඉන්නේ. හැබැයි, රජයක් හැටියට අපි විශ්වාස කරනවා, ලක්ෂ 25 නොවෙයි කැඩුණු ගෙවල්වල වටිනාකම. නමුත් ලක්ෂ 25 ක් හරි කඩිනමින් දෙන්න, ඒ අයට කැමැති ආකාරයට කටයුතු කරගන්න. ඒ වාගේම, බුලත්සිංහල ආසනයේ අද 70% ක් ගත්තොත් නායයාම්වලට ලක් වෙනවා. අයින් වෙන්නය කියලා කියන්නේ. පිඹුර ඉස්පිරිතාලේ ඉස්සරහා තිබෙනවා, තට්ටු දෙකේ කඩ ටික. අපේ ආසනය. ඔබතුමාත් දන්නවා. ඒ තට්ටු දෙකේ සියලුම ගෙවල්වලට අයින් වෙන්නය කියලා තිබෙනවා. මම හිතන්නේ, මේ මහ පාර අයිනේ තිබෙන උඩ කන්ද එනවාය කියලා. කොහේ යන්නද? කෝටි ගණන් වැය කරලා හදපු ගෙවල් දාලා කොහේ යන්නද? මේකට ඇත්තටම අපි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. තව ඉස්සරහාට අඩු වෙන්නේ නැහැ. නාය යන එක මීට ඉස්සරහාට වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ. ඒකට යම්කිසි වැඩපිළිවෙළක් ඇත්තටම ක්‍රියාත්මක කළ යුතුමයි.

දැන් පාසල් ළමුන්ගෙන් 50% ක් යට වෙලා තිබෙන්නේ. ඒ අයට පොත්පත් නැහැ. අඳින්න ඇඳුමක් නැහැ. එවෙලේ ඇඳගෙන හිටපු එක විතරයි. අද ඇත්තටම අපි විශේෂයෙන්ම අපේ පළාත් සභාව හැටියට මීට වැඩිය, මම ඒකයි කිව්වේ. මේ යෝජනාවේ මුලිනුත් කිව්වේ, අඩුම ගණනේ ක්ෂණිකව ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඩෙංගුවලට මැරෙන එක ගැන අපි කථා කරමින් ඉන්න අතරේ තමයි මේක ආවේ. දැන් ඒක වැහුණා. ඒකේ මරණ සංඛ්‍යාව ගැන ඇත්තටම දැන් කවුරුවත් කථා කරන්නේ නැහැ. මොකද, මේ ගංවතුර හින්දා. නමුත් අපේ වගකීමක් තිබෙනවා, පළාත් සභාව හැටියට මීට වැඩිය. හැබැයි, අපේ මහ ඇමතිතුමා ඇතුළු ඇමතිවරු ඒ අයට පුළුවන් විධියට, ශක්තියට ඒ උදව් උපකාර කළා. පෞද්ගලික මට්ටමෙන් චේවා වෙනත් විධියට. නමුත් අපේ වගකීමක් හැටියට මේ රටේ බස්නාහිර පළාතේ ජනතාව ගෙවන බදුවල - ඒ බදු වැඩ පිළිවෙළ තුළ අපි අපේ වගකීම ඉටු කළේ නැහැයි කියන එක මම දකිනවා. හරිනම් මේ වන කොට පළාත් සභාව තුළින් අධ්‍යාපන අමාත්‍යාංශය අඩුම ගණනේ නිල ඇඳුමකුයි, කොපි පොත් ටිකවත් අරගෙන දෙන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපට හරි දාලා, අපේ විමධ්‍යගත අරමුදල්වලින් හරි දාලා අරගෙන දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් තිබෙනවා නම් අපි කාගෙන්වත් ඉල්ලන්නේ නැහැ. අපේ සල්ලි ඔක්කොම ඒ දරුවන්ට ලබා දෙනවා.

[ගරු ලලිත් වර්ණකුමාර]

අද අපේ පාසල් පද්ධතියේ තිබුණු 75% ක් පාසල් යට වෙලා තිබෙන්නේ. බුලත්සිංහල ආසනයේ පාසල් 75% ක් යට වෙලා, විනාශ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒවාට අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ වාගේම අපේ සමාජ සේවා එකෙන් යම්කිසි ආකාරයට යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ විෂයට අදාළ තැන්වලදී ඒ විෂයේ වගකීම දැරිය යුතුයි. මම දන්නේ නැහැ එතුමන්ලාට තිබෙන ප්‍රතිපාදන හෝ චක්‍රලේඛ තුළ අපි දන්නේ නැහැ. නමුත් එහෙම විය යුතුයි. අපි ගිය දේවල් ගිහිල්ලා මෙවැනි දේවල් ඉදිරියට නොවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගත යුතුයි. විශේෂයෙන්ම ඔරු, අඟුල් පැහැදිලිව අපි හඳුනාගත් ක්‍රමවේදයක් තුළ ස්ථානගත කරලා, ඒ අයට වගකීම් භාර දීලා ඒ වෙලාවට කටයුතු කරන්න ඕනෑ. අපට ලොකු අඩුපාඩුවක් තිබෙනවා. මම මේකට දොස් කියන්නේ නැහැ. මම දන්නේ නැහැ. තරඟ විභාග තියලා වැඩිම ලකුණු ගත්තාම ග්‍රාම නිලධාරීතුමන්ලා, තුමියන්ලා තෝරනවා. අපේ බුලත්සිංහල ඉන්නේ වැඩියෙන්ම ගැහැණු අය. සමහර වෙලාවට ඒ අය බෝට්ටුවට නගින්න භයයි. එතකොට අපි දැන් ආසනයක, දිස්ත්‍රික්කයක කටයුතු කරන කොට සමහර ග්‍රාම නිලධාරීතුමියන්ලාට වසමටවත් යන්න බැරි වුණු අවස්ථාව තිබෙනවා. ඉතින් මේවාට අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. එක්කෙනෙක් හැර එක්කෙනෙක්වත් අඩුම ගණනේ දාලා මේ පිරිමි හැටියට ඔරුවක යන්න පුළුවන් නම්, මොකක හරි එල්ලිලා යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඉතින් ඒ නිසා මම මීට වඩා කාලය ගන්නේ නැහැ. බොහොමයක් අය අද කථා කරන නිසා. මේ ව්‍යසනය කවුරුත් දන්නවා. මම අර කලින් කිව්වා වාගේ, මේ ව්‍යසනය තුළ කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල, ග්‍රාම සේවා වසම් 54 තමයි වැඩිම ව්‍යසනය තිබුණේ.

ඒ වාගේම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ නිලධාරීන් පුළුවන් ආකාරයට තමන්ගේ කැපවීමත් එක්ක වැඩ කටයුතු කළා. ඒක නැහැයි කියන්න බැහැ. ග්‍රාම නිලධාරීන් සමහරු ඒක 100% ක් කළා. සමහරු 75% ක්, 80% ක් කරන්න පුළුවන්. හැබැයි, සමහරු මගහැරියේ හෝ නොකරපු කොටසකුත් නැතිවා නොවෙයි. නමුත් ඒක තමයි වැඩියෙන් කියවෙන්නේ. අපේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම්තුමා ගත්තාම එතුමායි මමයි එකට ආසනයට ආවේ. අපි දෙන්නාටම වාහන දෙක මග දාලා පයින් යන්න වුණේ. නාය ගිහිල්ලා. කඳු කඩාගෙන වැටිලා. පාරවල් හරස් වෙලා. බුලත්සිංහලට කොහෙන්වත් එන්න බැරි තත්ත්වයක් උදා වුණා දවස් හයක් විතර. ඒ තුළ එතුමා ගෙදර ගියේ නැහැ. තිබුණු ඇඳුම සෝදා සෝදා තමයි - මමත් ගෙදර ගියේ දවස් හතරකට පස්සේ. ඇඳගෙන හිටපු එක පිටින් තමයි අපි කටයුතු කළේ. ඉතින් මහජන නියෝජිතයෝ හැමෝම තමන්ට පුළුවන් ආකාරයට - හැමෝම අසරණයි. යන්න එන්න බැහැ. තමන් ඉන්න තැන ඉඳලා එක තැනකට යා ගන්න බැරි අවස්ථා තිබුණා. නමුත් තමන්ට පුළුවන් ආකාරයේ තැන්වල ඉඳලා කටයුතු කළා. ඒ නිසා විශේෂයෙන්ම ඒ අයට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපේ වර්තමාන ජනාධිපතිතුමා ඊයේ බුලත්සිංහල ගිහිල්ලා, මේ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. මෙහෙම කරනවා. මේ වැඩ පිළිවෙළවල් තුළ ගිහිල්ලා. ඒ වාගේම ඊට පෙර ගං වතුර බැස්ස ගමන්ම අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇවිල්ලා පාහියංගලට ඇවිල්ලා, ඒ අය එක්ක කථා කරලා, ඒ දුකට ඇහුම්කන් දීලා ගියා. ඒ වාගේම අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා වන විශේෂයෙන්ම වෙල්ගම මැතිතුමා, රෝහිත අබේගුණවර්ධන මැතිතුමා, ජයන්ත සමරවීර මැතිතුමා, ඒ වාගේම මට මතක හැටියට ඒ පැත්තට ආපු සියලු දෙනාටම අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. මොකද, ඒක සමහර වෙලාවට මොකුත් නොගෙනාවාට, මොකුත් නුදුන්නාට ඒකට ලොකු හයියක් වුණු අවස්ථා තිබෙනවා. ඒ නිසා ඒ ආපු ගිය සියලු දෙනා වාගේම රාජකාරී කළ අපේ නිලධාරී සියලු දෙනාටම අපේ ස්තුතියත් ගෞරවයත් මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වාගේම මේ ලංකාවේ නොයෙකුත් තැන්වලින් බඩු භාණ්ඩ ආදිය අර ගෙන මේ විපතට පත් වුණු අයට සහනයක් වෙන්න උදව් කරපු සියලු දෙනාට ඇත්තටම මේ අවස්ථාවේදී ස්තුති කරමින් මෙවැනි ආකාරයේ ව්‍යසන මේ ලංකාවේ අපට විතරක් නොවෙයි. මේ ලංකාවේ කොහේවත් නොවේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.56]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේදී අපි සිදු වූ ඛේදවාචකය ගැන ශෝකය පළ කරනවාට වඩා අපි ශෝක වෙනවා. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. හැබැයි, අපි ආපහු හැරිලා බලන්න ඕනෑ, ඉතිහාසයේ අපි කළ කී දෑ පිළිබඳව. විශේෂයෙන්ම අපට මතකයි. 2004 දෙසැම්බර් 26 වැනිදා මේ රටට සුනාමි ආවා. ජීවිත දස දහස් ගණනක් නැති වුණා. නිවාස දස දහස් ගණනක් විනාශ වුණා. හැබැයි, රජය විවිධ නීති, අණ පනත් ගෙනාවා. මීටර් 100 ඇතුළේ රක්ෂිත ප්‍රදේශයේ වෙරළ තීරයේ ගොඩනැගිලි හදන්න බැහැයි කිව්වා. කිසියම් කාලයක් ඒක ක්‍රියාත්මක වුණා. දේශපාලඥයෝ විවිධ තර්ක ගෙනාවා. විසඳුම් ගෙනාවා. හැබැයි, ඊළඟ සුනාමිය වෙනකල් මොකද වෙන්නේ? අර පරිච්ඡේදය වහලා තිබ්බා. ඊළඟට පසුගිය වසර කිහිපයේදී අපි දැක්කා. මේ රටේ කාලගුණික, දේශගුණික විපර්යාස රැසක් වෙනවා. කාලගුණ විද්‍යාව, විද්‍යාවක් හැටියට දියුණු වුණත් අපි දැක්කා කියන වෙලාවට වහින්නේ නැහැ. වහින වෙලාවට කියන්නේ නැහැ. අපේ ආනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. මම අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමා එක්කත් දුරකථනයෙන් කථා කරලත් විමසුවා. හැම තැනම වහිනවා. කටානට වහින්නේ නැහැ. මේක මේ බරපතළ ප්‍රශ්නයක්. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් මැද්දේ ඉන්න කොට රටක් හැටියට අපි මොකක්ද කරන්න ඕනෑ. අපි තවම පාඩම් ඉගෙන ගෙන නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය වසරේ මේ වාගේම මහා ගංවතුරක් ආවා. අපි දැක්කා වෙච්ච විනාශය. විශාල වශයෙන් ජීවිත හානි වුණා. ඒ වාගේම දේපළ විශාල වශයෙන් හානි වුණා. දවස් ගණනාවක්, දින ගණනාවක් කොළඹ දිස්ත්‍රික්කයේ ගම්මාන ගණනාවක්, ප්‍රදේශ ගණනාවක් වතුරෙන් යට වෙලා තිබුණා. ඉතින් ඒ වෙලාවේ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට අපි රණ්ඩු වුණා. තර්ක කළා. ආධාර ඉල්ලුවා. මේ සභාව ඇතුළේම බරපතළ ප්‍රශ්න මතු වුණා. හැබැයි, එදා මෙදා තුර වසරක කාලය ඇතුළේ අපි මොනවාද කළේ? අපි කිසි දෙයක් කළේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ටික දවසක් යන කොට අපි කථා කරලා අර විධියටම මොකද කරන්නේ. ඒ පරිච්ඡේදය ඉවරයි. ඊළඟ ගංවතුර එනකල් ඉන්නවා. දැන් මේවාට කථා කරපු දේශපාලඥයෝ කෝ? කෙස් පැලෙන්න තර්ක ගෙනාපු, යෝජනා ගෙනාපු, විසඳුම් ගෙනාපු දේශපාලඥයෝ කෝ? නිලධාරීන් කෝ? ඒ කවුරුත් අවසානයේදී විසඳුමක් නොදී නිහඬව ඉන්න අතරතුරදී ආයිත් අර මාරයා එනවා. මේක හරියට හෙම්බිරිස්සාව වාගේ. ගමේ උණ හෙම්බිරිස්සාව වාගේ. දැන් අපි දන්නවා, උණ හෙම්බිරිස්සාව එනවා වාගේ හැම අවුරුද්දේම ගංවතුර එනවා. මොකද කරන්නේ? අර පස්පංගුව දීලා හෙම්බිරිස්සාව හොඳ කර ගන්නවා වාගේ එදාට කථා කරලා වැඩේ වහ ගන්නවා. එහෙම නැත්නම් ඉංග්‍රීසි බෙහෙත් ටික දීලා පිරිටනුයි, පැනඩෝල්ලුයි දීලා ප්‍රතිජීවක ඖෂධ දීලා එදාට වහගන්නවා. ඊට පස්සේ ඒ පරිච්ඡේදය ඉවරයි. ආයිත් ඊළඟ වසරෙත් එනවාය කියලා අපි කල්පනා කරන්නේ, ඇවිල්ලා යට කර ගෙන ගියාට පස්සේ.

මම දැක්කා, ඊයේ අගමැතිතුමා කරපු කථාවක එතුමා සඳහන් කළා. එතුමා සඳහන් කළා අඩුම ගණනේ මිලිමීටර් 100 ට වඩා වහිනකොට අනතුරු ඇඟවීමක් කරන්න තිබුණාය කියලා. මිලිමීටර් 500, 600 වහිනකල් ඇයි බලාගෙන හිටියේ. එහෙම වතුරක් එනකොට අනිවාර්යයෙන් මේ නාය යාම සිද්ධ වෙනවා, මේ ජල ගැලීම සිද්ධ වෙනවා කියලා. කවුරුවත් ගණන් ගත්තේ නැහැ. ඒ නිසා අපි මොකද කරන්නේ. ඊළඟ අවුරුද්දට එනකල් බලාගෙන ඉන්නවා. අපි මොකක්ද කළ යුතුව තිබුණේ. අපි කළ යුතුව තිබුණු කිසිම දෙයක් කළේ නැහැ. ගිය වසරේ ගංවතුර ආපු වෙලාවේ අපි මේ සභාවේදී යෝජනා කළා. මොකක්ද? පළාත් සභාවට සම්බන්ධව අපි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරමු කියලා. අපි එහෙම එකක් කළේ නැහැ. එහෙම යෝජනාවක් ආවේ නැහැ. මේ ප්‍රතිපත්ති සම්පාදකයෝ මොකටද ඉන්නේ? පළාත් සභාවේ මේ නිලධාරීන් මොකටද ඉන්නේ? අපි මොනවාද කරන්නේ? මේ ඇමතිවරු, මහ ඇමතිවරු මොකද කරන්නේ? ව්‍යසනයක් ආවාම එදාට මොකද කරන්නේ? බත් පැකට් එකක් බෙදනවා. එහෙම නැත්නම් පරණ ඇඳුම් ටිකක් ගිහිල්ලා බෙදනවා. මේ බොරුවට අපි හැමදාම ගිහිල්ලා රැවටෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනේ දැන්වත් කල්පනා කරලා අපි යම්කිසි එකඟතාවයකට එමු. මේ වාගේ ආපදා අවස්ථාවකදී මේ බලය දරන, ව්‍යවස්ථාපිත බලය දරන ආයතනයක් විධියට අපේ කාර්යභාරය මොකක්ද

[ගරු ලලිත් වර්ණකුමාර]

කියන එක ගැන. අපේ මන්ත්‍රීවරු අසරණයි. මම දැක්කා, අපේ වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා එහෙම පුදුම මහන්සියක් දරනවා. අපේ හැම මන්ත්‍රීවරයාම ඒ පළාතේ කටයුතු කරනවා අපි දැක්කා. තම තමන්ට හැකි පමණින් කරනවා. ඒත් අපට බලාගෙන ඉන්න වෙනවා, කවුරු හරි ආධාර ටිකක් ගෙනැත් දෙනකල්. මම ඒ අභියෝගයට මුහුණ දීපු කෙනෙක්. ගිය වසරේ කොළොන්නාව යට වුණු වෙලාවේ, මේ කුණු කන්ද නාය ගිය වෙලාවේ කවුරු හරි මොනවා හරි ගෙනැත් දෙනකල් ඉන්නවා. මිනිස්සු ඇවිල්ලා අපෙන් අහනවා ඇයි මන්ත්‍රීතුමා, පළාත් සභාවෙන් අපට මොකුත් දෙන්නේ නැද්ද කියලා. අපි කවුරු හරි දෙන කල් බලාගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේක තමයි තේරුම් ගන්න ඕනෑ. අපට වැඩ පිළිවෙළක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ වෙලාවේ දෙන්නම් කිව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

2500, එතුමා දෙන්නම් කියපු එක දෙන්න දුන්නේ නැහැ නේ? වැඩ බලන මහ ඇමතිතුමා දෙන්නම් කියපු එක දෙන්න දුන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි වහාම මේ වාගේ සැලසුම් සහගත වැඩ පිළිවෙළකට යන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ අපි කථා කරන දේවල් සමාජ සේවා ඇමතිතුමා, අනික් එක මේ පාසල් පද්ධති ගැන මේ මන්ත්‍රීවරු කථා කරනවා. අධ්‍යාපන ඇමතිතුමා මෙතැන ඉන්න ඕනෑ. ඒ නිසා මේ අවට ඉන්නවා නම් ඒ දෙදෙනාව වහාම කැඳවන්නය කියලා මම ඉල්ලා සිටිනවා. අපි කථා කරන දේ ඒගොල්ලෝ දැනුවත් වෙන්න ඕනෑ. අනික් එක ඒ ප්‍රදේශය ගැන කථා කරන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා, එතුමන්ලාට ඕනෑ එවෙලේ කථා කරලා දුවන්න. දැන් අර අධ්‍යාපන ඇමතිතුමා මගෙත් එක්ක රණ්ඩු වුණා. එතුමාට ඕනෑ එයා කලින් කථා කරලා දුවන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමන්ලා ඉන්නවා නම් පොඩ්ඩක් සම්බන්ධ වෙන්න කියනවා නම් හොඳයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම කනගාටුදායක තත්ත්වයක් මේක. මේ ප්‍රතිපත්ති සැලසුම් කරන අය මෙතැන ඉඳලා මේවා අහන්න ඕනෑ. තමන්ගේ අමාත්‍යාංශය යටතේ මොනවාද කරන්න ඕනෑ කියලා කථා කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපිත් මේක නවත්වලා දාලා ගියාම ඉවරයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. අපිත් ඉවර කරලා ගියාම ඉවරයි. මේක අපේ වැඩක් විතරද? ඒ නිසා දැන් අධ්‍යාපන ඇමතිතුමා නැති නිසා කියන්න දෙයක් නැහැ. එතුමා මේ ගංවතුර 20 ක හිටියාය කියනවා. එතුමා දන්නේ නැහැ, අමාත්‍යාංශයත් නාහය ළඟට ගිලිලා තිබෙන්නේ. එතුමාගේ ඔලුව උඩිනුත් තව ටික දවසකින් වතුර යනවා. එදාට තමයි තේරෙන්නේ අනේ, මම ගිලිලා කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමතිතුමනි, ඔබතුමාවත් මේක අහගන්න. මේවා කැබිනට් මණ්ඩලයේදී කථා කරන්න. කථා කරලා කියන්න, දෙයියනේ මේවා කරපල්ලා ගියා. ඔබතුමාට උවමනාවක් තිබුණා ගිය අවුරුද්දේ ගංවතුර වෙලාවේදී. ඔබතුමා අපට පෞද්ගලිකව උදව් කළා. ඒ නිසා ආපදා කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කළ යුතුයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම අපි දැක්කා අපට අවශ්‍ය උපකරණ නැහැ. හදිසියට බෝට්ටුවක් නැහැ. අඟුලක් නැහැ. මේවා අපට අවශ්‍යයයි. මේවා අවශ්‍ය මේ ප්‍රභූන්ගේ

ප්‍රයෝජනයට නොවෙයි. මහජනතාවගේ ප්‍රයෝජනයට මේවා ලබා දෙන්න කටයුතු කරන්න. ගිය සැරේ ඔබතුමා දැක්කා, අපට බෝට්ටු නැතිව කොයි තරම් දුකක් වින්දාද කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එවැනි වැඩ පිළිවෙළකට යන්න.

ඊළඟට මේ වහින වතුර ටික අපි කොයි තරම් නාස්ති කරනවාද? අපි කොළඹ දිස්ත්‍රික්කය සැලකුවොත් මේ වහින වතුර ප්‍රමාණයෙන් මහා විශාල ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. මේක ජාල ගත කරලා, මේ ටික එකතු කරලා, වැව් ටිකක් හදලා, තිබෙන වැව් වහපුවා, ගොඩ කරපුවා ආපහු යළි හාරලා මේ වතුර ටික රැක ගන්න. අපට කොයි තරම් දේවල් මේ ජලය ටිකෙන් කරන්න පුළුවන්ද? නමුත් අපි ඒවා කරන්නේ නැහැ. අපට එහෙම වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, අපි දන්නවා අඩුම ගණනේ අපට පුළුවන් - අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඉන්නවා. ඔබතුමා දන්නවාද? මේ කොළඹ දිස්ත්‍රික්කයේ අපට අක්කර දහස් ගණනක් තිබුණා. අක්කර දහස් ගණනක් තිබුණා, වගා කරපුවා. මොකද කළේ? ඔක්කොම ගොඩ කළා. 1000 ට තිබුණු එක 600 ට බැස්සා. මේ පරණ පාර්ලිමේන්තුව හදන කොට 77 ආණ්ඩුව ඇවිල්ලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුඹුරු ගොඩ කරන්න ඕනෑ කියලා කිව්වේ කවුද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි මේ කියන්නේ. පටන් ගත්තේ පාර්ලිමේන්තුව හදලා කිව්වාම, ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ කොහෙන්ද මේ වැඩේ පටන් ගත්තේ කියලා. මම දේශපාලන පක්ෂයකට චෝදනා කරනවා නොවෙයි. හැබැයි, ඒ වැරදි ප්‍රතිපත්තිය පසුගිය අවුරුදු විස්සෙත් ක්‍රියාත්මක කළාය කියලා ඔබතුමා මතක තියා ගන්න. 77 දී පටන් ගත්ත ඒ වැරදි ප්‍රතිපත්තිය පසුගිය අවුරුදු 20 ත් මේ ආණ්ඩු යටතේ මේක සිද්ධ වුණා. බරපතළ විධියට සිද්ධ වුණා. ඒ නිසා මේ පහත් බිම් ටික කළමනාකරණය කරන්න ඕනෑ. මේවා පළාත් සභාවේ වගකීමක්. මේවාට ව්‍යවස්ථාවෙන් බලය ලැබිලා තිබෙන්නේ. නමුත් අපි ඒ වගකීම කරන්නේ නැහැ. මේක තමයි ආපදා කළමනාකරණය කියන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ප්‍රඥප්ති හදන එක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අඩුම ගණනේ ඒකට අවශ්‍ය ප්‍රඥප්ති හදලා, ඒ ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ප්‍රතිපත්ති හදන්න ඕනෑ. ඒවාට අවශ්‍ය ආයතන පිහිටුවන්න ඕනෑ. නමුත් ඒවා සිද්ධ කරන්නේ නැතිව මොකක්ද මේ අපි කරන්නේ? ඒ නිසා මේ සැලසුම් සහගත වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. මේ ආපදා කළමනාකරණය කියන්නේ, වහිනකල් ඉඳලා බත් පැකට් බෙදන එක නොවෙයි. පරණ ඇඳුම් ටිකක් බෙදන එක නොවෙයි. ඒ නිසා පළාත් සභාවක් හැටියට මේ ජලය ටික කළමනාකරණය කර ගන්න. ආපදාවකට මුහුණ දෙන්න අවශ්‍ය ඒ ව්‍යුහය සකස් කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න මේ පළාත් සභාවේ ක්‍රියාත්මක වෙන්නය කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගාමිණී තිලකසිරි ඇමතිතුමා වැඩ බලපු වෙලාවේ ගිය වර ගං වතුර ආවාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්නේ කුමක් යටතේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සම්බන්ධව මේ සභාවේ විවාදයක් තිබුණා. මේ වාගේම. ඒ වෙලාවේ මම කිව්වා, මම සමාජ සේවා අමාත්‍යවරයා හැටියට ප්‍රඥප්තියක් හදලා මේ සභාවට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කථා කරන්නේ කොහොමද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සභාව සාක්ෂි මේකට. අද වන තුරු සභා කටයුතු තමුන්නාන්සේලා ඉන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකට දාලා ඒක අනුමත කළාද? අනුමත කළේ නැහැ මේක.

[අ.භා. 01.08]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ වෙලාව ලබා දීම පිළිබඳව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පොඩ්ඩක් ඉන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මගේ වෙලාව නැති වෙලා යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා නැවත මේක ගෙනැල්ලා ඒක කරන්න. තමුන්නාස්ටත් ගං වතුර තිබෙනවා නේ? අපටත් කරදරේ නේ එක්කහු කරලා දෙන්න මිනිස්සුන්ට.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක තමයි කියන්න හදන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වෙලාව නොවෙයි නේ මේකේ වටින්නේ. වෙලාව පැත්තකට දාන්න. මේ ප්‍රශ්න දිහා බලන්න. වෙලාව කන්නදැයි මේක තියා ගෙන ඉන්නේ. වෙලාව කන්න නොවෙයි ඇවිල්ලා තිබෙන්නේ. බත් පැකට් එක කන්න නොවෙයි ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අනුව කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි නීත්‍යානුකූලව කථා කරන්නේ - මට තිබෙනවා, 7 යටතේ කථා කරන්න වාචිකව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

36(1).

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

36(1) වරප්‍රසාද නේ? වාචිකව කථා කරන්න මට තිබෙනවා අයිතියක්. මේක අනුව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ වෙලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගංවතුර පිළිබඳව යෝජනා දෙකක් ඇවිල්ලා තිබෙනවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තිබෙනවා. ඒ යෝජනාවේ තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව මේ මියගිය අයට කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑය කියලා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තිබෙන්නේ, අවතැන් වුණු, මියගිය සහ අතුරුදහන් වුණු ප්‍රමාණය ගැන කියලා මේ අවතැන් වුණු අයට රු. 50,000 ක දීමනාවක් දෙන්නය කියලා. ඒ යෝජනා දෙකම යටතේ

වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය නිර්මාණය කරපු එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා මොරවක ආසනයේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු හිටපු මන්ත්‍රීතුමා 'ඉදිරි මග' කියලා පොතක් ලිව්වා. ඒකේදී ඉතා පැහැදිලිව කිව්වා, නිල්වලා ව්‍යාපෘතිය, නිල්වලා ගඟ, ගංවතුර පාලනය කරලා සංවර්ධනය කරන්නේ කොහොමද කියලා. අවුරුදු ගණනක් තිස්සේ මේ රට කථා කරනවා. ලංකාවේ ඉහළ ගංගාදාරවල වැව් හදලා සහ වැඩිය වැටෙන වතුර ඇල මාර්ගවලින් වියළි කලාපවලට ගෙනිහිල්ලා ගං වතුර පාලනය කරන්න පුළුවන් කියලා ගං වතුර පාලන සංවර්ධන සැලැස්මක් කිව්වා. අද වන කල් ඒ සංවර්ධ සැලැස්ම ක්‍රියාත්මක වීම රටේ සිද්ධ වුණේ නැති එකත්, ඒ වාගේම වැටුණු අසාමාන්‍ය වැස්සත් නිසා තමයි මේ අවාසනාවන්ත ඉරණම මේ රටට ලක් වුණේ. මම මේ වෙලාවේ කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. 2002 අවුරුද්දෙත් මෙවැනි ගංවතුරක් කළුතර දිස්ත්‍රික්කයට බලපෑවා. කළුතර දිස්ත්‍රික්කයේත්, රත්නපුර දිස්ත්‍රික්කයේත් අතිවිශාල ජනතාවක් මිය ගියා. ඒ වෙලාවේ බස්නාහිර පළාතේ හිටපු සමාජ සේවා ඇමතිවරයා විධියට මට මගේ අමාත්‍යාංශය යටතේ පුළුවන්කම ලැබුණා, මුළු අමාත්‍යාංශයම මෙහෙයවලා අති විශාල මුදලක් එවකට රජයෙන් ඉල්ලා ගෙන පළාත් සභාවේ අමාත්‍යාංශයට ගං වතුරට හානි වුණු සියලු නිවාසවලට, පුද්ගලයන්ට වන්දි ගෙවලා ඒ අයට අවශ්‍ය සහන සලස්වන්න, කළුතර දිස්ත්‍රික්කයේ අති විශාල මෙහෙවරක් කරන්න අපට පුළුවන්කම ලැබුණා. අපි එදා ගුවන් හමුදාවෙන් හෙලිකොප්ටර් යානා පළාත් සභාවට ගත්තා. අද පාර්ලිමේන්තුවේ ඉන්න ඇමතිවරු සියලු දෙනා මගේ හෙලිකොප්ටරයේ තමයි එදා ගං වතුර බලන්න කළුතර දිස්ත්‍රික්කයේ හැම තැනම ඇවිද්දේ. ලසන්ත අලගියවන්න ගරු ඇමතිතුමා එක්ක, රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාට මතක ඇති. අදත් වෙල්ගම ඇමතිතුමා හම්බ වුණාම මට කියනවා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වමනෙත් ගියා චොපර් එකේ පළමුවැනි සැරේ ගිහිල්ලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අදත් වෙල්ගම ඇමතිතුමා කියනවා මල්ලී, උඹ තමයි මට ඔරු ටික දුන්නේ කියලා. මට මතකයි. මේ ගංවතුර එන වෙලාවේ පාන්දර පහාමාරට මම ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාට කථා කළා. ඇමතිතුමා වතුර ගලනවා අවිස්සාවේල්ලට. ඔරු ඕනෑය කියලා. ඇමතිතුමා ඒ වෙලාවේ හොඳටම අසනීප වෙලා ඇඳේ හිටියේ. ඇමතිතුමා දහයට කථා කරලා ආපහු මගෙන් ඇහුවා මල්ලී කීයක් ඔරු ඕනෑද කියලා. හැබැයි, ඒ වන කොට ඔරුවලින් උදව් කරන්න බැහැ, මිනිස්සුන්ට. ඒ තරමම වතුර වැඩි වෙලා. මම කිව්වා, ඇමතිතුමා දැන් ඔරු නොවෙයි ඕනෑ. බෝට්ටු කියලා. වාසනාවකට නාවික හමුදාව අනෙක් හමුදාවල් අවිස්සාවේල්ලට බෝට්ටු ගෙනැල්ලා උදව් කරන්න පටන් ගත්තා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විශ්වාස කරන්නේ ගංවතුරක් ආවාම යෝජනා ගෙනැල්ලා, මෙහෙම ශෝක වෙලා, ශෝකය ප්‍රකාශ කරලා මේ කටයුත්ත හමාර කරලා ආයිත් මේක අමතක කරලා ඉස්සරහාට යන එක නොවෙයි අපි කරන්න ඕනෑ.

මේකට තිරසාර වූ විසඳුමක් අපි සොයා ගත යුතුව තිබෙනවා. අපි විශේෂයෙන් චෝදනා කරන්න සිද්ධ වෙනවා. ආණ්ඩුව භාරයේ තිබෙන, ආණ්ඩුවේ කාලගුණය පිළිබඳ අනාවැකි කියන ආයතනය මේ ගංවතුර ආවාට පස්සේ, මිනිස්සු වැළලුනාට පස්සේ, නාය ගියාට පස්සේ විවිධ අනාවැකි කියන්න පටන් ගත්තා. 29, 30 වහිනවා කියලා ආපහු කිව්වා. දැන් අවිස්සාවේල්ල ආසනයේ මිනිස්සුන්ගේ ගංවතුර බැහැලා ගියා දවස් තුනක් විතර යද්දී. හැබැයි, මිනිස්සුන්ට ගේ සුද්ද කර ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කිව්වා, ආපහු වහිනවාය කියලා. මිනිස්සු මඩ පිටින් හිටියා. තව පාරක් ගේ හෝදන්න බැහැ. ඊළඟ පාර ගැලුවාට පස්සේ, යට වුණාට පස්සේ එකපාරම හෝදා ගන්නවාය කියලා. හැබැයි, ඒ දවස් දෙකේම වැස්සේ නැහැ. මිනිස්සු මඩේ ගෙවල්වලට වෙලා හිටියා, ගෙවල් සෝදා ගත්තේ නැතිව. මේ අනාවැකිය කලින් කිව්වා නම්, වහින දවස් දෙකේ මිලිමීටර් 377 ක වැස්සක් පාදුක්කටයි, අවිස්සාවේල්ලටයි වහිනවා කියලා කිව්වා නම්, මේ හානිය අපට සිද්ධ වෙන්නේ නැහැ. කැලණි ගඟ ගලලා නොවෙයි විශාලම හානිය සිද්ධ වුණේ. පුස්සැල් ඔයයි, වක් ඔයයි කියන ඔයවල් දෙක ගලලා තමයි අවිස්සාවේල්ල ආසනයේ

[ගරු මහේෂ් අල්මේදා]

බරපතළම හානිය සිද්ධ වුණේ. හැබැයි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ පණිවිඩය, මේ අනාවැකිය කලින් කිව්වේ නැහැ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව භාර ඇමතිවරයා රටේ හිටියෙත් නැහැ. දැන් මේ වාගේ අනාවැකියක් ලෝකයේ ප්‍රකාශ කරන්නේ දවස් ගණනකට කලින්. මේ ඇමතිතුමාට රට ඇතුළේ ඉන්න තිබුණා. ඒ වාගේම ජනාධිපතිතුමාට රට ඇතුළේ ඉන්න තිබුණා. මේ නායකයෝ කවුරුවත් රට ඇතුළේ, හිටියේ නැහැ. ඒ නිසා මේවා හරියට කළමනාකරණය කර ගන්න බැරි වුණාය කියන කාරණාව තමයි අපට කියන්න තිබෙන්නේ. හමුදාවල් නොහිටියා නම්, අපි කාටවත් කට උත්තර නැතිව යනවා ගං වතුරෙන්. මිනිස්සුන්ගේ ජීවිත බේරුනා නම් බේරුනේ හමුදාවල සහාය හම්බ වුණු නිසා. ඒ නිසා හමුදාවේ සහායෙන් තමයි මේ ගංවතුර බොහෝ ප්‍රමාණයක් පාලනය කර ගන්න පුළුවන් වුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවිස්සාවේල්ල ආසනයේ එක ගෙයක් රෑ 11 ට පස් කන්ද වැටිලා යට වුණා. හතර දෙනෙක් එක්ක. මේ හතර දෙනා මැරෙන්නේ නැතිව බේරා ගත්තේ. සම්පූර්ණයෙන්ම යට වෙලා ගියා මේ මිනිස්සු. බේර ගත්තේ - අවට හිටපු මිනිස්සු රෑ ඇවිල්ලා, මේ ගේ හාරලා මිනිස්සුන්ගේ පණ යන්න ඉස්සෙල්ලා එළියට ගන්න. තවම ළඟ ගෙදරක මේ හතර දෙනා ඉන්නවා. අත පය කැඩිලා. රාජ්‍ය නිලධාරීන් ගිහිල්ලා තිබුණේ නැහැ බලන්න. රාජ්‍ය මැදිහත්වීම තවම සිද්ධ වෙලා තිබුණේ නැහැ. මේ අයගේ ඉතිරි කටයුතු කරන්න. තවම නිවසක් දීලා නැහැ මේ අයට ඉන්න. අහළ පහළ නිවසක මේ අය ඉන්නවා. ඒ අයගේ නාම ලේඛන, මේ අයට අනතුරක් වුණාය කියන නාම ලේඛනවලට ඇතුළත් කරලා, නම් සඳහන් කරලා ඒ අවශ්‍ය කටයුතු කරලා නැහැ. තුම්මෝදර හන්දියේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මල්ලි ඉඳලත් බලලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

දැන් වාරිමාර්ග ඇමතිතුමාගේ සහෝදරයාත් ඉන්නවා අපේ ආසනයේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශාල කන්දක් නාය ගියා තුම්මෝදර හන්දියේ. වක් ඔය එහෙම්පිටින් වැහිලා ගියා අඩි 25 ක් විතර. මේ කන්ද නාය ගිහිල්ලා. ඒ කන්ද නාය ගියාට පස්සේ භූ විද්‍යා හා පතල් සමීක්ෂණ ආයතනය, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, NBRO එක ඇවිල්ලා කිව්වා තුම්මෝදර නගරයෙන් අයින් වෙන්නය කියලා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මල්ලි ආවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

තුම්මෝදර නගරයෙන් එහෙම්පිටින්ම ජනතාව අයින් කරනු ලැබුවා. අද ඒ ජනතාව පන්සලක ඉන්නේ. තවමත්, අද දවසේත්, මේ මොහොතේත් නගරය සහ නගරය අවට තිබෙන සියලුම ජනතාව ඉන්නේ පන්සලේ. දැන් මේ අය පන්සලේ දිගින් දිගට තියාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ අය අයින් කරන්න ඕනෑ. දැන් අපි දන්නවා. ලංකාවේ විවිධ නිවාස ව්‍යාපෘති සම්බන්ධයෙන් මාධ්‍ය සංදර්ශන ගණනාවක් තිබෙනවා. ගෙවල් හදනවාය කියලා කියනවා. දැන් අවිස්සාවේල්ල ආසනයේ දඹෝර කියන ගමේ අක්කර 25 ක් විතර නිවාස ව්‍යාපෘතියක් සඳහා පවරා ගෙන තිබෙනවා. මේ අක්කර 25 පවරා ගත්තේ නිවාස ව්‍යාපෘතිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් කරන්න නොවෙයි. ඒක ගම් පුළුල් කිරීම යටතේ අවිස්සාවේල්ල ආසනයේ ඉන්න ජනතාවට ඉඩම් නැති අයට බෙදලා දෙන්න තමයි -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

25 ක් නොවෙයි. 10 යි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ අක්කර 10 වෙන් කළේ. හැබැයි, මේ අක්කර 10 අද නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න හදන්නේ. ඒ නිසා අපි මේ වෙලාවේ මතක් කරනවා. තුම්මෝදර හන්දියේ, තුම්මෝදර නගරයේ, පතහි වත්තේ, අවිස්සාවේල්ල ආසනයේ මේ අයින් කරපු ජනතාව වහාම ගිහිල්ලා ඒ ඉඩම්වල පදිංචි කරවන්න. එහෙම නැත්නම් හදන ගෙවල් ඒ ජනතාවට දෙන්නය කියලා. එහෙම නැති වුණොත් ඒ මිනිස්සුන්ට පන්සලේ තමයි ජීවත් වෙන්න වෙන්නේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ළඟ සැලැස්මක් නොතිබුණු කාරණය අපි කියන්නට ඕනෑ. සැලැස්මක් නොතිබුණු නිසා, වේලාසනින් අනාවැකි නොකියපු හින්දා. අද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අර මහින්ද රාජපක්ෂ මහත්තයාට අනාවැකි කියපු සුමනදාස අබේගුණවර්ධනගේ අනාවැකි වාගේම තමයි ඒ අනාවැකි. ඊට එහා ගිය, තාක්ෂණය මුසු වුණු, විද්‍යාව මුසු වුණු, අනාවැකි කියන ආයතනයක් බවට මේ ආයතනය පත් කළේ නැත්නම් මේ රටේ ජනතාවට තවදුරටත් අනතුරු සිද්ධ වීම වළකවන්න පුළුවන්කමක් නැහැ. ගිය අවුරුද්දේ මැයි මාසේ 16 වැනිදා තමයි අපට ගංවතුර ආවේ. මේ අවුරුද්දේ මැයි මාසේ 26 වැනිදා ගංවතුර අපට ආවේ. ඒ වාගේම ජූනි මාසේ 05 වැනිදා, ඊයේට අවුරුද්දක් වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාලාව හමුදා කඳවුර පුපුරලා ගිහිල්ලා. ගිය අවුරුද්දේ ගංවතුරට හානි වුණු සමහර අයට අද වෙන කොටත් අවශ්‍ය සහන සලසන්න කටයුතු කරලා නැහැ. සාලාව කඳවුරේ 90% කට ගෙව්වාය කියලා ගරු ඇමතිතුමා කියනවා. නමුත් බොහෝ අයට තවම අවශ්‍ය කරන ඒ වන්දි මුදල් ලබා දීම සිද්ධ කරලා නැහැ. මගේ සහෝදරයාගේ මාමණ්ඩිය මිය ගියා සාලාව කඳවුර පිපිරුවාට පස්සේ, ඒ සුන්බුන් ඉවත් කරන්න ගිහිල්ලා. ඔහුට හිමි වන්දි මුදල් අද වනකල් ගෙවලා නැහැ. ඒවා ගෙවන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විවිධ කඩදාසි නිර්මාණය කරලා තිබෙනවා. මුදල් එවන්නේ නැහැ. ඒ නිසා මේ ආපදාවලට ප්‍රමුඛතාවය දීම සිද්ධ කළ යුතුව තිබෙනවා, පවතින රජය. එහෙම නැති වුණොත් රජයට විරුද්ධව මතු වන විරෝධය නතර කරන්න පුළුවන්කමක් නැහැ. හැබැයි අද අපි දන්නවා, රජයට විරෝධය මතු වුණාම කරන්නේ මොනවද කියලා. අද විරෝධතා පවත්වන අයට ප්‍රහාර එල්ල කරන්න පොලීසිය පාවිච්චි කරන්නේ. ඒ නිසා මිනිස්සු පාරට ආවාට පස්සේ මිනිස්සුන්ට ගහන එක සිද්ධ කරන්නේ නැතිව, මිනිස්සු පාරට එන්න බලපාන කාරණා ටික නතර කරන්න රජය කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ, සැලසුමකට අනුව මේ හානි වුණු පුද්ගලයන්ට වන්දි සහ ඒ අයට අවශ්‍ය කරන සහන ටික සලසන්න රජය සුවිශේෂී වූ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම තමයි බස්නාහිර පළාත් සභාව. මේ විපත ඇති වුණාට පස්සේ, සමාජ සේවය කියලා කියන්නේ 100% ක් විමධ්‍යගත වුණු විෂයයක්. ඒක devolved subject එකක්. සමාජ සේවා විෂයය තිබෙන්නේ පළාත් සභාව ඇතුළේ. ඒ නිසා පළාත් සභාව ඇතුළේ සමාජ සේවා අංශයට අපි මුදල් වෙන් කරගන්න ඕනෑ. මුදල් සොයා ගන්න ඕනෑ. අපි අයවැය වෙන් කරද්දී අයවැයේ වැඩි කොටසක් සමාජ සේවා විෂයයට දාලා තිබෙන්න ඕනෑ. දැන් බස්නාහිර පළාත් සභා සමාජ සේවා අමාත්‍යාංශයට මම හිතන්නේ අබමල් රේණුවක උදව්වක් මේ හානියේදී සිද්ධ කරන්න පුළුවන්කම තිබුණේ නැහැ. අඩුම තරමින් පිසූ ආහාර වේලක්. අපි අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුති කරන්න ඕනෑ. බත් පාර්සල් 3000 ක් හදාගෙන එතුමා අපේ ප්‍රදේශවලට ආවා. ඇවිල්ලා බොහෝ තැන්වලට ඒවා බෙදුවා. මිනිස්සුන්ට දුන්නා. එතුමා මිනිස්සු අනාථ වුණු වෙලාවේ පෞද්ගලිකවත් සංචාරය කරලා විවිධ කාරණා සොයලා උදව් කෙරුවා. දැන් තුන්මෝදර නගරයේ නාය ගියාට පස්සේ ඒ නගරයේ අවට තිබෙන ගම්මාන රාශියකට විදුලිය නැතිව තිබුණා. එතුමා ඒ ස්ථානයට ආවේ විදුලිබල මණ්ඩලයේ ජ්‍යෙෂ්ට නිලධාරීන් සියලු දෙනා අරගෙනයි. පාර එහෙම් පිටින්ම වැහිලා ගියා. කොළඹට වතුර දෙන ප්‍රධාන බටය නාය යැමත් එක්ක කැඩිලා විනාශ වෙලා ගියා. ඒ වැව් දෙකට ළං වෙන්න තිබෙන ප්‍රධාන පාරවල් දෙක එහෙම්පිටින්ම වැහිලා ගියා. ලබුගම පාර. ඒ පාර සුද්ධ කරන්න අදාළ නිලධාරීන් අරගෙන තමයි ගරු මහ ඇමැතිතුමා ඒ ස්ථානයට ආවේ. ඇවිල්ලා ගරු මහ ඇමැතිතුමා උපදෙස් දීලා, එදා රෑ වෙන කොට විදුලි කණු 100 ක් විතර කඩාගෙන වැටිලා තිබුණා. ඒ සියල්ල ප්‍රතිසංස්කරණය කරලා විදුලිබලය දෙන්න අවශ්‍ය කටයුතු කෙරුවා. ඒ සම්බන්ධීකරණ කටයුත්ත කෙරුවා. මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරලා ලබුගම පාර සුද්ධ කරන කටයුත්ත එතුමා කෙරෙව්වා. ඒ නිසා එතුමා යම් වැඩ ප්‍රමාණයක් කෙරුවා.

නමුත් සමාජ සේවා විෂයය භාර අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයටත්, සමාජ සේවා දෙපාර්තමේන්තුවටත් මේ විපතේදී ජනතාවට උදව් කරන්න බැරිව ගියා. අපට කථා කරන්නවත් පුළුවන්කම තිබුණේ නැහැ. ඒ නිසා බස්නාහිර පළාත් සභා සමාජ සේවා අමාත්‍යාංශයත්, දෙපාර්තමේන්තුවත් විපතකදී මීට වඩා ක්‍රියාකාරී වෙන්න ඕනෑ. මොකද අපි දන්නවා, දැන් අවුරුද්දකට පාරක් ආයේ ගංවතුර එනවා කියලා. ගිය අවුරුද්දේ ආපු ගංවතුර මේ අවුරුද්දෙත් ආවා. ලබන අවුරුද්දෙත් එනවා. අර දැඩි නියගය තිබෙන කොට අව් රස්නය වැදිලා ආඩිය දාන කාලවකවානුවේ අපේ ගම්වල මිනිස්සු කිව්වා, පොසොන්

[ගරු මහේෂ් අල්මේදා]

එකට ගංවතුරක් එනවා කියලා. ගමේ මිනිස්සුන්ට එහෙම දැනීමක් තිබෙනවා. සමාජයේ පරිසරය පිළිබඳව. ස්වභාව ධර්මය පිළිබඳව දැනීමක් තිබෙනවා. හැබැයි ඒ පුංචි දැනීමවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තිබුණේ නැහැ. ඒ නිසා ඒ අය ඒ අනාවැකිය කිව්වේ නැහැ. ඒ අනාවැකිය වේලාසනින් කිව්වා නම් මේ හානි වන තැන්වල සියලු දෙනා අයින් කරගන්න තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟ කාරණය පළාත් පාලන ආයතන විසුරුවා හැර තිබීම, මේ විපතේදී ජනතාවට සේවය සලසන්න තිබුණු අවස්ථාවන් 50% ක් අහිමි කළා කියන කාරණය මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. පළාත් පාලන ආයතන තිබුණා නම්, බොහෝ කටයුතු රාශියක් අපට ඉෂ්ට කරගන්න තිබුණා. අද පළාත් පාලන ආයතන ඇතුළේ නිලධාරීන් විතරයි ඉන්නේ. මේ අයට දේශපාලන තීන්දු ගන්න බැහැ. ප්‍රතිපත්තිමය තීන්දු ගන්න බැහැ. සමහර වෙලාවට සමහර තැන්වලදී පළාත් පාලන ආයතනවලට උදව් කරන්න පුළුවන්කම තිබෙනවා. අපේ ආසනයේ ස්ථාන ගණනාවක් ලොකු ගල් වැටිලා පළාත් පාලන ආයතනය සතු පාරවල් වැහිලා ගියා. ඒවා කඩා ගන්න, අයින් කර ගන්න, තීන්දු ගන්න පළාත් පාලන ආයතනවලට බොහෝ වෙලාවට බැරිව ගියා. ඒ පළාත් පාලන ආයතන පිහිටුවලා නැති නිසා. දැන් අපි දන්නවා, අපි ඉන්නේ පශ්චාත් ගංවතුර කාලසීමාව ඇතුළේ. මේ කාලයේ තමයි රෝග විශාල විධියට ව්‍යාප්ත වෙන්නේ. දැන් පසුගිය අවුරුද්දේ මුළු අවුරුද්දටම හිටපු ඩෙංගු රෝගීන්ට වැඩිය පසුගිය මාස දෙකේ ඩෙංගු රෝගීන් ලංකාව ඇතුළේ වාර්තා වෙනවා. අපේ ආසනය තුළත් ඒ අත්දැකීම එළෙසම තිබෙනවා. සාමාන්‍යයෙන් ඩෙංගු රෝගීන් වැඩි වෙන්නේ ජූනි සහ ජූලි මාසවල. ඒ කියන්නේ, ලබන මාස දෙකේ ඩෙංගු රෝගීන් අසීමිත සංඛ්‍යාවක් වාර්තා වෙන්න පටන් ගන්නවා. මේ වැස්ස නිසා ඩෙංගු රෝගය විශාල විධියට පැතිරෙනවා. අද වෛද්‍ය සංගමය චෝදනාවක් කරනවා, ඩෙංගු සඳහා ලබා දෙන්න ඕනෑ එන්නත්, ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය ගෙන්වලා නැහැයි කියලා. මේ අනතුර වේලාසනින් සෞඛ්‍ය අමාත්‍යාංශය දකිනවා නම්, මේ වාර්තා ඉදිරිපත් කරනවා නම් ඒකට සූදානම් වෙන්න ඕනෑ. හැබැයි කයිවාරු ගහන සෞඛ්‍ය අමාත්‍යාංශයක් මිසක වැඩ කරන සෞඛ්‍ය අමාත්‍යාංශයක් තිබෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. කාණු කට කැපුවා වාගේ තමයි කථාව. හැබැයි වැඩේ හරියට සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා ඉතුරු මාස දෙකේ ඩෙංගු රෝගීන් වැඩි වෙන කොට ඊට මුහුණ දෙන්න සූදානම තිබෙන්න නම්, පළාත් පාලන ආයතන තිබෙන්න ඕනෑ. අපි දන්නවා, පළාත් පළාත් පාලන ආයතනයේ මන්ත්‍රීවරයා තමයි ගමට බැහැලා ගම සුද්ධ කළේ. ගමේ කාණු ටික කපලා දුන්නේ. ගමේ මිනිස්සුන්ට ශ්‍රමදාන ලැහැස්ති කරලා දුන්නේ. හැම හයියක්ම දුන්නේ පළාත් පාලන ආයතනයේ මන්ත්‍රීවරයා. ඒ මන්ත්‍රීවරයා අද ගමේ නැහැ. ගමේ එහෙම මන්ත්‍රීවරයෙක් පත් වෙන්න ඉඩකඩ තියලා නැහැ. මිනිස්සුන්ගෙ ප්‍රජාතන්ත්‍රීය අයිතිය උදුරගෙන තිබෙනවා. ඒකම නැවත ප්‍රහාරයක් බවට පත් වෙලා තිබෙනවා. ජනතාවට ස්වභාවික විපත්වලින් සිදුවන හානි වැඩි වෙන්න. ඒ නිසා පළාත් පාලන ආයතන මැතිවරණ තිබීම අනිවාර්යයෙන්ම වහාම සිද්ධ කළ යුතුයි, මේ ව්‍යසනයන්ට මුහුණ දෙන්න නම්. ඒ නිසා මේ කාරණයත් අපි රජයට මේ වෙලාවේ මතක් කරනවා. මැතිවරණ තියලා මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරලා මේ බල ආයතන ශක්තිමත් කරලා තියන්න. එතකොට මේ ව්‍යසනයන්ට මුහුණ දෙන්න පුළුවන් හැකියාව විශාල විධියට ලැබෙනවා. ඒ නිසා මේ කාරණාවත් මතක් කරනවා. අපි ශෝක යෝජනාවක් දාලා මිය ගිය අයට ශෝකය විතරක් ප්‍රකාශ කරලා හරි යන්නේ නැහැ. ඒ අයට සාධාරණය කරන්නත්, ජීවත්වන අය නැවත මෙවැනි විපතකින් මිය නොයන්නත් අවශ්‍ය පරිසරය, දේශපාලනික පරිසරය නිර්මාණය කිරීම තමයි සිද්ධ කළ යුතුව තිබෙන්නේ. ඒ කාරණය වෙනුවෙන් මේ රජය මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින්, නැවත නැවතත් බස්නාහිර පළාතේ ශෝකයත් මේ මිය ගිය අයට එකතු කරමින් වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[අ.භා. 01.22]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ හිතවත් සහෝදර කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවට

එතුමාට ස්තූතිවන්ත වෙනවා. මොකද, අපි මේ ගංවතුර උවදුරින් විපතට පත් වූවන්ව බේරා ගැනීමට සටන් කරපු කණ්ඩායමක් හැටියට.අපි දැක්කා, කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු පක්ෂ භේදයකින් තොරව සියලු දෙනා තමන්ට දිය හැකි දේ, තමන්ට ලබා දිය හැකි දේ, දීලා ඒ ජනතාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා. නමුත් අද 2017.06.06 වැනිදා මෙතුමා මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව ඒ විපතට පත් වූවන් සහ ඒ මියගිය අය වෙනුවෙන් අපේ ශෝකය ප්‍රකාශ කරනවා. නමුත් ඊට එහා ගිය දෙයක් අපි බලාපොරොත්තු වෙනවා. 2018 වර්ෂයේ හය වැනි මාසයේ හය වැනිදා වෙන කොට ආපසු මේ මිය ගිය අය වෙනුවෙන් අපි ශෝකය පළ කරනවාට වැඩිය හොඳයි රජයක් හැටියට, රටක් හැටියට ඉදිරියේදී අපි ආපදාවලට මුහුණ දෙන්නේ කෙසේද කියලා අපි සූදානම් වීම.

මොකද, කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපි දැක්කා. හැම තැනම නාය යන කොට වතුර එන කොට කියනවා, ආපදාවක් ළඟ තිබෙනවා. ඉවත් වෙන්න කියලා. පසුගිය කාලයේ අපේ රජයත් ඒකම තමයි කළේ. ඉවත් වෙන්න කියනවා. නමුත් මිනිස්සුන්ට ඉවත් වෙලා යන්නේ කෙසේද කියන එක තමයි ප්‍රශ්නයක් තිබෙන්නේ. මොකද, මේ ගංවතුර 24, 25 වැහලා 26 වැනිදා රෑ වෙන කොට අපට බුලත්සිංහල ආසනයෙන්, අගලවත්ත ආසනයෙන් දුරකථනවලට අමතලා කිව්වා අපිව යට වේගෙන එනවා කියලා. ඒ අඩියක් එකහාමාරක් එන කොට තමයි අපට කථා කළේ. නමුත් අපිත් මනුෂ්‍යයෝ හැටියට අපි කිසි කෙනෙකුට වාහනයක් අරගෙන ඒ ප්‍රදේශයට ළඟා වෙන්න බැහැ. වර්ෂාපතනය වැඩියි. අපි එළියට බැස්සොත් අපටත් ජීවිත අවදානමක් තිබුණා. ඒක නිසා අපි 26 වැනිදා එළිය වැටෙනතුරු ඉන්න කොට වෙන්න ඕනෑ සියල්ල වෙලා ඉවරයි. නාය ගිහිල්ලා, කඳු ඇවිල්ලා මිය ගිහිල්ලා අනික් පැත්තෙන් සමහර අය යට වෙලා, සමහර අය කඳු ගැටිවලට ගිහිල්ලා ඒ බඩගින්න නිවාගන්න කෑ ගහන කොට තමයි අපි යමක් අරගෙන ඒ ප්‍රදේශවලට ඇතුල් වුණේ. අපට බඩු ලැබුණා. මොකද මගේ සහෝදරයා රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාට, 26 වැනිදා හවස් වන කොට අපට ලක්ෂ 100 ක විතර වියළි ආහාර අපේ කාර්යාලයට ලැබුණා. අපට බෙදා ගන්න බැරිව සිටියා. අපි 26 වැනිදා බෝට්ටු අරගෙන ගිහිල්ලා අවසානයේදී බෝට්ටු හරවාගෙන එන්න සිද්ධ වුණා. සැඩ පහරවල් නිසා අපට ජීවිත අවධානමක් තිබුණා. අපි අගලවත්ත පාස් කරගෙන ගිහිල්ලා ඒ සීමාවෙන් වතුරට දාලා යන කොට ලයිට් කම්බි තිබුණේ වතුරට යටින්. අපි ගියේ ලයිට් කම්බි උඩින්. එහෙම ගොඩබිම්වලට ගිහිල්ලා තමයි අවම වශයෙන් මිනිස්සුන්ට කෑම ටිකක් දුන්නේ. නමුත් සියල්ලටම දෙන්න බැරි වුණා. ඒ හැමෝම බෙදෙන අතරේ අපි දැක්කා කොටු වුණු තැන්වල, හැංගුණු තැන්වල, ඒ ජනතාවට යන්න බැරි වුණු තැන්වල පැය 24 බඩගින්නේ හිටපු මිනිස්සු සිටියා. පැය 24 ක් බොන්න වතුර ටිකක් නැති මිනිස්සු අපි ඊට පස්සේ දැක්කා. දැන් අපට ගොඩබිමෙන් ගමන් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ලැජ්ජා වෙනවා. බස්නාහිර පළාත් සභාවෙන් කියලා එක රුපියලක දෙයක් බෙදන්න අපට බස්නාහිර පළාත් සභාවෙන් උරුම කරලා දුන්නේ නැහැ. අපි ගිහිල්ලා බෙදුවා. අපි දුන්නා. ඒ දුන්නේ අපේ ව්‍යාපාරික ප්‍රජාව, අපේ සහෝදරයෝ ඒ අපට ගෙනැල්ලා දුන්න දේ තමයි අපි බෙදුවේ. නමුත් බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අපට අන්‍යාතාවයක් තිබෙනවා. මේ බස්නාහිර පළාත් සභාවෙන් අපට මේක දුන්නේ. මේක අවතැන් වූවන්ට ගිහිල්ලා දෙන්නය කියලා දෙන්න එක රුපියලක දෙයක් අපට ලැබුණේ නැහැ. ඒක නිසා මම බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ලැජ්ජා වෙනවා. මේ දේ මෙතැන අද ප්‍රකාශ කරන්නේ ඒකයි.

ඒක නිසා මම යෝජනාවක් හැටියට ඔබතුමාට මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. ඉදිරියේදී මෙවැනි ආපදාවලදී ක්ෂණිකව ක්‍රියාත්මක වී ජනතාවට සේවය ලබා දීම සඳහා එක් මන්ත්‍රීවරයෙකුට ඍජු ප්‍රතිපාදනයක් වෙන් කිරීම ඉතාම සුදුසු බව මම මේ සභාවට යෝජනා කරනවා. ඉදිරි අනාගතයේදී මුහුණ දෙන්නේ කෙසේද කියලා අපි හැඩ ගැහෙන්න ඕනෑ. අපි ආපදාවකදී ඒ අයට යන්න කියලා ගුවන් විදුලියෙන්, ටෙලි විෂන්වලින්, පත්තරවලින්, ලවුඩ්ස් පීකර් ගැට ගහලා කිව්වාට ඒ මිනිස්සුන්ට යන්න තැනක් නැහැ. රජයක් හැටියට අපි ලැහැස්ති වෙන්න ඕනෑ. ඒ ආපදා වන ස්ථානයේ ඉන්න අයව ස්ථාපිත කරන්න තැනක්. මම දැක්කා, දැන් ඊයේ පෙරෙයිදා අපේ ආපදා විෂයය භාර ඇමැතිවරයා කියනවා, ඒ වාගේ ස්ථාන ස්ථාපිත කරනවා කියලා. අපි ප්‍රමාදයි. මේවා වෙන්න ඕනෑ, මීට පෙර. මම හය නැතිව කියනවා. අපේ රජය තිබෙන කාලයේත් මේවාට සැලසුමක් තිබිලා නැහැ. නමුත් අපේ රජය

[ගරු පී.ආර්.පී. අබේගුණවර්ධන]

තිබෙන කාලයේත් ගංවතුර ආවා. අපි ගංවතුර උවදුරට මුහුණ දුන්නා. ප්‍රාදේශීය සභා, නගර සභා නියෝජනය කරන මන්ත්‍රීවරුත් එක්ක. අපට බඩු ටික ලැබුණාම ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරු අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියටත්, එක්සත් ජාතික පක්ෂය හැටියටත්, ජනතා විමුක්ති පෙරමුණ හැටියටත් ඒ තමන්ගේ සහෝදර මන්ත්‍රීවරුන්ට කථා කරලා කිව්වා. ඔය අහවල් ස්ථානයේ ඔබ ඉන්න. අපි මේ බඩු ටික අරගෙන, බෝට්ටු ටික අරගෙන එනවා කියලා. අපි අරගෙන ගිහිල්ලා ඒ බෝට්ටු ටික දාලා, ඒ බඩු ටික දීලා නිසි කළමනාකාරීත්වයකින් ගමට බෙදා දුන්නා. නමුත් අද ප්‍රාදේශී සභා, නගර සභා නැති පාඩුව අපි මේ ගංවතුර උවදුරේදී බොහොම පැහැදිලිව දැක්කා. ඒ මන්ත්‍රීවරු ඒ කරතව්‍යය කරන්න එතැනට ආවේ නැහැ. සියලු මන්ත්‍රීවරු, පක්ෂ භේදයකින් තොරව බොහොම හිතේ අමාරුවෙන්, බොහොම කේන්තියෙන් මේ ආපදාවලට ඉදිරිපත් වුණේ, බොහොම සුළු පිරිසක්. අපට ඡන්ද අයිතිය ලබා දීලා නැහැයි කියලා. ඒක නිසා මේ වුණු සිදු වීම සම්බන්ධයෙන් මේ රජය අනුගමනය කරන මතය වෙනස් කරලා, ඉදිරියේදී මැතිවරණයකට මුහුණ දෙන්න ජනතාවට ඡන්දය ලබා දීමක් අවශ්‍යයි කියලා අපි දකිනවා.

ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩිදුර කථා කරන්නේ නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ අපි විශාල ඛේදවාචකයකට මුහුණ දුන්නා. අපේ සහෝදර සහෝදරියෝ, තාත්තලා අම්මලා, දෙමව්පියෝ විශාල සංඛ්‍යාවක් මිය ගියා. විශාල සංඛ්‍යාවක් තවමත් අර ගෙවල් එක්ක පස්වලට යට වෙලා උඩට ගන්නේ නැතිව තිබෙනවා. අපි ඒ ස්ථානවලට ගියා. ගියාම ඒ ගමේ ඉන්න මිනිස්සු අපට කිව්වා, මහත්තයෝ මෙතැන ගෙවල් මෙච්චර තිබුණා. මේ ගෙවල්වල හිටපු අයගේ නම් ටික මෙන්න. මේ පස් යට මේ අය තවම ඉන්නවා කියලා. අද වන කොටත් ගත්තේ නැහැ. ගන්න බැහැ. ඒක නිසා තීන්දු කරලා තිබෙනවා, ඒ ස්ථානවල එහෙම්මම තියලා ඒ ස්ථාන සොහොන් බිමක් බවට පරිවර්තනය කරන්න. ඒක නිසා කළුතර දිස්ත්‍රික්කයේ අයට විතරක් නොවෙයි. මුළු ලංකාවේම මේ ආපදාවෙන් මිය ගිය අයට අපේ කනගාටුව අපි ප්‍රකාශ කරනවා. ඒ අවස්ථාවේදී කළුතර දිස්ත්‍රික්කයේ සහයෝගය දීපු ඒ සියලුම මන්ත්‍රීවරුන්ටත් ඒ කළුතර දිස්ත්‍රික්කයේ අපේ සහෝදර ඒ පිරිස්වලටත් අපට උදව් කරපු ව්‍යාපාරිකයන්ටත් අපි මේ අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම හදවතින් ස්තුතිවන්ත වෙමින් ඉදිරියේදී මේ වාගේ ඛේදවාචකයකට මුහුණ නොදෙන්න අපේ සහෝදරවරුන්ට, අපේ ජනතාවට මේ රටේ ඉන්න සියලුම ජනතාවට මේ වාගේ ඛේදවාචකයට මුහුණ දෙන්න ලැබෙන්න එපා කියන ප්‍රාර්ථනාව කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 01.29]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාත් ගෙනා යෝජනාව පිළිබඳව කළුතර දිස්ත්‍රික්කයේත්, ඒ අවට දිස්ත්‍රික්කවලත් අවතැන් වූ ජනතාව වෙනුවෙන් මුලින්ම ශෝකය ප්‍රකාශ කරන අතර, ඒ අවතැන් වූවන්ට කනගාටුව ප්‍රකාශ කරන ගමන්ම කථා ගණනාවකට ඇහුම්කන් දෙන්න සිද්ධ වුණා. මම හිතන්නේ අපි හැමදාම කුණු කන්ද පාත් වුණු දා සිට බැලුවත්, සුනාමිය පැමිණි දවසේ සිට බැලුවත් ඊට පෙරත් ඈත ඉතිහාසයේත්, අතීතයේත්, මම හිතන්නේ අනාගතයේත් අපි බලාපොරොත්තු වෙන්නේ, තවත් ව්‍යසනයක් සිද්ධ වුණාම, ආධාර බෙදන ක්‍රමයත්, මොකක්ද ඒ දෙන ක්‍රමය කියලා මේ සභාවේ සාකච්ඡා කරන එකයි කියන එක තමයි මගේ නම් මතය. මම හිතන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ගංවතුර ව්‍යසනයෙන් බේරුවලින් බෝට්ටු 12 ක් යැව්වාම, ඒ බෝට්ටු ටික අරගෙන යන්න ලොරිත් අරගෙන යන්න සිද්ධ වුණා. බෝට්ටුවෙන් එගොඩට ගිහිල්ලා එගොඩින් තවත් යට වුණු තැන්වලට යන්නට ලොරි නැති නිසා ඒ ගම්වලට බෝට්ටුව ළඟා වෙන්න දවස් දෙකක් ගියා. එහෙම තත්ත්වයක් පත් වුණු ව්‍යසනයක් එක්ක තමයි අපි මේ කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ නම් මතය මේවා වෙනස් වෙන්නට ඕනෑ. අපි ආධාර බෙදනවාට වඩා අදත් කියනවා, ඉංගිරියෙන් එහා පැත්තේ තිබෙන කන්ද නාය යන්න තිබෙන්නේ. වැස්ස කාලයක ඒ කන්ද නාය ගියා නම් මුළු රත්නපුර දිස්ත්‍රික්කය ඉංගිරියෙන් උඩහට යට වෙයි කියනවා. කළු ගඟ හරස් වෙලා. එහෙමනම් මීට වඩා ව්‍යසනයක් අපට බලාපොරොත්තු වෙන්නයි සිද්ධ වෙන්නේ. හැබැයි, මේවාට විසඳුම් තිබෙන එක ගැන අපි බලන්නේ නැහැ. බස්නාහිර පළාත් සභාව හැටියට අපට

බෝට්ටුවක් ලබා දෙන්න බැරි තත්ත්වයක්. ආණ්ඩුව දෙවැනි කොට තිබෙන විශාලම පළාත් සභාව. මුදල් පරිහරණය වන පළාත් සභාවේ හදිසි ආපදා තත්ත්වයකට අපට බෝට්ටුවක් ලබා ගන්න, ඔරුවක් ලබා ගන්න බැරි තත්ත්වයකට අපි පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඔය තැන් පරීක්ෂා කරලා බලලා හැමදාම, මම හිතන්නේ 2013 යට වුණා. 2014 යට වුණා. මහා ව්‍යසනයක් හැටියට 2013. අද 2017 යට වෙන කොටත් ඒ ප්‍රදේශම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි යට වුණේ.

එහෙමනම් අපට හැකියාවක් තිබෙනවා, ආපදා කළමනාකරණය කියන්නේ, ආපදා කළමනාකරණ අමාත්‍යාංශ වැඩ පිළිවෙළ කියන්නේ මොකක්ද? ආපදාවට ලක් වූවන්ට සහනයක් සැලසීම නොවෙයි වෙන්නට ඕනෑ. ආපදාවක් වෙන්නට පෙර කළමනාකරණය කිරීමයි ආපදා කළමනාකරණය වෙන්නට ඕනෑ. මේ රට තුළ ඒ දේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ දේ ක්‍රියාත්මක වුණා නම් එදා ක්ෂණිකව විවෘත වන - මම හිතන්නේ විදුලි යෝජනා ක්‍රමය කුකුලේ ගඟ යෝජනා ක්‍රමය. ඒ විදුලි යෝජනා ක්‍රමය ක්ෂණිකව විවෘත වන්නේ මහා පරිමාණ වතුර ජල ප්‍රමාණයක්. මහා විශාල ජල කඳක් ජනතාවගේ ඔළුට පාත් කරලා දාන්නේ, බුලත්සිංහල ප්‍රදේශයට පාත් වෙන්නේ මේ ජල ගංගාව. මේවා පරිහරණය කරලා යවන්නට හැකියාවක් නැහැ. අදටත් විසඳුමක් ලබා දීලා නැහැ. ඒ නිසා මේවාට විසඳුම් ලබා දෙන්නට ඕනෑ. බෝට්ටු ලබා ගැනීමේදී මම හිතන්නේ රෝද තිබෙන බෝට්ටු අද ලංකාවේත් තිබෙනවා. පාරෙත් යන්න පුළුවන්. ජලයෙත් යන්න පුළුවන් බෝට්ටු ලබා දෙන්නට ඕනෑ. ඒ නිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන මේ හඳුනා ගත්තු ප්‍රදේශ තෝරාගෙන අපි ඒවා ලබා දෙන්නට ඕනෑ.

මට කනගාටුවෙන් කියන්නට වෙන්නේ. රබර් ගස් ටිකක් කපා ගන්නට අර ඉලෙක්ට්‍රික් පිහියක්, චේන්සෝ එකකක් ලබා ගන්නට දර්ගා නගරයට යන්න වුණා. ඒ ප්‍රදේශයම යට වෙලා. දර්ගා නගරයෙන් චේන්සෝ එකක් අරගෙන ගිහිල්ලා, තවත් බෝට්ටුවක අරගෙන ගිහිල්ලා තමයි ගහක් කපන්නට චේන්සෝ එකක් අරගෙන යන්න සිද්ධ වුණේ. පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය මට දුරකථනයෙන් සිකුරාදා උදේ හතට කථා කරනවා. එතුමියට ප්‍රාදේශීය සභාවට එන්න බැහැ. යතුර තිබෙන තැන කියලා එතැනින් යතුර ලබාගෙන ඇවිල්ලා බේරුවල නගර සභාවේ බෝට්ටු දෙක පාලින්ද නුවරට යවන කොට බෝට්ටු දෙක ලොරියත් එක්ක ගිහිල්ලා නතර වෙනවා. ඊට එහාට යන්නට බැහැ. එතැනින් බෝට්ටු දෙක අරගෙන ගියත් තව අඩි 100 ක්, 200 ක් ගිහිල්ලා වතුරින් එගොඩට ගියාම එතැනින් යන්න පාර දන්නේ නැහැ. බේරුවල බෝට්ටු එළවන අයට ඒ ප්‍රදේශයේ කොහොමද බෝට්ටු ක්‍රියාත්මක කරන්නේ කියලා දන්නේ නැහැ. මහ සයුරේ බෝට්ටු ගියාට ඔය ඇළවල් කැළෑවල් අස්සේ බෝට්ටු පදින්නට ඒ ස්කීපර්ලාට දන්නේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභාවල්වලට ස්කීපර්ලා දීලා පුරුදු කරන්නට සිද්ධ වෙනවා. බෝට්ටු දෙන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි නිකන් සහනාධාර ගැන කථා කරනවා. මේ රටේ කිසිම කෙනෙක් බඩගින්නේ ඉන්න තියන්නේ නැහැ, මේ රටේ ජනතාව. මේ රටේ බෞද්ධ වෙන්න පුළුවන්, සිංහල වෙන්න පුළුවන්. මුස්ලිම් වෙන්න පුළුවන්. දෙමළ වෙන්න පුළුවන්. මේ සියලුම දෙනා විනාඩි ගණනෙන්, තත්පර ගණනෙන් ප්‍රවෘත්තිය ලැබෙන කොට මේ අසරණ අයට කෑම දෙන්න ලැහැස්ති වෙලා තමයි ඒ කෑම ටික අරගෙන ගියේ. හැබැයි අරගෙන ගිය කෑම ටික නරක් වෙන කොටවත් බෙදලා දෙන්න බැරි තත්ත්වයකට ඒ අවට ග්‍රාමසේවක මහත්වරු ගංවතුරවලට යට වෙලා තිබුණේ. ඒ නිසා මේවාට පිළියම් සොයනවා මිසක නැවතත් ගංවතුරට යට වුණු මොහොතක එහෙම නැත්නම් තවත් ආපදා තත්ත්වයකට යට වුණු කාලයක පිළියම් සහනාධාරයක් හැටියට ලබා දෙනවාට වැඩිය යම් පිළියමක් ලබා දිය යුතුයි. ආපදා තත්ත්වයක් ඇති වෙන්න පෙර අපි ඒ ප්‍රදේශවලට මොකක්ද කළ යුත්තේ කියන එක තීරණය කළ යුතුයි. පළමුවෙන්ම මම මේ සභාවට යෝජනා කරනවා. මේ ගංවතුරට යට වෙන ප්‍රදේශවල නිවාස හදන්නට ප්‍රාදේශීය සභාවට අවසර දෙන්න එපා කියන යෝජනාව මේ සභාවේ ගෙනෙන්න ඕනෑ. මේ අය එක තැන ගෙවල් හදාගෙන නැවත නැවතත් යට වෙවී, යට වෙවී, පල් වෙවී ජීවිත ගත කරනවාට වඩා මේ අයගේ අනාගතය ගැන මේ රටේ රජයක් හැටියට, මේ ප්‍රදේශය පළාත් සභාව හැටියට ඒ සභාව, අපි දැනුවත් කරන්නට ඕනෑ. ඒ නිසා එවැනි යෝජනාවක් හැටියට මම ඉදිරිපත් කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම හිතන්නේ කථා කරන්න දීර්ඝ ප්‍රශ්න ගණනාවක් තිබුණත් මගේ අසනීප තත්ත්වයත්, මම හිතන්නේ නෝම්බි අල්ලගෙන කථා කිරීමට අපහසු තත්ත්වයක් තිබෙන බැවින් මගේ කථාව අවසන් කරන්න සිද්ධ වෙනවා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.37]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අද ඉතාම වැදගත් යෝජනාවක් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, අපේ හිතවත් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාත් ගෙනාවේ. කළුතර දිස්ත්‍රික්කයට විශාල හානියක් වුණු වෙලාවක ඒ පිළිබඳව බස්නාහිර පළාත් සභාවට මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ රජය බලයට පත් වුණාට පස්සේ ව්‍යසනයන් ගණනාවක් සිද්ධ වුණේ. දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඔබතුමා දන්නවා, පසුගිය දවස්වල නියගයක් ආවා. ඒ නියගයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ මිනිස්සු අනන්ත අප්‍රමාණ පීඩාවට පත් වුණා. එදිනෙදා අවශ්‍ය කරන ආහාර ටිකවත් ලබා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මිරිස් කිලෝව රුපියල් එක් දහස් ගණනටත් ගියා. නියගයෙන් මිදිලා අපට වර්ෂාව, ජලය ලබා ගැනීම සඳහා මේ රට පුරාම ජනාධිපතිතුමා ඇතුළු මැති ඇමැතිවරු, විවිධ සංවිධාන, විහාරස්ථානවල බෝධි පූජා පැවැත් වූවා. අපට ජලය ලබා ගැනීම සඳහා. අපි නොහිතපු වෙලාවක විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ කළුතර දිස්ත්‍රික්කයේත්, කොළඹ දිස්ත්‍රික්කයේත් මැතිවරණ කොට්ඨාශ කිහිපයක මේ ගංවතුර උවදුරින් පීඩාවට පත්ව වුණු මැතිවරණ කොට්ඨාශ ගණනාවක් තිබුණා. පාලින්ද නුවර, බුලත්සිංහල, ඉංගිරිය, අගලවත්ත ප්‍රදේශවල ඉතාමත්ම දරුණු විධියට, නොහිතපු විධියට මේ ගංවතුර වලට ජනතාවට මුහුණ දෙන්න සිද්ධ වුණා. රජයක් හැටියට මේක රජයත් දැනගෙන සිටියේ නැහැ. ජනතාව හැටියට ජනතාව දැනගෙන සිටියෙත් නැහැ. මෙවැනි ව්‍යසනයක් වෙයි කියලා.

දැන් උදාහරණයක් වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා දන්නවා. ගහ ගලාගෙන ගිහිල්ලා ගහට පස් කන්ද වැටුණාම ගඟේ යන්න තිබුණු වතුර ටික දිගටම යන්න බැරි වුණා. ඒ ජල පහර තමයි එගොඩට ගසාගෙන ගිහිල්ලා ගෙවල් ගණනාවක්ම හානියට පත් වුණේ. ඒක ඔබතුමාත් මමත් ඇස් දෙකෙන් දැකපු දේවල්. ඒ නිසා අපට ඒ පිළිබඳව කථා කරන්න පුළුවන්. සමහර අවස්ථාවල රජයකට දොස් කියනවා. රජයක ඉන්නෙත් මිනිස්සු. රජයක නායකයෙක් ඉන්නවා. යම්කිසි ව්‍යසනයක් වෙනවා කියලා දැනුම් දීම කරන්න රාජ්‍ය ආයතන කිහිපයක් තිබෙනවා. ඒ රාජ්‍ය ආයතනවලින් ඒ පිළිබඳව හරියට ක්‍රමානුකූලව දැනුවත් කිරීමක් නොකෙරුණොත් රජයේ ප්‍රධානියා සිට මුළු සියලුදෙනාම අමාරුවේ වැටෙනවා. අපි ඒ පිළිබඳව කිසිඳු මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්කමක් නැහැ. අපි දේශපාලඥයින් හැටියට, ප්‍රජා සංවිධාන හැටියට, ගම්වැසියන් හැටියට, ජාති, ආගම් කුල භේදයෙන් තොරව සියලුම දෙනාට තිබෙන්නේ, යමක් සිද්ධ වුණායින් පස්සේ ගිහිල්ලා උදව් කිරීම පමණයි. ඉන් එහාට දෙයක් අපට නැහැ. ඒ පිළිබඳව දැනුවත් කිරීම කරන්න ඕනෑ, රාජ්‍ය ආයතනවලින්. ඒක සිද්ධ වුණේ නැහැයි කියන එක ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුගේම මුවින් ප්‍රකාශයට පත් වුණා.

මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම මේ කියන්නේ. දැන් විවිධ අදහස් ප්‍රකාශ වුණා. මේ අපේ ආණ්ඩුව. මේ කාටවත් දොස් කියනවා නොවෙයි. 2013.07.04 වැනිදා නිකුත් කරපු චක්‍රලේඛයේ දිනකට පිසූ ආහාරවලට වෙන් කරලා තිබුණේ රුපියල් 150 යි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

රු.115 යි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

රුපියල් 150/- යි. 2016 ගංවතුර වෙලාවේ මේක රුපියල් 225/- ට වැඩි කළා. (බාධා කිරීමක්) එතුමා දන්නේ නැතිව ඇති. 2017 මැයි මාසයේ රුපියල් 300/- දක්වා වැඩි කළා. ජනතාව මේවා දැනුවත් වෙන්න ඕනෑ. රජයක් කරන වැඩ - රජයක් කියන්නේ මහජනතාව. අපි මොන රජයක් පත් වුණත්, මහින්ද මහත්මයා සිටියත්, මෛත්‍රීපාල මහත්මයා සිටියත්, රනිල් මහත්තයා සිටියත් මේවා කළ යුතු දේවල්. මේවා නොකර ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ජනතාවක් හැටියට හැම වෙලාවකම ජනතාව පක්ෂ භේදයකින්, ආගම් කුල භේදයකින් තොරව - මම පෙරේදා දැක්කා. රෙජිනෝල්ඩ් කුරේ ගරු ආණ්ඩුකාරතුමා සමඟ කෝටි ගණනක බඩු අරගෙන දමිළ ජනතාව ආවා. මුස්ලිම් ජනතාව. සිංහල ජනතාව -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක ඇත්ත.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මෙතුමාටත් ලබා දුන්නා ඊයේ පෙරෙයිදා. මට පෙන්නුවා ඒක. අපි දෙන්නාම ගිහිල්ලා ඒ ටිකකුත් බෙදුවා. ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වියලි ආහාර මේ චක්‍රලේඛය අනුව එක පුද්ගලයෙකුට තිබුණේ රුපියල් 385/- යි. ඒක 2016.12.30 වැනිදා රුපියල් 700/- ට වැඩි කළා. 2017 මැයි මාසයේ රුපියල් 900/- ට වැඩි කළා. ඒ අනුව දෙන්නෙක් ඉන්න පවුලක රුපියල් 490/- තිබුණු එක මේ වන කොට රුපියල් 1200/- යි. තුන් දෙනෙකුට දීලා තිබුණු රුපියල් 595/- මේ වන කොට රුපියල් 1400/- යි. හතර දෙනෙක් හිටපු පවුලකට 2013 චක්‍රලේඛයෙන් රුපියල් 700/- යි තිබුණේ. මේ වනකොට රුපියල් 1600/- යි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සතියකට නේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඔව්. සතියකට. එතකොට පස් දෙනෙක් ඉන්න පවුලකට එදා තිබුණේ රුපියල් 805/- යි. අද රුපියල් 1800/- ක් ලැබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

භාණ්ඩවල මිල වැඩි වෙලා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

භාණ්ඩවල මිල - මම මේ රජයක් විවේචනය කරනවා නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු ඇමැතිතුමා මේකත් කියන්න. එදා තිබුණු මුදලට සාපේක්ෂව අද භාණ්ඩවල මිල වැඩියි. ඒකත් කියන්න.



**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2016.12.30 වැනිදා වැඩි කළේ 225 යි. මැයි මාසයේ රුපියල් 300 දක්වා වැඩි කළා. ඒකම වෙන්න බැහැ. යම්කිසි ප්‍රමාණයකට ඒකත් වෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා, මම ඒක පිළිගන්නවා. ඒ නිසා කොයි හැටි වෙතත් අපි මේ කාටවත්වත් දොස් කියන්නේ නැහැ. කිසිම රජයකට අපි දොස් කියන්නේ නැහැ. මේ හැම රජයක්ම ජනතාව පත් කරලා යවපු රජයවල්. මහින්ද මහත්මයා සිටියත්, චන්ද්‍රිකා මැතිනිය සිටියත්, මොන කවුරු සිටියත් ජනතාව පත් කරලා යවපු රජයවල්. නමුත් මම මේ වෙලාවේ සතුටු වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දොස් කියන්න බැහැ. ආණ්ඩු දෙකේම ඇමැතිවරයා වෙලා සිටියා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාජ්‍ය සේවකයන් ගැන අපි වචනයක් කථා කරන්න ඕනෑ. සමහර මිනිස්සු ග්‍රාමසේවක නිලධාරි මහත්වරුන්ට බණිනවා. සමහර වෙලාවට ග්‍රාමසේවා මහත්වරු 100 ක් ගත්තොත් එක පුද්ගලයෙක් වැරදි වැඩක් කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නමුත් ග්‍රාමසේවක නිලධාරීන්, ආර්ථික නිලධාරීන්, අර නිලධාරීන්, මේ නිලධාරීන් සියලුදෙනා එකතු වෙලා රජයෙන් ලබා දීපු වියලි ආහාර පිසලා ජනතාව අතරට ලබා දීමට අපි කටයුතු කළා. මේ බස්නාහිර පළාත් සභාවට යුතුකමක් තිබෙනවා කියන එක අපි පිළිගන්න ඕනෑ. මේ තරම් ව්‍යසනයක් වෙලා අමාත්‍යාංශයක් යටතේ කිසිම වැඩක් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව කියන්නේ පොඩි පළාත් සභාවක් නොවෙයි. මන්ත්‍රීවරු 104 ක් ඉන්න පළාත් සභාවක්. විශාලම පළාත් සභාව. මේ රටේ ජනතාවගෙන් 1/3 ක් ජීවත් වෙන පළාත් සභාවක්. මේ පළාත් සභාව ගැන අපට ලැජ්ජයි. ඇත්ත කථාව. ඒ කියන්නේ අද තත්ත්වය නොවෙයි. එදා සිටම මේ පළිබඳව නීති සකස් කළෙත් නැහැ. ප්‍රඥප්ති ඇති කළේත් නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පාන්දර 05.30 ට කථා කරන කොට මම පාන්දර බෙහෙත් අරගෙන

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

ඇවිල්ලා නිදාගෙන සිටියේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ගාමිණී අයියේ මට ඔරු දෙකක් එවන්න කියලා. මම කොහොම හරි මොන ක්‍රමයකින් හරි උදේ 09.00 වෙන කොට ඒ දෙක සොයා ගත්තා. මම ඇහුවා මල්ලියේ කොහාටද එවන්න ඕනෑ කිව්වාම, මට කිව්වා අවශ්‍ය නැහැයි කියලා. ඒ නිසා මෙතැනදී අපි කාටවත් දොස් කියන්න යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඉස්සරහාට අපි යමක් කරන්න - දැන් මම පෙරේදා ගරු මහ ඇමැතිතුමා පෞද්ගලිකවම එතුමාගේ අමාත්‍යාංශවලින් ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් වෙන් කළා. මොකද, ප්‍රාදේශීය සභාවන්වලින් යම්කිසි වැඩ කොටසක් කරනවා. ඒක පළාත් පාලන ආයතනවලින් කරනවා. ලයිට් ටික දාලා දෙන්න පුළුවන්කම තිබුණා. එතකොට සමහර පාරවල් ටික හදලා දෙන්න පුළුවන්කම ලැබුණා. ළිං ටික සුද්ධ කරලා දෙන්න පුළුවන්කම ලැබුණා. එතුමා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයකට ගිහිල්ලා ජනතාවත් එක්ක මහජන නියෝජිතයෙක් එක්ක හිටපු අයද, ඉන්න අයද කියලා බැලුවේ නැහැ. සියලු දෙනාත් එක් සාකච්ඡා කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාලින්ද නුවරට ගිය වෙලාවේ මන්ත්‍රී කෙනෙක් නැඟිටලා කිව්වා, හිටපු මන්ත්‍රීවරයෙක්. මම දන්නේ නැහැ පක්ෂය මොකක්ද කියලා. මම මේ වෙලාවේදී කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එතුමා කිව්වා, අපේ කොට්ඨාශය තුළ ස්ථාන 25 ක් මේ ගංවතුර උවදුරට පත් වුණා කිව්වා. ස්ථාන 25 ක්. අපට රෑ සිද්ධ වෙලා උදේ වන කොට එගොඩ යන්න බැරි වුණා. මෙගොඩ එන්න බැරි වුණා. ආහාර ටිකක් දෙන්න බැරි වුණා කිව්වා. ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. අපේ හැම ගමකටම, අපට බෝට්ටු ඕනෑ නැහැ. අපට ඔරු දෙක ගණනේ ලැබෙන්න සලස්වන්න කිව්වා. නැවත ගංවතුර එන වෙලාවක් කොයි වෙලාවේද කියන්න බැහැයි කියලා. මම උදේ ගරු මහ ඇමැතිතුමාට කිව්වා. මේ පිළිබඳව අපි ඉක්මන් තීන්දුවක් ගන්න ඕනෑ. එක එක්කෙනාගේ පස්සෙන් ගිහිල්ලා, අපට මහ ආණ්ඩුව පස්සෙන් ගිහිල්ලා, පෞද්ගලික වෙළෙන්දෝ ගාවට ගිහිල්ලා, පෞද්ගලික ව්‍යාපාරිකයන් ගාවට ගිහිල්ලා හිඟා කන්න පුළුවන්කමක් නැහැ. බෝට්ටුවක් දෙන්න කියන්න පුළුවන්කමක් නැහැ. අපේ අන්‍යාතාවය තියාගෙන බස්නාහිර පළාත කියන්නේ කුමක්ද කියන එක තියාගෙන අපි ස්ථිරව වැඩ කරන්න පුරුදු වෙමු. ඒ නිසා මම හෙට හදිසි කැබිනට් රැස්වීමක් කැඳවන්න කියලා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කිව්වා. එතුමා එකඟ වුණා. මම කැබිනට් පත්‍රිකාවක් දානවා, බස්නාහිර පළාතේ ගංවතුරෙන් යට වන සෑම ස්ථානයකටම අඩුම වශයෙන් ඔරු දෙකක්වත් ලබා දීමට කටයුතු කරන්න. ඒ නිසා අපි යමක් කළ යුතුයි. අපෙන් ඉල්ලුවාම, ධීවර ඇමැති වුණත් ඔරුවක් බෝට්ටුවක් දෙන්න පුළුවන්කමක් නැහැ. බෝට්ටුවක් සොයා ගන්න ලංකාවේ හැම තැනම යන්න වෙලා තිබෙනවා. එතකොට මෙතැන වැඩ සිද්ධ වෙලා අවසානයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අඩුපාඩුකම් තිබෙනවා. මේක යම්කිසි පුද්ගලයෙකුට වුණ දෙයක් නොවෙයි. අපේ සියලුම රටවාසී ජනතාවට සිදු වුණු විනාශයක්. ස්වභාවික විනාශයන්වලදී අපි යම් යම් අයට දොස් කීම වැරැදියි.

දැන් ඊයේ රාත්‍රියේ අතිගරු ජනාධිපතිතුමා මහනායක හිමිවරු ඇතුළු ගෞරවනීය මහා සංඝරත්නය 1000 ක් ටොරින්ටන් චතුරශ්‍රයට වැඩම්මුවා. පිරිත් සජ්ඣායනයක් කළා. මෙවැනි විපත්තියක් නැවත වෙන්නේ නැති වෙන්න කියලා. ඒ නිසා අපි මෙතැනදී දේශපාලඥයින්ට - දැන් සමහර මිනිස්සු සමහර මාධ්‍ය නාලිකාවල කරන දෙයක් තමයි - මාධ්‍ය නාලිකාවලින් යමක් කරන්න කැමැතියි. අපි කැමැතියි. මොකෝ ප්‍රචාරයට කැමැතියි නේ? මාධ්‍ය විශාල සේවාවක් කළා. අනන්ත අප්‍රමාණ බඩු අරගෙන ගියා. එතැනට ගිහිල්ලත් මයික් එක දෙන්නේ ආණ්ඩුවට විරුද්ධව බණිනවා නම් විතරයි. අපිට කෑම පැකට් එක හම්බ වුණේ නැහැ. අපට වතුර ටික හම්බ වුණේ නැහැ. අපට අරක හම්බ වුණේ නැහැයි කියලා බණිනවා නම් විතරයි ඒක කරන්නේ. එතැනත් වාසියක් ගන්නවා. ඒ මාකට්ං. දැන් මෙතැන අපේ අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා කිව්වා, තමන්ගේ සහෝදරයාට ලක්ෂ 100 ක බඩු ලැබුණා කියලා. මොකද, එතුමා විපක්ෂයේ කියලා ලක්ෂ 100 බඩු ටික ගෙදර තියාගෙන හිටියේ යැ? එතුමාත් ව්‍යසනයට ගෙනැල්ලා මේ ටික භාර දුන්නා. අපි පක්ෂයක් පාටක් බැලුවේ නැහැ. මට තවත් කවුද මන්ත්‍රීවරයෙක් කිව්වා, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා පවුල් කීයකටද මන්දා කොසු ඉදල් පෞද්ගලිකව බෙදුවා කියලා. මෙතුමා මට කිව්වේ. ඒ නිසා මෙතැනදී පක්ෂයක්, පාටක්, කාටවත්වත් බණින්න ඕනෑ නැහැ. අපි සියලු දෙනාම එකතු වෙලා මේ ව්‍යසනයට මුහුණ දෙන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. හැම නැති වුණොත් අපට හැමදාම වෙන්නේ බැණ බැණ ඉන්න.

මම දීර්සව කථා කරන්න යන්නේ නැහැ. බස්නාහිර පළාත් සභාවක් හැටියට මේ බස්නාහිර පළාත් සභාව තුළ ඊළඟ එන නියගයේදී - නියගය ආවත් අපට ප්‍රශ්නයක්. මේ හැම අවස්ථාවකටම මුහුණ දෙන්න පුළුවන් වෙනම ඒකකයක් හදලා මේවාට මුහුණ දෙන්න අපි වැඩ කටයුතු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඒ ජනතාව දක්වපු සහයෝගය - ත්‍රිවිධ හමුදාව දක්වපු සහයෝගය පිළිබඳව අපට පැත්තක තියන්න පුළුවන්කමක් නැහැ. ඒ මිනිස්සු නොසිටින්න මීටත් වඩා බරපතළ විධියට මේ මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න ආණ්ඩුවකට සිද්ධ වෙනවා. ඒ නිසා කථා කළ යුතු බොහෝ දේ තිබුණත්, මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ ගරු සභාපතිතුමනි. ලබන අවුරුද්දේද? තව මාස හයකින්ද කියන එක අපට කියන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ සඳහා පක්ෂ පාට භේදයකින් තොරව සියලුම දෙනා එකතු වෙලා මේ රටට ව්‍යසනයන් වලදී මුහුණ දීමට කටයුතු කරන්න බස්නාහිර පළාත් සභාවක් හැටියට අපි සියලුමදෙනා සූදානම් වෙමුයි කියන පණිවිඩය කියමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරද්දී මතු කළෙත් ඕක තමයි. ගරු ඇමැතිතුමා කෘෂිකර්ම, ධීවර ඒකට ඇඳගන්න ආපදා කළමනාකරණ අමාත්‍ය කියලා කොටසකුත් හදන්න. ආපදා කැල්ලත් දාලා ගරු ඇමැතිතුමා මේ මන්ත්‍රීතුමන්ලා කථා කරලා කියන්නේ පරිපූරක ඇස්තමේන්තු දාන්න මේ වාගේ වෙලාවට. මේවා දාලා ගන්න. පරිපූරක දාලා ගන්න. ඒක තමයි මේ කියන්නේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

නැතුව වාහන එහෙම ගෙන්වන්න නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පරිපූරක දාලා ගන්න.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

වාහන එහෙම ගෙන්වන්න නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, තිබෙන අමාත්‍යාංශයේ මුදල් හදිසි ආපදාවලට ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආපදා කැල්ලක් හදලා ගම්මු ඕකට. මීළඟට මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 01.51]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගියදා ඇති වුණු ගංවතුර උවදුර නිසා අපේ රටේ ජීවිත විශාල ප්‍රමාණයක් විනාශ වෙලා, විශාල ජනතාවකට තමන්ගේ උන්හිටි තැන් නැති වෙලා විශාල කරදර රාශියක් වුණා. එම නිසා මුලින්ම අපේ මියගිය පිරිසට ශෝකය ප්‍රකාශ කරනවාත් එක්කම පසුගිය 2016 අවුරුද්දෙත් මැයි මාසයේ මුල් වකවානුව තුළ මීට වඩා දරුණු විශාල ව්‍යසනයක් අපේ රටේ ඇති වුණා. ඊට නොදෙවෙනි, ඊට පොඩ්ඩක් අඩුවෙන් තමයි මෙවර ගංවතුර ආවේ. නමුත් ඊට වඩා විශාල මරණ ප්‍රමාණයක් වාර්තා වුණා. ඒ මරණ ප්‍රමාණය නිසා ලංකාවේ සිදු වුණු විශාලතම හානියත් මෙවර ගංවතුරෙන් වාර්තා වුණා. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රක්කයෙන් තමයි මෙවර ගංවතුර ආවේ. නමුත් ඊට වඩා විශාල මරණ ප්‍රමාණයක් වාර්තා වුණා. මරණ ප්‍රමාණය නිසා ලංකාවේ සිදු වුණු විශාලතම හානියත් මෙවර ගංවතුරෙන් වාර්තා වුණා. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය විශාල වශයෙන් හානි වෙනවාත් එක්කම ගම්පහ දිස්ත්‍රික්කයේ මරණ පහක් සිදු වෙලා මම හිතන්නේ ජනතාවට විශාල හානියක් සිද්ධ වුණා. කළුතර දිස්ත්‍රික්කය පිළිබඳව කථා කළා. රත්නපුර දිස්ත්‍රික්කය පිළිබඳව කථා කරනකොට විශේෂයෙන් අපි ජීවත්වන ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම මැතිවරණ කොට්ඨාශය පිළිබඳව කථා කරන්න ඕනෑ.

මට මතක් වෙනවා, පසුගිය 2016 ගංවතුර එනකොට බස්නාහිර පළාත් සභාව වශයෙන් අපි සාකච්ඡා කරලා, පළාත් සභාවේ අපි රැස්වීම් කිහිපයක් පවත්වලා, බස්නාහිර පළාත් සභාව තුළින් යම්කිසි සහනයක් ලබා

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

දෙන්න මම හිතන්නේ අපි උත්සාහයක් දැරුවා. ඒ 2016 ගංවතුරෙදී. නමුත් ඒ කටයුත්ත බස්නාහිර පළාතට කෙසේ වෙතත් බියගම මැතිවරණ කොට්ඨාශය කියන්නේ කැලණි ගඟේ මිටියාවතේ තිබෙන ප්‍රදේශයක්. පහත් බිමක්. අපේ මැතිවරණ කොට්ඨාශයට බස්නාහිර පළාත් සභාව තුළින් 2016 ගංවතුරට කිසිඳු සහනයක් ලබා දුන්නේ නැහැ. මට මතකයි අතිගරු ජනාධිපතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයට ආවාට පස්සේ එතුමා කිව්වා, ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර උවදුර වන කොට විශේෂයෙන් බියගම මැතිවරණ කොට්ඨාශයේ ඇළවේලි ටික සුද්ධ කරන්නට 2016 ජූලි මාසයේ 07 වැනිදා තිබුණු පත්තලගෙදර තිබුණු රැස්වීමේදී එතුමා උපදෙස් දුන්නා. නමුත් අවුරුද්දක් වෙන කොටවත් මේ බස්නාහිර පළාත් සභාව මැදිහත් වෙලා කිසිඳු ඇළක් සුද්ධ කිරීමට අපට අවස්ථාවක් ලැබුණේ නැහැ. මෙතැන ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාත් ඉන්නවා. මම හිතන්නේ ඔබතුමාත් ජනාධිපතිතුමාගේ රැස්වීමට සම්බන්ධ වුණා. එතුමාට කරන්න දෙයක් තිබුණේ නැහැ. එතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔක්කොටම ඉතුරු වෙලා තිබෙන්නේ එතුමා විතරයි.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

විශාල කාර්ය භාරයක් කළත්, එතුමාත් දැන් කිව්වේ මුදල් ප්‍රතිපාදන නැහැයි කියලා. මම හිතන්නේ ඔරුවක් ගන්නවත් අපේ පළාත් සභාවට සහයෝගයක් ලබා දුන්නේ නැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. ගරු අමාත්‍යතුමනි පසුගියදා සිදු වුණු ගංවතුරෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මරණ පහයි සිද්ධ වුණේ. ඒ මරණ පහෙන් මරණ තුනක් වුණේ බියගම මැතිවරණ කොට්ඨාශයේ. ඒක නිසා විශේෂයෙන්ම ග්‍රාමසේවා කොට්ඨාශ 23 ක් තුළ පවුල් 3771 ක් අපේ ආසනයේ අසරණභාවයට පත් වුණා. විශේෂයෙන්ම කඳවුරු 24 ක් තිබුණා. මේ පසුගිය කාලසීමාව තුළදී මධ්‍යම ආණ්ඩුවෙන් ඔය කිව්වා වාගේ රුපියල් 200/- යි ආධාර දුන්නේ. මේ රුපියල් 200/- දුන්නේ ඊයේ පෙරෙයිදා නොවෙයි. අවුරුදු ගණනාවකට කලින්. නමුත් මෙවර ජනාධිපතිතුමා මැදිහත් වෙලා රුපියල් 300/- කළා. මේ රුපියල් 300/- යවත් මම හිතන්නේ මිනිස්සුන්ට හම්බ වෙයිද දන්නේ නැහැ, ගරු මන්ත්‍රීවරුනි. අපි රුපියල් 300/- ක් කිව්වාට පසුගිය දවස්වල - ඊයේ පෙරෙයිදා පත්තරවල තිබෙනවා මම දැක්කා සමහර ග්‍රාමසේවක මහත්වරුත් ආධාර මංකොල්ල කාලා. රාජ්‍ය නිලධාරීන්. ඒක තමයි ඇත්ත කථාව. ඉතින් ඒක නිසා අපි බස්නාහිර පළාත් සභාව වශයෙන් මේක කොච්චර කථා කළත්, අපි මධ්‍යම ආණ්ඩුවට කොච්චර කිව්වත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක වැඩක් නැහැ. අපි කරන්න ඕනෑ පළාත් සභාව වශයෙන් අපට කරන්න තිබුණු යුතුකම. බස්නාහිර පළාත් සභාව විසින් මේ ගංවතුරට, අපට විශාල කාර්ය භාරයක් කරන්න නොවෙයි. මම දන්න තරමට මොකුත්ම වුණේ නැහැ. බියගම මැතිවරණ කොට්ඨාශයට නම් මම දන්න තරමට නම් මොකුත් වුණේ නැහැ. 2016 ගංවතුරටත් මොකුත්ම වුණේ නැහැ. අපි දැක්කා, පසුගිය කාලයේ 2016 ගංවතුරට මේ පළාත් සභාව තුළින් යම්කිසි ආධාර ප්‍රමාණයක් දුන්නා. ඒ ආධාර දෙන කොට ගංවතුර නොගලපු ආසනවලටත් ඒආධාර ලබා දුන්නා. අපට ආධාර ලබා දුන්නේ නැහැ. ඉතින් අපි ඉල්ලීමක් කරනවා. බස්නාහිර පළාත් සභාව හරහා අපි සියලුම ගරු අමාත්‍යතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ පළාත් සභාව ආරම්භ කරලා දැන් අවුරුදු 30 ක් වෙනවා. අවුරුදු 30 ක් වුණත් මේ පළාත් සභාවට තවම ඔරුවක්, බෝට්ටුවක් නැහැයි කියන එක ලැජ්ජාවක්. අපේ ධීවර ඇමැතිතුමා, ඔබතුමාට වග කියන්න බැහැ. ඔබතුමා මෑත කාලයේ පත් වුණේ. ඒ නිසා අපි සියලුම දෙනා එකතු වෙලා, අපි 104 දෙනාම එකතු වෙලා පක්ෂ භේදයකින් තොරව අඩුම ගණනේ මේ බස්නාහිර පළාත් සභාවට බෝට්ටු කිහිපයක් හරි, ඔරු කිහිපයක් හරි අරගෙන මේ කැලණි ගඟ තුළින් සහ අනිකුත් ගංගාවලින් වන ව්‍යසනයට මම හිතන්නේ විශාල වශයෙන් සහනයක් සලසන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. පසුගිය දවස්වල මරණ වුණා. ඒ මරණ වන කොට අපි දැක්කා අතිගරු ජනාධිපතිතුමා කිව්වා ඒකට විශාල වශයෙන් සහනයක් දෙනවා කියලා. ඒ එක්කම ගෙවල් කැඩුණු ඒවාට දෙන මුදල වැඩි කරනවා කිව්වා. සම්පූර්ණයෙන්ම විනාශ වුණු ගෙයකට රුපියල් ලක්ෂ 25 ක් දෙනවා කියලා කිව්වා. මේ දෙනවා කියලා කිව්වාට මම හිතන්නේ මේක ප්‍රායෝගිකව ඔප්පු කරන්න ඕනෑ. අපි ඉල්ලීමක් කරනවා. අපි සියලු දෙනාම එකතු වෙලා, දේශපාලන පක්ෂවලට මඩ

ගහගන්නේ නැතිව මේ ගංවතුරට අපි ඔක්කොම වග කියන්න ඕනෑ. මේ ගංවතුර එන්නේ අනවසර ඉදිකිරීම් - පළාත් පාලන ආයතනවල සභාපතිවරු, පළාත් පාලන ආයතනවල හිටපු ප්‍රධාන ලේකම්වරු මම හිතන්නේ මේවාට වගකියන්න ඕනෑ. මම දැක්කා. සමහර තැන්වල කාණු වහලා තමයි බිල්ඩින් ගහලා තිබෙන්නේ. වතුර බහින්න ක්‍රමයක් නැහැ. ඉතින් ඒ නිසා විශේෂයෙන්ම මේ ගංවතුරේදී අපි සියලුම දෙනා අසරණ වුණා. මොකද, මමත් බියගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් සිටියා. එතුමාත් සිටියා. අපි දෙන්නාම සිටියා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දෙන්නාගේ කාලයේ ගහලා නැද්ද?

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඒ කාල සීමාව තුළ මම හිතන්නේ ගංවතුර නොගැලුවත් අද වන කොට ඉතාමත් දරුණු ව්‍යසනයක් එල්ල වෙලා තිබෙන්නේ. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා, දෙන්නාගේ කාලයේ ගහලා නැද්ද?

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

එහෙම ගැහුවා නම් අද අපට මෙතැනට එන්න බැහැ. ඉතින් ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. මේ ගංවතුර උවදුර නිසා විශාල වශයෙන් හානියක් සිද්ධ වුණා. බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා - ප්‍රධාන ගරු ඇමැතිතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. බියගම මැතිවරණ කොට්ඨාශයට මේ බස්නාහිර පළාත් සභාව තුළින් ශත පහක ආධාරයක් දුන්නේ නැහැ. එක බෝට්ටු කැල්ලක් දුන්නේ නැහැ. මම දන්නේ නැහැ, ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් සාක්ෂි දරනවා ඇති. ගිය අවුරුද්දේ අපේ ආසනයේ විශාල වශයෙන් හානියක් සිද්ධ වුණා. එක හාල් ඇටයක් දුන්නේ නැහැ. නමුත් මේ පළාත් සභාවෙන් යම්කිසි ආහාර ප්‍රමාණයක් දුන්නා. අපි කියනවා, ඉදිරි කාලසීමාව තුළදීවත් මේ බස්නාහිර පළාත් සභාව හරහා ගංවතුර ගැලුවොත්, ජනතාවට යම්කිසි විධියකින් හානියක් වුණොත් එහෙම මුළු පළාතටම සහනදායී වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියන ඉල්ලීම කරනවා. මේ ගංවතුර තුළින් අපේ බියගම මැතිවරණ කොට්ඨාශයට විශාල හානියක් සිදු වුණා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මම තව ඉල්ලීමක් කරනවා. අපේ ආසනයේ සංඝමිත්තා විද්‍යාලය කියලා ඉස්කෝලයක් තිබෙනවා. මේ විද්‍යාලයේ විශාල පස් කන්දක් තිබෙනවා. ඒ පස් කන්ද කඩාගෙන වැටුණොත් එහෙම අපේ පාසල් සිසු දරුවන් විශාල ප්‍රමාණයකට අනතුරුදායක තත්ත්වයක් තිබෙනවා. අපි එදා ගම්පහ රැස්වීමේදීත් මේක කිව්වා. මම ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා, ගරු අධ්‍යාපන ඇමැතිතුමා නොමැති වුණත් ඒ සංඝමිත්තා විද්‍යාලයේ තිබෙන පස් කන්ද කඩාගෙන වැටුණොත් පාසල් දරු දැරියන් විශාල ප්‍රමාණයක් මම හිතන්නේ, විශාල වශයෙන් ගැටලුවකට මුහුණ දෙනවා. ඒ පස් කන්ද පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියලා ගෞරවයෙන් ඉල්ලීමක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 01.58]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව මම අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරනවා. මම ඇත්තටම මේ යෝජනාවට සංශෝධනයක් එකතු කළේ. මොකද අපි ශෝකය විතරක් ප්‍රකාශ කරලා මදී. මේ අය අද අන්ත අසරණ තත්ත්වයටම පත් වෙලා තිබෙන්නේ. මම ඒකයි කිව්වේ, අඩුම තරමේ මේ ගංවතුරෙන් සම්පූර්ණයෙන් යට වුණු අයට රුපියල් 50,000/- ක දීමනාවක් ක්ෂණිකව - හැබැයි මේක ඉතින් දීර්ඝ කාලීනව වෙලා වැඩක් නැහැ. ක්‍රමයක් හදලා ක්ෂණිකව රුපියල් 50,000/- ක මුදලක් ඒ අයට ලබා දෙන්නය කියලා. ඒ ලබා දෙන්නේ වෙන මොහොකටවත් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කළුතර දිස්ත්‍රික්කය ගත්තාම කළුතර දිස්ත්‍රික්කයේ විශාල ප්‍රමාණයක් යට වුණා. මේ ගම්පහ, කළුතර, කොළඹ යන දිස්ත්‍රික්ක තුනේම පුද්ගලයන් සංඛ්‍යාව ගත්තාම දෙලක්ෂ දොළොස් දහස් නවසිය හැත්තෑ එකක්. බස්නාහිර පළාතේ දෙලක්ෂ

[ගරු ලලිත් එල්ලාවල]

දොළොස් දහස් නවසිය හැත්තෑ එකක්. පවුල් සංඛ්‍යාව ගත්තාම පනස් පන්දහස් නවසිය හැට දෙකක් මේ ගංවතුරෙන් අවතැන් වෙලා ඉන්නවා. ඒකත් එක්කම මරණ සංඛ්‍යාව ගත්තාම 65 දෙනෙක් බස්නාහිර පළාතේ මේ වනකොට මිය ගිහිල්ලා ඉන්නවා. ඒ වාගේම අතුරුදහන් ප්‍රමාණය ගත්තාම 50 දෙනෙක්, මේ තුන් වැනිදා වනකොට වාර්තා තිබුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒගොල්ලෝ මැරිලා නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒගොල්ලොත් මිය ගිහිල්ලා. නමුත් අතුරුදහන් කියලා තමයි කියන්නේ. තවම ඒ අයගේ body සොයා ගන්න බැරිවීම නිසා. මෙන්න මේ වාගේ විශාල ප්‍රමාණයක් අද බස්නාහිර පළාතේ අවතැන් වෙලා, මිය ගිහිල්ලා ඉන්නවා. මේ ගංවතුරත්, මේ නාය යෑමත් නිසා.

දැන් අපේ බණ්ඩාරගම ආසනය ගත්තාම, බණ්ඩාරගම ආසනයේ ග්‍රාමසේවක වසම් 21 කට වඩා මේ වන කොට යට වෙලා තිබෙනවා. අර අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ වහළවලට වඩා උසින් තමයි ගංවතුර ගියේ. ඉතින් ඒ අයට අපි ගිහිල්ලා කථා කළාම අපට කිව්වේ, මෙට්ට ටික, අපේ තිබෙන ටීවී, මේවා ඔක්කොම ගලවලා වහළවල්වල එල්ලුවා කිව්වා. වහළ උසට වතුර එන එකක් නැහැයි කියලා හිතලා. අන්තිමට ටිකක් වෙලා යන කොට, පැයක් විතර යන කොට වහළයටත් වඩා උඩින් වතුර ගියා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඒ අයට ඉතිරි වුණේ ඇඳිවත විතරයි. මට මතකයි. ගල්පාත ප්‍රදේශයේ අපට එක ගෙදරකින් කථා කරලා කිව්වා, වතුර එන්න එන්නම වැඩි වෙනවා. මායි පුංචි දරුවයි නෝනයි විතරයි ඉන්නේ. පුංචි දරුවාට මාස තුනක් ඇති. එන්න විධියක් නැහැයි කියලා. නාවික හමුදාවට පිංසිද්ධ වෙන්න, නාවික හමුදාවේ බෝට්ටුවක් අරගෙන ගිහිල්ලා ඒ තුන්දෙනාව අරගෙන ආවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අම්මා ඇඳගෙන හිටපු ඇඳුමත් ඒ පුංචි දරුවාගේ නෙට් එකත් අතේ තියාගෙන තමයි පන්සලට ආවේ.

අපි මේ වෙලාවේදී විශේෂයෙන්ම විහාරස්ථානවලට අපේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. මට මතකයි ඒ වාගේ පුංචි දරුවන් හිටපු පවුල්වලට අපේ ගල්පාත නායක හාමුදුරුවෝ පැත්තකට ගිහිල්ලා ලැගුම් ගෙය භාර දුන්නා, ඒ පුංචි දරුවන්ට ඉන්න. අන්න එහෙම වැඩ පිළිවෙළක් පන්සල්වල අපේ ගෞරවණීය නායක හාමුදුරුවරු ඉෂ්ට කළා. අන්න ඒ වාගේ මහා විපත්තියක් වුණේ. මම මේක උදාහරණයක් හැටියට පෙන්නුවේ අද මේ අයට ඉතුරු වෙලා තිබෙන්නේ ඇඳිවත විතරයි. අද බස්නාහිර පළාත් සභාව හැටියට, ලංකාවේ වැඩිම ආදායම් තිබෙන පළාත් සභාව හැටියට මේ වාගේ කෙනෙකුට රුපියල් 50,000/- කවත් දීමනාවක්වත් දෙන්න බැරි නම් මේ පළාත් සභාවෙන් වැඩක් නැහැ. මේ පළාත් සභාවේ අපි ඉඳලා වැඩකුත් නැහැ. මෙපමණ ව්‍යසනයක් වෙලා මෙහෙම කරන්න බැරි නම්.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපි කනගාටු වෙනවා. අපි පොඩි ස්තුතියක් කරනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. මොනවා වුණත් ගරු මහ ඇමැතිතුමා කොහෙන් හරි පෞද්ගලිකව - විශාලව කරන්න බැහැ. මොකද සියල්ල ඉෂ්ට වෙලා නැහැ නේ? පළාතෙන් වෙන්න ඕනෑ දේ. නමුත් ගරු මහ ඇමැතිතුමා පුද්ගලික ආයතනවලට කථා කරලා, පළාත් පාලන ආයතනවලට කථා කරලා තමන්ට කරන්න පුළුවන් දේ ඉෂ්ට කළා. ඊට පසුව ඒ ප්‍රදේශයට ඇවිල්ලා සියලු නිලධාරී කැඳවලා මේ විධියට කරන්න කියලා කිව්වා. අපටත් ඔය ප්‍රාදේශීය සභාවල ලේකම්වරුන්ට වඳින්න සිද්ධ වුණා, බටු මුට්ටු ටිකක් දෙන්න කියන්න. අපි මෙතැනදී එහෙම අසරණ වුණා. හැබැයි අපි වැඳලා හරි, අසරණ වෙලා හරි අපි මේ දුප්පත් අහිංසක, ගංවතුරෙන් යට වුණු මිනිස්සුන්ට උදව් කරන්න තමයි ඒ වැඩේ කළේ. අපි කවදාවක්වත් නොකරන දේවලුත් කළා. අපි ඇත්තටම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කනගාටු වෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. අද නිකන් බලන්න. අද මේ දිස්ත්‍රික්ක 11 ක් යට වුණා. මේ ලංකාවේ. දිස්ත්‍රික්ක 11 ක් යට වෙන කොට ලක්ෂ 07 කට වඩා අවතැන් වුණා. ඒ වාගේම මිය ගිය සංඛ්‍යාව 212 ක්. අතුරුදහන් වුණු සංඛ්‍යාව 79 ක් සිටියා. 300 කට ආසන්න සංඛ්‍යාවක් මිය ගියා. ඉතින් මේ මිය ගියාට පස්සේ මෙහෙම වෙලත් අද

තවම බැරි වුණා මේ අයට යමක් කරන්න. මම හිතන්නේ නැහැ, අපි කවුරු කථා කළත් - මම මේ දේශපාලනයක් කථා කරනවා නොවෙයි. ජනාධිපතිතුමා මොන නියෝග කළත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අගමැතිතුමා මොන නියෝග කළත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා ක්‍රියාත්මක වෙනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර සාලාව පුපුරපු එකේ මිනිස්සු උසාවි යන්න ඕනෑ කියලා කියන්නේ නැහැ. මම මේ මාධ්‍යවල දැක්කේ. ඊට පස්සේ අර රත්නපුර ප්‍රදේශයේ නාය ගිය අය. ඒ ප්‍රශ්න තවම විසඳගන්න බැරි වුණා. මේවා එකින් එක ගත්තාම - දැන් මේ ගංවතුරෙන් යට වුණු මිනිස්සුන්ට ඒවා විසඳගන්න බැරි වුණා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ මේවා ගැන දැඩිව අවධානයේ ඉඳලා මෙයිට වඩා මේවා ගැන හිතලා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මම පැහැදිලිව කියන්නේ අර ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ මේ කුඹුරු ගොඩකිරීම් මේවා නවතින්න ඕනෑ. අද බණ්ඩාරගම ආසනය ගත්තාම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා දන්නවා. අද දේශපාලනයේ ප්‍රබලයා තමයි මුලින්ම කුඹුරු ටික ගොඩ කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විධියට කුඹුරු ටික ගොඩ කරගෙන ගියොත් බණ්ඩාරගම නගරයත් තව ටිකක් කල් යන කොට යට වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා සම්පූර්ණයෙන්ම නවතින්න ඕනෑ දේවල්. ඒ වාගේම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ ප්‍රබලයා කවුද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නියෝජ්‍ය ඇමැතිවරු තමයි. හරිද? ඒ වාගේම අපි පැහැදිලිව මතක් කරන්න ඕනෑ. අපේ කෘෂිකර්ම ගරු ඇමැතිතුමා කිව්වා වාගේ අපි ආපදා කැල්ලක් මේකට ආඳගෙන අඩුම ගණනේ මේකට බෝට්ටුවක් ලබා දෙන්න ඕනෑ. දැන් බණ්ඩාරගම ආසනය වාගේ ඒවාට අඟුල් හරි යන්නේ නැහැ. මොකද අඟුල්වලින් යන්න බැහැ. සැඩ පහර වැඩියි. අඟුල්වලින් යන්න බැහැ. ඒවාට බෝට්ටු කිහිපයක් ඕනෑ. ඒවාත් මේ හෝස් පවර් 15 බෝට්ටු හරි යන්නේ නැහැ. ඒවාත් 25, 30, 40 කවත් ඕනෑ. ඉතින් මේ වාගේ කිහිපයක් ඕනෑ වෙනවා. මොකද, අපි දැක්කා. ගොඩක් වෙලාවට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කෑම ටික අරගෙන යන්න ගියාම - අපට මතකයි මමයි, අපේ යසස් ගරු මන්ත්‍රීතුමයි, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමයි අපි තුන්දෙනාත් එක්ක එකට ගියේ. අර කියමනටත් තිබෙනවා නේ. එක බෝට්ටුවේ ගියේ. අර කියමනකුත් තිබෙනවා නේ ගංවතුර ගැලුවාම නයි මුගටි එක කොටේ යනවා කියලා. ඒ වාගේ අපට හයක් තිබුණේ නැහැ. මට මනාප කවුරුවක්වත් සිටියේ නැති හින්දා. ඉතින් යසස් ගරු මන්ත්‍රීතුමයි, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමයි දෙන්නාට දෙන්නා බොහොම හයෙන් ගියේ. ඉතින් ඒ නිසා, දේශපාලනයක් නැතිව අපි තුන්දෙනාත් එක්ක බොහොම සමඟියෙන් මේ වැඩේ කළේ. ඉතින් ඒ නිසා අපි දැක්කා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත කතන්දරය මේක. සමහර අපට යන්න බැරි වුණු තැන්වලට අපි කථා කරලා ඇහුවාම අපට කිව්වේ,

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඊයේ කියනවා, නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා එන්න ඉස්සෙල්ලා දෙන්න පුළුවන්ද කියලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපට කරන්න දෙයක් නැහැ. ජනතාව යට වෙලා සිටිද්දී රට ගියාට අපි මොකද කරන්නේ? නේද? ඒ නිසා ඒවා ගැන අපි කියන්න යන්නේ නැහැ. ඒ නිසා මම මේ බෝට්ටු ගැන කිව්වේ. එක තැනක අපට කිව්වා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පැහැදිලිව කිව්වා. අමු කොසුයි පොලුයි තමයි දවස් දෙකක් කාලා තිබෙන්නේ. මේ කියන්නේ නිලධාරීන්ගේ වරදවත්, කාගේවත් වරදක් නොවෙයි. ඒවාට යන්න ක්‍රමයක් නැහැ. ඉතින් ඒ නිසා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, හෙට කැබිනට් මණ්ඩලයේ රැස්වීමක් හදිසියේ තිබෙනවා. ඒකෙදී කථා කරමු.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඉතින් ඒක නිසා අපි ඇත්තටම සතුටු වෙනවා. එහෙම එකක් පිළිබඳව. ඒකත් එක්කම මේකේ පැහැදිලිවම අපි විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවට විශේෂ ස්තූතියක් කරනවා. මොකද ඒ අය ත්‍රිවිධ හමුදාව, පොලීසිය මේ සියලු දෙනා එකතු වෙලා ලොකු සේවාවක් කළා. ඒකත් ඉතින් මතක් කරන්න ඕනෑ. යුද්ධය ඉවර වුණු නිසා තමයි එච්චර සේවාවක් කරන්න පුළුවන් වුණේ. යුද්ධය තිබුණා නම් ඔය කට්ටිය ගෙන්න ගන්න බැහැ නේ? ඒකත් ඉතින් මහින්ද රාජපක්ෂ මහත්මයාට ස්තූතිවන්ත වෙන්න ඕනෑ. යුද්ධය ඉවර කරපු නිසා. නැත්නම් ඔය අය ගෙන්න ගන්න බැහැ. එහෙම නම් ඔක්කොම යුද්දෙට ගිහිල්ලා නේ? ඒක නිසා අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. යුද්ධය අවසන් කරපු නිසා මේ වාගේ රණවිරුවන් පිරිසක් මේකට ගෙන්න ගන්න පුළුවන් වුණු එක ගැන.

ඒකත් එක්කම මම කියන්නේ. දැන් බලන්න. බස්නාහිර පළාතේ ලක්ෂ ගණනක් යට වෙලා. සිය ගණනක් මිය ගිහිල්ලා. මේ බස්නාහිර පළාතේ 104 ක් මන්ත්‍රීවරු ඉන්නවා. පළාතේ සමාජසේවා ඇමැතිතුමාත් නැහැ. අපේ කළුතර දිස්ත්‍රික්කය ගත්තාම ගරු මහ ඇමැතිතුමා, අධ්‍යාපනය - විශාල පාසල් පද්ධතියක් යට වෙලා. හොරණ කලාපයේ විතරක්ම විශාල දරුවන් සංඛ්‍යාවක් මැරිලා. මම කියන්නේ, මේ යෝජනාව ගත් අවස්ථාවේ සිට සමාජ සේවා ඇමැතිතුමා අධ්‍යාපන ඇමැතිතුමා තමන්ගේ සීට් එකේ ඉන්න ඕනෑ. හරිද? නමුත් අද බලන්න. බස්නාහිර පළාතේ 104 දෙනාගෙන් - දැන් තමයි ගරු අධ්‍යාපන ඇමැතිතුමා ආවේ. මම ස්තූතිවන්ත වෙනවා. මොකද, 104 දෙනාගෙන් කීයද ඉන්නේ? ගණන් කරලා බලන්න කීදෙනාද ඉන්නේ කියලා. මේකේ ඇත්තටම අද ගත්තාම අපි මේ පළාත් සභාව විහිළුවක් කරගෙන. මොකද, මේ පළාත් සභාව ඊයේ පෙරෙයිදා සිට ගණපූරණය බැලුවාම ගණපූරණය නැහැ. දැන් මේ අපි කථා කරන මොහොතේත් පළාත් සභාවේ ගණපූරණය නැහැ. ගණපූරණය නැතිව අපි මේ කථා කරන්නේ. ඉතින් මේ ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. මේ සිද්ධිය පිළිබඳව ඇත්තටම. 104 දෙනාගෙන් මගේ හිතේ කීයද ඉන්නේ? ගණන් කළොත් එහෙම. මේක මම කියන්නේ එන්නේ නැති අයව ජනතාවට ප්‍රකාශ කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

කථා කරනකොට පරිස්සමින් කථා කරන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පරිස්සමින් මම දැනගෙන කථා කළේ. රටට පෙන්වන්න එපැයි. මියගිය මිනිස්සු ගැන කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ගණපූරණය පෙන්නා දුන්න නිසා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ පළාත් සභාව විහිළුවක් වෙලා. මම කියන්නේ මේ අයව ගෙන්වන්න වැඩ පිළිවෙළක් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා විනාඩියක් වාඩි වෙන්න. සීනුව නාද කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කවුරුත් ඇහුවේ නැහැ නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඇහුවේ නැති වුණාට මේ සභාවේ මේ වෙලාවේ ගණපූරණය නැහැයි කියන එක කිව්වා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කථාවේදී කියාගෙන ගියේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න. කැන්ටිමට ඇහෙන්න සීනුව නාද කරන්න. මේ වෙලාවේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු කවුද කියලා නම් කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඊළඟ පාරට ගන්න කියලා ඉල්ලනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනා එම යෝජනාව අපි ලබන සභා වාරය දක්වා කල් තබනවා. මේක ඉතාම වැදගත් යෝජනාවක්. වැදගත් අදහස් ප්‍රකාශ වුණා.

# රීති අංක 12 (1) යටතේ සභාව කල් තැබීම

ADJOURNMENT OF THE COUNCIL SITTING UNDER RULE NO. 12(1)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.17 ට, 2017 ජූනි මස 20 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 02.17 p.m till 9.30 a.m. on 20.06.2017*